# වාර්ෂික වාර්තාව
# 2023

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය

කර්මාන්ත අමාත්‍යාංශය

# පටුන

අපගේ දැක්ම ...... 1
අරමුණු ...... 1
ආයතනික තොරතුරු ...... 2
ආයතනික ව්‍යුහය ...... 5
**කළමනාකරණ සමාලෝචනය ...... 7**
2023වසරේ වැදගත් සිදුවීම් ...... 12
**ප්‍රගති සාරාංශය ...... 24**
**මෙහෙයුම් සමාලෝචනය ...... 30**
1) පරිපාලන අංශය ...... 31
2) ඉංජිනේරු අංශය ...... 35
3) කාර්මික ජනපද අංශය ...... 42
4) ව්‍යවසායකත්ව සංවර්ධන අංශය ...... 47
5) ප්‍රාදේශීය සංවර්ධන අංශය ...... 55
6) සැලසුම් අංශය ...... 60
7) තාක්ෂණික සේවා අංශය ...... 65
8) අලෙවි අංශය ...... 70
9) රබර් නිෂ්පාදන සංවර්ධන සහ සේවා මධ්‍යස්ථානය ...... 73
10) සම්භාණ්ඩ නිෂ්පාදන සහ පාවහන් සංවර්ධන මධ්‍යස්ථානය ...... 76
**මූල්‍ය සමාලෝචනය ...... 81**
විස්තීරණ මූල්‍ය තත්ත්ව ප්‍රකාශය ...... 82
විස්තීර්ණ ආදායම් ප්‍රකාශය ...... 83
හිමිකම වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය ...... 84
මුදල් ප්‍රවාහ ප්‍රකාශය ...... 85
වැදගත් වන ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් ...... 86
**මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සමාලෝචනය ...... 115**

## කෙටි යෙදුම් ලේඛනය

| | | |
|---|---|---|
| AD | - | පරිපාලන අංශය |
| ATRDC | - | යෝග්‍යතා තාක්ෂණ පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය |
| AVCO Method | - | සාමාන්‍ය පිරිවැය ක්‍රමය |
| BMICH | - | බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව |
| BAU | - | ව්‍යාපාරයේ සාමාන්‍ය මෙහෙයුම් |
| BSC | - | පිත්තල භාණ්ඩ සේවා මධ්‍ය ස්ථානය |
| CDLPF | - | සම්භාණ්ඩ නිෂ්පාදන සහ පාවහන් සංවර්ධන මධ්‍යස්ථානය |
| CNC | - | පරිගණක සංඛ්‍යාත්මක පාලනය |
| CSC | - | පොදු සේවා මධ්‍යස්ථානය |
| CTB | - | ලංකා ගමනාගමන මණ්ඩලය |
| DS | - | ප්‍රාදේශීය ලේකම් |
| ED | - | ඉංජිනේරු අංශය |
| EDD | - | ව්‍යවසායකත්ව සංවර්ධන අංශය |
| E-commerce | - | ඉලෙක්ට්‍රොනික වාණිජ්‍යය |
| EnMS | - | බලශක්ති කළමනාකරණ පද්ධතිය |
| EPC | - | විද්‍යුත් ලෝහාලේපන මධ්‍යස්ථානය |
| EU | - | යුරෝපා සංගමය |
| FD | - | මුදල් අංශය |
| GDP | - | දළ දේශීය නිෂ්පාදනය |
| GHG | - | හරිතාගාර වායු |
| HDFC | - | නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථාව |
| HODs | - | අංශ ප්‍රධානීන් |
| ICC | - | ජාත්‍යන්තර වාණිජ මණ්ඩලය |
| ICT | - | තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය |
| IDB | - | කාර්මික සංවර්ධන මණ්ඩලය |
| IEC | - | ජාත්‍යන්තර විද්‍යුත් තාක්‍ෂණික කොමිෂන් සභාව |
| IED | - | කාර්මික ජනපද අංශය |
| INBAR | - | ජාත්‍යන්තර උණ සහ වේවැල් සංවිධානය |
| IoT | - | අන්තර්ජාල දේවල් |
| ISO | - | ජත්‍යන්තර ප්‍රමිති සංවිධානය |
| IT | - | තොරතුරු තාක්ෂණය |
| JAS | - | ජපන් කෘෂිකාර්මික ප්‍රමිති |
| KPIs | - | ප්‍රධාන කාර්ය සාධන දර්ශක |
| Ltd | - | සීමාසහිත |
| MD | - | අලෙවි අංශය |
| MFIF | - | මධ්‍යම සංඛ්‍යාත ප්‍රේරක උඳුන |
| MOU | - | අවබෝධතා ගිවිසුම |
| MPI | - | ක්‍රම සම්පාදන හා ආයෝජන අමාත්‍යාංශය |
| MSMEs | - | ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර |
| MT | - | මෙට්‍රික් ටොන් |
| NBT | - | ජාතිය ගොඩනැගීමේ බදු |
| NMRA | - | ජාතික ඖෂධ නියාමන අධිකාරිය |
| NVQ | - | ජාතික වෘත්තීය සුදුසුකම් |
| PCU | - | ප්‍රක්ෂේපිත ඒකක ණය ක්‍රමය |
| PCU | - | ප්‍රක්ෂේපිත ඒකක බැර ක්‍රමය |
| PD | - | සැලසුම් අංශය |
| PPP | - | රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරීත්වය |
| RDD | - | ප්‍රාදේශීය සංවර්ධන අංශය |
| RPDSC | - | රබර් නිෂ්පාදන සංවර්ධන සහ සේවා මධ්‍යස්ථානය |
| R&D | - | පර්යේෂණ සහ සංවර්ධන |
| SCX | - | උපකොන්ත්‍රාත් හුවමාරුව |
| SDB | - | සණස සංවර්ධන බැංකුව |
| SEs | - | ස්වයං රැකියා නියුක්තිකයන් |
| SEDA | - | තිරසාර ව්‍යවසායකත්ව සංවර්ධන ප්‍රවේශය |
| SoP | - | උසස්වීම් යෝජනා ක්‍රමය |
| SoR | - | බඳවා ගැනීමේ යෝජනා ක්‍රමය |
| TSD | - | තාක්ෂණික සේවා අංශය |
| TVEC | - | තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව |
| UNIDO | - | එක්සත් ජාතීන්ගේ කාර්මික සංවර්ධන සංවිධානය |
| USAID | - | ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වූ එක්සත් ජනපද නියෝජිතායතනය |

# අපගේ දැක්ම

*"සමස්ත ශ්‍රී ලංකාව පුරා ඇති සියලුම කර්මාන්ත සංවර්ධනය කිරීම"*

# අපගේ මෙහෙවර

*"සමස්ත ශ්‍රී ලංකාව පුරා ඇති සියලුම කර්මාන්ත දිරිමත් කිරීම, ප්‍රවර්ධනය කිරීම හා සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය ක්‍රමෝපායික, තාක්ෂණික හා වාණිජමය පදනම සකසා දීම"*

# අරමුණු

| | |
|---|---|
| 1 | 2030 වන විට "ව්‍යාපාර කිරීමේ පහසුව" දර්ශකයේ 99 වැනි ස්ථානයේ සිට 50 වැනි ස්ථානයෙන් පහලට ගෙන ඒම. |
| 2 | 2030 වන විට ව්‍යවසායකත්ව ප්‍රතිශතය (කර්මාන්ත ගොඩ නැගීම වැඩි කිරීම) - 2.8% සිට 10% දක්වා වැඩි කිරීම. |
| 3 | 2030 වන විට GDP සඳහා නිෂ්පාදන කර්මාන්ත දායකත්වය - 15% සිට 25% දක්වා වැඩි කිරීම (ස්ථාවරත්වය - නව/ පවතින කර්මාන්ත). |
| 4 | 2030 වන විට වත්මන් ඒක පුද්ගල අපනයනය (US$ 596) ගෝලීය සාමාන්‍යයෙන් (US$ 3055) 50% (US$ 1527) දක්වා වැඩි දියුණු කිරීම. |
| 5 | 2030 වන විට කාර්මික කලාප සඳහා ඉඩම් ප්‍රතිශතය 0.04% සිට 1% දක්වා වැඩි කිරීම. |
| 6 | සම්පත් කාර්යක්ෂමතාව, හරිත තාක්ෂණය සහ චක්‍ර ආර්ථික සංකල්ප අනුගමනය සහ ඇතුළත් කර ගන්නා අතරම අවම කිරීමේ ක්‍රියාකාරකම් වැඩි දියුණු කිරීම තුළින් 2030 වන විට කර්මාන්ත අංශයේ BAU තත්ත්වයට එරෙහිව හරිතාගාර වායු (GHG) විමෝචනය 7% කින් අඩු කිරීම. |

## 1) ආයතනික තොරතුරු

**නෛතික ආකෘතිය**

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය (IDB) යනු කර්මාන්ත අමාත්‍යාංශය යටතේ පවතින ප්‍රමුඛතම රාජ්‍ය සංවිධානය වේ. එය 1969 අංක 36 දරණ කාර්මික සංවර්ධන පනත මගින් බල ගන්වා ඇති අතර ශ්‍රී ලංකාවේ කාර්මික අංශය සංවර්ධනය කිරීමේ වගකීම පැවරී ඇත.

ශ්‍රී ලංකාව "මධ්‍ය ආදායම්" ලබන රටක තත්ත්වයට වර්ගීකරණය කර ඇති බැවින්, සංවර්ධිත රටවලට කාර්මික නිෂ්පාදන අපනයනය කිරීමේදී සහනදායි කොන්දේසි මත තවදුරටත් යැපීමට අපට නොහැකිය. අපගේ නිෂ්පාදනවල ගුණාත්මකභාවය ඉහළ නැංවීම, පිරිවැය අඩු කිරීම, ඵලදායිතාව ඉහළ නැංවීම සහ සන්නාම වටිනාකම වැඩිදියුණු කිරීම අපගේ කාර්මික නිෂ්පාදනයන්හි තරඟකාරීත්වය දේශීය හා විදේශීය වෙළඳපල තුළ පවත්වා ගැනීම සඳහා අතිශයින් වැදගත් වේ. කාර්මික සංවර්ධන මණ්ඩලය පිහිටුවන ලද 1969 අංක 36 දරන කාර්මික සංවර්ධන පනත මගින් ශ්‍රී ලංකාවේ රාජ්‍ය සහ පෞද්ගලික යන අංශයන්හි සියලුම කර්මාන්ත ආවරණය වන පරිදි පුළුල් බලතල කා.සං.ම. වෙත ලබා දී ඇත. ජාතික ආර්ථිකයේ වර්ධනය සඳහා වන උපායමාර්ගික වැදගත්කම හේතුවෙන් කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්ත දිරිමත් කිරීම සහ ප්‍රවර්ධනය කිරීම කෙරෙහි අතීතයේ දී කා.සං.ම. ප්‍රධාන වශයෙන් අවධානය යොමු කර ඇත. කා.සං.ම. විසින් ව්‍යවසායකයින් සහ SMIs පමණක් දිරිමත් කිරීම සහ ප්‍රවර්ධනය කිරීම නොකළ යුතු අතර, කාර්මික පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම සහ අපගේ කාර්මික නිෂ්පාදන අපනයනය කිරීමට සහාය වීම ඇතුළුව අපගේ සියලු කර්මාන්ත සංවර්ධනය කිරීමට පහසුකම් සැලසිය යුතුය. වර්තමානය වන විට, කා.සං.ම. විසින් අපනයනය කෙරෙහි නැඹුරු වූ සංස්කෘතියක් කරා යන ගමන සම්පූර්ණයෙන් ආවරණය වන පරිදි සිය ක්‍රියාකාරකම් පුළුල් කර ඇත. තවද, කා.සං.ම. ජාත්‍යන්තර වෙළඳ ක්ෂේත්‍රය තුළ දේශීය කාර්මික නිෂ්පාදන විදේශීය වෙළෙඳපොළ වෙත අපනයනය ප්‍රවර්ධනය කරන අතර ශ්‍රී ලංකාවේ ඕනෑම කාර්මික ව්‍යාපාරයකට හෝ කාර්මික ආයතනයකට හෝ ඊට අදාළව අවශ්‍ය සේවා සහ පහසුකම් සපයයි. පනතේ නිශ්චිතව දක්වා ඇති සියලුම අරමුණු තිරසාර ලෙස සාක්ෂාත් කර ගැනීම සඳහා, කා.සං.ම. විසින් සිය සියලු මෙහෙයුම්වල කාර්යක්ෂමතාව සහ මූල්‍ය ශක්‍යතාව වැඩිදියුණු කළ යුතුය. කාර්මික සංවර්ධන මණ්ඩලය එහි ආරම්භයේ සිට පසුගිය වසර 53 තුළ රජයන් වෙනස්වීමත් සමඟ අමාත්‍යාංශ කිහිපයක් යටතේ ක්‍රියාත්මක විය. දැනට කර්මාන්ත අමාත්‍යාංශයේ පරිපාලන විෂය පථය යටතේ ව්‍යවස්ථාපිත ආයතනයක් ලෙස කාර්මික සංවර්ධන මණ්ඩලය ක්‍රියාත්මක වේ.


## අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් – 2023/24

| අංකය | තනතුර | නම | ආයතනය | කාල පරිච්ඡේදය | |
|---|---|---|---|---|---|
| | | | | පත්වීමේ දිනය | පත්වීමේ අවසන් දිනය |
| 01. | සභාපති | වෛද්‍යා සාරංග අලහප්පෙරුම | කාර්මික සංවර්ධන මණ්ඩලය | 2022.09.15 | 2024.09.20 |
| 02. | මණ්ඩලයේ සාමාජික | එච්.ආර්.පී .පීරිස් මහතා | - | 2020.01.01 | 2023.06.10 |
| 03. | මණ්ඩලයේ සාමාජික | ආලෝක වහලවත්ත මහතා | - | 2020.01.01 | 2023.03.17 |
| 04. | මණ්ඩලයෙහි නිලබලයෙන් පත්වන සාමාජික | කේ.ජී.ආර්.ජී.ආර් . වික්‍රමවර්ධන මහතා | ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව | 2020.06.30 | 2023.08.09 |
| 05. | භාණ්ඩාගාර නියෝජිත | බී.කේ.ආර් .බාලසූරිය මහතා | මුදල් අමාත්‍යාංශය | 2022.03.23 | 2023.01.25 |
| 06. | මණ්ඩලයේ නිරීක්ෂක | කේ.ජී.ආර් .විමලසූරිය මහතා | කර්මාන්ත අමාත්‍යාංශය | 2022.06.01 | 2023.07.14 |
| 07. | මණ්ඩලයේ සාමාජික | සුරංග මෙන්ඩිස් මහතා | ලංකා – ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනය | 2022.07.29 | 2024.09.20 |
| 08. | මණ්ඩලයේ සාමාජික | එච්.එම් .රංජිත් කිරිඇල්ල මහතා | - | 2022.08.08 | 2024.09.20 |
| 09. | භාණ්ඩාගාර නියෝජිත | චන්දිමා පුංචිහේවා මෙනවිය | මුදල් අමාත්‍යාංශය | 2023.01.25 | 2023.08.08 |
| 10. | මණ්ඩලයේ සාමාජික | පී. සාරද මාවිටගම මහතා | - | 2023.06.26 | 2024.06.26 |
| 11. | මණ්ඩලයේ නිරීක්ෂක | එස්.එච්. ප්‍රනාන්දු මහතා | කර්මාන්ත අමාත්‍යාංශය | 2023.07.14 | 2024.01.12 |
| 12. | මණ්ඩලයේ සාමාජික | පී.එල්.යූ. රත්නමලල මහතා | - | 2023.07.28 | 2024.09.20 |
| 13. | භාණ්ඩාගාර නියෝජිත | බී.ඒ.ටී. රොද්‍රිගු මහතා | මුදල් අමාත්‍යාංශය | 2023.08.08 | 2024.05.09 |
| 14. | මණ්ඩලයෙහි නිලබලයෙන් පත්වන සාමාජික | කුමුදු මීගහගේ මහතා | වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය | 2023.08.14 | 2024.09.20 |
| 15. | මණ්ඩලයෙහි නිලබලයෙන් පත්වන සාමාජික | එස්.එච්.වී. කුමාර මහතා | සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව | 2023.10.10 | 2024.05.09 |

මණ්ඩලයේ ප්‍රධාන අංශ

| අංකය | අංශයේ නම | | අංශ ප්‍රධානී |
|---|---|---|---|
| 01 | පාලන අංශය (AD) | - | චමින්ද රාමසුන්දර මහතා (අධ්‍යක්ෂ) |
| 02 | ප්‍රාදේශීය සංවර්ධන අංශය (RDD) | - | පී.පී.පී.එස් .දික්වැල්ල මහතා (අධ්‍යක්ෂ) |
| 03 | සැලසුම් අංශය (PD) | - | ජේ.ඩී.හේමකුමාර සිල්වා මහතා (අධ්‍යක්ෂ) |
| 04 | අලෙවි අංශය (MD) | - | එච්.එම්.එස් .සමරකෝන් මහතා (අධ්‍යක්ෂ) |
| 05 | කාර්මික ජනපද අංශය (IED) | - | ඩබ්ලිව්.ඒ.ලාල් ප්‍රියන්ත මහතා (අධ්‍යක්ෂ) |
| 06 | ඉංජිනේරු අංශය (ED) | - | ඩබ්.ඒ.පී.කපිල නිෂාන්ත මහතා (අධ්‍යක්ෂ) |
| 07 | ව්‍යවසායකත්ව සංවර්ධන හා උපදේශන සේවා මධ්‍යස්ථානය (CEDACS) | - | රේණුකා ජයලත් මිය (අධ්‍යක්ෂ) |
| 08 | තාක්ෂණ සේවා අංශය (TSD) | - | එච්.ඒ.පී .ගුණවර්ධන මහතා (අධ්‍යක්ෂ) |
| 09 | මුල්‍ය අංශය (FD) | - | ජේ.එම්.ආර්.එස්. ජයසිංහ මහතා (අධ්‍යක්ෂ) |
| 10 | සම්භාණ්ඩ නිෂ්පාදන හා පාවහන් සංවර්ධන මධ්‍යස්ථානය (CDLPF) | - | අමරනාත් විමලසිංහ මහතා (නියෝජ්‍ය අධ්‍යක්ෂ) |
| 11 | රබර් නිෂ්පාදන සංවර්ධන හා සේවා මධ්‍යස්ථානය (RPDSC) | - | හසමාලි සමරසිංහ මිය (සහකාර අධ්‍යක්ෂ) |

## ආයතනික ව්‍යුහය



සභාපති
HM 2-1
අධ්‍යක්ෂ ජනරාල්
HM 1-3
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (මෙහෙයුම්)
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (සංවර්ධන)
HM 1-2
අධ්‍යක්ෂ - පරිපාලන (01)
අධ්‍යක්ෂ - මුදල් (01)
අධ්‍යක්ෂ - සැලසුම් (01)
අධ්‍යක්ෂ - අලෙවිකරණ (01)
අධ්‍යක්ෂ - ව.ස.උ.සේ.ම. (CEDACS) (01)
අධ්‍යක්ෂ - කාර්මික ජනපද (01)
අධ්‍යක්ෂ - ප්‍රාදේශීය සංවර්ධන (01)
අධ්‍යක්ෂ - තාක්ෂණ සේවා (01)
අධ්‍යක්ෂ - ඉංජිනේරු (01)
MM 1-2
ස.අ./ නි.අ. (04)
ගණකාධිකාරීන් (03)
ස.අ./ නි.අ. (03)
ස.අ./ නි.අ. (03)
ස.අ./ නි.අ.– (03) පුස්තකාලයාධිපති – (01) පද්ධති පරිපාලක – (01)
ස.අ./ නි.අ. (02)
ස.අ. / නි.අ. (02)
ස.අ. / නි.අ. (25)
ස.අ./ නි.අ. -(10) ඉංජිනේරු (02)
ස.අ./ නි.අ. -(01) ඉංජිනේරු (07)
අභ්‍යන්තර විගණක (01)
අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් (01)
JM 1-1
පරිපාලන නිලධාරී (02) සැපයුම් නිලධාරී (01) ආරක්ෂක නිලධාරී (01) ප්‍රවාහන නිලධාරී (01)
ගිණුම් නිලධාරී (01)
ස.නි / . ජ්‍යෙ.ව.ප්‍ර.නි. (03)
ස.නි / . ජ්‍යෙ.ව.ප්‍ර.නි. (02) අලෙවි නිලධාරී (03)
ස.නි / .ජ්‍යෙ.ව.ප්‍ර.නි. (02) මුද්‍රණ නිලධාරී (1) වෙබ් මාස්ටර් (1)
ස.නි / . ජ්‍යෙ.ව.ප්‍ර.නි. (02) අධිකාරී (07)
ස.නි / . ජ්‍යෙ.ව.ප්‍ර.නි. (02)
ජ්‍යෙ.ව.ප්‍ර. නි. (25)
ස.නි / . ජ්‍යෙ.ව.ප්‍ර.නි. (15) පරි.නි
ස.නි / . ජ්‍යෙ.ව.ප්‍ර.නි. (01) ජ්‍යෙ.ඉ.ස (09)
අභ්‍යන්තර විගණක නිලධාරී (01)
සභාපතිතුමාගේ පෞද්ගලික සහකාර (01)
MA 5-2
සහායක කාර්ය මණ්ඩලය [ව්‍යාපාර ප්‍රවර්ධන නිලධාරී (EPO) / (94) සංඛ්‍යාලේඛන නිලධාරී / (01)නිර්මාණකරු (01)]
MA 2-1/MA 1-
සහායක කාර්ය මණ්ඩලය :
/ කෙටුම්පත්කරු සහකාර / ෆෝර්මන් / රසායනාගාර සහකාර / පුස්තකාල සහකාර / පරිගණක ග්‍රැෆික් නිර්මාණකරු / ඉංජිනේරු සහකාර / කෙටුම්පත්කරු / පොත් තබන්නා)
පුහුණු / ප්‍රදර්ශක / ගබඩා භාරකරු / අලෙවි සහකාර / සංඛ්‍යා ලේඛන පරීක්ෂක / කළමනාකරණ සහකාර උපදේශක (- (184)
PL 1/PL 2/PL 3
සහායක කාර්ය මණ්ඩලය )නිපුණතා කාර්යයන් /කාර්යාල සහායක /ක්ෂේත්‍ර සහායක /ගබඩාකරු /කම්කරු) – (266)

# කළමනාකරණ සමාලෝචනය

- සභාපතිතුමන්ගේ පණිවිඩය
- අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය

# සභාපතිතුමන්ගේ පණිවිඩය



පසුගිය වසර දෙස හැරී බැලීමේදී, කාර්මික සංවර්ධන මණ්ඩලය (IDB) ලෙස අප ලබා ඇති සුවිසල් ප්‍රගතිය සහ ජයග්‍රහණ ඔබ සමඟ බෙදා ගැනීමට ලැබීම පිළිබඳව මම බෙහෙවින් සතුටට පත් වෙමි. 2023 වර්ෂයේ දී අභියෝග රැසකට මුහුණපෑමට සිදු වුවද, අපනයනය කේන්ද්‍ර කරගත් ශක්තිමත් නිෂ්පාදනාගාර බවට දේශීය කර්මාන්ත පරිවර්තනය කිරීම අරමුණු කරගත් රජයේ ප්‍රතිපත්ති රාමුව ක්‍රියාත්මක කිරීම උදෙසා කැපවූ අපගේ කණ්ඩායම, සිය කැපී පෙනෙන ඔරොත්තු දීමේ හැකියාව, නව සංකල්පනා සහ නොසැලෙන කැපවීම පෙන්නුම් කරන ලදී. කර්මාන්ත අමාත්‍ය ගරු වෛද්‍ය රමේෂ් පතිරණ මහතා විසින් මෙම ව්‍යායාමය මෙහෙයවන ලදී.

කාර්මික අංශයේ සංවර්ධනය සඳහා වගකියනු ලබන එකම රාජ්‍ය ආයතනය වන කා.සං.ම., කර්මාන්තකරුවන් මුහුණ දෙන අභියෝගවලට විසඳුම් සෙවීම හා ඔවුන්ට හිතකර ව්‍යාපාරික පරිසරයක් නිර්මාණය කිරීම සඳහා සංවර්ධන ක්‍රියාවලියේ කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම, ව්‍යවසායක සංස්කෘතියක් ගොඩනැගීම, සහ සමාජය තුළ නිෂ්පාදනයේ ජාතික වැදගත්කම ඒත්තු ගැන්වීම කෙරෙහි උපායමාර්ගිකව අවධානය යොමු කර ඇත.

මෙම මුලපිරීම් ක්‍රියාවට නැංවීම තුළින් "ව්‍යාපාර කිරීමේ පහසුව" දර්ශකයේ ශ්‍රේණිගත කිරීම් තුළ 99 වැනි ස්ථානයේ සිට 50 වැනි ස්ථානය දක්වා ශ්‍රී ලංකාව ඉහළ නැංවීම අපගේ අරමුණ විය. නිෂ්පාදන අංශය 15% සිට 25% දක්වා ඉහළ නැංවීම, ව්‍යවසායකත්ව අනුපාතය 2.8% සිට 10% දක්වා ඉහළ නැංවීම, කාර්මික ජනපදයන්හි ඉඩම් දායකත්වය 0.04% සිට 1% දක්වා පුළුල් කිරීම, ඒක පුද්ගල අපනයන ගෝලීය සාමාන්‍යයෙන් 50% දක්වා ඉහළ නැංවීම සහ සාමාන්‍ය ව්‍යාපාර තත්ත්වයට සාපේක්ෂව හරිතාගාර වායු විමෝචනය 7% කින් අඩු කිරීම අපගේ ඉලක්ක තුළ අන්තර්ගත විය. 2030 වන විට සම්පත් කාර්යක්ෂමතාව, හරිත තාක්ෂණය සහ චක්‍රීය ආර්ථික සංකල්ප හරහා මෙම අරමුණු සාක්ෂාත් කර ගැනීමට නියමිතව තිබුණි.

වසරේ සුවිශේෂී ජයග්‍රහණයන් අතරට "කර්මාන්ත සංවර්ධන අරමුදල" ආරම්භ කිරීම, "ඉන්ඩස්ට්‍රි එක්ස්පෝ 2023" සහ ඉන් අනතුරුව කලාපීය ප්‍රදර්ශන තුනක් සාර්ථකව නිම කිරීම, කා.සං.ම. වෙබ් අඩවිය උසස් උපකාරක මෙවලම් සහිත විස්තීරණ එකම ස්ථානයකින් සියලු සේවාවන් ලබා දෙන one-stop shop බවට වැඩිදියුණු කිරීම සහ සියලුම දිස්ත්‍රික්ක තුළ ප්‍රාදේශීය මට්ටමින් පුහුණු සැසි 40,000 කට අධික ප්‍රමාණයක් සම්පූර්ණ කිරීම ඇතුළත් වේ.

තාක්ෂණ හුවමාරුව සහ පුහුණුව මගින් කාර්මික අංශයට නවීන තාක්‍ෂණය හඳුන්වා දී, එමගින් දේශීය හා විදේශීය කර්මාන්ත අතර පවතින තාක්‍ෂණික පරතරය අවම කිරීමේ අරමුණින්, අප විසින් වසර පුරා ආරම්භක සහ විස්තීරණ (Startup and Scale-up) උපාය මාර්ග යටතේ ව්‍යාපෘති කිහිපයක් සාර්ථකව ක්‍රියාත්මක කළෙමු. SEDA හි ආරම්භක සහ විස්තීරණ වැඩසටහන් හරහා ශ්‍රී ලාංකීය පුරවැසියන් අතර ව්‍යවසායකත්ව මානසිකත්වයක් ඇති කිරීමට, ඉඩම්, ද්‍රවශීලතාවය සහ බලපත්‍ර (Ls 3) සම්බන්ධ ගැටළු ලිහිල් කිරීමට සහ දේශීය හා ජාත්‍යන්තර වෙළඳපල සබඳතා පුළුල් කිරීම සහ ශක්තිමත් කිරීම මගින් ශ්‍රී ලංකාව තිරසාර කාර්මික සංවර්ධනයක් සහිත සමෘද්ධිමත් ජාතියක් බවට ගොඩනැගීමට ද අපි කටයුතු කළෙමු. තරුණ පරම්පරාව අතර ව්‍යවසායකත්වය පෝෂණය කිරීම සඳහා පාසල්, විශ්වවිද්‍යාල සහ අනෙකුත් උසස් අධ්‍යාපන ආයතනවල විෂයමාලාවලට පාසල් කර්මාන්ත ව්‍යවසායකත්ව සංකල්ප ඇතුළත් කිරීමට කටයුතු සම්පාදනය වෙමින් පවතී. සෑම දිස්ත්‍රික්කයක්ම සහ අධ්‍යාපන කලාපයක්ම ආවරණය වන පරිදි පාසල් කර්මාන්ත ව්‍යවසායකත්ව කව හඳුන්වා දීමටත් අපි මූලිකත්වය ගෙන ඇත. මීට අමතරව, පුළුල් ප්‍රේක්ෂක පිරිසක් කරා ළඟා වීමට සහ දැනුවත් කිරීමට විවිධ මාධ්‍ය වේදිකා උපයෝගී කර ගනිමින්

නිෂ්පාදන ආර්ථිකයක් කරා රට පරිවර්තනය කිරීමේ වේගය වැඩිදියුණු කිරීම අරමුණු කරගත් වැඩසටහන් අප විසින් සකස් කර ඇත්තෙමු.

මීට අමතරව, ඩිජිටල් අලෙවිකරණය සහ ඊ-වාණිජ්‍යය වේදිකා ප්‍රවර්ධනය කිරීම මගින් දේශීය ව්‍යවසායකයින්ට ගෝලීය වෙළඳපොළට පිවිසීමට කා.සං.ම. විසින් පදනම සකස් කර ඇත. නැගී එන ව්‍යවසායකයින්ට සහය වීමට සහ අවශ්‍ය විටෙක සහයෝගය ලබා දීමට, අපි කෙටි දුරකථන අංකයක් (1995), ජංගම යෙදුමක් සහ වට්ස්ඇප් අංකයක් (0705001995) හඳුන්වා දුන්නෙමු. ව්‍යවසායකයින්ගේ කැපවීම සහ වෙහෙස මහන්සි වී වැඩ කිරීම සඳහා පිළිගැනීමක් සහ ඇගයීමක් ලබා දීමෙන් ව්‍යවසායක සංස්කෘතිය වැඩිදියුණු කිරීම කෙරෙහි ද අපි අවධානය යොමු කලෙමු. මෙයට කා.සං.ම. ලියාපදිංචිය වැනි විශේෂ වැඩසටහන් ඇතුළත් වන අතර එමඟින් රජයේ නිල පිළිගැනීම, විශේෂ හැඳුනුම්පත් සහ වාහන අවසර පත්‍ර ලබා දෙන අතර එමඟින් සමාජය තුළ ඔවුන්ගේ තත්ත්වය වැඩිදියුණු වේ.

මෙම සමාලෝචිත කාල සීමාව තුළ අපගේ අරමුණු සහ ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා සිය මාහැඟි දායකත්වය ලබාදුන් කා.සං.ම. හි අධ්‍යක්ෂ ජනරාල්වරයා ඇතුළු කාර්ය මණ්ඩලය වෙත මාගේ හෘදයාංගම ස්තුතිය පුද කිරීමට කැමැත්තෙමි. කා.සං.ම. හි කාර්යයන් කළමනාකරණය කිරීමේදී කළමනාකරණ මණ්ඩලය විසින් ලබාදුන් මගපෙන්වීම, උපදෙස් සහ සහයෝගය ද මවිසින් බෙහෙවින්ම අගය කරමි. කර්මාන්ත අමාත්‍ය ගරු වෛද්‍ය රමේෂ් පතිරණ මැතිතුමාගේ සුවිශේෂී මගපෙන්වීම වෙනුවෙන් සහ 2023 දී අපගේ අරමුණු සාක්ෂාත් කර ගැනීමට අපට උපකාර කිරීම සඳහා ඇප කැප වූ කර්මාන්ත අමාත්‍යාංශයට විශේෂ ස්තුතිය පුදකර සිටිමි. එම උද්‍යෝගය සහ කැපවීම අඛණ්ඩව පවත්වා ගැනීම තුළින් ඉදිරි වසර තුළ මීටත් වඩා සුවිශාල සාර්ථකත්වයක් ළඟාකර ගැනීමට හැකිවනු ඇතැයි මම බලාපොරොත්තු වෙමි.

**වෛද්‍ය සාරංග අලහප්පෙරුම**
**සභාපති**
**ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය**

# අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය



රටක ආර්ථික සංවර්ධනය ශක්‍ය සහ අර්ථවත් වන්නේ එය තිරසාර නම් පමණි. එම සන්දර්භය තුළ, රටේ සංවර්ධනය සහ තිරසාරභාවය නොසැලකුවද, ඕනෑම ආර්ථිකයක කර්මාන්ත අංශය ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි.

ශ්‍රී ලංකාවේ සහයෝගී පරිසරය දේශීය කර්මාන්ත සඳහා විවිධ දෘෂ්ටිකෝණයන් හරහා දියුණු වීමට දිරිගැන්වීමක් ලබා දී ඇත. මේ අතර, ආර්ථික වර්ධනය කෙරෙහි නිෂ්පාදන අංශයේ සෘජු හා සැලකිය යුතු බලපෑම හේතුවෙන් ඒ සඳහා විශේෂයෙන් ප්‍රමුඛත්වය දී ඇත. මෙම විභවය ප්‍රයෝජනයට ගැනීම සඳහා පැහැදිලි සහ අවධානය යොමු කළ උපාය මාර්ගයක් සමඟ දේශීය කර්මාන්ත සඳහා සුවිශේෂී සංවර්ධන මුලපිරීම් ක්‍රියාත්මක කිරීම අත්‍යවශ්‍ය වේ.

කෙසේ වෙතත්, දැඩි ගෝලීය තරඟකාරී යුගයක, අපගේ මාතෘභූමියේ කර්මාන්ත නව්‍යකරණයන් වැලඳ ගනිමින් සහ ඔරොත්තු දීමේ හැකියාව, තිරසාරභාවය සහ වර්ධනය සහතික කිරීම සඳහා උපාය මාර්ගික ප්‍රවේශයන් අනුගමනය කරමින් අභියෝගයට මුහුණ දීම අවශ්‍ය වේ. කාර්මික සංවර්ධනය සඳහා කැප වූ ප්‍රමුඛ රාජ්‍ය ආයතනයක් ලෙස ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය (IDB) මෙම පරිවර්තනීය ක්‍රියාවලිය සඳහා ඉමහත් දායකත්වයක් ලබා දීමේ සුවිශේෂී වගකීම දරයි.

මෙම වාර්ෂික වාර්තාවේ ඉස්මතු කර ඇති මුලපිරීම්, දෘෂ්ටීන් සහ සාමූහික ප්‍රයත්නයන් දේශීය කර්මාන්තයේ අවශ්‍යතා සපුරාලීම සඳහා පමණක් නොව, කාර්මික සංවර්ධනය නංවාලීම සඳහා අපගේ සේවකයින්ට සහ සංවිධානයට වඩා ශක්තිමත්, වඩා ඵලදායී කාර්යභාරයක් ඉටු කිරීමට බල ගන්වනු ඇතැයි මම විශ්වාස කරමි.

අවසාන වශයෙන්, කා.සං.ම. හි සභාපතිවරයාගේ දූරදර්ශී නායකත්වය සහ මඟපෙන්වීම වෙනුවෙන් සහ කා.සං.ම. කාර්ය මණ්ඩලයේ කැපවීම සහ නොපසුබස්නා උත්සාහය වෙනුවෙන් එම සමස්ත කණ්ඩායමටම මගේ හෘදයාංගම ස්තුතිය පුද කිරීමට කැමැත්තෙමි. අපගේ ප්‍රගතිය සහ සාර්ථකත්වය පිටුපස ඇති ගාමක බලවේගය ඔබගේ නොසැලෙන කැපවීමයි.

**එච්.එම්.එස් සමරකෝන්**
**අධ්‍යක්ෂ ජනරාල්**
**ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය**




# අතීත කාර්යසාධනය

## 2023 වසරේ වැදගත් සිදුවීම්

### 1) "Industry 2023", ජාතික කර්මාන්ත ප්‍රදර්ශනය සහ කර්මාන්ත විශිෂ්ටතා සම්මාන උළෙල නිල වශයෙන් දියත් කෙරේ…



කර්මාන්ත හා වැවිලි කර්මාන්ත අමාත්‍ය ගරු වෛද්‍ය රමේෂ් පතිරණ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සහ ප්‍රාථමික කර්මාන්ත රාජ්‍ය අමාත්‍ය ගරු චාමර සම්පත් දසනායක මැතිතුමාගේ සහභාගීත්වයෙන් "Industry 2023" ජාතික කර්මාන්ත ප්‍රදර්ශනය සහ කර්මාන්ත විශිෂ්ටතා සම්මාන උළෙල නිල වශයෙන් එළිදැක්වීම බත්තරමුල්ල වෝටර්ස් එජ් පරිශ්‍රයේ දී සිදු විය. විදේශ දූත මණ්ඩල තානාපතිවරු, කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම් තිලකා ජයසුන්දර මහත්මිය, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම් ජානක ධර්මකීර්ති මහතා, අතිරේක ලේකම්වරුන් සහ අනෙකුත් නිලධාරීන්, ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ සභාපති වෛද්‍ය සාරංග අලහප්පෙරුම, ආයතන ප්‍රධානීන්, නිලධාරීන්, කර්මාන්ත අමාත්‍යාංශයේ කර්මාන්ත උපදේශක සභා ප්‍රධානීන්, දිවයිනේ ප්‍රමුඛ පෙළේ ව්‍යවසායකයින්, ඇතුළු සම්භාවනීය අමුත්තන් රැසක් මෙම අවස්ථාවට එක්ව සිටියහ. මෙම අවස්ථාවේදී, කර්මාන්ත හා වැවිලි අමාත්‍යවරයා විසින් රටක ආර්ථික වර්ධනය උදෙසා කර්මාන්ත ප්‍රවර්ධනයේ අවශ්‍යතාවය තවදුරටත් පැහැදිලි කරන ලදී.

### 2) ජාතික කර්මාන්ත විශිෂ්ටතා සම්මාන උළෙල - 2023




ක්ෂුද්‍ර, කුඩා, මධ්‍ය හා මහා පරිමාණ කර්මාන්ත ව්‍යවසායකයින් 300 කගේ කැපවීම සහ ගෞරවනීය දායකත්වය ඇගයීම උදෙසා කර්මාන්ත අමාත්‍යාංශය සහ කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් "2023 ජාතික කර්මාන්ත විශිෂ්ටතා සම්මාන උළෙල" සංවිධානය කරන ලදී. තවද, අපනයන නැඹුරු නිෂ්පාදන ආර්ථිකයක් උදෙසා ඔවුන් තවදුරටත් සවිබල ගැන්වීම පිණිස වේ. අතිගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ, කර්මාන්ත හා සෞඛ්‍ය අමාත්‍ය වෛද්‍ය රමේෂ් පතිරණ, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධන රාජ්‍ය අමාත්‍ය, ප්‍රසන්න රණවීර මහතා, ප්‍රාථමික කර්මාන්ත රාජ්‍ය අමාත්‍ය චාමර සම්පත් දසනායක මහතා ඇතුළු සම්භාවනීය අමුත්තන් රැසකගේ සහභාගීත්වයෙන් යුතුව එය නොවැම්බර් 01 වැනි දින කොළඹ නෙළුම් පොකුණ රඟහලේදී අති උත්කර්ෂවත් ලෙස පැවැත්වුණි.

ශ්‍රී ලංකාවේ සියලුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි ක්ෂුද්‍ර, කුඩා, මධ්‍ය සහ මහා පරිමාණ කර්මාන්ත යටතේ අයදුම් කරන ලද තරඟකාරී කර්මාන්ත 4000ක් අතරින්, ප්‍රවීණ විනිශ්චය මණ්ඩලයක් විසින් 'ජාතික කර්මාන්ත විශිෂ්ටතා සම්මාන ප්‍රදානෝත්සවයේදී ජයග්‍රාහකයින් 300ක් තෝරා ගන්නා ලදී. සැනොටා ප්‍රවර්

ලිමිටඩ් - ක්ෂුද්‍ර පරිමාණ, තොටවත්ත ඉංජිනියරින් වර්ක්ස් - කුඩා පරිමාණ, දනුෂා ගෲප් ඔෆ් කොම්පැනිස් - මධ්‍ය පරිමාණ සහ ඩීප්ඩ් ප්‍රඩක්ට්ස් පී.එල්.සී. - මහා පරිමාණ යනාදියෙහි සමස්ත කාර්ය සාධනය උදෙසා උපහාරයක් ලෙස ප්ලැටිනම් සම්මාන පිරිනැමීම අතිගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමා අතින් සිදු විය.









**3) "Industry 2023" – ජාතික කර්මාන්ත ප්‍රදර්ශනය**




අපනයන කේන්ද්‍රීය ආර්ථිකයක් ගොඩ නැගීම පිණිස දේශීය කර්මාන්ත ශක්තිමත් කිරීම සඳහා කර්මාන්ත අමාත්‍යාංශය, කාර්මික සංවර්ධන මණ්ඩලය, අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන අනෙකුත් ආයතන සහ පෞද්ගලික අංශයේ සහයෝගීත්වයෙන් යුතුව "Industry 2023" ජාතික කර්මාන්ත ප්‍රදර්ශනය සංවිධානය කරන ලදී. මෙම උත්සවය 2023 ජුනි 22 වන දින අග්‍රාමාත්‍ය ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් BMICH පරිශ්‍රයේදී ආරම්භ විය. 2023 කර්මාන්ත ප්‍රදර්ශනය අඛණ්ඩව දින හතරක් මුළුල්ලේ අති සාර්ථක ලෙස පැවැත්විණි. ශ්‍රී ලංකාවේ සමස්ත කර්මාන්ත ආවරණය වන පරිදි ක්ෂුද්‍ර, කුඩා, මධ්‍ය හා මහා පරිමාණ කර්මාන්ත සම්බන්ධ කරමින් ක්ෂේත්‍ර 21ක් නියෝජනය කරමින් ප්‍රදර්ශකයින් 700කට අධික ප්‍රමාණයක් මෙම දැවැන්ත ප්‍රදර්ශනයට ඇතුළත් විය.

මෙම ජාතික කර්මාන්ත ප්‍රදර්ශනය මගින් කර්මාන්ත දිරිගැන්වීමට, නව තාක්ෂණය හඳුන්වා දීමට, නවෝත්පාදන දිරිගැන්වීමට, දේශීය හා ජාත්‍යන්තර ව්‍යවසායකයින්, සැපයුම්කරුවන් සහ ගැනුම්කරුවන් ඒකාබද්ධ කිරීමට සහ ශ්‍රී ලංකාවේ නව කර්මාන්ත සඳහා සුවිශාල අවකාශයක් නිර්මාණය කිරීමට අවස්ථාව

උදාකර දී ඇත. එසේම, ශ්‍රී ලාංකේය වෙළඳපොළ තුළ අගය එකතු කළ නිෂ්පාදන සඳහා ඇති ඉල්ලුම ඉහළ නංවන අතරම තරුණ හා කාන්තා ව්‍යවසායකත්වය ඉහළ නැංවීමට මේ මඟින් අවස්ථාව උදාවී ඇත.

### 4) දකුණු පළාත් කර්මාන්ත ප්‍රදර්ශනය - 2023 (Industry 2023 Galle Edition)



රට තුළ අපනයන නැඹුරු නිෂ්පාදන ආර්ථිකයක් බලගැන්වීමේ අරමුණින් කර්මාන්ත අමාත්‍යාංශය සහ කාර්මික සංවර්ධන මණ්ඩලය එක්ව Industry 2023 Galle Edition දකුණු පළාත් කර්මාන්ත ප්‍රදර්ශනය සංවිධානය කර ඇත. කර්මාන්ත හා සෞඛ්‍ය අමාත්‍ය වෛද්‍ය රමේෂ් පතිරණ මහතාගේ ප්‍රධානත්වයෙන් සහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධන රාජ්‍ය අමාත්‍ය ප්‍රසන්න රණවීර මහතා ඇතුළු සම්භාවනීය අමුත්තන් රැසකගේ සහභාගීත්වයෙන් දෙසැම්බර් 28 වැනි දින ගාල්ල සමනල ක්‍රීඩාංගනයේ දී දකුණු පළාත් කර්මාන්ත ප්‍රදර්ශනය පැවැත්විණි. එය නවෝත්පාදන, නව තාක්ෂණයන් සහ විශේෂයෙන්ම දකුණු පළාතේ නව කර්මාන්ත ඇතුළත් කුටි 300 කින් සමන්විත විය.

මෙම අවස්ථාවට දකුණු පළාත් ආණ්ඩුකාර ආචාර්ය විලී ගමගේ, ගාල්ල දිස්ත්‍රික් සංවර්ධන කමිටු සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී සම්පත් අතුකෝරල, කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම් තිලකා ජයසුන්දර, දකුණු පළාත් ප්‍රධාන ලේකම් සුමිත් අලහකෝන්, ගාල්ල දිස්ත්‍රික් ලේකම් ශාන්ත වීරසිංහ, කාර්මික සංවර්ධන මණ්ඩලයේ සභාපති වෛද්‍ය සාරංග අලහප්පෙරුම, දකුණු පළාත් පාලන කොමසාරිස් රනිල් වික්‍රමසේකර, ගාල්ල දිස්ත්‍රික්කයේ හිටපු නගරාධිපති ප්‍රියන්ත සහබන්දු, කර්මාන්ත අමාත්‍යාංශයේ සියලුම අතිරේක ලේකම්වරුන් ඇතුළු සම්භාවනීය අමුත්තන් රැසක් මෙම අවස්ථාවට එක්ව සිටියහ.









## 5) උතුරු පළාත් කර්මාන්ත ප්‍රදර්ශනය - 2023 (Industry 2023 Jaffna Edition)



රට තුළ අපනයන නැඹුරු නිෂ්පාදන ආර්ථිකයක් බලගැන්වීමේ අරමුණින් කර්මාන්ත අමාත්‍යාංශය සහ කාර්මික සංවර්ධන මණ්ඩලය එක්ව Industry 2023 Jaffna Edition උතුරු පළාත් කර්මාන්ත ප්‍රදර්ශනය සංවිධානය කර ඇත. කර්මාන්ත හා සෞඛ්‍ය අමාත්‍ය වෛද්‍ය රමේෂ් පතිරණ මහතාගේ ප්‍රධානත්වයෙන් සහ ධීවර අමාත්‍ය ඩග්ලස් දේවානන්ද මහතාගේ සහභාගීත්වයෙන් යුතුව යාපනය සංස්කෘතික මධ්‍යස්ථාන පරිශ්‍රයේ දී මෙය ආරම්භ කෙරිණි.

උතුරු පළාතට අනන්‍ය වූ කර්මාන්ත ක්ෂේත්‍ර 20ක් යටතේ ප්‍රදර්ශන කුටි 300කට වැඩි ප්‍රමාණයක් ආවරණය වන පරිදි නවෝත්පාදන, නව තාක්ෂණයන්ගෙන් මෙම ප්‍රදර්ශනය සමන්විත විය. කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධන රාජ්‍ය අමාත්‍ය ප්‍රසන්න රණවීර, කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම් තිලකා ජයසුන්දර, කාර්මික සංවර්ධන මණ්ඩලයේ සභාපති වෛද්‍ය සාරංග අලහප්පෙරුම, යාපනය නියෝජ්‍ය කොන්සල් ජනරාල් රාම් මහේෂ්, උතුරු පළාත් ප්‍රධාන ලේකම් එස්.එම් සමන් බන්දුලසේන, දිස්ත්‍රික් ලේකම් අම්බලවානර් සිවබාලසුන්දරන්, Korian Spa Packaging පුද්ගලික සමාගමේ ප්‍රධාන විධායක නිලධාරී නලින් ඇන්තනි, Diana Recycling Manufacturing & Play Equipment හි ටී.තවරාසා යන මහත්වරු ඇතුළු සම්භාවනීය අමුත්තන් රැසක් මෙම අවස්ථාවට සහභාගී වූහ.





## 6) නුවර කර්මාන්ත ප්‍රදර්ශනය - 2023 (Industry 2023 Kandy Edition)




මධ්‍යම පළාත් ආණ්ඩුකාර කාර්යාලය, මධ්‍යම පළාත් කර්මාන්ත අමාත්‍යාංශය ඇතුළු අනෙකුත් රාජ්‍ය සහ පෞද්ගලික ආයතනවල සහයෝගීතාවයෙන් කර්මාන්ත අමාත්‍යාංශය සහ කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් නුවර කර්මාන්ත ප්‍රදර්ශනය සංවිධානය කරන ලදී. මධ්‍යම පළාත් ආණ්ඩුකාර ලලිත් යූ. ගමගේ, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධන රාජ්‍ය අමාත්‍ය ප්‍රසන්න රණවීර ඇතුළු සම්භාවනීයන්ගේ සහභාගීත්වයෙන් මහනුවර පැරණි බෝගම්බර බන්ධනාගාර පරිශ්‍රයේදී එය පැවැත්විණි.

මධ්‍යම පළාතට අනන්‍ය වූ කර්මාන්ත ක්ෂේත්‍ර 20ක් යටතේ ප්‍රදර්ශන කුටි 300කට අධික ප්‍රමාණයක් ආවරණය වන පරිදි නවෝත්පාදන, නව තාක්ෂණයන්ගෙන් මෙම කර්මාන්ත ප්‍රදර්ශනය සමන්විත විය.

මෙම අවස්ථාවට කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම් තිලකා ජයසුන්දර, කර්මාන්ත අමාත්‍යාංශයේ අතිරේක ලේකම් චමින්ද පතිරාජ, ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ සභාපති වෛද්‍ය සාරංග අලහප්පෙරුම, මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම් ජී.එච්.එම්.ඒ. ප්‍රේමසිංහ, මධ්‍යම පළාත් ආණ්ඩුකාර ලේකම් එම්.ඩබ්ලිව්.එම්.එම්. මඩහපොල, මධ්‍යම පළාත් කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම් කේ.ජී. උපාලි රණවක, කර්මාන්තකරුවන්, ව්‍යවසායකයින් ඇතුළු සම්භාවනීයයන් විශාල පිරිසක් එක්ව සිටියහ.

## 7) රණවිරු පවුල් වල ආර්ථිකය නගා සිටුවීම



රණවිරු පවුල්වල ආර්ථිකය නගා සිටුවීම සහ රටේ ආර්ථිකයට තිරසාර දායකත්වයක් ලබාදීම සඳහා ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය, රණවිරු සේවා අධිකාරිය සහ බාටා ආයතනය එක්ව වැඩසටහනක් දියත් කර ඇත. ඒ අනුව ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය මගින් පාවහන් නිෂ්පාදනය පිළිබඳ පුහුණුවක් ලබා දී ඔවුන් හට බාටා ආයතනය මගින් උප කොන්ත්‍රාත් ක්‍රමයට පාවහන් කොටස් නිෂ්පාදනය කිරීම සඳහා මෙම වැඩසටහන සැලසුම් කර ඇත.

**8) 'පාසල් කර්මාන්ත ව්‍යවසායකත්ව කව' වැඩසටහන**




පාසල් මට්ටමින් ව්‍යවසායකත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය සහ කර්මාන්ත අමාත්‍යාංශය විසින් කා.සං.ම. සමඟ සම්බන්ධීකරණයෙන් මෙම වැඩසටහන ආරම්භ කරන ලදී. අභියෝගවලට මුහුණ දිය හැකි තමන්ගේ කුසලතා මත විශ්වාසය තබා කටයුතු කරනු ලබන පුද්ගලයකු ගොඩනැගීම සඳහා ව්‍යවසායක සංස්කෘතියක් ගොඩනැගීම මෙහි මූලික අරමුණ වේ. මේ වනවිට පාසල් ව්‍යවසායකත්ව කව 350කට අධික ප්‍රමාණයක් ආරම්භ කර ඇති අතර 2024 වසරේදී එය 5000 දක්වා ඉහළ නැංවීම ඉලක්කයයි.

**9) ජාතික ආහාර පාන සමුළුව - 2023**




ආහාර පාන ආශ්‍රිත ලෝක වෙළෙඳපොළ සඳහා සාර්ථකව පිවිසීමට අවශ්‍ය කරන මගපෙන්වීම මෙරට ආහාර පාන නිෂ්පාදන අංශයට ලබාදීමේ අරමුණින් කර්මාන්ත අමාත්‍යාංශය, කාර්මික සංවර්ධන මණ්ඩලය (IDB) හා එක්සත් ජාතීන්ගේ කාර්මික සංවර්ධන සංවිධානය (UNIDO) විසින් සංවිධානය කල ජාතික ආහාර පාන සමුළුව (National Food & Beverage Conference - 2023) කර්මාන්ත හා සෞඛ්‍ය අමාත්‍ය වෛද්‍ය රමේෂ් පතිරණ මහතාගේ ප්‍රදානත්වයෙන් කොළඹ මරිනෝ බීච් හෝටලයේදී පැවැත්විණ.

මෙහිදී, Finagle Lanka (Pvt) Ltd හි ප්‍රධාන විධායක නිළධාරි කුෂාන් අමරසිංහ මහතා, Ceylon Plant Food (Pvt) Ltd හි සභාපති අනීෂ් ජුනයිඩ් මහතා සහ Nelna Agri Development (Pvt) Ltd හි අධ්‍යක්ෂ පූනාශා නානායක්කාර මහත්මිය මුඛ්‍ය දේශනයන් සඳහා එක්වූහ. මුඛ්‍ය දේශනයන් අවසානයේ ආහාර පාන නිෂ්පාදන ක්ෂේත්‍රය හා සම්බන්ධවන රාජ්‍ය නිළධාරින් සමග ශ්‍රී ලංකාවේ ආහාර පාන කර්මාන්තයේ අනාගතය පිලිබඳව සාකච්ඡා කල අතර ලෝකයේ පවතින අවශ්‍යතාවයන් හඳුනා ගනිමින් මෙම අංශයේ අපනයනයන් වැඩි දියුණු කිරීම පිළිබඳවත් ශ්‍රී ලංකාවේ එළවලු හා පලතුරු අපනයන හැකියාව පිළිබඳවත් මෙහිදී දීර්ඝ ලෙස කතිකා කෙරිණි.

මෙම සම්මන්ත්‍රණය සඳහා කර්මාන්ත අමාත්‍යාංශයේ අතිරේක ලේකම් රන්ජිත් විමලසූරිය, කාර්මික සංවර්ධන මණ්ඩලයේ සභාපති වෛද්‍ය සාරංග අලහප්පෙරුම, රාජ්‍ය නිලධාරීන් , UNIDO හි ප්‍රධානීන්, Sri Lanka Food Processors Association හි සභාපති තුසිත් විජේසිංහ, පුද්ගලික අංශයේ නිලධාරීන්, ආහාර පාන කර්මාන්ත ආශ්‍රිත ව්‍යවසායකයින්, කර්මාන්තකරුවන්, ආයෝජකයන් ඇතුළු විශාල පිරිසක් එක්වූහ.

**10) අපනයන නැඹුරු ආර්ථිකයක් කරා - ලෝක ආහාර ප්‍රදර්ශනය, මොස්කව් 2023 (World Food Moscow 2023**

ගරු කර්මාන්ත අමාත්‍යතුමාගේ සහ කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ මගපෙන්වීම යටතේ කාර්මික සංවර්ධන මණ්ඩලය "World Food Moscow 2023" සඳහා සහභාගී විය. රුසියාවේ මොස්කව් හි ක්‍රොකස් එක්ස්පෝ හිදී මෙම ප්‍රදර්ශනය පැවැත්විණි. විශේෂයෙන්ම රුසියාවේ සහ ඒ අවට රටවල විවිධ විදේශීය ගැනුම්කරුවන් සම්බන්ධ කර ගැනීමටත් විදේශ වෙළෙඳපොළේ පවතින නව ප්‍රවණතා ගවේෂණය කිරීමටත් ශ්‍රී ලංකාවේ අපනයනකරුවන්ට මෙම ප්‍රදර්ශනය කදිම වේදිකාවක් සපයා දී ඇත.




World Food Moscow යනු ආහාර කර්මාන්තයේ වෘත්තිකයන් සහ ප්‍රවීණයන්, ආහාර නිෂ්පාදකයින් සහ සැපයුම්කරුවන්, තොග සහ සිල්ලර වෙළඳාමේ ගැනුම්කරුවන් මෙන්ම පොදු ආහාර සැපයුම් ව්‍යවසායන් එක් කරන කර්මාන්ත වේදිකාවකි. මෙම අවස්ථාව සඳහා රුසියානු සමූහාණ්ඩුවේ ශ්‍රී ලංකා තානාපතිනිය, මහාචාර්ය ජනිතා ඒ. ලියනගේ මහත්මිය සහ අධ්‍යාපන හා ආර්ථික කටයුතු අමාත්‍ය චමිල ජයරත්න මහතා සහභාගී විය.



### 11) 20 වැනි චීන-ආසියාන් ප්‍රදර්ශනය (20th China-ASEAN Expo)




“20th China – ASEAN Expo 2023” චීනයේ Nanning International Convention & Exhibition Center (NICEC) හිදී පැවැත්විණි. ප්‍රධාන අංශ වූයේ ආහාර පාන, කෘෂි නිෂ්පාදන, ජාත්‍යන්තර වෙළඳාම සඳහා භාණ්ඩ, පාරිභෝගික භාණ්ඩ, සේවා නිෂ්පාදන යනාදියයි. මහජන චීන සමූහාණ්ඩුවේ Guangzhou හි ශ්‍රී ලංකා කොන්සල් ජනරාල් කාර්යාලයේ සහ කාර්මික සංවර්ධන මණ්ඩලයේ සහාය ඇතිව ශ්‍රී ලාංකික සමාගම් මෙම ප්‍රදර්ශනය සඳහා සහභාගී විය.

### 12) වියට්නාමයේ හැනෝයි හි සිත් ඇදගත් ශ්‍රී ලාංකික SME නිෂ්පාදන ප්‍රදර්ශනය




වියට්නාමයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය, කාර්මික සංවර්ධන මණ්ඩලය (IDB) සමඟ සහයෝගීත්වයෙන් ශ්‍රී ලංකාවේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ගේ නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම සඳහා *“Sri Lankan Fair”* සංවිධානය කරන ලදී. දෙදිනක් පුරා පැවති මෙම ශ්‍රී ලාංකික නිෂ්පාදන ප්‍රදර්ශනයට වියට්නාම ජාතිකයින්, හැනෝයි හි වෙසෙන වෙනත් විදේශිකයින්, ජ්‍යෙෂ්ඨ රජයේ සහ ආයතනයන් හි පුද්ගලයන්, සහ හැනෝයි හි අනිගරු තානාපතිවරුන් ඇතුළු රාජ්‍ය තාන්ත්‍රික නිලධරයන් ඇතුළු විශාල පිරිසක් සහභාගී වූහ.

ශ්‍රී ලාංකික නිෂ්පාදන ප්‍රදර්ශනය ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ දී පැවැත්විණි. එහිදී ප්‍රදර්ශනය කරන ලද නිෂ්පාදනයන් වූයේ ලී සහ විසිතුරු භාණ්ඩ, සාම්ප්‍රදායික ශ්‍රී ලාංකික වෙස් මුහුණු සහ සිතුවම්, බතික් සහ අතින් සකසන ලද ඇඳුම්, විසිතුරු භාණ්ඩ, අතින් සකසන ලද රිදී ආභරණ සහ මැණික් ගල්, මෘදු සෙල්ලම් බඩු, විශිෂ්ඨ ලී කැටයම්, ඔසු තේ හා කුළුබඩු සහ පිත්තල භාණ්ඩ ආදිය විය. හැනෝයි හි පිහිටි ඩිල්මා ආයතනය විසින් එම පරිශ්‍රයේම සකස් කරන ලද ශ්‍රී ලාංකීය සාම්ප්‍රදායික ආහාර පිළිගැන්වීම සහ අලෙවි කිරීම මෙන්ම සම්ප්‍රදායික ශ්‍රී ලංකා තේ පිළිගැන්වීම මගින් මෙම දෙදින උත්සවය වඩාත් සාර්ථක විය.

ශ්‍රී ලාංකික නිෂ්පාදන ප්‍රදර්ශනය සුබ මොහොතින් ආරම්භ කරමින් හැනෝයි හි ශ්‍රී ලංකා තානාපති මහාචාර්ය ඒ. සාජ් යූ. මෙන්ඩිස් මහතා සිය අදහස් පළ කරමින් පැවසුයේ සංවර්ධිත, සංවර්ධනය වෙමින් පවතින හෝ අවම වශයෙන් සංවර්ධිත යනාදී ඕනෑම ආර්ථිකයක කොඳු නාරටිය ලෙස කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් බොහෝ විට විස්තර කෙරෙන බවත් සැලකෙන බවත් ය. වාණිජ දෙපාර්තමේන්තුවේ වාණිජ අමාත්‍යතුමන් විසින් ද විවෘත කිරීමේ උත්සවය අමතනු ලැබිය.
හැනෝයි වෙත පැමිණි ශ්‍රී ලාංකික කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් 15 කට අධික පිරිසකට දිගුකාලීන ව්‍යාපාරික සහ වාණිජ සබඳතා ඇති කර ගැනීමටත්, එමගින් ශ්‍රී ලාංකික නිෂ්පාදන වියට්නාමයට අපනයනය කිරීමටත් හැකි වනු පිණිසත්, Bat Trang කුඹල් ගම්මානය, දැව ශිල්ප ගම්මානය සහ වියට්නාම මැණික් ගල් සංගමය නැරඹීම සඳහා කටයුතු යොදන ලදී. තවද, තානාපති කාර්යාලය විසින් ශ්‍රී ලාංකික ව්‍යවසායකයින් සඳහා ඔවුන්ගේ වාණිජ ආයතන ප්‍රවර්ධනය කිරීම සඳහා B2B රැස්වීම් සංවිධානය කරන ලදී.
වියට්නාම ජාතිකයන් සහ හැනෝයි හි සිටින අනෙකුත් විදේශීය ජාතිකයන් අතර මෙරට ප්‍රතිරූපය වැඩිදියුණු කිරීමට මෙම වාණිජ මුලපිරීම හේතු විය.

### 13) Food Africa 2023 ප්‍රදර්ශනය




කාර්මික සංවර්ධන මණ්ඩලය 2023 දෙසැම්බර් මස 10 සිට 12 දක්වා ඊජිප්තුවේ කයිරෝ හි පැවති **Food Africa 2023** සඳහා සහභාගී විය. අවට රටවලින් පැමිණි විවිධ විදේශීය අමුත්තන්ගෙන් සමන්විත වූ විශිෂ්ට වේදිකාවක් සපයා තිබූ මෙම ප්‍රදර්ශනය, විදේශ වෙළෙඳපොළේ පවතින නව ප්‍රවණතා ගවේෂණය කිරීමට මහඟු අවස්ථාවක් විය. **Food Africa යනු ආහාර සහ ඇසුරුම් කර්මාන්තයේ වෘත්තිකයන් සහ ප්‍රවීණයන් එක් කරන කර්මාන්ත වේදිකාවකි**. රටක් වශයෙන්, මෙම ප්‍රදර්ශනයේදී පොල් ආශ්‍රිත නිෂ්පාදන, කුළුබඩු, ශාකසාර නිෂ්පාදන වැනි ආහාර පාන නිෂ්පාදන ප්‍රදර්ශනය කරන ලදී. මෙම අවස්ථාවට ඊජිප්තුවේ ශ්‍රී ලංකා තානාපති, අතිගරු එම්.කේ. පද්මනාදන් මහතා සහ දෙවන ලේකම් - වාණිජ, කසුන් බාලසූරිය මහතා ද සහභාගී විය.

### 14) දේශීය සුහුරු විදුලි රෝද පුටු නිෂ්පාදනය වැඩිදියුණු කිරීම සහ ව්‍යවසායකයින්ට සහාය වීම සඳහා IDB විසින් "Moving on Wheels" අවබෝධතා ගිවිසුම අත්සන් කිරීම.



සෞඛ්‍ය සත්කාර ක්ෂේත්‍රයේ තවත් ව්‍යවසායකයෙකු සමඟ සාර්ථක ගමනක ආරම්භය සනිටුහන් කරමින් විදුලි රෝද පුටු සහ උපාංග දේශීය නිෂ්පාදනය දිරිගැන්වීම සඳහා කාර්මික සංවර්ධන මණ්ඩලය අවබෝධතා ගිවිසුමකට අත්සන් තැබිය. විදුලි රෝද පුටු සහ උපාංග දේශීයව නිෂ්පාදනය කිරීම, නවතම මාදිලි එකලස් කිරීම සහ ජාත්‍යන්තරව අලෙවි කිරීම සඳහා ශ්‍රී ලංකාවේ ප්‍රථම සහ එකම විදුලි රෝද පුටු නිර්මාණකරු සහ නිෂ්පාදකයා වන "Moving on Wheels" සහ කාර්මික

සංවර්ධන මණ්ඩලය අතර දේශීයව අවශ්‍ය ප්‍රමිතිකරණය වර්ධනය කිරීම අරමුණු කරගත් නවත් දැවැන්ත වැඩසටහනක ආරම්භය මෙහිදී සනිටුහන් කෙරිණි. මෙහිදී, තත්ත්ව පාලනය සහ ප්‍රමිතීන්, අවශ්‍ය පරීක්ෂණ, දේශීය සැපයුම් දාමයක් නිර්මාණය කිරීම සහ තෙවන පාර්ශවීය තත්ත්ව සහතික මත පවත්වා ගැනීම සඳහා නුවමාරු තාක්ෂනය ප්‍රචලිත කිරීම සහ නඟා සිටුවීම සිදු කෙරේ.
"Moving on Wheels" ආයතනයේ නිර්මාතෘ තරංග වගසෙනවි මහතා එම ආයතනය නියෝජනය කළ අතර වෛද්‍ය සාරංග අලහප්පෙරුම, සභාපතිතුමන් කාර්මික සංවර්ධන මණ්ඩලය නියෝජනය කරන ලදී.

## 15) ඉලක්කගත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සැපයුම් දාම කළමනාකරණය අත්‍යවශ්‍ය වේ.

කර්මාන්ත අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන කාර්මික සංවර්ධන මණ්ඩලය (IDB) සැපයුම් හා ද්‍රව්‍ය කළමනාකරණ ආයතනය (ISMM) සමඟ කර්මාන්ත ක්ෂේත්‍රය තවදුරටත් ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් කාර්මික අංශයේ සැපයුම් සහ ද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අවබෝධතා ගිවිසුමකට එළඹ ඇත. එය කර්මාන්ත හා සෞඛ්‍ය අමාත්‍ය වෛද්‍ය රමේෂ් පතිරණ මහතාගේ ප්‍රධානත්වයෙන් කර්මාන්ත අමාත්‍යාංශයේදී පැවැත්විණි.



කාර්මික සංවර්ධන මණ්ඩලයේ සභාපති වෛද්‍ය සාරංග අලහප්පෙරුම මහතා සහ ISMM හි සභාපති ජයන්ත ගාල්ලෙහේවා මහතා විසින් අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුම මගින් කර්මාන්ත අංශයට අදාළ සැපයුම් දාමය කළමනාකරණය කිරීම සඳහා මූලික ප්‍රතිපත්ති රාමුවක් සකස් කිරීමට සැලසුම් කර ඇත. එසේම, මෙම අවබෝධතා ගිවිසුම ක්‍රියාත්මක කිරීම තුළින් කර්මාන්තශාලාවල සැපයුම් දාම ක්‍රියාවලිය කාර්යක්ෂම සහ ශක්තිමත් කිරීමට හැකි වනු ඇත.

වසර 50ක දීර්ඝ ඉතිහාසයක් ඇති, සැපයුම් සහ ද්‍රව්‍ය කළමනාකරණ ක්ෂේත්‍රයේ වෘත්තිකයන් බිහි කරන ප්‍රමුඛතම ආයතනය ISMM වන අතර, කර්මාන්ත සඳහා පහසුකම් සපයන ප්‍රමුඛ රාජ්‍ය ආයතනය සමඟ එක්ව, පුද්ගලික අංශයේ සහ රාජ්‍ය අංශයේ කර්මාන්ත සඳහා දාම කළමනාකරණය හා සැපයුම් පිළිබඳ වැඩසටහන් රැසක් පැවැත්වීමට කාර්මික සංවර්ධන මණ්ඩලය බලාපොරොත්තු වේ.

## 16) Industry Sri Lanka රූපවාහිනී වැඩසටහන සඳහා අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීම

කර්මාන්ත අමාත්‍යාංශය යටතේ පවතින කාර්මික සංවර්ධන මණ්ඩලය සහ ජාතික රූපවාහිනිය අතර "Industry Sri Lanka" රූපවාහිනී වැඩසටහන ආරම්භ කිරීම සඳහා අවබෝධතා ගිවිසුම අත්සන් කිරීම ප්‍රවාහන, මහාමාර්ග හා ජනමාධ්‍ය අමාත්‍ය ආචාර්ය බන්දුල ගුණවර්ධන මහතා, ජාතික රූපවාහිනියේ සභාපති ආචාර්ය ප්‍රසාද් සමරසිංහ සහ කාර්මික සංවර්ධන මණ්ඩලයේ සභාපති වෛද්‍ය සාරංග අලහප්පෙරුම යන මහත්වරුන්ගේ ප්‍රධානත්වයෙන් සිදු විය. දේශීය යාන්ත්‍රණයක් මුල්කොට ගත් දේශීය කර්මාන්තකරුවා නව තාක්ෂණය හා යාවත්කාලීන කරමින් අපනයන කේන්ද්‍රීය නිෂ්පාදන ආර්ථිකයක් කරා



ප්‍රවර්ධනය කිරීමේ වර්තමාන රජයේ අපේක්ෂාව පෙරදැරිව මෙය ක්‍රියාත්මක කර ඇත. මෙම වැඩසටහන සඳහා මූල්‍ය අනුග්‍රාහකයන් ලෙස සණස රක්ෂණ සමාගම සහ කොමර්ෂල් බැංකුව සමඟ ද ගිවිසුම් ඇති කර ගන්නා ලදී. ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම් අනුෂ පැල්පිට, කර්මාන්ත අමාත්‍යාංශයේ අතිරේක ලේකම් චමින්ද පතිරාජ, ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලයේ සභාපති අධිනීතිඥ සුදර්ශන ගුණවර්ධන, කාර්මික සංවර්ධන මණ්ඩලයේ සහ ජාතික රූපවාහිනියේ නිලධාරීහු ඇතුළු සම්භාවනීය අමුත්තන් රැසක් මෙම අවස්ථාවට සහභාගී වූහ.

## 17) "Industry" ණය සඳහා අවබෝධතා ගිවිසුම අත්සන් කිරීම

කාර්මික සංවර්ධන මණ්ඩලය (IDB) විසින් කර්මාන්ත සංවර්ධන අරමුදලෙන් ණය ලබාදීමට නිල බැංකුව ලෙසින් තෝරා ගැනුණු ප්‍රාදේශීය සංවර්ධන බැංකුව (RDB) සමග ඊට අදාළ අවබෝධතා ගිවිසුමට එළඹීම කාර්මික සංවර්ධන මණ්ඩලයේ සභාපති වෛද්‍ය සාරංග අලහප්පෙරුම මහතාගේ සහ ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ සභාපති සුසන්ත සිල්වා මහතාගේ ප්‍රධානත්වයෙන් සිදුකෙරිණි.



1969 අංක 36 දරන කාර්මික සංවර්ධන පනත මගින් බලාත්මක කරන ලද කර්මාන්ත සංවර්ධන අරමුදල, කර්මාන්ත හා සෞඛ්‍ය අමාත්‍ය වෛද්‍ය රමේෂ් පතිරණ මහතා විසින් රුපියල් මිලියන 10 ක ආරම්භක ශේෂයක් සහිතව BMICH හි ජාතික කර්මාන්ත සතියේදී නිල වශයෙන් ආරම්භ කරන ලදී.

දිවයින පුරා පිහිටි කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා Industry ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා නිල බැංකු හවුල්කරු ලෙස ප්‍රාදේශීය සංවර්ධන බැංකුව සමඟ අවබෝධතා ගිවිසුම අත්සන් කරන ලදී.

අවම ලියකියවිලි යටතේ ඉතා කෙටි කාලයකින්, 6% වාර්ෂික සහන පොලී අනුපාතිකයක් යටතේ 'Industry' ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක වන අතර පළමු අදියරේ දී දිවයින පුරා සියළුම දිස්ත්‍රික්ක නියෝජනය වන පරිදි තෝරාගත් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ගේ 25 දෙනෙකු වෙත එක් අයෙකුට ලක්ෂ 5 බැගින් වූ උපරිමයකට යටත්ව ලබාදීමට සැලසුම් කොට තිබේ.

මෙම අවස්ථාවට ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ ව්‍යවසායකත්ව සංවර්ධන අංශයේ අධ්‍යක්ෂ රේණුකා ජයලත් මහත්මිය ප්‍රමුඛ කා.සං.ම. නිලධාරීන්, ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ සාමාන්‍යාධිකාරී පාලිත සුමේධ මහතා ප්‍රමුඛ RDB නිලධාරීන් එක්වූහ.

## 18) ණය යෝජනා ක්‍රමය සඳහා කර්මාන්තකරුවන් 25 දෙනෙකු තෝරා ගැනේ.




කර්මාන්ත අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන කාර්මික සංවර්ධන මණ්ඩලය ප්‍රාදේශීය සංවර්ධන බැංකුව සමඟ එක්ව ශ්‍රී ලංකාවේ ව්‍යවසායන් දියුණු කිරීම වෙනුවෙන් ණය ලබා දීම සඳහා හඳුන්වා දුන් "කර්මාන්ත සංවර්ධන අරමුදල" ආරම්භ කරන ලදී. මෙම අරමුදල යටතේ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් සඳහා ණය ලබා දෙනු ඇත. ආරම්භක අදියරේ දී කර්මාන්තකරුවන් 25 දෙනෙකුට එක් පුද්ගලයෙකුට රුපියල් ලක්ෂ 5 ක උපරිමයකට යටත්ව

ණය ලබා දෙන ලදී. 6% ක වාර්ශික පොලී අනුපාතයක් මත වසර 3 ක ගෙවීමේ කාල සීමාවකට යටත්ව ලංකාවේ සෑම දිස්ත්‍රික්කයක්ම නියෝජනය වන පරිදි තෝරාගත් ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් 25 දෙනෙක් වෙනුවෙන් රුපියල් මිලියන 6.5 ක මුදලක් පළමු අදියරේ දී ප්‍රදානය කර ඇත. මේ වන විට රුපියල් මිලියන 15 දක්වා වර්ධනය වී ඇති කර්මාන්ත සංවර්ධන අරමුදල ලබන වසර වන විට රුපියල් බිලියනයක් දක්වා ඉහළ නැංවීමට අපේක්ෂා කෙරේ.

මෙම අවස්ථාවට කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම් තිලකා ජයසුන්දර මහත්මිය, කර්මාන්ත සංවර්ධන මණ්ඩලයේ සභාපති වෛද්‍ය සාරංග අලහප්පෙරුම, ව්‍යවසායකත්ව සංවර්ධන මණ්ඩලයේ අධ්‍යක්ෂ රේණුකා ජයලත් මහත්මිය, කාර්මික සංවර්ධන මණ්ඩලයේ නිලධාරීන්, ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ නිලධාරීන්, ව්‍යවසායකයින් ඇතුළු පිරිසක් සහභාගී වූහ.

# ප්‍රගති සාරාංශය

- භෞතික ප්‍රගතිය
- මූල්‍ය ප්‍රගතිය
- නිෂ්පාදන කර්මාන්ත ප්‍රවර්ධනය සඳහා ක්‍රියාත්මක විශේෂ වැඩසටහන්
- අභියෝග
- අනාගත ඉලක්ක
- කාර්ය සාධන දර්ශක

## භෞතික ප්‍රගතිය

- 2023 වර්ෂය තුළ නව කර්මාන්ත 204ක් ඇති කිරීමට සහාය විය.
- වර්ෂය තුළ මෙරට පවතින කර්මාන්ත 465ක් සංවර්ධනය කිරීමට සහාය විය.
- වර්ෂය තුළ ක්ෂුද්‍ර කර්මාන්ත 793 ක් සංවර්ධනය කරන ලදී.
- වසර තුළ අපනයනය සඳහා සූදානම් කර්මාන්ත 31ක් සංවර්ධනය කරන ලදී.
- වර්ෂය තුළ තාක්ෂණ පුහුණු වැඩසටහන් 1162ක් පවත්වන ලදී.
- ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් 397 ක් පවත්වන ලදී.
- කර්මාන්තකරුවන් 736ක් සඳහා ඉංජිනේරු සේවා සපයන ලදී.

## මූල්‍ය ප්‍රගතිය

- 2023 වර්ෂය සඳහා පුනරාවර්තන සහ අනෙකුත් පුනරාවර්තන වියදම්වල මුළු ප්‍රතිපාදන පිළිවෙලින් රු. මිලියන 517 ක් සහ රු. මිලියන 94 කි. එම මුළු ප්‍රතිපාදන වලින්, පුනරාවර්තන වියදම්වලින් 60% ක් සහ අනෙකුත් පුනරාවර්තන වියදම්වලින් 80% ක් වසර තුළ වැය කර ඇත.

- සංවර්ධන කටයුතු සඳහා වර්ෂයේ ප්‍රතිපාදන රු. මිලියන 40 ක් වන අතර 90% කට ආසන්න මුදලක් වැය කර ඇත.

- වර්ෂය සඳහා ප්‍රාග්ධන වත්කම් මිලදී ගැනීම සඳහා රු. මිලියන 60 ක මුදලක් වෙන් කර ඇති අතර, එයින් 65% ක් ප්‍රාග්ධන අයවැය හරහා වියදම් කර ඇත.

- දැනට ක්‍රියාත්මක ව්‍යාපෘති සඳහා මුළු ප්‍රතිපාදන රු. මිලියන 100 ක් වූ අතර ව්‍යාපෘති සඳහා 30% ක් වැය කර ඇත.

## නිෂ්පාදන කර්මාන්ත ප්‍රවර්ධනය සඳහා ක්‍රියාත්මක විශේෂ වැඩසටහන්

- දේශීය කර්මාන්ත ජාත්‍යන්තර වෙළෙඳපොළට නඟා සිටුවීමේ අරමුණින් කා.සං.ම. විසින් BMICH හි ජාතික කර්මාන්ත ප්‍රදර්ශනය සහ ඊට සමගාමීව "Industry 2023" නමින් යාපනය දිස්ත්‍රික්කයේ, මහනුවර දිස්ත්‍රික්කයේ සහ ගාල්ල දිස්ත්‍රික්කයේ කර්මාන්ත ප්‍රදර්ශන සංවිධානය කරන ලදී.

- ජූනි 22 ජාතික කර්මාන්ත දිනය ලෙස ප්‍රකාශයට පත් කිරීම සහ ජාතික කර්මාන්ත ප්‍රදර්ශනයට සමගාමීව ජාතික කර්මාන්ත සතියක් නම් කිරීම.

- පාසල්වල පාසල් කර්මාන්ත ව්‍යවසායකත්ව කව පිහිටුවීම සහ ඉදිරියේදී විශ්වවිද්‍යාල සහ අනෙකුත් උසස් අධ්‍යාපන ආයතන ආවරණය වන පරිදි මෙම ව්‍යාපෘතිය පුළුල් කිරීම.

- විවිධ කර්මාන්ත ක්ෂේත්‍රවලට ලෝක වෙළඳපොළට සාර්ථකව ප්‍රවේශ වීමට අවශ්‍ය මඟ පෙන්වීම ලබා දීම සඳහා 2023 වර්ෂයේදී ජාතික ආහාර පාන සමුළුව සහ ජාතික රබර් සහ ප්ලාස්ටික් සමුළුව පැවැත්වීම.

- අපනයන නැඹුරු ආර්ථිකයක් නිර්මාණය කිරීම සඳහා "මොස්කව්හි ලෝක ආහාර ප්‍රදර්ශනය, 20 වැනි චීන-ආසියාන් ප්‍රදර්ශනය සහ වියට්නාමයේ හැනෝයි හි ශ්‍රී ලංකා SME නිෂ්පාදන සංගමයේ ප්‍රදර්ශනය" වැනි ජාත්‍යන්තර ප්‍රදර්ශන සඳහා දේශීය කර්මාන්තකරුවන් සම්බන්ධීකරණය කිරීම.

- ක්ෂුද්‍ර, කුඩා, මධ්‍ය හා මහා පරිමාණ කර්මාන්ත 300 කගේ කැපවීම සහ දායකත්වය අගයමින් සහ ඒවායේ අපනයන නවදුරටත් සවිබල ගැන්වීම සඳහා කර්මාන්ත අමාත්‍යාංශය සහ ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය එක්ව "ජාතික කර්මාන්ත විශිෂ්ටතා සම්මාන 2023" පැවැත්වීම.

- ශ්‍රී ලාංකේය කර්මාන්ත සංවර්ධනය සඳහා දියත් කරන ලද පළමු රූපවාහිනී නාලිකාව ලෙස "Industry TV" Peo TV නාලිකා අංක 130 ඔස්සේ හඳුන්වාදීම.

- කර්මාන්ත අංශයට අදාළ වත්මන් පුවත් සහ සිදුවීම් යාවත්කාලීන කරමින් කර්මාන්ත සඳහා කැප වූ "Industry Ceylon" හඳුන්වා දීම.

- දේශීය ව්‍යවසායකයින්ට ගෝලීය වෙළඳපොළට ළඟා වීමට ඇති බාධක හඳුනා ගැනීම සහ විදේශ ආර්ථිකයන් සමඟ නව ආර්ථික හවුල්කාරිත්වයන් ඇති කර ගැනීම සහ විශාල විභවයක් ඇති විදේශ රටවල විදේශ තානාපති කාර්යාල හරහා සබඳතා ගොඩනඟා ගැනීමට අවකාශය සලසා දීම (Connect Sri Lanka).

- ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය කාර්මික සංවර්ධන පනතට අනුව කාර්මික සංවර්ධන අරමුදල ස්ථාපිත කර ඇති අතර එමඟින් කුඩා පරිමාණ කර්මාන්තකරුවන්ට ඔවුන්ගේ කර්මාන්ත සංවර්ධන හා සංවර්ධන අවශ්‍යතා සඳහා රු. ලක්ෂ 5 ක සීමාවකට යටත්ව ණය ලබා දීම.

## අභියෝග

- කාර්මික සංවර්ධන පනත බලාත්මක කිරීම - 1969 අංක 36 දරන කාර්මික සංවර්ධන පනත යළි බලාත්මක කිරීම හරහා කාර්මික දිරිගැන්වීම, ප්‍රවර්ධනය සහ සංවර්ධනය සඳහා මූලික පදනම සහ පසුබිම් සහාය සැපයිය යුතුය.

- කර්මාන්තපුර පිහිටුවීම සඳහා ඉඩම් අත්පත් කර ගැනීමේ ගැටලු - ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල ඉඩම් වැඩි ප්‍රමාණයක අයිතිය පිළිබඳ දත්ත නොමැතිකම සහ අයිතිකරුවන්ට වන්දි ගෙවීමේ ක්‍රමවල අඩුපාඩු.

- ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය පිහිටි ඉඩමේ අයිතිය මණ්ඩලයට පැවරීම - අංක 615, ගාලු පාර, කටුබැද්ද, මොරටුව යන ස්ථානයේ පිහිටි ඉඩම 1970 සිට වසර 50කට වැඩි කාලයක් මණ්ඩලය විසින් පරිහරණය කර ඇත. නමුත්, මෙම ඉඩම නීත්‍යානුකූලව කාර්මික සංවර්ධන මණ්ඩලයට පවරා දී ඇති බවට කිසිදු ලිඛිත සාක්ෂියක් මණ්ඩලය සතුව නොමැත.

## අනාගත ඉලක්ක

- 2030 වන විට "ව්‍යාපාර කිරීමේ පහසුව" දර්ශකයේ 99 වැනි ස්ථානයේ සිට 50 වැනි ස්ථානයෙන් පහලට ගෙන ඒම.
- 2030 වන විට ව්‍යවසායකත්ව ප්‍රතිශතය (කර්මාන්ත ගොඩ නැගීම වැඩි කිරීම) - 2.8% සිට 10% දක්වා වැඩි කිරීම.
- 2030 වන විට GDP සඳහා නිෂ්පාදන කර්මාන්ත දායකත්වය - 15% සිට 25% දක්වා වැඩි කිරීම (ස්ථාවරත්වය - නව/ පවතින කර්මාන්ත).
- 2030 වන විට වත්මන් ඒක පුද්ගල අපනයනය (US$ 596) ගෝලීය සාමාන්‍යයෙන් (US$ 3055) 50% (US$ 1527) දක්වා වැඩි දියුණු කිරීම.
- 2030 වන විට කාර්මික කලාප සඳහා ඉඩම් ප්‍රතිශතය 0.04% සිට 1% දක්වා වැඩි කිරීම.
- සම්පත් කාර්යක්ෂමතාව, හරිත තාක්ෂණය සහ චක්‍රීය ආර්ථික සංකල්ප අනුගමනය සහ ඇතුළත් කර ගන්නා අතරම අවම කිරීමේ ක්‍රියාකාරකම් වැඩි දියුණු කිරීම තුළින් 2030 වන විට කර්මාන්ත අංශයේ BAU තත්ත්වයට එරෙහිව හරිතාගාර වායු (GHG) විමෝචනය 7% කින් අඩු කිරීම.

## කාර්ය සාධන දර්ශක

<u>කාර්මික ජනපද සංවර්ධනය</u>


| අංකය. | විස්තරය | පාද වර්ෂය (සත්‍ය අගය 2022) | අපේක්ෂිත අගය 2023 | ප්‍රගතිය 2023.12.31 |
|---|---|---|---|---|
| 1 | ස්ථාපිත නව කාර්මික ජනපද සංඛ්‍යාව | 16 | 2 | 1 |
| 2 | වාණිජ නිෂ්පාදනයේ යෙදී සිටින මුළු කර්මාන්ත සංඛ්‍යාව - සමුච්චිත | 277 | 20 | 14 |
| 3 | වාණිජ නිෂ්පාදනයේ යෙදී සිටින නව කර්මාන්ත | - | 10 | 6 |
| 4 | ජනනය කරන ලද සමස්ත රැකියා අවස්ථා | 8595 | 400 | 295 |
| 5 | ජනනය කරන ලද නව රැකියා අවස්ථා | - | 300 | 180 |
| 6. | වෙනත් | - | - | - |

**නිෂ්පාදන කර්මාන්තවල තත්ව සංවර්ධනය**

| අංකය. | විස්තරය | පාද වර්ෂය (තථ්‍ය අගය 2022) | අපේක්ෂිත අගය 2023 | ප්‍රගතිය 2023.12.31 |
|---|---|---|---|---|
| 1 | තත්ත්ව සහතික ලබා ගැනීමට සහාය වූ කර්මාන්ත සංඛ්‍යාව | 1,480 | 1,924 | 1,305 |
| 2 | වෙනත් තත්ත්ව වැඩිදියුණු කිරීමේ වැඩසටහන් | 158 | 205 | 255 |

**නිෂ්පාදන කර්මාන්ත සඳහා ලබා දී ඇති පුහුණු වැඩසටහන්**

| නිෂ්පාදන කර්මාන්ත සඳහා ලබා දී ඇති පුහුණු අවස්ථා ගණන | | පාද වර්ෂය (තථ්‍ය අගය 2022) | අපේක්ෂිත අගය 2023 | ප්‍රගතිය 2023.12.31 |
|---|---|---|---|---|
| **1. නිපුණතා සහ ධාරිතා ගොඩනැගීම - තාක්ෂණික නොවන** | | | | |
| **1.1** වැඩසටහන් සංඛ්‍යාව | දේශීය | 273 | 475 | 397 |
| | විදේශීය | - | - | - |
| **1.2** ප්‍රතිලාභීන් සංඛ්‍යාව | දේශීය | 3,273 | 11,875 | 14,618 |
| | විදේශීය | - | - | - |
| **2. නිපුණතා සහ ධාරිතා ගොඩනැගීම – තාක්ෂණය හා සම්බන්ධ** | | | | |
| **1.1** වැඩසටහන් සංඛ්‍යාව | දේශීය | 417 | 2,262 | 1,003 |
| | විදේශීය | - | - | - |
| **1.2** ප්‍රතිලාභීන් සංඛ්‍යාව | දේශීය | 8,667 | 55,882 | 21,843 |
| | විදේශීය | - | - | - |
| මුළු වැඩසටහන් සංඛ්‍යාව | **දේශීය** | **690** | **2,737** | **1,400** |
| | **විදේශීය** | - | - | - |
| මුළු ප්‍රතිලාභීන් සංඛ්‍යාව | **දේශීය** | **11,940** | **67,757** | **36,461** |
| | **විදේශීය** | - | - | - |



## 2023 වර්ෂය තුළ පවත්වන ලද වැඩසටහන් / ව්‍යාපෘති

| අංකය. | වැඩසටහන් / ව්‍යාපෘති (2023 වසර ඇතුළුව) | ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|---|
| 1 | කර්මාන්ත ක්ෂේත්‍ර සමග සමපාත වන තාක්ෂණික පුහුණු වැඩසටහන් (රසායනික අංශය, ගොඩනැගිලි ද්‍රව්‍ය, තෙල් සහ කෙඳි, පාවහන් හා සම්භාණ්ඩ, ආහාර අංශය සහ තාක්ෂණයට අදාළ අනෙකුත්) | 16,784 |
| 2 | තාක්‍ෂණය සමඟ සමපාත වන විශේෂ පුහුණු වැඩසටහන් (සමෘද්ධි, ත්‍රිරෝද රථ රියදුරු - ව්‍යාපාර තාක්‍ෂණය, රණවිරු) | 1,361 |
| 3 | තාක්ෂණ පුහුණු වැඩසටහන්/ වැඩමුළු/ ආදර්ශන | 1,551 |
| 4 | කර්මාන්ත / සංවිධාන / ආයතනවල ඉල්ලුම අනුව සකස් කරන ලද ක්ෂේත්‍ර පදනම් කරගත් තාක්ෂණික පුහුණු වැඩසටහන් පැවැත්වීම | 60 |
| 5 | කාර්මික සහතික පුහුණු පාඨමාලා පැවැත්වීම | 61 |
| 6 | තාක්ෂණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන්/වැඩමුළු/ආදර්ශන පැවැත්වීම | 50 |
| 7 | පාවහන් තාක්ෂණ පුහුණු වැඩසටහන් පැවැත්වීම | 135 |
| 8 | බෑග් නිෂ්පාදන තාක්ෂණ පුහුණු වැඩසටහන් | 34 |
| 9 | සම් භාණ්ඩ තාක්ෂණ පුහුණු වැඩසටහන් | 40 |
| 10 | තත්ත්ව වැඩිදියුණු කිරීමේ වැඩසටහන් | 77 |
| 11 | පාවහන් නිෂ්පාදන ව්‍යාපාර ආරම්භ කිරීම | 291 |
| 12 | තත්ත්ව වැඩිදියුණු කිරීමේ වැඩසටහන් පැවැත්වීම | 77 |
| 13 | ව්‍යවසායකයින් / කර්මාන්තකරුවන් / රාජ්‍ය සහ බාහිර සංවිධාන සඳහා සකස් කරන ලද පුහුණු වැඩසටහන් පැවැත්වීම | 68 |
| 14 | පවතින සහ නව කර්මාන්තකරුවන් සඳහා කාර්මික ඉංජිනේරු පුහුණු | 98 |
| 15 | සමාජ මාධ්‍ය අලෙවිකරණය, වෙබ් සංවර්ධනය සහ ඩ්‍රොප් ෂිපින් පිළිබඳ වැඩමුළු (Zoom තාක්ෂණය ඔස්සේ) | 827 |
| 17 | Zoom තාක්ෂණය ඔස්සේ අපගේ කලාපීය ජාලය හරහා දිවයින පුරා ව්‍යවසායකයින් සඳහා ඩිජිටල් අලෙවිකරණ ප්‍රායෝගික වැඩසටහන | 30 |
| 18 | බාහිර අරමුදල් සපයන සංවිධාන සමඟ සමාජ මාධ්‍ය අලෙවිකරණය, අන්තර්ජාල දේවල් (IoT), Fiverr, ජංගම යෙදුම් සංවර්ධනය පිළිබඳ තරුණ තරුණියන් සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සම්බන්ධ විවිධාංගිකෘත වැඩමුළු | 162 |
| 19 | අපනයන ක්‍රියාපටිපාටිය පිළිබඳ ව්‍යවසායක දැනුම වැඩිදියුණු කිරීමේ වැඩමුළුව | 99 |
| 20 | අදාළ ආයතන / දිස්ත්‍රික් කාර්යාල සමඟින් කර්මාන්ත සඳහා වැඩිදියුණු කිරීම් වැඩසටහන් පැවැත්වීම | 38 |

## මූල්‍ය ආධාර සපයන ලද ව්‍යවසායන් සංඛ්‍යාව

| අංකය | කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධනය සඳහා නව ව්‍යාපෘති | පාද වර්ෂය (තත්‍ය අගය 2022) | අපේක්ෂිත අගය 2023 | ප්‍රගතිය 2023.12.31 |
|---|---|---|---|---|
| 1 | කර්මාන්ත සංවර්ධන අරමුදල | - | - | 33 |
| 2 | කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා අනෙකුත් මූල්‍ය ආධාර | 601 | 780 | 930 |
| | එකතුව | **601** | **780** | **963** |

# මෙහෙයුම් සමාලෝචනය

1) පරිපාලන අංශය
2) ඉංජිනේරු අංශය
3) කාර්මික ජනපද අංශය
4) ව්‍යවසායකත්ව සංවර්ධන අංශය
5) ප්‍රාදේශීය සංවර්ධන අංශය
6) සැලසුම් අංශය
7) තාක්ෂණික සේවා අංශය
8) අළෙවි අංශය
9) රබර් නිෂ්පාදන සංවර්ධන සහ සේවා මධ්‍යස්ථානය
10) සම්භාණ්ඩ නිෂ්පාදන සහ පාවහන් සංවර්ධන මධ්‍යස්ථානය


## 1) පරිපාලන අංශය

### 1.1 හැඳින්වීම

පරිපාලන අංශය යනු සේවා ස්ථානයේ යහපත් මානව සම්පත් කළමනාකරණය තුළින් ඵලදායිතාව සහ කාර්යක්ෂමතාවය ඉහළ මට්ටමක පවත්වා ගැනීම සම්බන්ධව ක්‍රියාකරන අංශයකි. තවද, සියලු මානව සම්පත් කළමනාකරණ සහ සංවර්ධන ක්‍රියාකාරකම් සැකසීම, ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය සහ ඇගයීම සඳහා ඔවුන් වගකියනු ලබයි. ශ්‍රම බලකාය ශක්තිමත් කිරීම සඳහා බඳවා ගැනීමේ පටිපාටිය (SoR) සහ උසස් කිරීමේ පටිපාටිය (SoP) සකස් කිරීම, විධිමත් බඳවා ගැනීම් සිදු කිරීම, කාර්ය සාධන ඇගයීම්, උසස්වීම් සහ විශ්‍රාම ගැන්වීම් යනාදිය මෙම අංශයට පැවරී ඇති අනෙකුත් ක්‍රියාකාරකම් කිහිපයකි. ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය සහ සේවකයින් සම්බන්ධ කෙරෙන පුරුකක් ලෙස මෙම අංශය ක්‍රියා කරයි. ඔවුන් ශ්‍රම බලකාය සඳහා අභිප්‍රේරණයක් සපයන අතර සංවිධානයේ අරමුණු සාක්ෂාත් කරවයි. මීට අමතරව, පරිපාලන හා මානව සම්පත් සංවර්ධන අංශය විසින් කා.සං.ම. සේවකයින්ගේ ධාරිතා වර්ධනය කිරීමේ සහ අවශ්‍ය කුසලතා වැඩි දියුණු කිරීමේ වගකීම දරනු ලබයි.

**වගුව 1.1 : සේවක සංඛ්‍යා කළමනාකරණය 2023**

| වර්ගීකරණය | අනුමත සේවක සංඛ්‍යාව | දැනට සිටින සේවක සංඛ්‍යාව | පුරප්පාඩු / (අතිරික්ත) |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 12 | 08 | 04 |
| තෘතීක මට්ටම | 252 | 180 | 72 |
| ද්විතීක මට්ටම | 184 | 155 | 29 |
| ප්‍රාථමික මට්ටම | 266 | 199 | 67 |
| එකතුව | **714** | **542** | **172** |



1.1 ප්‍රස්ථාරය : සේවක සංඛ්‍යා කළමනාකරණය 2023

1.2 වගුව : 2023 වර්ෂය තුළ මානව සම්පත් කළමනාකරණය උදෙසා පවත්වන ලද පුහුණු වැඩසටහන්

| අංකය | වැඩසටහනේ නම | පුහුණු වූ සේවක සංඛ්‍යාව | මුළු ආයෝජනය (රු.) | |
|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය |
| 1 | ක්ෂුද්‍රජීව විද්‍යාව - 02 අදියර | 02 | 12,0000.00 | |
| 2 | ISO / IEC 17025:2017 අනුව රසායනාගාර තත්ත්ව කළමනාකරණ පද්ධති සංවර්ධනය කිරීම පන්තිකාමර පුහුණුව | 02 | 40,000.00 | |
| 3 | AutoCAD පිළිබඳ විස්තීර්ණ සහතිකපත්‍ර පාඨමාලාව | 01 | 18,000.00 | |
| 4 | ලිපිගොනු කළමනාකරණය පිළිබඳ පුහුණු වැඩසටහන | 08 | 20,000.00 | |
| 5 | මූලික විමර්ශන පුහුණුව | 02 | 19,000.00 | |
| 6 | අභ්‍යන්තර විගණන පරිචයන් | 01 | 13,000.00 | |
| 7 | පෞද්ගලික ලිපිගොනු නඩත්තු කිරීම | 02 | 19,000.00 | |
| 8 | ආයතනික ප්‍රසම්පාදන සහ සැපයුම් දාම කළමනාකරණය | 02 | 14,000.00 | |
| 9 | රජයේ නව බදු ප්‍රතිපත්තිය පිළිබඳව දැනුවත් කිරීම | 02 | 13,000.00 | |
| 10 | රාජ්‍ය පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය | 01 | 105,300.00 | |
| 11 | කම්කරු සබඳතා සහ මානව සම්පත් කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය | 01 | 105,300.00 | |
| 12 | නවෝත්පාදන නායකත්වය සහ ව්‍යාපාරික අවස්ථා | 01 | 10,100.00 | |
| 13 | පරීක්ෂණ වාර්තාවල මිනුම් සහතික කිරීම සහ අර්ථ නිරූපණය පිළිබඳ පුහුණු වැඩසටහන | 02 | 18,871.78 | |
| 14 | බලශක්ති පද්ධති ප්‍රශස්තිකරණය (ESO) විශේෂඥ පුහුණු වැඩසටහන | 01 | නොමිලේ | |
| 15 | ලිපි ලිවීම පිළිබඳ මාර්ගගත වැඩමුළුව | 07 | 17,500.00 | |
| 16 | කාර්ය මණ්ඩල පුහුණුව සහ සංවර්ධනය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව සඳහා ඉල්ලුම් පත්‍ර | 01 | නොමිලේ | |
| 17 | වැඩමුළුවේදී ඵලදායි 'ආරක්ෂාව සහ සෞඛ්‍ය' කමිටුවක් පිහිටුවීම | 01 | 15,332.75 | |
| 18 | අධීක්ෂණ සහ මිනුම් උපාංග ක්‍රමාංකනය පිළිබඳ පුහුණු වැඩසටහන | 02 | 16,410.24 | |
| 19 | පරිපාලන නිලධාරීන්ගේ වගකීම් සහ රාජකාරි | 02 | 15,000.00 | |
| 20 | Advanced Microsoft Excel පුහුණුව | 01 | 18,000.00 | |
| 21 | Sage 200 මෙහෙයුම් සඳහා පුහුණු වැඩසටහන | 01 | 35,000.00 | |
| 22 | RAMIS පද්ධති පුහුණුව | 01 | 35,000.00 | |
| 23 | විජලනය කිරීමේ තාක්ෂණය | 01 | 13,500.00 | |
| 24 | කෘෂිකාර්මික සහ තාක්ෂණ ආහාර සුරක්ෂිතතාව උත්තේජනය කිරීම | 02 | 7,000.00 | |
| 25 | ආයතනික සැලසුම් සංවර්ධනය | 01 | 12,500.00 | |
| 26 | අමාත්‍ය මණ්ඩල සංදේශ සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම | 01 | 9,500.00 | |
| 27 | ව්‍යුහගත ගැටළු විසඳීමේ ක්‍රමවේදය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව | සියලුම JM MM | 92,630.00 | |

| අංක ය. | වැඩසටහනේ නම | පුහුණු වූ සේවක සංඛ්‍යාව | මුළු ආයෝජනය (රු.) | |
|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය |
| 28 | සබන් නිෂ්පාදනය පිළිබඳ වැඩමුළුව | 01 | 30,000.00 | |
| 29 | විවෘත මූලාශ්‍ර ඩිජිටල් පුස්තකාල මෘදුකාංග පිළිබඳ මාර්ගගත පුහුණු වැඩසටහන - Java /CDS/ISIS | 01 | 5,000.00 | |
| 30 | මුදල් අයකැමි තනතුරේ යුතුකම් සහ වගකීම් | 02 | 12,000.00 | |
| 31 | Milling සහ Shaping පාඨමාලාව | 01 | 26,000.00 | |
| 32 | රාජ්‍ය පරිපාලන හා කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය 2023/2024 | 01 | 108,000.00 | |
| 33 | ISO/IEC 17025:2017 අනුව රසායනාගාර තත්ත්ව කළමනාකරණ පුහුණු වැඩසටහන සංවර්ධනය කිරීම | 02 | 40,000.00 | |
| 34 | නිලධාරීන් සඳහා දින 02 පුහුණු වැඩසටහන | 80 | 731,482.00 | |
| 35 | FSSC22000V.5.1/ISO22000:2018 ආහාර සුරක්ෂිතතා කළමනාකරණ පද්ධතිය පිළිබඳ පුහුණු වැඩසටහන ප්‍රධාන විගණක පාඨමාලාව | 01 | 79,925.00 | |
| 36 | වියලි රබර්, රබර් කිරි සහ ප්ලාස්ටික් කර්මාන්ත සඳහා උසස් බහු අවයවීය ද්‍රව්‍ය ලක්ෂණ හඳුනා ගැනීමේ වැඩමුළුව | 04 | 60,000.00 | |
| 37 | විනය පටිපාටිය පිළිබඳ දෙදින වැඩමුළුව | 01 | 9,500.00 | |
| 38 | ISO/IEC 17025 අනුව රසායනාගාර තත්ත්ව කළමනාකරණ පද්ධතියේ අභ්‍යන්තර විගණනය | 02 | 60,000.00 | |
| 39 | දෙදින පුහුණු වැඩසටහන - MA | 160 | 1,280,176.00 | |
| 40 | රියදුරන් සඳහා එක්දින වැඩමුළුව | 01 | 5,000.00 | |
| 41 | NVQ – 04 වාර්තා පොත - මුද්‍රණය | 10 | 5,000.00 | |
| 42 | පුහුණුකරුවන් සඳහා පුහුණුව | 80 | 775,733.00 | |
| 43 | World food මොස්කව් ප්‍රදර්ශනය – 2023 | 02 | | 2,466,700.00 |
| 44 | ඉන්දියාවේ මෝටර් රථ නිෂ්පාදන කම්හල් වෙත නිරාවරණ සංචාරය | 01 | | 65,976.00 |
| 45 | ශ්‍රී ලංකාව සඳහා කාර්මික උද්‍යාන ඉදිකිරීම සහ කළමනාකරණය පිළිබඳ සම්මන්ත්‍රණය | 02 | | 276,950.00 |
| 46 | සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා විදුලි - යාන්ත්‍රික කර්මාන්ත ප්‍රවර්ධනය සහ ආර්ථික සංවර්ධනය පිළිබඳ සම්මන්ත්‍රණය | 01 | | 155,981.00 |
| 47 | Food Africa, කයිරෝ, ඊජිප්තුව – 2023 | 02 | | 1,908,511.00 |

## 1.2 කාර්ය සාධනය - 2023

**1.3 වගුව : අංශයේ කාර්ය සාධන විශේෂතා**

| # | ක්‍රියාකාරකම | සංඛ්‍යාව |
|---|---|---|
| **1** | **HRM – බඳවා ගැනීම්** | |
| (i) | බඳවා ගැනීම් (කාර්ය මණ්ඩලය) | 104 |
| (ii) | ඉල්ලා අස්වීම් | 13 |
| (iii) | විශ්‍රාම ගැනීම් | 17 |
| (iv) | තනතුර හැර යාම් | 06 |
| **2** | **HRD – පුහුණු වැඩසටහන්** | |
| (i) | දේශීය පුහුණු | 42 |
| (ii) | විදේශීය පුහුණු | 05 |
| **3** | **HRM – සේවක සුභසාධනය** | |
| (i) | ආපදා ණය - පුද්ගලයන් 127 | රු. 27,539,824.52 |
| **4** | **ආරක්ෂක කළමනාකරණය** | |
| (i) | ආරක්ෂක පිරිවැය | රු. 59,132,410.48 |
| **5** | **තැපැල් හා විදුලි සංදේශ ගාස්තු** | |
| (i) | තැපැල් ගාස්තු | රු. 989,740.00 |
| (ii) | විදුලි සංදේශ ගාස්තු | රු. 5,974,015.82 |
| **6** | **HRM - වන්දි** | |
| (i) | පාරිතෝෂික ගෙවීම - පුද්ගලයන් 44 | රු. 34,262,870.50 |

## 2) ඉංජිනේරු අංශය

කාර්මික සංවර්ධන මණ්ඩලයේ ඉංජිනේරු අංශය මෙරට තිරසර කර්මාන්ත සංවර්ධනයක් උදෙසා මණ්ඩලයෙහි දැක්ම ක්‍රියාත්මක කිරීමට දායක වන ප්‍රමුඛතම තාක්ෂණික/ඉංජිනේරු අංශය ලෙස ක්‍රියාත්මක වෙයි.

**ඉංජිනේරු අංශයේ ප්‍රධාන අරමුණු**

1. පුහුණු පහසුකම්, නවෝත්පාදනයන් පෝෂණය කිරීම සහ ග්‍රාමීය අංශය තුළ අන්තර්ගත වර්ධනයක් ඇති කිරීම තුළින් ශ්‍රී ලංකාවේ තාක්ෂණවේදීන් සවිබල ගැන්වීම අරමුණු කෙරේ.
2. කර්මාන්තයේ ඉංජිනේරු/තාක්ෂණික අවශ්‍යතා හඳුනාගෙන සියලු පාර්ශ්වකරුවන් සඳහා ප්‍රියජනක සේවාවන් සැපයීම සඳහා පවතින සම්පත් ප්‍රශස්ත ලෙස භාවිතා කරමින් ඔවුන්ගේ අරමුණු සාක්ෂාත් කර ගැනීමට ඔවුන්ට සහාය වීම.
3. විස්තීරණ මාර්ගෝපදේශ සහ ප්‍රතිපත්ති ක්‍රියාවට නංවමින්, ක්ෂේත්‍රයේ වගකීම් සහගත සහ පරිසර හිතකාමී පරිවර්තනයක් පෝෂණය කරමින් ශ්‍රී ලාංකේය මෝටර් රථ කර්මාන්තය තිරසාරත්වය කරා මෙහෙයවීම.
4. දේශීය කර්මාන්තවල නිෂ්පාදිත ලෝහ සහ ලෝහ නොවන නිෂ්පාදන/භාණ්ඩවල නිෂ්පාදන සාධක (ශ්‍රමය, තාක්‍ෂණය සහ අමුද්‍රව්‍ය) අධ්‍යයනය කිරීම සහ එම කර්මාන්තවල පවතින පරතරයන් හඳුනා ගැනීම සඳහා අනෙකුත් රටවල් සමඟ සංසන්දනය කිරීම, සහ ආනයනය අඩු කිරීම සඳහා මෙන්ම දේශීය කර්මාන්ත සඳහා විදේශීය වෙළෙඳපොළ විවෘත කිරීම පිණිස තිරසාර ලෙස පරතර සපුරාලීමට අවශ්‍ය පාරිසරික වෙනස්කම් සිදු කිරීම.
5. උපකරණ, යන්ත්‍රෝපකරණ, පිරියත සහ නිෂ්පාදන පහසුකම් තක්සේරු කිරීම සහ කර්මාන්ත සඳහා තත්ව වාර්තාව සහ තක්සේරු වාර්තා සකස් කිරීම.
6. අබලි ලෝහ ප්‍රතිචක්‍රීකරණය කිරීම සඳහා දේශීය ලෝහ කර්මාන්ත සඳහා වාත්තු පහසුකම් සංවර්ධනය කිරීම සහ එමඟින් ලෝහ ආනයනය සහ අබලි ලෝහ අපනයනය අඩු කිරීම

ඉහත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ඉංජිනේරු අංශයේ විෂය පථය යටතේ පහත ඒකක ක්‍රියාත්මක වේ:

**අ) වැඩහල - කටුබැද්ද ප්‍රධාන කාර්යාලය:**

- ශ්‍රී ලංකාවේ කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සඳහා උපකරණ සහ යන්ත්‍රෝපකරණ සැකසීම, එකලස් කිරීම, ස්ථාපනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා මෙම වැඩහල පට්ටල, ඇඹරුම්, යන්ත්රෝපකරණ, වෙල්ඩින්, තාප පිරියම් කිරීම සහ එකලස් කිරීමේ පහසුකම් වලින් සමන්විත වේ.
- කර්මාන්ත සඳහා පහසුකම් අවශ්‍යතා හඳුනාගෙන ශ්‍රී ලංකාවේ ලෝහ පාදක කර්මාන්තවල වඩා හොඳ නිෂ්පාදන පහසුකම් ක්‍රියාත්මක කිරීමට සහාය ලබා දීම.
- යන්ත්‍ර සූත්‍ර සහ සංරචක සැලසුම් කිරීම සහ නිෂ්පාදනය කිරීම සහ වෙල්ඩින්, තාප පිරියම් කිරීම සහ යන්ත්‍රෝපකරණ වැනි අනෙකුත් වැඩහල් සේවා පිළිබඳ පුහුණුව ලබා දීම.

- යන්ත්‍රෝපකරණ සහ උපකරණ අවශ්‍යතා සපුරාලීම සඳහා යන්ත්‍ර නිෂ්පාදකයින් පාරිභෝගිකයින් සමඟ සම්බන්ධ කිරීම.
- කර්මාන්තය සඳහා මූලාා ආධාර සැපයීමට තක්සේරු වාර්තා පරීක්ෂා කිරීම සහ සකස් කිරීම.
- විශ්වවිද්‍යාල සහ අනෙකුත් ආයතන සඳහා පිරියත තුළ පුහුණු පහසුකම් (උදා: NAITA).

**ආ) වාත්තු පහසුකම් සහ සේවා - කටුබැද්ද ප්‍රධාන කාර්යාලය:**




- ශ්‍රී ලංකාවේ ෆෙරස් සහ ෆෙරස් නොවන ලෝහ නිෂ්පාදන නිෂ්පාදනය කිරීම සඳහා වාත්තු තාක්ෂණය දේශීය කර්මාන්ත වෙත ලබා දීම සඳහා මෙම පහසුකම සංවර්ධනය කර ඇත.
- දේශීය කර්මාන්ත සඳහා මූලික ලෝහ නිෂ්පාදනය කිරීම සඳහා ශ්‍රී ලංකාව තුළ අබලි ලෝහ ප්‍රතිචක්‍රීකරණ තාක්ෂණය හඳුන්වා දීම සහ ස්ථාපිත කිරීම. එමඟින් ලෝහ ආනයනය සහ අබලි ලෝහ අපනයනය අඩු කිරීමට හැකියාව ලැබේ. එබැවින්, ගෝලීය වෙළෙඳපොළ සමඟ තරඟ කිරීම සඳහා අප විසින් ශ්‍රී ලංකාව තුළ මිල තරඟකාරී ලෝහ නිෂ්පාදන වැඩි දියුණු කරනු ලබයි.
- ලෝහ විද්‍යාත්මක රසායනාගාර පහසුකම: ශ්‍රී ලංකාවේ ලෝහ පාදක නිෂ්පාදනවල අපේක්ෂිත ගුණාත්මකභාවය ළඟා කර ගැනීම සඳහා කාර්මික අවශ්‍යතා සැලකිල්ලට ගනිමින් ලෝහවල සංයුතිය, ව්‍යුහය සහ ගුණාංග හඳුනාගෙන සංවර්ධනය කිරීම.
- වාහන කර්මාන්ත සංරචකය සඳහා අනුකූලතා වාර්තා සහ අපනයනය-නැඹුරු ලෝහ නිෂ්පාදන සඳහා අගය එකතු කිරීමේ වාර්තා සැපයීම.
- ලෝහ අපද්‍රව්‍ය (Mill scale, Mill powder, Aluminium ash, Zinc ash සහ dross ආදිය) අපනයන අනුමත කිරීම් සලකා බැලීම.
- අමුද්‍රව්‍ය සහ අතරමැදි ද්‍රව්‍ය සඳහා තීරුබදු නිදහස් කිරීම් අනුමත කිරීම් සඳහා නිර්දේශ ලබා දීම.
- නව සහ පවතින වාත්තු කර්මාන්තවල ධාරිතා සංවර්ධනය කිරීම සහ පුහුණු වැඩසටහන් පැවැත්වීම.

ඇ) ඉංජිනේරු කාර්යාලය




- අංක CP21/1529/320/043 දරන කැබිනට් අනුමැතිය යටතේ බොයිලේරු සහ පීඩනාගාරක යන්ත්‍ර පර්යේෂණ සංවර්ධන නියාමන මධ්‍යස්ථානය (Boiler and pressure vessel research development Centre) ස්ථාපිත කරන ලද අතර ආරම්භයේදී මෙම ව්‍යාපෘතිය සඳහා පහත සඳහන් යන්ත්‍රෝ උපකරණ මිලදී ගෙන ඇති අතර එහි වටිනාකම රුපියල් මිලියන 8.4 කි. දැනටමත් මෙම යන්ත්‍ර භාවිතයෙන් පරීක්ෂණ කටයුතු ආරම්භ කර ඇත.

    1. අතිධ්වනික වෙල්ඩින් පරීක්ෂකය (Ultrasonic welding tester)
    2. අතේ ගෙන යා හැකි දෘඪතාව පරීක්ෂකය (Portable hardness tester)
    3. ලේසර් මිනුම් / මට්ටම් උපකරණ (Laser measuring /leveling equipment)
    4. ඩිජිටල් වර්නියර් කැලිපරය (Digital Vernier caliper)

ඇ) රොබෝ තාක්ෂණය සඳහා විශිෂ්ඨතා මධ්‍යස්ථානය (**Centre of Excellence in Robotic Application**)



රොබෝ විද්‍යා යෙදවුම් මධ්‍යස්ථානය කර්මාන්ත, දීර්ඝකාලීනව අවතැන් වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශයේ විෂය පථය යටතේ විශේෂයෙන් දේශීය කර්මාන්ත සඳහා ජාතික

වශයෙන් වැදගත් උපායමාර්ගික ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක වන අතර, කාර්මික සංවර්ධන මණ්ඩලය දේශීය ආර්ථිකයට ඉහළ දායකත්වයක් ලබා දීම සඳහා ක්ෂේත්‍රයේ වේගවත් වර්ධනයක් සඳහා කර්මාන්තයට තාක්‍ෂණය ඇතුළත් කිරීමට නියමිතය. රොබෝ විද්‍යා මධ්‍යස්ථානය MIG වෙල්ඩින් රොබෝ (MIG welding robot), ප්ලාස්මා කැපුම් රොබෝ යන්ත්‍රය (Plasma cutting robot) යන්ත්‍ර හතරකින් සමන්විත වේ.

- දේශීය කර්මාන්ත සඳහා නිෂ්පාදන/ක්‍රියාවලි සංවර්ධනය, ක්‍රියාවලි සැලසුම්කරණය සහ තාක්ෂණික සහාය වැනි ඉංජිනේරු සේවා සැපයීම.

- විශේෂයෙන් මෝටර් රථ අංශයේ සහ අනෙකුත් නිෂ්පාදන අංශවල අගය එකතු කිරීමේ කටයුතු සෝදිසි කර පරීක්ෂා කර මෙම නිෂ්පාදන අංශය දියුණු කිරීමට සහභාගී වීම.

### ඉ) පර්යේෂණ සහ සංවර්ධන ඒකකය:



කර්මාන්තවල තිරසාර ආර්ථික වර්ධනය උදෙසා කාර්මික අවශ්‍යතා හඳුනාගෙන උපකරණ, යන්ත්‍රෝපකරණ, පිරියත සහ නිෂ්පාදන පහසුකම් සැලසුම් කිරීම සහ ඒවා තිරසාර ලෙස ක්‍රියාත්මක කිරීම.

### ඊ) තක්සේරු කිරීම් සහ ලෝහ පදනම් කරගත් කර්මාන්ත දත්ත විශ්ලේෂණ ඒකකය:

- ශ්‍රී ලංකාවේ පිරියත, උපකරණ, යන්ත්‍ර සූත්‍ර සහ නිෂ්පාදන පහසුකම් ඇගයීම, තක්සේරු කිරීම සහ තත්ත්ව වාර්තා සකස් කිරීම.
- දේශීය කර්මාන්තවල ලෝහ හා ලෝහ නොවන නිෂ්පාදන/භාණ්ඩ නිෂ්පාදනයේ නිෂ්පාදන සාධක (ශ්‍රමය, තාක්ෂණය සහ අමුද්‍රව්‍ය) අනුපාත අධ්‍යයනය කිරීම සඳහා ප්‍රාථමික සහ ද්විතියික දත්ත රැස් කිරීම සහ පරණ ලෝහ ආනයනය හා අපනයනය අවම කිරීමට මෙන්ම දේශීය කර්මාන්ත වලට විදේශීය වෙළෙඳපොළ විවෘත කිරීම සඳහා තිරසාර ලෙස පරතරය සපුරාලීම වෙනුවෙන් පරතර හඳුනාගෙන අවශ්‍ය පාරිසරික වෙනස්කම් සිදු කිරීම සඳහා ඒවා අනෙකුත් රටවල් සමඟ සංසන්දනය කිරීම.

### උ) සිවිල් ඉංජිනේරු ඒකකය:

කා.සං.ම. සහ කර්මාන්ත සඳහා පහත සඳහන් සේවාවන් සැපයීම සඳහා මෙම ඒකකය ප්‍රධාන කාර්යාලයේ ස්ථාපිත කර ඇත.

- ආයතනික අරමුණු සපුරාලීම සඳහා කා.සං.ම. යටිතල පහසුකම් සංවර්ධනය සහ නඩත්තු කිරීම.
- කාර්මික ජනපද වල කාර්මික යටිතල පහසුකම් සංවර්ධන අවශ්‍යතා හඳුනාගෙන ආර්ථිකයට වඩා හොඳ ප්‍රතිඵලයක් ලබා දීම සඳහා අදාළ කොටස් හිමියන් සමඟ සම්බන්ධ වී ඒවාට සහභාගී වීම.
- ශ්‍රී ලංකාවට ගෝලීය ආර්ථික අවස්ථා උකහා ගැනීම සඳහා රට තුළ නැගී එන කාර්මික ජනපද සැලසුම් කිරීම සහ ගොඩනැගීම.
- යෝග්‍ය කාර්මික අපද්‍රව්‍ය කළමනාකරණ තාක්ෂණය හඳුනාගෙන, රටේ තිරසාර කාර්මික සංවර්ධනය සඳහා එය දේශීය කර්මාන්ත සඳහා හඳුන්වාදීම/ක්‍රියාත්මක කිරීම.
- විශේෂ ව්‍යාපෘතිවලට අදාළ සිවිල් ඉංජිනේරුමය කටයුතු සිදු කිරීම.

### ඌ) විදුලි ඉංජිනේරු ඒකකය:

කා.සං.ම. සහ කර්මාන්ත සඳහා පහත සඳහන් සේවාවන් සැපයීම සඳහා මෙම ඒකකය ස්ථාපිත කර ක්‍රියාත්මක කර ඇත.

- IEE රෙගුලාසිවලට අනුව තිරසාර ලෙස (කා.සං.ම. සඳහා හරිත/පිරිසිදු බලශක්තිය) විදුලි බල සැපයුම, පවතින විද්‍යුත් ජාල සහ ගොඩනැගිලි සහ කා.සං.ම. හි අනෙකුත් යටිතල පහසුකම්වල යෙදීම් යාවත්කාලීන කිරීම සහ නඩත්තු කිරීම.
- කාර්මික ජනපද සඳහා තිරසාර විදුලි බලය සැපයීම සහ බෙදා හැරීම සහ ජනපද කර්මාන්ත වලට ඔවුන්ගේ බලශක්ති පිරිවැය අවම කිරීම සඳහා අඩු වියදම් බලශක්ති යෙදුම් සහ තාක්ෂණය හඳුන්වා දීම.
- ශ්‍රී ලංකාවේ නැගී එන කාර්මික බලශක්ති ගැටළු හඳුනාගෙන ශ්‍රී ලංකාවේ තිරසාර කාර්මික සංවර්ධනය උදෙසා ඒවා වළක්වා ගැනීම සඳහා පිළියම් හෝ නව තාක්ෂණික යෙදුම් යෝජනා කිරීම. (තරඟකාරී වාසියක් ලබා ගැනීම සඳහා කා.සං.ම. සහ කර්මාන්ත සඳහා සූර්ය බලශක්තිය, බලශක්ති විගණනය සහ කාබන් විගණනය හඳුන්වා දීම).
- විද්‍යුත් හා විදුලි කර්මාන්ත අංශයේ උන්නතියට අදාල සැලසුම් කිරීම, ප්‍රතිපත්ති සකස් කිරීම හා ඒවාට අවශ්‍ය පහසුකම් කර්මාන්තවලට සලසා දීම.

### එ) යෝග්‍ය තාක්ෂණ පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය (ATRDC), පන්නල:

- කෘෂිකාර්මික අංශයේ සංවර්ධනය සඳහා අවැසි යන්ත්‍ර සූත්‍ර හා උපකරණ අවශ්‍යතාවන් හා වුවමනාවන් හඳුනා ගැනීමේ හැකියාව හා ශක්‍යතාව මෙම පහසුකම සතුව පවතින අතර දේශීය ගොවීන් සඳහා ප්‍රශස්ත පිරිවැයකින් ඒවා සැලසුම් කිරීම හා පිරිසැකසුම් කිරීම සිදුකරනු ලබයි.
- යන්ත්‍ර සූත්‍ර, උපකරණ, පිරියත සහ වෙනත් නිෂ්පාදන පහසුකම් තක්සේරු කිරීම සහ කර්මාන්ත සඳහා තත්ත්ව වාර්තා සහ තක්සේරු වාර්තා සකස් කිරීම.

- ශ්‍රී ලංකාවේ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සඳහා යන්ත්‍ර සූත්‍ර හා උපකරණ සැලසුම් කිරීම, පිරිසැකසුම් කිරීම, එකලස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම මෙම මධ්‍යස්ථානය විසින් මෙහෙයවනු ලබන නවත් ක්‍රියාකාරකම් කිහිපයක් වේ.

### ඒ) මාතර පොදු සේවා මධ්‍යස්ථානය (CSC)

ශ්‍රී ලංකාවේ කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සඳහා උපකරණ සහ යන්ත්‍රෝපකරණ සැකසීම, එකලස් කිරීම, ස්ථාපනය කිරීම සහ ආරම්භ කිරීම සඳහා පට්ටල, ඇඹරුම්, යන්ත්‍රෝපකරණ, නැමීම්, වෙල්ඩින් සහ එකලස් කිරීමේ පහසුකම් වලින් මෙම CSC සමන්විත වේ.

### ඔ) CNC ඒකකය



කා.සං.ම. හි CNC ඒකකය 5-අක්ෂ (axis) CNC මෙහෙලුම් පට්ටලයක් (milling machine), CNC ලියවන පට්ටලයක් (lathe), මෙවලම් සහ කටර් ග්‍රයින්ඩරයක් සහ ඉහළ නිරවද්‍යතාවයකින් යුත් යන්ත්‍රකරණයට කාර්යයන් සම්බන්ධ නිරවද්‍ය මෙවලම් වලින් සමන්විත වේ.

## 2.1 අංශයේ ප්‍රගතිය - 2023

2.1 වගුව : 2023 දී සම්පූර්ණ කරන ලද සේවා සඳහා බාහිර ආදායම

| අංකය | අංශය / ඒකකය | ආදායම / **LKR** |
|---|---|---|
| 1 | ඉංජිනේරු වැඩහල, ප්‍රධාන කාර්යාලය - කටුබැද්ද | 6,759,662.00 |
| 2. | වාත්තු වැඩහල, ප්‍රධාන කාර්යාලය - කටුබැද්ද | 42,237,898.76 |
| 3. | තක්සේරු වාර්තා - ප්‍රධාන කාර්යාලය - කටුබැද්ද | 2,116,935.00 |
| 4. | A.T.R.D.C. පන්නල | 1,829,673.55 |
| 5. | විදුලි | 113,361.92 |
| 6. | CNC ඒකකය | 2,459,914.00 |
| 7. | කාර්මික ඉංජිනේරු පුහුණුව | 623,850.00 |
| | එකතුව | **56,141,295.23** |

## 2.2 අභ්‍යන්තර සේවා

කා.සං.ම. වෙත සම්පූර්ණ කරන ලද අභ්‍යන්තර ඉංජිනේරු සේවා කාර්යයන් වල අගයන් (තත්‍ය පිරිවැය පදනම) පහත පරිදි වේ:

2.2 වගුව : 2023 දී අභ්‍යන්තරව සම්පූර්ණ කරන ලද සේවාවන්හි වටිනාකම්

| අංකය | අංශය | වටිනාකම/LKR |
|---|---|---|
| 1 | වැඩහල – ප්‍රධාන කාර්යාලය | 3,176,000.00 |
| 2 | වාස්තු වැඩහල - ප්‍රධාන කාර්යාලය | 1,460,500.00 |
| 3 | සිවිල් ඉංජිනේරු සේවා - ප්‍රධාන කාර්යාලය | 6,758,572.00 |
| 4 | විදුලි ඉංජිනේරු සේවා - ප්‍රධාන කාර්යාලය | 4,213,123.98 |
| | එකතුව | **15,608,195.99** |

2.3 වගුව : තත්‍ය ආදායම වාර්ෂිකව සංසන්දනය කිරීම

| වර්ෂය | තත්‍ය ආදායම (රු.) |
|---|---|
| **2019** | 22,769,521 |
| **2020** | 21,806,327 |
| **2021** | 27,993,261 |
| **2022** | 63,751,098 |
| **2023** | 56,141,295 |




**2.1 ප්‍රස්ථාරය : වාෂරීක තත්‍ය ආදායම් සංසන්දනය**

## 3) කාර්මික ජනපද අංශය

### 3.1 විස්තරය

කාර්මික සංවර්ධන පනතේ 33(2) (අ) වගන්තිය මගින් කාර්මික ජනපද පිහිටුවීමට, නඩත්තු කිරීමට සහ පවත්වාගෙන යාමට කා.සං.ම. වෙත බලය පවරා දී ඇත. එබැවින් කාර්මික ජනපද අංශයේ ප්‍රධාන අරමුණ වන්නේ නව කාර්මික ජනපද පිහිටුවීම, කා.සං.ම. හි අරමුණු ප්‍රකාරව ඒවා නඩත්තු කිරීම/කළමනාකරණය කිරීම, සහ තම නිෂ්පාදන කර්මාන්ත සඳහා ප්‍රමාණවත් ඉඩක් නොමැති කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා දිගු කාලීන කල් බදු පදනම මත ගොඩනැගිය හැකි ඉඩම් හෝ කර්මාන්තශාලා ගොඩනැගිලි/වැඩි දියුණු කළ දේපල ලබා දීමයි. එබැවින්, ප්‍රාදේශීය කාර්මීකරණය ප්‍රවර්ධනය කිරීම සහ රට පුරා කාර්මික සංවර්ධන ක්‍රියාකාරකම් සිදුකිරීම සඳහා, 1960 දශකයේ දී කාර්මික ජනපද සංකල්පය ශ්‍රී ලංකාවට හඳුන්වා දෙන ලදී. විශේෂයෙන් හොඳ කාර්මික පරිසරයක පිහිටි ප්‍රදේශවල ප්‍රමාණවත් යටිතල පහසුකම් සහිත ඉඩම් සහ සාදා නිම කළ ගොඩනැගිලි සපයන කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්ත පෙළගැස්වීමට ප්‍රධාන වශයෙන් අවධානය යොමු විය.

එතැන් සිට, පසුගිය වසර පනස් හය තුළ, කා.සං.ම. විසින් රට පුරා කාර්මික ජනපද 18 ක් සංවර්ධනය කිරීමත් සමඟ සැලකිය යුතු මට්ටමකින් කොළඹ, තදාසන්න ප්‍රදේශ සහ ග්‍රාමීය ප්‍රදේශවලට අවධානය යොමු කරන ලදී. දැනට කාර්මික ජනපද 16ක් සුමටව ක්‍රියාත්මක වන අතර කාර්මික ජනපද දෙකක්, එනම් බෙලිඅත්ත සහ බද්දේගම ක්‍රියාත්මක නොවේ. කා.සං.ම. විසින් මෙම කාර්මික ජනපද වල දිගුකාලීන බදු පදනම යටතේ තම කර්මාන්ත පිහිටුවීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සහිත සුදුසු ඉඩම් සහ ගොඩනැගිලි වෙන් කරනු ලැබේ.

පසුගිය වසර කිහිපය තුළ, නවත් නව කර්මාන්ත පිහිටුවීමට පෞද්ගලික අංශය දිරිමත් කිරීම සඳහා පවතින කාර්මික ජනපද වල යටිතල පහසුකම් නංවාලීමට තවදුරටත් කටයුතු කර ඇත. ආයෝජකයින්ගේ ඉල්ලුම සපුරාලීමට සහ මෙම කාර්මික ජනපද වල කර්මාන්ත පිහිටුවීම සඳහා සුදුසු ඉඩම් කට්ටි සහ සාදා නිම කළ ගොඩනැගිලි නිර්දේශ කිරීම සඳහා කාර්මික ජනපද අංශය සහ අදාළ කා.සං.ම. දිස්ත්‍රික් කාර්යාලවල අධ්‍යක්ෂවරුන් සමඟ එක්ව කා.සං.ම. විසින් ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරනු ලබයි.

1967 සිට සංවර්ධනය කරන ලද මුළු භූමි ප්‍රමාණය අක්කර 305ක් පමණ වේ. එය ඉඩම් කට්ටි 733 කට බෙදා ඇති අතර දැනටමත් කර්මාන්තකරුවන් 378 දෙනෙකු සඳහා වෙන් කර ඇත. එසේම, වෙන් කරන ලද සමස්ත සංවර්ධිත බිම් කැබලිවලින් 280 ක්, තම ව්‍යාපාර ආරම්භ කර ඇති අතර රැකියා අවස්ථා 8627 ක් උත්පාදනය කර ඇත. නවත් කර්මාන්ත ඒකක 50 ක් ඔවුන්ගේ කර්මාන්තශාලා ගොඩනැගිලි ඉදිකිරීමේ විවිධ අදියරවල පවතී. නේවාසික අවශ්‍යතා සඳහා භාවිතා කරන කර්මාන්ත ඒකක 23 ක් සහ කුඩා කර්මාන්තපුරවල ක්‍රියාත්මක නොවන කර්මාන්ත 26 ක් අහෝසි කිරීමට පියවර ගෙන ඇති අතර කර්මාන්ත 60 ක් සඳහා කා.සං.ම. විසින් සාදා නිම කළ ගොඩනැගිලි 80 ක් වෙන් කර ඇත.

### 3.2 කා.සං.ම. යේ කාර්මික ජනපද වල වත්මන් තත්ත්වය

- 1965-1970 වර්ෂය තුළ කා.සං.ම. විසින් පහත සඳහන් කාර්මික ජනපද තුන ආරම්භ කර ඇත.

3.1 වගුව: මුල් කාර්මික ජනපද

| | කාර්මික ජනපදය | දිස්ත්‍රික්කය |
|---|---|---|
| 01 | ඒකල | ගම්පහ |
| 02 | පල්ලෙකැලේ | මහනුවර |
| 03 | අච්චුවේලි | යාපනය |

- කළුතර දිස්ත්‍රික්කයේ හොරණ කාර්මික ජනපදය 1978 දී පිහිටුවන ලදී.

- කුරුණෑගල සහ පුත්තලම දිස්ත්‍රික්කවල පිළිවෙලින් පන්නල සහ ලුණුවිල කාර්මික ජනපද 1980 ගණන්වල පිහිටුවන ලදී. තවද, 2022 වසරේදී II අදියර යටතේ පන්නල කාර්මික ජනපදයේ අක්කර 6.5ක සංවර්ධන කටයුතු අවසන් කර ඇත.

- "ඉසුරු උයන කාර්මික ජනපද වැඩසටහන සහ ග්‍රාමීය කාර්මික ජනපද වැඩසටහන" යටතේ 1990 වසරේ කොටගල, වවුළුගල, ගලිගමුව, පුස්සැල්ල, බද්දේගම, නෑගම්පහ, මිහින්තලේ, වවුනියාව, බෙලිඅත්ත සහ බුත්තල කාර්මික ජනපද පිහිටුවන ලදී.

- කොළඹ දිස්ත්‍රික්කයේ පානළුව කාර්මික ජනපදය 2006 දී පිහිටුවන ලදී. මෙම ඉඩමේ අයිතිය අත්පත් කරගැනීම 2023 වර්ෂයේදී සාර්ථකව අවසන් කර ඇත.

- මීට අමතරව, කර්මාන්ත අමාත්‍යාංශය විසින් 2018/2019 දී අදියර II සංවර්ධන වැඩසටහන ආරම්භ කර යටිතල පහසුකම් සංවර්ධනයට රු. මිලියන 100ක් ලබාදෙන ලදී.

- 2023 වර්ෂයේදී දකුණු පළාතේ ආහාර සහ කෘෂි නිෂ්පාදන අක්කර 21ක් සමඟින් 'ඇල්පිටිය' නව කාර්මික ජනපදය ආරම්භ කර ඇත. තවද, අක්කර 45කින් යුත් ඇල්පිටිය II අදියර නව කාර්මික ජනපදයක් ලෙස සංවර්ධනය කර ඇත.

- කා.සං.ම. විසින් කළුතර දිස්ත්‍රික්කයේ දොඩංගොඩ සහ මාතර දිස්ත්‍රික්කයේ කඹුරුපිටිය නව කාර්මික ජනපද පිහිටුවීම සඳහා 2023 දී හඳුනාගෙන ඇත. 2023 වසරේ දී, සම් සහ සම් ආශ්‍රිත නිෂ්පාදන නව කාර්මික ජනපදයක් ස්ථාපිත කිරීම සඳහා නැගෙනහිර පළාතේ වාලච්චේන ප්‍රදේශයේ අක්කර 50ක ප්‍රදේශයක් හඳුනාගෙන ඇත.

- මීට අමතරව, නව කාර්මික ජනපද ආරම්භ කිරීම සඳහා දිවයින පුරා ඉඩම් අක්කර 338ක් හඳුනාගෙන ඇත.

3.2 වගුව : රට පුරා පිහිටා ඇති කාර්මික ජනපද - (පළාත් අනුව)

| කාර්මික ජනපදය | පළාත |
|---|---|
| ඒකල, හොරණ, වවුළුගල සහ පානළුව | බස්නාහිර පළාත |
| පල්ලෙකැලේ, කළුදෑවල සහ කොටගල | මධ්‍යම පළාත |
| පන්නල සහ ලුණුවිල | වයඹ පළාත |
| ගලිගමුව සහ පුස්සැල්ලාව | සබරගමුව පළාත |
| නෑගම්පහ සහ මිහින්තලේ | උතුරු මැද පළාත |
| පුන්නෝට්ටම් සහ අච්චුවේලි | උතුරු පළාත |
| බුත්තල | ඌව පළාත |
| **යෝජිත කාර්මික ජනපද** | |
| ඇල්පිටිය සහ කඹුරුපිටිය | දකුණු පළාත |
| දොඩන්ගොඩ | බස්නාහිර පළාත |
| වාලච්චේන | නැගෙනහිර පළාත |

## 3.3 කාර්මික ජනපද අංශය මගින් කාර්මික ජනපද වල කර්මාන්තකරුවන්ට ලබා දෙන පහසුකම්

01 ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය මගින් බිම් කොටස් සහ සාදා නිම කරන ලද ගොඩනැගිලි පිළිවෙලින් වසර 30 සහ වසර 20 ක දීර්ඝ කාලීන පදනමින් තම ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කරන ආයෝජකයින්ට ඇගයීම් කමිටුවේ අනුමැතියට සහ මූලික ආයෝජනය අඩු බැවින් ඉහළ නිමැවුමකින් ප්‍රතිලාභ ලැබීමට යටත්ව බදු දෙනු ලැබේ.

02 යටිතල පහසුකම් ලබා දීම.

- තෙකලා විදුලිය සහ අභ්‍යන්තරව විදුලිය බෙදා හැරීමේ පද්ධතියක් පැවතීම.
- ජල සැපයුම, ජලය ගබඩා කිරීම සහ බෙදා හැරීමේ පද්ධතියක් පැවතීම.
- විදුලි සංදේශ පහසුකම් ලබාදීම.
- ප්‍රවාහන පහසුකම් සහ අභ්‍යන්තර මාර්ග සඳහා ප්‍රවේශ වීමේ හැකියාව ලබා ගත හැකි වීම. එබැවින් කාලය හා සම්පත් අපතේ නොයවා නිෂ්පාදනය වහාම ආරම්භ කළ හැකිය.

03 ආධාරක පහසුකම් පැවතීම.

මූලික යටිතල පහසුකම් හැරුණු විට, තැපැල් කාර්යාල, ආපනශාලා, පොලිස් මුරපොල ආදිය කාර්මික ජනපදවල පිහිටා ඇත. මෙමගින් බොහෝ දුරට ව්‍යාපාරික ගණුදෙනු සඳහා පහසුකම් සැලසේ.

04 අපජලය හා කාර්මික අපද්‍රව්‍ය බැහැර කිරීමේ පද්ධතිය (කාණු, මැන්හෝල්, පොම්පාගාර ආදිය).

05 කා.සං.ම. කාර්මික ජනපද සඳහා අඛණ්ඩව ආරක්ෂණ සේවා සපයයි.

06 කර්මාන්තකරුවන්ට බදු දී ඇති දේපල පිළිබඳ කල්බදු අයිතිය බැංකු සමඟ තබා ගනිමින් ණය පහසුකම් සැලසීම.

07 කාර්මික ජනපදයන්හි පරිපාලන හා නඩත්තු අවශ්‍යතා සඳහා අඛණ්ඩව මැදිහත් වීම.

08 සියලුම කාර්මික ජනපද ආශ්‍රිතව පරිසර හිතකාමීව නඩත්තු කටයුතු පවත්වාගෙන යාම පිළිබඳ අවශ්‍ය අධීක්ෂණය සහ මෙහෙයවීම ලබා දීම.

09 රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවේ ඇස්තමේන්තුගත වටිනාකම් අනුව මාසික පදනමින් බදු දී ඇති කාර්මික ජනපදවල ඉඩම් කට්ටි/ගොඩනැගිලි සඳහා කර්මාන්තකරුවන්ගෙන් මාසික කුලිය සහ ආපසු ගෙවිය හැකි පදනම මත තෙවසරක ඇප මුදල් ලබා ගැනීමට කටයුතු කිරීම.

### 3.4 2023 වර්ෂය තුළ සිදු කරන ලද මෙහෙයුම්

2020/2021 නව කොරෝනා වෛරස් රෝගය (COVID-19) සහ 2022 ආර්ථික අර්බුදය ලොව පුරා සැලකිය යුතු ලෙස ව්‍යාප්ත විය. එතැන් පටන් 2019-2021 වසරේ සංචරණ සීමා පැනවීම් සහ නිවසේ සිට වැඩ කිරීමේ කාලසීමාවන් පැනවීමත් සමඟ ශ්‍රී ලංකාවේ නිෂ්පාදන/අපනයන කාර්මික අංශ වල තත්ත්වය වඩාත් නරක අතට හැරුණ නමුත් සමහර නිෂ්පාදන කර්මාන්තවලට සේවා අපනයනය කිරීමට ප්‍රබල හැකියාවක් තිබුණි. ජීවන රටා වෙනස් වීමත් සමඟ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට ඇහලුම්, අගය එකතු කළ කෘෂිකාර්මික සහ පතල් නිෂ්පාදන සහ සැකසූ ආහාර ද්‍රව්‍ය ආදිය සැපයීමට වැඩි වැඩියෙන් අවස්ථා උදා වී ඇති අතර සමහර ව්‍යවසායකයින් විවිධ නව්‍ය අදහස්වලට ද පිවිස ඇත. මෙසේ කොවිඩ් වෛරසය පැතිරී යාම මෙම වර්ධන අවධියේදී ඔවුන් මුහුණ දුන් දැඩි පහරක් විය .

දැනට පවතින කාර්මික ජනපද වල පවතින යටිතල පහසුකම් නවීකරණය හා වැඩි දියුණු කිරීම සහ ඇල්පිටිය නව කාර්මික ජනපදයේ අක්කර 65 ක පමණ භූමි ප්‍රමාණයක යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා කඩිනම් සංවර්ධන වැඩසටහන යටතේ රජයේ භාණ්ඩාගාරයෙන් රේඛීය අමාත්‍යාංශය හරහා ලබාගත් රුපියල් මිලියන 100 කට ආසන්න මුදලක් කාර්මික ජනපද අංශය විසින් වැය කර ඇත.

ප්‍රධාන වශයෙන් රජය සතු ඉදිකිරීම් ආයතන සහ පෞද්ගලික ඉදිකිරීම් සමාගම් මේ සඳහා දායක වී ඇති අතර බොහෝ ව්‍යාපෘති 2015 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ.

- **කාර්මික ඒකක සඳහා කර්මාන්තකරුවන් හඳුනා ගැනීම සහ තෝරා ගැනීම**

දැනට පදිංචිව සිටින කර්මාන්තකරුවන්ගෙන් සහ නව ඉඩම් කට්ටි/ සාදා නිම කරන ලද ගොඩනැඟිලි සොයන නව ආයෝජකයින්ගෙන් ලැබුණු අයදුම්පත් අතරින් ශක්‍යතාව සැලකිල්ලට ගනිමින් හඳුනාගත් කර්මාන්තකරුවන් 49 දෙනෙකු වර්ෂය තුළ සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවන ලදී.

3.3 වගුව : 2023 වර්ෂය තුළ පිහිටුවන ලද කර්මාන්ත

| කාර්මික ජනපදය | ඉඩම් කට්ටි / ගොඩනැගිලි වෙන් කරදීම | අලුතින් ආරම්භ කරන ලද කර්මාන්ත | |
|---|---|---|---|
| | | කර්මාන්ත | රැකියා |
| කොටගල | 2 | 1 | 10 |
| ඒකල | 1 | 1 | 35 |
| පන්නල | 1 | 1 | 8 |
| පූන්තෝට්ටම් | 6 | 2 | 35 |
| කළුදැවල | 1 | 1 | 11 |
| එකතුව | **11** | **06** | **99** |

3.4 වගුව : 2023 වර්ෂයේ දී සංවර්ධනය කරන ලද පවතින කර්මාන්ත

| කාර්මික ජනපදය | සංවර්ධනය කරන ලද පවතින කර්මාන්ත | |
|---|---|---|
| | කර්මාන්ත | උත්පාදනය වූ අමතර රැකියා |
| ඒකල | 3 | 42 |
| පල්ලෙකැලේ | 3 | 38 |
| පූන්තෝට්ටම් | 1 | 5 |
| කළුදැවල | 1 | 8 |
| එකතුව | **8** | **93** |

- **බදු ගිවිසුම් අත්සන් කිරීම**

ඉඩම් සහ සාදා නිම කරන ලද ගොඩනැගිලි සඳහා පිළිවෙලින් වසර 30 ක සහ වසර 20 ක කාලසීමාවක් සඳහා සතුටුදායක ලෙස ව්‍යාපාර කරනු ලබන අදාළ කර්මාන්තකරුවන් සමග ඉඩම්/ සාදා නිම කරන ලද ගොඩනැගිලි සඳහා බදු ගිවිසුම් අත්සන් කරන ලදී. ඒ අනුව 2023 වර්ෂය තුළ අදාළ කර්මාන්තකරුවන් සමඟ බදු ගිවිසුම් 32ක් අත්සන් කර රුපියල් 1,046,750/- ක් උපයා ගැනීමට හැකි විය.

- **අසාර්ථක කර්මාන්ත අත්පත් කර ගැනීම සහ සුදුසු ආයෝජකයින් වෙත පැවරීම**

2023 වර්ෂය තුළ කාර්මික ජනපද 19 ක් ආවරණය වන පරිදි අසාර්ථක කර්මාන්ත අත්පත් කර ගෙන ඇති අතර නව කර්මාන්ත ආරම්භ කිරීම සඳහා සුදුසු ආයෝජකයින් වෙත ඒවා පවරා දී ඇත.

- **කර්මාන්ත සඳහා ණය පහසුකම් සැලසීම**

කර්මාන්තකරුවන්ට බදු දී ඇති දේපල පිළිබඳ කල්බදු අයිතිය තබා ගනිමින් මූල්‍ය ආයතනවලින් කර්මාන්ත 8ක් සඳහා ණය පහසුකම් ලබා ගැනීමට පහසුකම් සලසා දී ඇත.

- **කුලී ආදායම එකතු කිරීම**

2023 වර්ෂය තුළ එකතු කරන ලද බදු දී ඇති ඉඩම් සහ ගොඩනැගිලි සඳහා මාසික/වාර්ෂික කුලී, ජල ගාස්තු, පැවරීමේ ගාස්තු (ඉඩම් අගය කිරීමේ ගාස්තු) සහ හිඟ එකතු කිරීමේ ආදායම රුපියල් මිලියන 92.58 කි. බදුකරුවන්ගෙන් වසර තුනක ආපසු ගෙවිය හැකි තැන්පතු ලෙස අයකර ගන්නා ලද එකතු කිරීම් වෙනුවෙන් චක්‍රීය අරමුදල පවත්වාගෙන යනු ලබයි. ඒ අනුව, 2023 අවසානයේ දී චක්‍රීය අරමුදලේ සමුච්චිත මුදල රුපියල් මිලියන 10.63 කි.

## 4) ව්‍යවසායකත්ව සංවර්ධන අංශය

### 4.1 හැඳින්වීම

පේෂකර්ම හා ග්‍රාමීය කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය විසින් 1989 දෙසැම්බර් 15 වැනි දින කැබිනට් පත්‍රිකාවක් මගින් මෙම අංශය කාර්මික සංවර්ධන මණ්ඩලය යටතේ විශේෂ පුහුණු අංශයක් ලෙස ස්ථාපිත කරන ලදී. මෙම අංශය මගින් දිවයින පුරා පදනම්න් කළමනාකරණ කුසලතා සහ ව්‍යවසායකත්ව සංවර්ධනය පිළිබඳ පුහුණුව ලබා දේ. 2023 දී, මෙම අංශයේ නම ව්‍යවසායකත්ව සංවර්ධන අංශය (EDD) ලෙස වෙනස් කරන ලදී. EDD අංශය පුහුණු ඒකකය, පුස්තකාලය සහ තොරතුරු කුටිය, තොරතුරු තාක්ෂණ ඒකකය සහ මුද්‍රණ ඒකකය ලෙස ඒකක හතරකින් සමන්විත වේ. වත්මන් වැදගත් ව්‍යාපාර සහ නව කර්මාන්ත තේමා පිළිබඳව කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සහ අනාගත ව්‍යවසායකයින් දැනුවත් කිරීම මෙම සියලුම උප අංශවලට පැවරී ඇත. තවද, සමාජය තුළ ව්‍යවසායක සංස්කෘතියක් ඇති කිරීම EDD හි අරමුණ වේ.

පුහුණු ඒකකයේ ප්‍රධාන කාර්ය භාරය වන්නේ රට පුරා ව්‍යවසායකත්ව සංවර්ධනය සහ කළමනාකරණ කුසලතා පිළිබඳ විවිධ පුහුණු ලබා දීමයි. ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට ඔවුන්ගේ කර්මාන්ත දියුණු කිරීම සඳහා මූල්‍ය ආධාර සැපයීම, පාසල් සිසුන් සහ සමාජය අතර ව්‍යවසායක සංස්කෘතියක් ඇති කිරීම, රටේ කැපී පෙනෙන ව්‍යවසායකයින් සඳහා පිළිගැනීමක් සහ ඇගයීමක් ලබා දීම සහ අනෙකුත් අනාගත ව්‍යවසායකයින් ඔවුන්ගේ ව්‍යාපාර ආරම්භ කිරීමට දිරිමත් කිරීම මෙම පුහුණු ඒකකයට තවදුරටත් පැවරී ඇති කාර්යයන් වේ. EDD විසින් "Industry TV" නාලිකාව (PEO TV 130 නාලිකාව) හරහා සමාජයට කාර්මික පුවත් සහ යාවත්කාලීන තොරතුරු ලබා දීමට වේදිකාවක් නිර්මාණය කර ඇත. කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් වැඩි දියුණු කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ සංවර්ධනය කිරීම සඳහා පුස්තකාල පහසුකම්, උපදේශන සේවා සහ කාර්මික තොරතුරු සැපයීම පුස්තකාල සහ තොරතුරු ඒකක නිලධාරීන්ට පැවරී ඇත. අංශයේ තොරතුරු තාක්ෂණ ඒකකය (ITU) විසින් කා.සං.ම. තුළ ජාල සහ තොරතුරු පහසුකම් සපයන අතර ව්‍යවසායකයින්ගේ ICT සහ ඩිජිටල් ප්‍රවේශ්‍යතා කුසලතා සහ ඩිජිටල්කරණය සමඟින් ව්‍යවසායකයින්ගේ උපාය මාර්ග වැඩි දියුණු කිරීම සහ කා.සං.ම. හි නිල වෙබ් අඩවි, අදාළ උප පද්ධති සහ සමස්ත සමාජ මාධ්‍ය ජාලය සංවර්ධනය කිරීම, යාවත්කාලීන කිරීම සහ නඩත්තු කිරීම සිදු කරනු ලබයි. වාර්තා, අත්පොත්, පත්‍රිකා ඇතුළු ලිපි ලේඛන මුද්‍රණය කිරීම මුද්‍රණ ඒකකය විසින් සිදු කරයි. EDD ශ්‍රී ලංකාව තුළ නව කළමනාකරණ උපාය මාර්ග හඳුන්වාදීම, තාක්ෂණික දැනුම ලබා දීම, උපදේශන සේවා සැපයීම සහ ඩිජිටල් අලෙවිකරණය, ජංගම තාක්ෂණය, ඊ-වාණිජ්‍යය සහ IoT යනාදි ක්ෂේත්‍රවල ව්‍යවසායකයින්ගේ ICT කුසලතා වැඩි දියුණු කිරීම තුළින් නව ව්‍යවසායක සංස්කෘතියක් ඇති කිරීමට සම්බන්ධ වී ඇත. එම ඉලක්ක සපුරා ගැනීම සඳහා, EDD වෙත පවරා ඇති කාර්යයන් කිහිපයක් පහත දැක්වේ.

### 4.2 EDD වෙත පැවරී ඇති ක්‍රියාකාරකම්

<u>පුහුණු ඒකකය</u>

- ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන්
- කළමනාකරණ කුසලතා සංවර්ධන වැඩසටහන්
- පාසල් කර්මාන්ත ව්‍යවසායකත්ව නව ජාතික වැඩසටහන
- ජාතික කර්මාන්ත විශිෂ්ටතා සම්මාන- 2023
- පාසල් ළමුන් සඳහා ජාතික මට්ටමේ තරඟ

- "Industry TV" (PEO TV 130 නාලිකාව)
- සුභාරතී ගුවන් විදුලි වැඩසටහන
- SEDA Start-up and Scale-up පුහුණු අත්පොත
- Industry-2023 ප්‍රදර්ශනයේ "One-stop-shop"
- කර්මාන්ත ණය යෝජනා ක්‍රමය

<u>තොරතුරු තාක්ෂණ ඒකකය</u>

- ඊ-වාණිජ්‍යය වෙබ් වේදිකා සංවර්ධනය, සමාජ මාධ්‍ය අලෙවිකරණය සහ යූ ටියුබ් අලෙවිකරණය සහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ගේ කාර්යක්ෂමතාවය උපරිම කිරීම සඳහා AI මෙවලම් පිළිබඳ ව්‍යවසායකයින් සඳහා ඩිජිටල් ප්‍රවේශ්‍යතා වැඩමුළු පැවැත්වීම.
- ව්‍යවසායකයින් සඳහා උසස් ඩිජිටල් අලෙවිකරණය පිළිබඳ TVEC ලියාපදිංචි කුසලතා වැඩිදියුණු කිරීමේ දින දහයක වැඩසටහනක් පැවැත්වීම.
- කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ගේ ව්‍යාපාර සඳහා ඩිජිටල් උපාය මාර්ගයක් ක්‍රියාත්මක කිරීම සඳහා ඔවුන් සමඟ තනි සහ කණ්ඩායම් වශයෙන් සාකච්ඡා පැවැත්වීම (one to one සහ one to many discussions)
- නිල වෙබ් අඩවියේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා වෙබ් පැතිකඩ සැකසීමට *zoom* සැසි පැවැත්වීම.
- කා.සං.ම. හි Zoom ගිණුම පරිපාලනය කිරීම. (රැස්වීම් කාලසටහන් සකස් කිරීම, පටිගත කිරීම් යැවීම සහ ගෙවීම් සකස් කිරීම)
- TSD සහ RDD විසින් සංවිධානය කරන ලද වැඩමුළු ප්‍රවර්ධනය කිරීම සඳහා *Facebook* හරහා සමාජ මාධ්‍ය ප්‍රචාරණ පැවැත්වීම.
- කා.සං.ම. හි සමාජ මාධ්‍ය ජාලය පරිපාලනය කිරීම. (Facebook Page, Facebook Group, Twitter, LinkedIn, YouTube channel ආදිය)
- නිල වෙබ් අඩවිය පරිපාලනය කිරීම. අදාළ උප පද්ධති සමඟ ඩිජිටල් One Stop Shop.
- මානව සම්පත් කළමනාකරණ පද්ධතිය, දුක්ගැනවිලි හැසිරවීමේ පද්ධතිය, රසායනාගාර කළමනාකරණ තොරතුරු පද්ධතිය සහ SAGE ගිණුම්කරණ පැකේජය වැනි අභ්‍යන්තර තොරතුරු පද්ධති සංවර්ධන සහ TEC ක්‍රියා පටිපාටිවලට සහභාගී වීම සහ සහයෝගයෙන් කටයුතු කිරීම.
- කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා රජයේ ඊ-වාණිජ්‍ය වේදිකාව වන 'Ceylon Plaza' පරිපාලනය කිරීම.
- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශයේ සම්බන්ධීකරණ කමිටුව නියෝජනය කරමින් කර්මාන්තයක් ලෙස තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය සක්‍රිය කිරීම සහ සංවර්ධනය කිරීම.
- FITIS සහ WIT වැනි ICT ආශ්‍රිත කර්මාන්ත සංගම් සමඟ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ගේ ප්‍රයෝජනය සඳහා අවබෝධතා ගිවිසුමකට එළඹීම.
- කර්මාන්තවල ඩිජිටල් පරිවර්තනය පිළිබඳ විස්තර කිරීම සඳහා කර්මාන්ත ප්‍රදර්ශන, රූපවාහිනී සාකච්ඡා සහ ගුවන් විදුලි වැඩසටහන් නියෝජනය කිරීම.
- කා.සං.ම. හි දෘඪාංග, මෘදුකාංග සහ ජාල ගැටළු විසඳීම.

<u>පුස්තකාලය සහ තොරතුරු කුටිය</u>

- ප්‍රකාශන අලෙවි කිරීම
- පුස්තකාල පොත් එකතුව වැඩිදියුණු කිරීම (සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි)
- මාර්ගගත දත්ත ගබඩාව තුළ කා.සං.ම. සේවාලාභීන් ලියාපදිංචි කිරීම
- කර්මාන්තකරුවන්, ගනුදෙනුකරුවන් සහ කා.සං.ම. කාර්ය මණ්ඩලය යනාදීන් වෙත කාර්මික තොරතුරු බෙදා හැරීම

- ග්‍රන්ථ නාමාවලි දත්ත, දේශීය යන්ත්‍රෝපකරණ සහ නිෂ්පාදන නිමැවුම්කරුවන්, වාර්තා, ශ්‍රී ලංකා ප්‍රමිති, ආධාරක ආයතන, පනත් පිළිබඳ දත්ත සමුදායන් නඩත්තු කිරීම සහ යාවත්කාලීන කිරීම .

<u>මුද්‍රණ ඒකකය</u>

- අත් පොත්, පැකේජ, පත්‍රිකා, දර්ශක සහ පුස්තිකා යනාදී ප්‍රකාශන සම්පාදනය සහ යාවත්කාලීන කිරීම.

## 4.3 අංශය මගින් පවත්වනු ලබන ප්‍රධාන වැඩසටහන්

### 4.3.1 SEDA අත්පොත දියත් කිරීම

වත්මන් සහ විභව ව්‍යවසායකයින්ට දැනුමක් සහ සහයෝගයක් ලබා දීමේ අරමුණ පෙරදැරිව තිරසාර ව්‍යවසායකත්ව සංවර්ධන ප්‍රවේශය (SEDA) අත්පොත සකස් කරන ලදී. ඒ අනුව, SEDA Start-up අත්පොත විභව හෝ නැගී එන ව්‍යවසායකයින්ට ඔවුන්ගේ කුසලතා, නව ව්‍යාපාර හැකියාවන් සහ අදහස් හඳුනා ගැනීමට මග සලසනු ලබයි. SEDA Scale-up අත්පොත දැනට සිටින ව්‍යවසායකයින්ට ඔවුන්ගේ ශක්තීන්, දුර්වලතා හඳුනා ගැනීමට සහ ඔවුන්ගේ ව්‍යාපාර ඊළඟ මට්ටමට වැඩිදියුණු කිරීමට මග පෙන්වයි. මෙම අත්පොත් සකස් කරන ලද්දේ ව්‍යවසායකත්ව සංවර්ධන අංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ, රංජිත් පද්මලාල් මහතා ඇතුළු කණ්ඩායම විසිනි.
2023 නොවැම්බර් 21 වැනි දින කර්මාන්ත හා සෞඛ්‍ය අමාත්‍ය ගරු වෛද්‍ය රමේෂ් පතිරණ මහතාගේ ප්‍රධානත්වයෙන් පොල්හේන්ගොඩ පිහිටි ජනමාධ්‍ය අමාත්‍යාංශයේ රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තු ශ්‍රවණාගාරයේ දී මෙම අත්පොත් එළිදැක්විණි.





### 4.3.2 කා.සං.ම. නිලධාරීන් සඳහා SEDA පිළිබඳ පුහුණුකරුවන් පුහුණු කිරීමේ (TOT) වැඩසටහන

SEDA Start-up සහ Scale-up අත්පොත් පිළිබඳ පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන 2023 දෙසැම්බර් 11 සිට 13 දක්වා කටුබැද්ද CEWAS හිදී පැවැත්විණි. කාර්මික සංවර්ධන මණ්ඩලයේ තෝරාගත් නිලධාරීන් හට SEDA පිළිබඳව පුහුණුව ලබා දුන් අතර අත්පොත තවදුරටත් වැඩිදියුණු කිරීම සඳහා යෝජනා ලබා ගැනීමට සාකච්ඡා පවත්වන ලදී.



### 4.3.3 පුහුණු වැඩසටහන්

කා.සං.ම. විසින් සිදුකරනු ලබන ක්‍රියාකාරකම් පිළිබඳව දැනුවත් කිරීම සඳහා 2023 නොවැම්බර් 18 දින නිලධාරීන් සඳහා සහ 2023 දෙසැම්බර් 08 දින කළමනාකරණ සහකාර නිලධාරීන් සඳහා වශයෙන් පුහුණු වැඩසටහන් දෙකක් පවත්වන ලදී. අප දෙපාර්තමේන්තුවේ ප්‍රවීණයන් විසින් මෙම වැඩසටහන මෙහෙයවන ලදී.



### 4.3.4 ජාතික කර්මාන්ත විශිෂ්ටතා සම්මාන උළෙල - 2023

කර්මාන්ත අමාත්‍යාංශය සහ කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් අපනයන නැඹුරු නිෂ්පාදන ආර්ථිකය යන තේමාව යටතේ "ජාතික කර්මාන්ත විශිෂ්ටතා සම්මාන උළෙල - 2023" අභිමානවත් ලෙස පවත්වන ලදී. මෙම ජාතික උත්සවය 2023 නොවැම්බර් මස 01 වැනි දින කොළඹ නෙළුම් පොකුණ රඟහලේ දී සවස 4:30 සිට 7:30 දක්වා පැවැත්විණි. මෙම අවස්ථාවට අතිගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා සහ කර්මාන්ත හා සෞඛ්‍ය අමාත්‍ය ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා ඇතුළු රාජ්‍ය අමාත්‍යවරු සහභාගී වූහ.

ශ්‍රී ලංකාවේ සියලුම දිස්ත්‍රික්ක නියෝජනය වන පරිදි ක්ෂුද්‍ර, කුඩා, මධ්‍ය සහ මහා පරිමාණ කාණ්ඩ වශයෙන් තැනැත්තන් සඳහා පුළුල් තක්සේරුවක් පවත්වන ලදී. මෙම ඇගයීම සඳහා ගෘහස්ථ කර්මාන්ත අංශය තුළ අංශ 21 ක් සහ උප අංශ 67 ක් ඇතුළත් විය.

ප්‍රාථමික අංශවල සහ උප අංශවල දක්ෂතා දැක්වූ පුද්ගලයන් 296 දෙනෙකු සඳහා ඇගයීම් ප්‍රදානය කෙරිණි. ක්ෂුද්‍ර, සුළු, මධ්‍ය සහ මහා පරිමාණ කාණ්ඩවලට අයත් සෑම අංශයකම සුවිශේෂී තැනැත්තන් සඳහා ප්ලැටිනම් සම්මාන 4ක් පිරිනැමීම කැපී පෙනුණි.

| | රන් | රිදී | ලෝකඩ | ප්ලැටිනම් | එකතුව |
|---|---|---|---|---|---|
| මහා | 17 | 15 | 12 | 1 | 45 |
| මධ්‍ය | 39 | 25 | 15 | 1 | 80 |
| කුඩා | 42 | 38 | 38 | 1 | 119 |
| ක්ෂුද්‍ර | 18 | 18 | 19 | 1 | 56 |
| එකතුව | 116 | 96 | 84 | 4 | 300 |

මෙම උත්සවයෙන් උපයාගත් රු.5,040,000.00ක ආදායම කර්මාන්ත සංවර්ධන අරමුදලට බැර කරන ලදී.






### 4.3.5 පාසල් කර්මාන්ත ව්‍යවසායකත්ව කවය ජාතික වැඩසටහන

කර්මාන්ත අමාත්‍යාංශය සහ ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය, අධ්‍යාපන අමාත්‍යාංශය හා එක්ව ව්‍යවසායක සංස්කෘතියක් ගොඩනැගීමේ සහ ජාතික නිෂ්පාදනයට සක්‍රියව හා ඵලදායී ලෙස දායක විය හැකි ශිෂ්‍ය පරම්පරාවක් සමාජගත කිරීම සඳහා පාසල් යොමු කිරීම තුළින් කර්මාන්ත හා නවෝත්පාදන ඇති කිරීමට අවශ්‍ය මානසිකත්වය රට තුළ ගොඩනැගීමේ අරමුණින් පාසල් කර්මාන්ත ව්‍යවසායකත්ව කව වැඩසටහන දියත් කරන ලදී.

මේ වන විට පාසල් කර්මාන්ත ව්‍යවසායකත්ව කව වැඩසටහන දිවයින පුරා පාසල් 257කට ආසන්න සංඛ්‍යාවක සාර්ථකව ක්‍රියාත්මක වන අතර පාසල් කර්මාන්ත ව්‍යවසායකත්ව කව 473 ක පාසල් සිසුන් 11,409 කට අධික පිරිසක් මෙම කටයුතුවල සක්‍රියව නියැලී සිටිති. මෙම වැඩසටහන සම්බන්ධයෙන් ගුරුවරුන් 814 දෙනෙකුට පමණ පුහුණුව ලබාදී ඇත.





### 4.3.6 පාසල් ළමුන් සඳහා ජාතික මට්ටමේ තරඟ

අධ්‍යාපන ආයතන සහ සමාජය තුළ පාසල් කර්මාන්ත ව්‍යවසායකත්ව කව වැඩසටහන පිළිබඳ අර්ථවත් සංවාදයක් ඇති කිරීම අරමුණු කරගනිමින් චිත්‍ර, රචනා, ගීත සහ කෙටි චිත්‍රපට ඇතුළත් බහුවිධ තරඟයක් සංවිධානය කරන ලදී.
චිත්‍ර, රචනා, ගීත සහ කෙටි චිත්‍රපට තරඟවල ජයග්‍රාහකයින් තෝරාගෙන ඇති අතර, පාසල් කර්මාන්ත ව්‍යවසායකත්ව කව වැඩසටහනේ නියමු පදක්කම සඳහා සුදුසුකම් ලත් සිසුන් හට පදක්කම් පිරිනැමීම සඳහා වෙන් කර ඇති ජාතික පදක්කම් ප්‍රදානෝත්සවයේදී සම්මාන බෙදාදීම සිදුකිරීමට අපේක්ෂා කෙරේ.

තවද, තරඟකරුවන්ගේ දායකත්වය ඇගයීම සහ රසාස්වාදනය උදෙසා වේදිකාවක් සැපයීම පිණිස සහභාගිවන්නන්ගේ නිර්මාණ ප්‍රදර්ශනය කෙරෙන තෙදින චිත්‍ර ප්‍රදර්ශනයක් 2024 මාර්තු මස පැවැත්වීමට නියමිතය.

### 4.3.7 "Industry TV" (PEO TV 130 නාලිකාව)

කර්මාන්ත අමාත්‍යාංශය, ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය සමඟ එක්ව, විද්‍යුත් මාධ්‍ය හරහා කාර්මික දැනුම සහ තොරතුරු ප්‍රවර්ධනය කිරීම කෙරෙහි කැපවූ රූපවාහිනී නාලිකාවක් වන "Industry TV" නාලිකාව දියත් කරන ලදී. මෙම නාලිකාවේ අරමුණු වන්නේ මහජන මතය හැඩගැස්වීම, කාර්මික නවෝත්පාදනයන් සඳහා දායක වීමට ග්‍රාමීය ප්‍රජාවන් සවිබල ගැන්වීම සහ එමගින් අපනයන නැඹුරු නිෂ්පාදන ආර්ථිකයක් සඳහා ජාතියේ පදනම ශක්තිමත් කිරීමයි. 2023 නොවැම්බර් 21 වන දින මෙම නාලිකාව නිල වශයෙන් සජීවීව විකාශය විය. එහි සමාරම්භක උත්සවය ජනමාධ්‍ය අමාත්‍යාංශයේ රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තු ශ්‍රවණාගාරයේ දී පැවැත්විණි. Peo TV හි නාලිකා අංක 130 ඔස්සේ බාල මහලු සියලුම වයස් කාණ්ඩවල පුරවැසියන් ඉලක්ක කරගනිමින් මෙය විකාශනය කරනු ලබයි. මේ වන විට Industry TV නාලිකාව හරහා විවිධ වැඩසටහන් විකාශනය කෙරේ.



### 4.3.8 සුභාරති ගුවන් විදුලි වැඩසටහන

සුභාරති ගුවන්විදුලි වැඩසටහන සෑම බදාදා දිනකම පෙරවරු 7.00 සිට පෙරවරු 9.00 දක්වා ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ ස්වදේශීය නාලිකාව ඔස්සේ විකාශය කෙරේ. සෑම වැඩසටහනක් සඳහාම කථිකයන් සහ මාතෘකා සම්බන්ධීකරණය කිරීම අප අංශය විසින් සිදු කෙරේ.

### 4.3.9 Industry-2023 ප්‍රදර්ශනයේ "One-stop-shop"

Industry - 2023 ප්‍රදර්ශනයේ (කොළඹ, යාපනය, මහනුවර සහ ගාල්ල) One-stop-shop සම්බන්ධීකරණය කිරීම සහ පැවැත්වීම අප අංශය විසින් සිදු කරන ලද අතර සේවාදායකයින් මුහුණ දෙන ගැටළු වලට අවශ්‍ය විසඳුම් ලබා දීම සඳහා සියලුම තොරතුරු අදාළ දිස්ත්‍රික්ක වෙත යොමු කරන ලදී.





### 4.3.10 කර්මාන්ත ණය යෝජනා ක්‍රමය


ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය ප්‍රාදේශීය සංවර්ධන බැංකුව සමඟ එක්ව කර්මාන්ත සංවර්ධන අරමුදල හරහා "කර්මාන්ත ණය" යෝජනා ක්‍රමය ආරම්භ කර ඇත. 2023 සැප්තැම්බර් 14 වැනි දින දෙපාර්ශවය (කා.සං.ම. සහ ප්‍රා.සං.බැං.) අතර ඇති කර ගත් අවබෝධතා ගිවිසුම මත පදනම්ව "කර්මාන්ත ණය" යෝජනා ක්‍රමය 2023 සැප්තැම්බර් 18 වැනි දින සිට ක්‍රියාත්මක වේ. 2023 වසර අවසන් වන විට "කර්මාන්ත ණය" යෝජනා ක්‍රමය යටතේ ව්‍යවසායකයින් 33 දෙනෙකුට ණය ලබා දී ඇත.

4.3.1 වගුව : කර්මාන්ත සංවර්ධන අරමුදල

| සාරාංශ වාර්තාව (රු.) | |
|---|---|
| අරමුදල් තැන්පතු **2023.09.15** | 10,000,000.00 |
| ඇප අරමුදල | (1,000,000.00) |
| | **9,000,000.00** |
| අරමුදල් තැන්පතු **2023.09.15** | 6,948,392.92 |
| ඇප අරමුදල | (694,839.30) |
| | 15,253,553.62 |
| ලබාදුන් ණය | 12,375,000.00 |
| පවතින ශේෂය | **2,878,553.62** |
| ඇප අරමුදල | **1,694,839.30** |

4.3.2 වගුව : අංශයේ වසර අවසාන ප්‍රගතිය - 2023

| ක්‍රියාකාරකම් අංකය | ක්‍රියාකාරකම | සමුච්චිත මූල්‍ය ප්‍රගතිය (රු.) |
|---|---|---|
| **1** | **කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා ඩිජිටල් ප්‍රවේශ්‍යතා ප්‍රායෝගික වැඩමුළු පැවැත්වීම - තොරතුරු තාක්ෂණ ඒකකය** | |
| **1.1** | සමාජ මාධ්‍ය අලෙවිකරණය, වෙබ් සංවර්ධනය සහ ඩ්‍රොප් ෂිපින් පිළිබඳ TVEC හි ලියාපදිංචි දින අටක වැඩමුළු පැවැත්වීම (Zoom තාක්ෂණය ඔස්සේ + පරිශ්‍රයේ දී) | 1,851,000 |
| **1.2** | සමාජ මාධ්‍ය අලෙවිකරණය, වෙබ් සංවර්ධනය සහ ඩිරෙක්ට් ෂිපින් පිළිබඳ TVEC හි ලියාපදිංචි දින අටක වැඩමුළු පැවැත්වීම (Zoom තාක්ෂණය ඔස්සේ + පරිශ්‍රයේ දී) | 861,000 |
| **1.3** | Zoom තාක්ෂණය ඔස්සේ අපගේ කලාපීය ජාලය හරහා දිවයින පුරා ව්‍යවසායකයින් සඳහා දින 8 ක ඩිජිටල් අලෙවිකරණ ප්‍රායෝගික වැඩසටහන පැවැත්වීම | 114,000 |
| **1.4** | මහවැලි අධිකාරිය සහ නැණසල මාර්ගගත විශ්වවිද්‍යාලය සමඟ එක්ව සමාජ මාධ්‍ය අලෙවිකරණය, Fiverr, ජංගම යෙදුම් සංවර්ධනය පිළිබඳව තරුණ තරුණියන් සඳහා ICT ආශ්‍රිත විවිධාංගීකරණය වූ වැඩමුළු පැවැත්වීම | 532,000 |
| **1.5** | ව්‍යවසායකයින්ගේ වීඩියෝ සාක්ෂි දත්ත ගබඩාව පවත්වාගෙන යාම (ප්‍රවර්ධන ක්‍රියාකාරකම්) | 49,600 |
| **1.6** | අපනයන ක්‍රියාපටිපාටිය පිළිබඳ ව්‍යවසායක දැනුම වැඩිදියුණු කිරීමේ වැඩමුළුව | 242,500 |
| | **තොරතුරු තාක්ෂණ ඒකකයේ එකතුව** | **3,650,100** |
| **2** | **විශේෂිත සේවා** | |
| **2.1** | තොරතුරු සැපයීම / බෙදා හැරීම | 369,315 |
| | **මුළු එකතුව** | **4,019,415** |




**4.1 ප්‍රස්තාරය : වාෂර්ක තත්‍ය ආදායම සංසන්දනය කිරීම (රු. මිලියන)**

## 5) ප්‍රාදේශීය සංවර්ධන අංශය

ප්‍රාදේශීය සංවර්ධන අංශය (RDD) විසින් ප්‍රාදේශීය කාර්ය මණ්ඩලය විසින් පවත්වනු ලබන සංවර්ධන වැඩසටහන් සහ ව්‍යාප්ති ක්‍රියාකාරකම් මෙහෙයවීම සහ අධීක්ෂණය කිරීම සිදු කරයි. අංශයේ ප්‍රධාන අරමුණ වන්නේ කර්මාන්තකරුවන්ට සහ ව්‍යවසායකයින්ට දිවයිනේ විවිධ ප්‍රදේශවල තම ව්‍යාපාර ආරම්භ කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා සහාය වීමයි. කාර්මික සංවර්ධන මණ්ඩලය යටතේ පවතින මෙම ප්‍රාදේශීය සංවර්ධන අංශය මණ්ඩලයෙහි ඉලක්ක සපුරා ගැනීම සඳහා දායකත්වය සපයාදීම පිණිස මූලික ක්ෂේත්‍ර 4ක් යටතේ ක්‍රියාත්මක වේ. දිස්ත්‍රික්ක 25හි කර්මාන්ත වල ආර්ථික තත්වය හඳුනා ගැනීම, නව කර්මාන්ත නිර්මාණය කිරීම, පවතින කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් ප්‍රවර්ධනය සහ සංවර්ධන කිරීම, ප්‍රාදේශීය සංවර්ධන අංශයේ කාර්යය මණ්ඩලයෙහි හා ප්‍රාදේශීය කාර්ය මණ්ඩලයෙහි හැකියා සංවර්ධනය කිරීම එම ක්‍රියාමාර්ග හතර වේ.

මීට අමතරව, ප්‍රාදේශීය කාර්මික ආර්ථික වාර්තා සකස් කිරීම, නව කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් ඇති කිරීම, ක්ෂුද්‍ර කර්මාන්ත පිහිටුවීම, පවතින කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් වැඩිදියුණු කිරීම, අපනයන සඳහා සූදානම් සමාගම් ලෙස සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් හඳුන්වාදීම සහ ප්‍රවර්ධනය කිරීම අංශය විසින් සිදු කරනු ලබන තවත් ප්‍රධාන ක්‍රියාකාරකම් කිහිපයකි.

### 5.1 2023 ක්‍රියාකාරී සැලැස්ම තුළ සාර්ථකත්වය

2023 වර්ෂය සඳහා වන ප්‍රාදේශීය සංවර්ධන අංශයේ ක්‍රියාකාරී සැලැස්ම දිස්ත්‍රික් කාර්යාල 25 ම මගින් ක්‍රියාත්මක කරන ලද අතර ශ්‍රී ලංකාවේ ආර්ථික අර්බුද අභියෝගයන්ට මුහුණ පාන අතරම, ලබා දී ඇති ඉලක්ක සපුරා ගනු ලැබේ.

ඒ අනුව, මෙම අංශයට අනුයුක්ත සියලුම නිලධාරීන්ගේ සහ කාර්ය මණ්ඩලයේ සහයෝගය ඇතිව වර්ෂය තුළ දී රුපියල් මිලියන 32.80ක ආදායමක් උපයා ගැනීමට ප්‍රාදේශීය සංවර්ධන අංශයට හැකි වී ඇත. අංශය විසින් සපුරා ගත් ඉලක්ක පහත පරිදි වේ.

**5.1 වගුව : අංශයේ කාර්ය සාධනය**

| අංකය | ප්‍රතිඵලය | ප්‍රධාන කාර්යසාධන දර්ශක | කාර්යසාධන දර්ශක | සමුච්චිත | |
|---|---|---|---|---|---|
| | | | | ඉලක්කය | ප්‍රගතිය |
| 1 | පිහිටවනු ලැබූ නව කර්මාන්ත (ආරම්භක) | පිහිටවනු ලැබූ නව කර්මාන්ත (ආරම්භක) සංඛ්‍යාව | කර්මාන්ත සංඛ්‍යාව | 420 | 204 |
| 2 | වැඩිදියුණු කරන ලද පවත්නා කර්මාන්ත | වැඩිදියුණු කරන ලද පවත්නා කර්මාන්ත සංඛ්‍යාව | කර්මාන්ත සංඛ්‍යාව | 700 | 465 |
| 3 | පිහිටවනු ලැබූ/ වැඩිදියුණු කරන ලද ක්ෂුද්‍ර කර්මාන්ත | පිහිටවනු ලැබූ/ වැඩිදියුණු කරන ලද ක්ෂුද්‍ර කර්මාන්ත සංඛ්‍යාව | කර්මාන්ත සංඛ්‍යාව | 850 | 793 |
| 4 | අපනයනය කිරීම සඳහා සූදානම් සමාගම් | වැඩිදියුණු කරන ලද කර්මාන්ත සංඛ්‍යාව | කර්මාන්ත සංඛ්‍යාව | 50 | 31 |

## 5.2 අංශය විසින් සිදු කරන ලද විශේෂ සිදුවීම්

- **ජාතික කර්මාන්ත ප්‍රදර්ශනය – 2023**

කර්මාන්ත අමාත්‍යාංශයේ මගපෙන්වීම යටතේ, ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය (IDB) විසින් ශ්‍රී ලංකාවේ කර්මාන්ත ප්‍රවර්ධනය, දිරිගැන්වීම සහ සංවර්ධනය කිරීම සඳහා මුල පිරීම් බොහොමයක් සිදු කර ඇත. මේ සඳහා වෙහෙසෙමින්, 2023 ජුනි 22 සිට 25 දක්වා BMICH හිදී National Industry Exhibition – 2023 සංවිධානය කරන ලදී. ශ්‍රී ලාංකේය නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම සඳහා දින හතරක් පුරාවට ආසන්න වශයෙන් ප්‍රදර්ශන කුටි 700 කින් සමන්විත මෙම ප්‍රදර්ශනය උත්සවාකාරයෙන් පැවැත්විණි. ශ්‍රී ලාංකේය නිෂ්පාදන විශේෂයෙන් ආහාර අංශයේ නිෂ්පාදන, ඇඳුම් සහ ඇඟලුම් අංශය, යන්ත්‍රෝපකරණ සහ බෝට්ටු, සම් සහ පාවහන් අංශය, ඖෂධ ක්ෂේත්‍රය ප්‍රදර්ශනයේ කැපී පෙනුන ප්‍රධානතම අංශයන් විය. ප්‍රදර්ශන කුටි වලට අමතරව, නවෝත්පාදන අංගනය සහ මැණික් සහ ස්වර්ණාභරණ මණ්ඩපය මෙම සුවිශාල ප්‍රදර්ශනයට නව වර්ණයක් එක් කර ඇත.




- **යාපනය කර්මාන්ත ප්‍රදර්ශනය - Jaffna Edition 2023**

BMICH හි සාර්ථක ලෙස පැවැත්වූ ජාතික කර්මාන්ත ප්‍රදර්ශනයෙන් පසුව, ප්‍රාදේශීය වශයෙන් අඛණ්ඩව ප්‍රදර්ශන පැවැත්වීමට කා.සං.ම. කළමනාකාරිත්වය තීරණය කරන ලදී. ඒ අනුව යාපනය කර්මාන්ත ප්‍රදර්ශනය 2023 සැප්තැම්බර් මස 1 සිට 3 දක්වා යාපනය සංස්කෘතික මධ්‍යස්ථානයේ දී පැවැත්විණි. එය දේශීය කර්මාන්තකරුවන්ට නවමු අත්දැකීමක් වූ අතර, විශේෂයෙන්ම උතුරු පළාත තුළ තම නිෂ්පාදන ප්‍රචලිත කිරීමේ අගනා අවස්ථාවක් ඔවුන්ට හිමි විය. ආසන්න වශයෙන් ප්‍රදර්ශන කුටි 300 කින් සමන්විතව උත්කර්ශවත් උත්සවයක් ලෙස මෙම ප්‍රදර්ශනය පැවැත්විණි. යන්ත්‍රෝපකරණ, තාක්‍ෂණය, අමුද්‍රව්‍ය සහ ව්‍යාපාර සංවර්ධන සේවාවන්හි දේශීය කර්මාන්තයේ විශිෂ්ටත්වය මෙහිදී ප්‍රදර්ශනය කරන ලද අතර වඩාත් වැදගත් ලෙස ප්‍රතිපත්ති සම්පාදකයින් මෙන්ම අනෙකුත් රාජ්‍ය සහාය සේවා ඇතුළු නිසි පාර්ශ්වකරුවන් සමඟ සබඳතා ඇති කර ගැනීමට කදිම වේදිකාවක් නිර්මාණය කරන ලදී. සියලුම ශ්‍රී ලාංකේය කර්මාන්තවල හැකියාවන් සහ ධාරිතාවන් පුළුල් කිරීමේ චේතනාවෙන් මෙම උත්සවය සැලසුම් කර ඇති අතර, මෙම උත්සවයේදී එය ඵලදායී ලෙස සපුරා ගන්නා ලදී.



- නුවර කර්මාන්ත ප්‍රදර්ශනය – **Kandy Edition 2023**

නුවර කර්මාන්ත ප්‍රදර්ශනය 2023 ඔක්තෝබර් 6 සිට 8 දක්වා බෝගම්බර පැරණි බන්ධනාගාර පරිශ්‍රයේ දී පැවැත්විණි. ප්‍රදර්ශන කුටි 300කින් පමණ සමන්විතව අති උත්කර්ෂවත් ලෙස මෙය පැවැත්විණි. කර්මාන්ත අමාත්‍ය ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා ඇතුළු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සහ ආරාධිතයන් රැසක් මෙම උත්කර්ෂවත් අවස්ථාවට එක්ව සිටියහ. මෙම ප්‍රදර්ශනය One Stop Shop වැඩසටහන සහ පාසල් ව්‍යවසායකත්ව කව චිත්‍ර තරඟ ඉසව් වලින් විචිත්‍රවත් විය.



- ගාල්ල කර්මාන්ත ප්‍රදර්ශනය – **Galle Edition 2023**

ගාල්ල කර්මාන්ත ප්‍රදර්ශනය 2023 යනු අපනයන ඉලක්ක කරගත් නිෂ්පාදන ආර්ථිකයක් සවිබල ගැන්වීමේ අරමුණින් කර්මාන්ත අමාත්‍යාංශය සහ ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය එක්ව සංවිධානය කරන ලද ගාල්ල කර්මාන්ත ප්‍රදර්ශනය වේ. දකුණු පළාත් කර්මාන්ත ප්‍රදර්ශනය සඳහා ශ්‍රී ලංකාවේ කර්මාන්ත අංශ 20 කට අයත් ප්‍රදර්ශන කුටි 300 කට අධික සංඛ්‍යාවක නවෝත්පාදන සහ නව තාක්ෂණයන් අන්තර්ගත කර ඇත. නව කර්මාන්ත වලට මෙන්ම දකුණු පළාතට අනන්‍ය වූ කර්මාන්ත රැසකට මෙම ප්‍රදර්ශනය හරහා තම නිෂ්පාදන අලෙවි කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා මහඟු අවස්ථාවක් හිමි විය.







- දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ රැස්වීම

කර්මාන්ත අමාත්‍යාංශයේ මගපෙන්වීම යටතේ ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ දිස්ත්‍රික් කාර්යාල හරහා සිදු කළ හැකි කර්මාන්ත සංවර්ධන කිරීමේ කටයුතු පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ රැස්වීම් දිස්ත්‍රික් වශයෙන් සංවිධානය කරන ලදී. මෙය කර්මාන්තකරුවාට, විශේෂයෙන්ම දුර්වල කර්මාන්තවලට වෙළෙඳපොළ ශක්‍යතා අවබෝධ කර ගැනීමට සහ ඔවුන්ගේ ව්‍යාපාර ඉහළ මට්ටමට දියුණු කර ගැනීමට මහඟු සහායක් වී ඇත.




5.2 වගුව : වසර අවසාන ප්‍රගතිය - 2023

| ක්‍රියාකාරකම | සමුච්චිත භෞතික ප්‍රගතිය |
|---|---|
| **1. නව කර්මාන්ත පිහිටුවීම (ආරම්භක) - *(One to One)*** | |
| විභව ව්‍යවසායකයින් හඳුනා ගැනීම | 1,503 |
| පාරිසරික සහාය සබල කිරීම (යටිතල පහසුකම් සහ උපයෝගිතා ආශ්‍රිත) | 87 |
| අලෙවිකරණ සහාය ලබා දීම | 98 |
| ඉංජිනේරු සහ තාක්ෂණික සහාය ලබා දීම | 884 |
| කළමනාකරණ සහය ලබා දීම | 192 |
| මූල්‍ය පහසුකම් ලබා ගැනීම සඳහා සම්බන්ධීකරණය (ණය / ප්‍රදාන සහ ආශ්‍රිත) | 30 |
| **2. පවතින කර්මාන්ත සඳහා ව්‍යාපාර වැඩිදියුණු කිරීමේ වැඩසටහන් - *(One to One)*** | |
| පවතින කර්මාන්ත හඳුනා ගැනීම | 828 |
| පාරිසරික සහාය සබල කිරීම (යටිතල පහසුකම් සහ උපයෝගිතා ආශ්‍රිත) | 238 |
| අලෙවිකරණ සංවර්ධන සහාය ලබා දීම | 677 |
| ඉංජිනේරු සහ තාක්ෂණ සංවර්ධන සහාය ලබා දීම | 397 |
| කළමනාකරණ සංවර්ධන සහාය ලබා දීම | 203 |
| මූල්‍ය පහසුකම් ලබා ගැනීම සඳහා සම්බන්ධීකරණය (ණය / ප්‍රදාන සහ ආශ්‍රිත) | 85 |
| **3. ක්ෂුද්‍ර කර්මාන්ත ආරම්භ කිරීම / වැඩිදියුණු කිරීම - *(One to One)*** | |
| ක්ෂුද්‍ර කර්මාන්ත හඳුනා ගැනීම | 4,063 |
| පාරිසරික සහාය සබල කිරීම (යටිතල පහසුකම් සහ උපයෝගිතා ආශ්‍රිත) | 179 |
| අලෙවිකරණ සහාය ලබා දීම | 493 |
| ඉංජිනේරු සහ තාක්ෂණික සහාය ලබා දීම | 1,413 |
| කළමනාකරණ සහය ලබා දීම | 645 |
| මූල්‍ය පහසුකම් ලබා ගැනීම සඳහා සම්බන්ධීකරණය (ණය / ප්‍රදාන සහ ආශ්‍රිත) | 150 |
| **4. අපනයන සූදානම් සමාගම් - *(One to One)*** | |
| අපනයනය කිරීම සඳහා සූදානම් කර්මාන්ත හඳුනා ගැනීම | 51 |
| පාරිසරික සහාය සබල කිරීම (යටිතල පහසුකම් සහ උපයෝගිතා ආශ්‍රිත) | 3 |
| ගෝලීය වෙළෙඳපොළ වෙත ප්‍රවේශ වීම සඳහා අලෙවිකරණ සහාය ලබා දීම | 37 |
| ඉංජිනේරු සහ තාක්ෂණ සංවර්ධන සහාය ලබා දීම | 41 |
| කළමනාකරණ සංවර්ධන සහාය ලබා දීම | 8 |
| මූල්‍ය පහසුකම් ලබා ගැනීම සඳහා සම්බන්ධීකරණය (ණය / ප්‍රදාන සහ ආශ්‍රිත) | 3 |
| **5. පුහුණු වැඩසටහන් - *(කණ්ඩායම් ලෙස)*** | |
| අංශ වලට සම්පාත වන තාක්ෂණික පුහුණු වැඩසටහන් පැවැත්වීම (රසායනික අංශය, ගොඩනැගිලි ද්‍රව්‍ය, තෙල් සහ කෙඳි, ආහාර අංශය සහ තාක්ෂණයට අදාළ අනෙකුත්) | 763 (සංඛ්‍යාව)<br>16,784 (ප්‍රතිලාභීන්) |
| ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු වැඩසටහන් (අලෙවිකරණය, මූල්‍ය, කළමනාකරණය, ධාරිතා ගොඩනැගීම සහ තාක්ෂණික නොවන ව්‍යවසායකත්ව සංවර්ධනයට අදාළ අනෙකුත්) | 360 (සංඛ්‍යාව)<br>12,692 (ප්‍රතිලාභීන්) |
| කාන්තා ව්‍යවසායකත්ව සංවර්ධන (WED) පුහුණු පැවැත්වීම | 38 (සංඛ්‍යාව)<br>1,984 (ප්‍රතිලාභීන්) |
| තාක්ෂණය සමඟ සම්පාත වන විශේෂ පුහුණු වැඩසටහන් (සමෘද්ධි, ත්‍රිවිල් රියදුරු - ව්‍යාපාර තාක්ෂණය, රණවිරු) | 46 (සංඛ්‍යාව)<br>1,361 (ප්‍රතිලාභීන්) |

| ක්‍රියාකාරකම | | සමුච්චිත භෞතික ප්‍රගතිය |
|---|---|---|
| **6. වෙළඳපල ප්‍රවේශය සහ වෙනත් විශේෂ වැඩසටහන්/සේවා** | | |
| කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සායන පැවැත්වීම | 8 (සංඛ්‍යාව) | |
| | 297 (ප්‍රතිලාභීන්) | |
| පළාත් මට්ටමින් ප්‍රදර්ශන පැවැත්වීම | 33 | |
| ව්‍යවසායක කව පිහිටුවීමට සහාය වීම | 172 (සංඛ්‍යාව) | |
| | 7,995 (ප්‍රතිලාභීන්) | |
| කා.සං.ම. හි "ඉඩම් බැංකු" සංකල්පය ස්ථාපිත කිරීම සඳහා සහාය වීම | 3 (සංඛ්‍යාව) | |
| | 48 (ප්‍රතිලාභීන්) | |
| පසු විපරම් සහාය ලබා දීම | 565 | |
| **7. ආදායම් උත්පාදන සේවා** | | |
| වෙනත් විශේෂ සේවා / වැඩසටහන් (උදා: මහවැලි සහ ආශ්‍රිත ව්‍යාපෘති) | | 42 |
| කිතුල් මදින්නන් සඳහා කැස්පර් බෝතල් විකිණීම | | 3,718 |
| ලෝහ පදනම් වූ අමුද්‍රව්‍ය බෙදා හැරීම | | 793 |
| ව්‍යාපෘති වාර්තාව සකස් කිරීම | | 52 |
| අරමුදල් අරමුණු සඳහා ව්‍යාපෘති යෝජනා සම්පාදනය කිරීම | | 8 |

5.3 වගුව : වාර්ෂික ආදායම සංසන්දනය කිරීම

| වර්ෂය | සත්‍ය ආදායම (රු.මි.) |
|---|---|
| 2019 | 12.46 |
| 2020 | 15.76 |
| 2021 | 9.88 |
| 2022 | 22.04 |
| 2023 | 32.80 |



## 6) සැලසුම් අංශය

කා.සං.ම. හි ක්‍රියාකාරී අංශ මගින් සිදු කරනු ලබන ක්‍රියාකාරකම්වල ප්‍රගතිය අධීක්ෂණය කිරීම සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ අමාත්‍යාංශයේ දැනගැනීම සඳහා වරින් වර ප්‍රගති වාර්තා ඉදිරිපත් කිරීමේ සමස්ත වගකීම සැලසුම් අංශය සතු වේ. තවද, ආයතනික උපායමාර්ගික සැලැස්ම සැලසුම් කිරීම සහ සකස් කිරීම සහ භෞතික හා මූල්‍ය ඉලක්ක අනුව අංශවල ක්‍රියාකාරකම්වල ප්‍රගතිය ඇගයීම මෙම අංශයට පැවරී ඇති ප්‍රධාන ක්‍රියාකාරකම් කිහිපයකි. සමාලෝචිත වර්ෂය තුළ එම වගකීම් අඛණ්ඩව ඉටු කරන ලදී. මීට අමතරව, රේඛීය අමාත්‍යාංශයේ අවශ්‍යතා අනුව, මණ්ඩලයේ කාර්ය සාධන ඇගයීම්වලට අදාළ තොරතුරු වරින් වර ලබා දෙන ලදී.

### 6.1 අංශය විසින් පවත්වනු ලබන විශේෂ ව්‍යාපෘති

#### 6.1.1 කර්මාන්ත ආශ්‍රිත සංඛ්‍යාලේඛන පැවැත්වීම සඳහා පහසුකම් සැලසීම සහ අදාළ අංශයේ සංවර්ධන සැලසුම් සකස් කිරීමට සහාය වීම

6.1 වගුව : අංශ වර්ගීකරණය

| අංකය | අංශයේ නම | කෙටි නම (Ceylon Industry Hub Platform හි සඳහන් නම - CIH නම) |
|---|---|---|
| 1 | ආහාර පාන | ආහාර පාන |
| 2 | සැලසුම්, ඇසුරුම්කරණය සහ කඩදාසි ආශ්‍රිත කර්මාන්ත | සැලසුම් සහ ඇසුරුම් |
| 3 | කුළුබඩු ආශ්‍රිත කර්මාන්ත | කුළුබඩු සහ ඖෂධ |
| 4 | පොල්, කිතුල් සහ තල් ආශ්‍රිත නිෂ්පාදන සහ කෙඳි ආශ්‍රිත කර්මාන්ත | පොල්, කිතුල්, තල් සහ කෙඳි |
| 5 | තේ, අගය එකතු කළ තේ සහ ඒ ආශ්‍රිත කර්මාන්ත | ලංකා තේ |
| 6 | පාවහන්, සම්, සම් නිෂ්පාදන සහ ඒ ආශ්‍රිත කර්මාන්ත | පාවහන් සහ සම් |
| 7 | රබර්, ප්ලාස්ටික් සහ ඒ ආශ්‍රිත කර්මාන්ත | රබර් සහ ප්ලාස්ටික් |
| 8 | ලෝහ, මුද්‍රා සහ අච්චු යන්ත්‍රෝපකරණ මෙවලම් සහ අනුබද්ධ කර්මාන්ත | ලෝහ වැඩ සහ යන්ත්‍ර-මෙවලම් |
| 9 | දැව, දැව ආශ්‍රිත කර්මාන්ත සහ ගෘහ භාණ්ඩ කර්මාන්ත | ලී සහ ගෘහ භාණ්ඩ |
| 10 | වාහන, වාහන එකලස් කිරීම සහ වාහන ආශ්‍රිත කර්මාන්ත | මෝටර් රථ සහ වාහන අමතර කොටස් |
| 11 | විදුලි හා ඉලෙක්ට්‍රොනික උපකරණ සහ ඒ ආශ්‍රිත කර්මාන්ත | විදුලි සහ ඉලෙක්ට්‍රොනික |
| 12 | බටහිර, දේශීය ආයුර්වේද සහ අනෙකුත් ඖෂධ සහ ඒ ආශ්‍රිත කර්මාන්ත | ඖෂධ සහ ආයුර්වේදය |

| අංකය | අංශයේ නම | කෙටි නම (Ceylon Industry Hub Platform හි සඳහන් නම - CIH නම) |
|---|---|---|
| 13 | ඉදිකිරීම්, ග්‍රැනයිට්, උළු, මැටි භාණ්ඩ, පිඟන් භාණ්ඩ සහ අලංකරණ ආශ්‍රිත කර්මාන්ත | ඉදිකිරීම් සහ අලංකරණය |
| 14 | සමුද්‍රීය සහ නාවික ආශ්‍රිත කර්මාන්ත | සමුද්‍රීය සහ නාවික |
| 15 | මුද්‍රණ, ප්‍රකාශන ද්‍රව්‍ය සහ ඒ ආශ්‍රිත කර්මාන්ත | මුද්‍රණ සහ ප්‍රකාශන |
| 16 | රූපලාවණ්‍ය හා ඒ ආශ්‍රිත කර්මාන්ත | ආලේපන සහ රූපලාවන්‍ය සත්කාර |
| 17 | මැණික් හා ස්වර්ණාභරණ ආශ්‍රිත කර්මාන්ත | මැණික් හා ස්වර්ණාභරණ |
| 18 | ඛනිජ සහ පතල් ආශ්‍රිත කර්මාන්ත | ඛනිජ සහ පතල් කර්මාන්තය |
| 19 | ඇඟලුම්, රෙදිපිළි සහ ඒ ආශ්‍රිත කර්මාන්ත | ඇඟලුම් සහ රෙදිපිළි |
| 20 | රසායනික, බලශක්ති සහ අනුබද්ධ කර්මාන්ත | රසායනික සහ බලශක්ති |
| 21 | ICT සහ උසස් තාක්ෂණ සේවා | ICT |
| 22 | අත්කම් කර්මාන්තය | අත්කම් |
| 23 | කෘෂි පාදක කර්මාන්තය | කෘෂි පාදක |
| 24 | සේවා කර්මාන්තය | සේවා |
| 25 | වෙනත් කර්මාන්ත | වෙනත් |

### 6.1.2 "Industry Ceylon" සඟරාව




පවතින ආර්ථික අර්බුදය හමුවේ, කර්මාන්ත ක්ෂේත්‍රයේ ශීඝ්‍ර ප්‍රවර්ධනය සහ දේශීය හා විදේශීය වෙළෙඳපොළ ජයගත හැකි කර්මාන්ත ප්‍රජාවක් බිහි කිරීම ශ්‍රී ලාංකික ජනතාව වෙනුවෙන් සෞභාග්‍යමත් ජීවන තත්ත්වයක් උදා කිරීම පිණිස අත්‍යවශ්‍ය සාධක ලෙස හඳුනාගෙන තිබේ. ඒ අනුව "අපනයන නැඹුරු නිෂ්පාදන ආර්ථිකයක් කරා" යන තේමාව යටතේ ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය ඉදිරි වසර කිහිපය තුළ කාර්මික අංශයේ දියුණුව සඳහා වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

ඒ අනුව එහි එක් පියවරක් ලෙස "Industry Ceylon" නමින් කර්මාන්ත සඟරාවක් කාර්තුමය වශයෙන් ප්‍රකාශයට පත් කිරීමට කටයුතු යොදා ඇත. මෙම සඟරාවේ අරමුණ වන්නේ අපගේ පාර්ශවකරුවන්හට වටිනා දැනුම, කර්මාන්ත පිළිබඳ යාවත්කාලීන තොරතුරු සහ අවස්ථා ලබා දීමයි. එය ශ්‍රී ලංකාවේ කාර්මික අංශයේ ජයග්‍රහණ, නවෝත්පාදන සහ හැකියාවන් ප්‍රදර්ශනය කිරීමේ වේදිකාවක් ලෙස කටයුතු කරනු ඇත. මෙම සඟරාව ප්‍රකාශයට පත් කිරීම මගින්, විචිත්‍රවත් කාර්මික පරිසර පද්ධතියක් පෝෂණය කිරීම සහ විවිධ පාර්ශ්වකරුවන් අතර සහයෝගීතාව සඳහා පහසුකම් සැලසීම අරමුණු කෙරේ.

### 6.1.3 ආහාර සැකසුම් කර්මාන්ත ඇතුළත ගෘහස්ථ පර්යේෂණ සහ සංවර්ධන ඒකක *(In-House R & D Units)* පිහිටුවීම ප්‍රවර්ධනය කිරීම සහ පහසුකම් සැලසීම.

දේශීය ආහාර කර්මාන්ත සංවර්ධනය කිරීමේ අරමුණින් ශ්‍රී ලංකාව තුළ නිර්මාණාත්මක පර්යේෂණ සහ සංවර්ධන සංස්කෘතියක් ගොඩනැගීමේ ව්‍යාපෘතියක් කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් ආරම්භ කරන ලදී. මෙම ව්‍යාපෘතිය යටතේ සියලුම පර්යේෂණ ආයතන සහ තනි පුද්ගල පර්යේෂකයන්ට තම පර්යේෂණ යන්හි සොයාගැනීම් 2023 ජාතික කර්මාන්ත ප්‍රදර්ශනයේ "නව නිපැයුම් මණ්ඩපයෙහි" ප්‍රදර්ශනය කිරීමට අවස්ථාවක් ලබා දෙන ලදී. තවද, ප්‍රදර්ශන කාලය තුළ පැවති නව නිපැයුම්කරු - ආයෝජක සංසදයේදී ඔවුන්ගේ පර්යේෂණ විභව ආයෝජකයින් වෙත ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන ලදී. තෝරාගත් ප්‍රමුඛ පෙළේ ආහාර කර්මාන්ත සඳහා ඔවුන්ගේ කර්මාන්ත ඇතුළත පර්යේෂණ සහ සංවර්ධන ඒකක පිහිටුවීම සහ නඩත්තු කිරීම පිළිබඳ පුහුණුව ලබා දෙන ලදී.

### 6.1.4 ජා-ඇල, ඒකල කාර්මික ජනපදයේ නිෂ්පාදන කර්මාන්තවල බලශක්ති කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමේ නියමු ව්‍යාපෘතිය - 2022/2023

**කාර්මික සංවර්ධන මණ්ඩලය (IDB)** 2022 ජූනි මාසයේදී USAID - S/L බලශක්ති වැඩසටහනේ සහයෝගිතාවයෙන් **ජා-ඇල - ඒකල කාර්මික ජනපදයේ කර්මාන්තවල බලශක්ති කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමේ නියමු ව්‍යාපෘතිය** ආරම්භ කළ අතර එය 2023 නොවැම්බර් 16 වන දින සාර්ථකව නිම කරන ලදී.

ඉහත ව්‍යාපෘතිය සඳහා ඉල්ලුම් කළ සමාගම් 19 අතරින්, බලශක්ති කාර්යක්ෂමතාව සඳහා ඔවුන්ගේ හැකියාවන් සහ යෝජිත බලශක්ති කාර්යක්ෂමතා විසඳුම් ක්‍රියාත්මක කිරීමට එම සමාගම්වලට ඇති හැකියාව මත පදනම්ව, එය ක්‍රියාත්මක කිරීම සඳහා **Finagle Lanka (Pvt) Ltd** සහ **Michelin Lanka (Pvt) Ltd** තෝරාගෙන ඇත. **Michelin Lanka - රෝද නිෂ්පාදන අංශය,** ද්‍රව්‍ය හැසිරවීම, ඉදිකිරීම්, කෘෂිකර්මාන්තය සහ ක්‍රීඩා සහ ජවසම්පන්න ආශ්‍රිත කර්මාන්ත (power sports) කර්මාන්ත සඳහා රළු මාර්ග සඳහා උචිත ටයර් (off-road tires), රෝද, රබර් පීලි සහ ධාවන පථ නිෂ්පාදනය කිරීම සඳහා විශේෂත්වයක් දක්වන අතර **Finagle Lanka (Pvt) Ltd** යනු ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම කාර්මික බේකරි නිෂ්පාදන නිෂ්පාදකයෙකි. ඒ අනුව, USAID SL Energy වැඩසටහන, IDB සහ ඉහත සඳහන් කළ කර්මාන්ත අතර ත්‍රෛපාර්ශ්වික අවබෝධතා ගිවිසුමක් (MoU) 2023 මැයි 18 වන දින කටුබැද්ද, කාර්මික සංවර්ධන මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය රැස්වන ශාලාවේ දී අත්සන් කරන ලදී. අවබෝධතා ගිවිසුමට අනුව, ව්‍යාපෘතිය යටතේ පවත්වනු ලබන විස්තිරණ බලශක්ති විගණනයන් මගින් ලබාගත් විදුලි කාර්යක්ෂමතා විකල්ප වැඩිදියුණු කිරීම සඳහා නොමිලේ තාක්ෂණික උපදේශන සේවා ලබාදීමෙන් තෝරාගත් කර්මාන්ත ප්‍රතිලාභ ලබා ඇත.


### 6.1.5 ශ්‍රී ලංකාවේ කර්මාන්තවල දේශගුණික ප්‍රතිචාරය වේගවත් කිරීම


ව්‍යාපෘතියේ සමස්ත අරමුණ වන්නේ කාර්මික අංශය තුළ ශ්‍රී ලංකාවේ ජාතිකව නිර්ණය කළ දායකත්ව (NDC) ක්‍රියාත්මක කිරීමට සහාය වීම තුළින් දේශගුණික විපර්යාස අවම කිරීම සඳහා දායක වීමයි. දේශගුණික විපර්යාසවලට ප්‍රතිචාර දැක්වීමට ලෝකයේ වඩාත්ම අවදානමට ලක්විය හැකි රටවලට සහාය වීම අරමුණු කරගත් EU GCCA + මුලපිරීමේ සහාය ඇතිව ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ. "කර්මාන්ත ක්‍රියාකාරී කණ්ඩායම" (Industry working group) ක්‍රියාකාරකම් ක්‍රියාවට නැංවීමට නායකත්වය දෙනු ඇත, EO4 යටතේ: කර්මාන්ත ක්ෂේත්‍රයේ දේශගුණික විපර්යාස අවම කිරීමේ පිළිවෙත්වලට අදාළ ධාරිතාව

ගොඩනැගීම සහ EO5: වැඩි දියුණු කරන ලද බලශක්ති කාර්යක්ෂමතාව සහ GHG විමෝචනය අඩු කිරීමට තුඩු දෙන නියමු තාක්ෂණයන් සහ ක්‍රමවේදයන් ප්‍රතිනිර්මාණය කිරීමට පරීක්ෂා කරනු ලැබේ.

### 6.1.6 කර්මාන්ත ලියාපදිංචි කිරීමේ සහතික, ව්‍යවසායක හැඳුනුම්පත සහ මෝටර් රථ අවසර පත්‍රයක් පිරිනැමීම මගින් ව්‍යවසායකයින් ඇගයීමට ලක් කරන අතරම පිළිගැනීමක් ගොඩනැගීම.

වර්තමාන සමාජය විසින් ව්‍යවසායකත්වය කෙරෙහි අවම අවධානයක් යොමු කරනු ලබන බැවින් සීමිත පුද්ගලයින් සංඛ්‍යාවක් මෙම ක්ෂේත්‍රයට සහභාගී වේ. ව්‍යවසායකත්වය මගින් විශාල පරිමාණයේ රැකියා සහ ආදායම් උත්පාදන මාර්ග සැපයීමට පමණක් නොව, පුද්ගල ජීවිතයේ ගුණාත්මක භාවය වැඩිදියුණු කිරීමට ද එයට හැකියාව ඇත. මෙරට ව්‍යවසායකයන්ගේ ප්‍රතිශතය ඉහළ නැංවීම සඳහා, ඔවුන් දිරිමත් කිරීම, අගය කිරීම සහ සමාජයේ උසස් තත්වයක් සහ පිළිගැනීමක් ලබා දීම මගින් ආර්ථික වර්ධනයේ ප්‍රධාන ධාවකයක් වශයෙන් ව්‍යවසායකත්වය නිරන්තර සම්මානයට පාත්‍ර කළ යුතුය. එබැවින් ලියාපදිංචි සහතිකයන්, ව්‍යවසායක හැඳුනුම්පතක් සහ මෝටර් රථ අවසර පත්‍රයක් ලබා දීමෙන් ව්‍යවසායකයින් සඳහා පිළිගැනීමක් ලබාදීමට මණ්ඩලය පියවර ගෙන ඇත.






### 6.1.7 අංශය විසින් සිදු කරනු ලබන උප ක්‍රියාකාරකම්

- අරමුදල් ලබා ගැනීම සඳහා කා.සං.ම. හි අයවැය යෝජනා අමාත්‍යාංශයට ඉදිරිපත් කිරීම.
- ඉදිරි වර්ෂය සඳහා ආයතනික අයවැය සහ සමස්ත ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව ප්‍රාග්ධන අයවැය සහ පුනරාවර්තන වියදම් අවශ්‍යතා සකස් කිරීමට පහසුකම් සැලසීම.
- කා.සං.ම. සඳහා ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම.
- වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම.
- වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළිබඳ මාසික කාර්තුමය සහ වාර්ෂික ප්‍රගති වාර්තා සකස් කිරීම.
- මාසික ප්‍රගති සමාලෝචන රැස්වීම් සංවිධානය කිරීම.
- වාර්ෂික වාර්තාව (2022) සකස් කිරීම.
- කා.සං.ම. හි අනිවාර්ය අරමුණු වලට අනුකූලව ප්‍රතිපත්ති සහ උපාය මාර්ග සම්පාදනය කිරීම.
- විදේශ අරමුදල් සඳහා සංවර්ධන ව්‍යාපෘති යෝජනා සහ සංකල්ප පත්‍රිකා සකස් කිරීම.
- පවතින කර්මාන්ත ආශ්‍රිත ප්‍රතිපත්ති සම්පාදන කමිටු සඳහා කා.සං.ම. සහභාගීත්වය සහතික කිරීම සහ අවශ්‍ය විටෙක ප්‍රතිපත්ති පත්‍රිකා සකස් කිරීම.
- එක් එක් මූල්‍ය වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තා.
- අමාත්‍යාංශයේ ක්‍රියාකාරකම් පිළිබඳ කාර්තුමය සමාලෝචනය භාෂාත්‍රයෙන්ම සිදුකිරීම.

## 7) තාක්ෂණික සේවා අංශය (TSD)

තාක්ෂණික සේවා අංශය කා.සං.ම. හි ප්‍රධාන අංශයක් වන අතර, ශ්‍රී ලංකාවේ සමස්ත කාර්මික ප්‍රජාව ඇතුළු අනාගත ව්‍යවසායකයින්ට කර්මාන්තයේ ව්‍යාප්තිය, නවීකරණය, විවිධාංගීකරණය සහ ඵලදායිතා වැඩිදියුණු කිරීම් සඳහා අවශ්‍ය තාක්ෂණික සහාය සපයයි. ඊට අමතරව ව්‍යවසායකයින්ගේ අවශ්‍යතා අනුව ආහාර, රසායනික ද්‍රව්‍ය, තෙල් හා කෙඳි, ගොඩනැගිලි ද්‍රව්‍ය සහ පරිගණක තාක්‍ෂණය යන අංශ පහක් මත පදනම් වූ පුහුණු වැඩසටහන්, උපදේශන සේවා සහ මාර්ගෝපදේශනයන් මෙම අංශය විසින් සපයනු ලබයි. හැකි උපරිම කාර්යක්ෂම, ඵලදායී සහ නව්‍ය ක්‍රමවලින් භෞතික සහ අතථ්‍ය තොරතුරු සම්පත් අත්පත් කර ගැනීම, සංවිධානය කිරීම, සංරක්ෂණය කිරීම, නඩත්තු කිරීම සහ ප්‍රවේශය ලබා දීම මගින් විභව ව්‍යවසායකයින්ට සහාය වීම කෙරෙහි තාක්ෂණික සේවාවන්හි අවධානය යොමු කර ඇත. TSD හි මූලික පරමාර්ථය වන්නේ ව්‍යවසායකයින්හට නව කර්මාන්ත වල සංකල්පිතයේ සිට ක්‍රියාත්මක කිරීම දක්වා සහ පවතින කර්මාන්ත පුළුල් කිරීම, නවීකරණය කිරීම, විවිධාංගීකරණය කිරීම, ගුණාත්මකභාවය සහ ඵලදායිතාව වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික සහාය ලබා දීමයි .

- ආහාර, රසායනික ද්‍රව්‍ය, තෙල් සහ කෙඳි, ගොඩනැගිලි ද්‍රව්‍ය සහ ඛනිජ යන ක්ෂේත්‍ර පිළිබඳව තාක්ෂණික පුහුණු සහතිකපත්‍ර පාඨමාලා පැවැත්වීම.
- තාක්ෂණික සහාය/උපදේශන සැපයීම.
- සුදුසු විදේශීය සහ දේශීය තාක්ෂණය අත්පත් කර ගැනීම සහ බෙදා හැරීම.
- ප්‍රමිති සහතික (GMP, SLS, සහ ISO ආදිය) ලබා ගැනීමට කර්මාන්තවලට සහාය වීම.
- නිෂ්පාදන ඇසුරුම්කරණය සහ ලේබල් කිරීම වැඩිදියුණු කිරීමට පහසුකම් සැලසීම.
- ප්‍රවර්ධනය සඳහා නිෂ්පාදන හඳුනා ගැනීම.
- ව්‍යාපාර තොරතුරු සහ සම්බන්ධතා.
- ආහාර පරීක්ෂා කිරීම සහ වාර්තා කිරීම.

### 7.1 2023 දී TSD විසින් සිදු කරන ලද ප්‍රධාන ක්‍රියාකාරකම්

#### 7.1.1 පුහුණු වැඩසටහන් පැවැත්වීම

#### 7.1.2 තාක්ෂණය පිළිබඳ වැඩසටහන් / වැඩමුළු / ආදර්ශන

තාක්ෂණික සේවා අංශය තුළ සහ ඉන් පිටත ආහාර, රසායනික ද්‍රව්‍ය, තෙල් සහ කෙඳි සහ ගොඩනැගිලි ද්‍රව්‍ය යන උප අංශ යටතේ තාක්ෂණ භුවමාරු පුහුණු වැඩසටහන් / වැඩමුළු / ආදර්ශන හැත්තෑ හතක් පවත්වන ලද අතර මෙම වැඩමුළු හරහා සමස්තයක් වශයෙන් පුද්ගලයින් 1677 දෙනෙකු පුහුණු කර සහය ලබා දී එමගින් රුපියල් මිලියන විසි එකක ආදායමක් උපයා ඇත.

#### 7.1.3 ආහාර පාන අපනයනය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන

2023 ජනවාරි 28 වැනි දින කර්මාන්තකරුවන් 110 දෙනෙකු සඳහා යූනියන් පෙදෙයේ කොමර්ෂල් බැංකුව විසින් සංවිධානය කරන ලද ආහාර පාන අපනයනය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනට TSD සහභාගී විය. කර්මාන්තකරුවන් අතර ආහාර පාන අංශයේ වක්‍ර අපනයනකරුවන්, අපනයන සූදානම් කර්මාන්ත සහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් විය. ශ්‍රී ලංකාවේ කෘෂි පාරිභෝගික භාණ්ඩ සඳහා වැඩි වටිනාකමක් එක් කිරීමේ අරමුණින් ආහාර පාන කර්මාන්ත ක්ෂේත්‍රයේ ගෝලීය ප්‍රවණතා සහ රටා හඳුන්වා දීම සඳහා

TSD විසින් ''ආහාර පාන අපනයනය කිරීම පිළිබඳ කර්මාන්ත දළ විශ්ලේෂණය'' යන මැයෙන් දේශනයක් පවත්වන ලදී.

### 7.1.4 ඉල්ලුම අනුව සකස් කරන ලද පුහුණු වැඩසටහන් පැවැත්වීම

- පනාගොඩ යුධ හමුදා කඳවුරේ හමුදා නිලධාරීන් 10 දෙනෙකුගෙන් යුත් කණ්ඩායමක් සඳහා "මඤ්ඤොක්කා සැකසුම් තාක්ෂණය" සහ "අපජලය පිරිපහදු කිරීමේ තාක්ෂණය" පිළිබඳ පුහුණු වැඩසටහන් දෙකක් පවත්වන ලදී.
- පනාගොඩ යුද හමුදා කඳවුරේ හමුදා නිලධාරීන් 9 දෙනෙකුගෙන් යුත් කණ්ඩායමක් සඳහා ''ක්ෂණික පළතුරු බීම, ජෑම් සහ කෝඩියල්'' පිළිබඳ පුහුණු වැඩසටහන් පවත්වන ලදී.
- ලස්සන ඇග්‍රි ලංකා පුද්ගලික සමාගමට ඔවුන්ගේ කාබනික ගොවිතැන වැඩිදියුණු කිරීම සඳහා ''උණබට පිරියම් කිරීම'' (Bamboo Softwood Treatment) පිළිබඳ පුහුණු වැඩසටහනක් පවත්වන ලදී.
- බස්නාහිර පළාත් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ මූල්‍ය ආධාර යටතේ බස්නාහිර පළාතේ ව්‍යවසායකයින් සඳහා ''කුළුබඩු සැකසීමේ තාක්ෂණය'' පිළිබඳ පුහුණු වැඩසටහනක් පවත්වන ලදී.

### 7.1.5 අංශ සංවර්ධන රැස්වීම්

හඳුනාගත් ප්‍රමුඛතා අංශ කිහිපයක් සඳහා 2023 දී කර්මාන්ත අමාත්‍යාංශය විසින් සංවිධානය කරන ලද අංශ සංවර්ධන රැස්වීම් කිහිපයකට TSD නිලධාරීන් සහභාගී විය.

### 7.1.6 A & B Solutions (ද්‍රාවණය) සකස් කිරීම සහ විකිණීම

දැව පිරියම් කර ඇත්දැයි පරීක්ෂා කිරීම සඳහා තාක්ෂණික සේවා අංශය විසින් A & B Solutions සකස් කරනු ලැබේ. මෙය ලී ආශ්‍රිත කර්මාන්ත අංශයට ඉතා ප්‍රයෝජනවත් වේ. මෙමගින් භාණ්ඩ අපනයනය සඳහා භාවිතා කරන ලී පෙට්ටි සඳහා තත්ත්ව සහතික පහසුවෙන් ලබා ගත හැක. මෙම නිෂ්පාදනය සඳහා පේටන්ට් බලපත්‍රය IDB සතු වේ.

### 7.1.7 ජාතික කර්මාන්ත සතිය - 2023 ප්‍රකාශයට පත්කිරීමට සමගාමීව කා.සං.ම. විශේෂ සම්මන්ත්‍රණය "කඩිනම් කාර්මික සංවර්ධනය සඳහා උපාය මාර්ග" පිළිබඳ සම්මන්ත්‍රණය

කාර්මික සංවර්ධන මණ්ඩලය (IDB) විසින් 2023 ජූනි 22 සිට 28 දක්වා ප්‍රකාශයට පත් කරන ලද "ජාතික කර්මාන්ත සතිය - 2023" ට සමගාමීව ශ්‍රී ලංකාවේ ප්‍රධාන දේශීය කර්මාන්තකරුවන් 200 ක් සඳහා සම්මන්ත්‍රණයක් සංවිධානය කරන ලදී. මෙම සම්මන්ත්‍රණය මගින් ප්‍රධාන රාජ්‍ය නිලධාරීන්, ප්‍රතිපත්ති සම්පාදකයින් සහ කර්මාන්ත ප්‍රධානීන්ගෙන් සමන්විත ඉහළ මට්ටමේ මඩුල්ලක් හරහා කර්මාන්ත වල ගැටළු පැහැදිලි කරගැනීමට කර්මාන්ත වලට වේදිකාවක් සපයා දෙන ලදී. තවද, කර්මාන්ත ක්ෂේත්‍ර සංවර්ධනය පිළිබඳ රජයේ සැලසුම් සහ ශ්‍රී ලංකාවේ ආයෝජන අවස්ථා පිළිබඳව ද සහභාගී වූ කර්මාන්තකරුවන් දැනුවත් කරන ලදී.

මෙම අවස්ථාවට කර්මාන්ත අමාත්‍ය ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ සහ ශ්‍රී ලංකා මහ බැංකු අධිපති ආචාර්ය නන්දලාල් වීරසිංහ යන මහත්වරු ද සහභාගී වූහ.

### 7.1.8 ජාතික මෝටර් රථ සම්මන්ත්‍රණය - 2023

**2035 වර්ෂය වන විට ශ්‍රී ලංකාව ආසියාවේ මෝටර් රථ සැපයුම් දාමයේ න්‍යෂ්ටිය බවට පත් කිරීම**

කාර්මික සංවර්ධන මණ්ඩලය (IDB) කර්මාන්ත අමාත්‍යාංශය හා එක්ව 2023 ජූලි 25 වැනි දින කොළඹ මැරිනෝ බීච් හෝටලයේ දී ජාතික මෝටර් රථ සම්මන්ත්‍රණය - 2023 සාර්ථකව පවත්වන ලදී. "2035 වන විට ශ්‍රී ලංකාව ආසියාවේ මෝටර් රථ සැපයුම් දාමයේ න්‍යෂ්ටිය බවට පත් කිරීම" යන තේමාව යටතේ, දේශීය හා ගෝලීය පරිමාණයන් දෙකෙහිම සහයෝගීතාව පෝෂණය කරන අතරතුර ශ්‍රී ලංකාවේ මෝටර් රථ සහ වාහන උපාංග නිෂ්පාදන කර්මාන්තවල වර්ධනයට සහ සංවර්ධනයට අවශ්‍ය පරිසරයක් නිර්මාණය කිරීමේ අරමුණ ඇතිව මෙම උත්සවය පැවැත්වුණි. මෙම සමුළුව මගින් ශ්‍රී ලංකාවේ මෝටර් රථ සහ වාහන අනුබද්ධ කර්මාන්ත ක්ෂේත්‍රවල ප්‍රධාන පාර්ශ්වකරුවන් සිය ඉලක්කය සපුරා ගැනීමේ මාවත සවිමත් කරගැනීම සඳහා එකතු කර ගන්නා ලදී.

මෙම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් සහභාගී වූ කර්මාන්ත අමාත්‍ය ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා මෝටර් රථ ක්ෂේත්‍රයට සහය දැක්වීමේ රජයේ කැපවීම අවධාරණය කළේය. මෙම අවස්ථාව සඳහා විශේෂ ආරාධිතයෙකු ලෙස ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍ය ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා ද සහභාගී විය.

"මෝටර් රථ සම්මන්ත්‍රණය - 2023" ශ්‍රී ලංකාවේ මෝටර් රථ ක්ෂේත්‍රයේ අනාගතය සඳහා පුළුල් මාර්ග සිතියමක් ඉදිරිපත් කරන ලද අතර කර්මාන්තයේ අනාගතය හැඩගස්වා ගැනීම සඳහා තීරණාත්මක නිර්දේශ කිහිපයක් ද ඉදිරිපත් කරන ලදී. අමුද්‍රව්‍ය හෝ නිම නොකළ ද්‍රව්‍ය සැපයීම සඳහා දේශීය කර්මාන්ත සංවර්ධනය කිරීම, පර්යේෂණ සහ සංවර්ධන පහසුකම් වලින් සමන්විත මෝටර් රථ ආශ්‍රිත ආයතනයක් පිහිටුවීම, පරීක්ෂණ සහ සහතික කිරීමේ රසායනාගාරය, සහ කර්මාන්තයේ ඉහළම ගුණාත්මක බව සහතික කිරීම සඳහා ජාත්‍යන්තර මිණුම් සලකුණු සහ රෙගුලාසිවලට සමගාමීව ශ්‍රී ලංකාවේ ප්‍රමිතීන් සකස් කිරීම යනාදිය සමුළුවේ දී සාකච්ඡා කර පොදු එකඟතාවයට පැමිණි කරුණු කිහිපයකි.

### 7.1.9 ජාතික ආහාර පාන සමුළුව - 2023

**ගෝලීය වෙළෙඳපොළ තුළ සාර්ථක වීම සඳහා ශ්‍රී ලාංකේය ආහාර පාන අංශය ශක්තිමත් කිරීම**

කාර්මික සංවර්ධන මණ්ඩලය (IDB) විසින් කර්මාන්ත අමාත්‍යාංශය සහ එක්සත් ජාතීන්ගේ කාර්මික සංවර්ධන සංවිධානය (UNIDO) BESPA-FOOD ව්‍යාපෘතිය සමඟ සහයෝගයෙන්, යුරෝපා සංගමයේ (EU) දායකත්වයෙන් 2023 අගෝස්තු මස 25 වැනි දින ජාතික ආහාර පාන සමුළුව - 2023 සංවිධානය කරන ලදී. ජාත්‍යන්තර වෙළඳපොල තුළ ශ්‍රී ලංකාවේ සකසන ලද සහ නැවුම් කෘෂිකාර්මික නිෂ්පාදන වැඩිදියුණු කිරීමට පහසුකම් සැලසීම සඳහා මෙම සමුළුව කර්මාන්ත විශේෂඥයින්, ප්‍රතිපත්ති සම්පාදකයින් සහ පාර්ශවකරුවන් ඒකරාශී කරන ලදී. කර්මාන්ත අමාත්‍ය ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස මෙම අවස්ථාවට සහභාගී විය.

### 7.1.10 ජාතික රබර් සහ ප්ලාස්ටික් සමුළුව - 2023


**නවීන තාක්ෂණයේ සහයෝගයෙන් ශ්‍රී ලංකාවේ රබර් සහ ප්ලාස්ටික් කර්මාන්තය ප්‍රේරණය කිරීම**

කාර්මික සංවර්ධන මණ්ඩලය (IDB) කර්මාන්ත අමාත්‍යාංශය සමඟ සහයෝගයෙන්, 2023 සැප්තැම්බර් 26 වැනි දින ජාතික රබර් සහ ප්ලාස්ටික් සමුළුව - 2023 සාර්ථකව පවත්වන ලදී. ශ්‍රී ලංකාවේ රබර් සහ ප්ලාස්ටික් කර්මාන්ත කාර්මීකරණය සඳහා ඉලක්ක කරගත් අංශ ලෙස සංවර්ධනය කිරීමේ අරමුණින් "නවීන තාක්‍ෂණයේ සහයෝගයෙන් ශ්‍රී ලංකාවේ රබර් සහ ප්ලාස්ටික් කර්මාන්තය ප්‍රේරණය කිරීම" යන තේමාව යටතේ මෙම උත්සවය පැවැත්විණි.

### 7.1 වගුව : අංශ වල ආදායම් සාරාංශය 2023

| අංකය. | ක්‍රියාකාරකම | ආදායම (රු.) |
|---|---|---|
| 01 | තාක්ෂණ පුහුණු වැඩසටහන්/ වැඩමුළු/ ආදර්ශන | 19,616,000.00 |
| 02 | කර්මාන්ත / සංවිධාන / ආයතනවල ඉල්ලුම මත සකස් කරන ලද අංශ පදනම් කරගත් තාක්ෂණික පුහුණු වැඩසටහන් | 241,712.00 |
| 03 | කාර්මික සහතික පුහුණු පාඨමාලා | 1,370,000.00 |
| 04 | උණ බට පිරිසැකසුම් තාක්ෂණය පිළිබඳ දැනුවත් කිරීම් / තාක්ෂණ හුවමාරු වැඩසටහන් | 56,520.00 |
| 05 | දේශීය හා විදේශීය තාක්ෂණයන් අත්පත් කර ගැනීම සහ බෙදා හැරීම | 284,500.00 |
| 06 | ක්ෂුද්‍රජීව විද්‍යාගාරයේ ආහාර සාම්පල පරීක්ෂාව | 8,716,570.13 |
| 07 | විශ්ලේෂණ රසායනාගාරයේ ආහාර සාම්පල පරීක්ෂාව | 89,661.70 |
| | එකතුව | **30,374,963.83** |









**7.2** වගුව: වාර්ෂික තත්‍ය ආදායම සංසන්දනය කිරීම **(2019 සිට 2023)**

| වර්ෂය | තත්‍ය ආදායම (රු.) |
|---|---|
| 2019 | 18,607,832 |
| 2020 | 8,107,910 |
| 2021 | 3,788,750 |
| 2022 | 20,071,900 |
| 2023 | 30,374,963 |



## 8) අලෙවි අංශය

භාණ්ඩ සහ සේවා ප්‍රවර්ධනය කිරීමේ සහ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ට දේශීය හා විදේශීය වෙළෙඳපොළ තුළ තරඟ කිරීමට පහසුකම් සැලසීමේ වගකීම කා.සං.ම. හි අලෙවි අංශය වෙත පැවරී ඇත. තවද, අලෙවිකරණ උපාය මාර්ග ස්ථාපිත කිරීම සඳහා කර්මාන්ත හෝ MSMEs ප්‍රවර්ධනය සහ සංවර්ධනය සඳහා අලෙවිකරණ සහාය සහ උපදේශන සේවා මෙම අංශය විසින් සපයයි.

### 8.1 අංශය විසින් සපයනු ලබන සේවාවන්

- කාර්මික ප්‍රදර්ශන සංවිධානය කිරීම සහ පැවැත්වීම/ ජාතික ප්‍රදර්ශන සහ වෙළඳ ප්‍රදර්ශන සඳහා සහභාගී වීම.
- දිවයින පුරා සිටින තෝරාගත් ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ ව්‍යවසායකයින්/ කාර්මිකයින් මෙන්ම ස්වයං රැකියාලාභීන් සඳහා ජාතික සම්මාන උළෙල සංවිධානය කිරීම.
- "ලක්කම්" අලෙවි මධ්‍යස්ථානයේ විකුණුම් පහසුකම් සැපයීම.
- උප කොන්ත්‍රාත් හුවමාරු සඳහා පහසුකම් සැලසීම.
- වාත්තු, ලුහු ඉංජිනේරු, කම්මල්කරු සහ අනෙකුත් ලෝහ වාත්තු සහ අත්කම් කර්මාන්තවල නියැලී සිටින කර්මාන්තකරුවන්ට සහනදායී මිල ගණන් යටතේ අමුද්‍රව්‍ය/අබලි ද්‍රව්‍ය ලබා දීම.
- කර්මාන්ත/MSMEs ප්‍රවර්ධනය සහ සංවර්ධනය සඳහා අලෙවිකරණ සහාය සහ උපදේශන සේවා සැපයීම.

### 8.2 අලෙවිකරණ සහාය

ලක්කම් අලෙවි මධ්‍යස්ථානය හරහා කර්මාන්තකරුවන්ට අලෙවිකරණ සහාය ලබාදීමට අලෙවි අංශය කැපවී සිටී.

*ලක්කම් අලෙවි මධ්‍යස්ථානය :* සාම්ප්‍රදායික ශ්‍රී ලාංකේය නිෂ්පාදන "ලක්කම්" ලාංඡනය යටතේ දේශීය සහ ජාත්‍යන්තර වෙළෙඳපොළ වෙතට ප්‍රවිෂ්ට වේ. පසුගිය දශක තුනක කාලය තුළ, කාර්මික සංවර්ධන මණ්ඩලයේ ලක්කම් මධ්‍යස්ථානය විසින් දිවයින පුරා විසිරී සිටින කුඩා පරිමාණ කර්මාන්තකරුවන් විසින් නිෂ්පාදනය කරනු ලබන පාරම්පරික සහ අනෙකුත් නිෂ්පාදන සඳහා ප්‍රමුඛ පෙළේ අලෙවිකරුවෙකු වශයෙන් සිය සේවාව ලබා දී ඇත. මෙම නිෂ්පාදන සාම්ප්‍රදායික වට්ටෝරු යටතේ සැකසූ ආහාර නිෂ්පාදන, සාම්ප්‍රදායික ඖෂධ නිෂ්පාදන, SME යන්ත්‍රෝපකරණ, අත්යන්ත්‍ර හා සම්ප්‍රදායික ඇඟලුම් සහ හස්ත කර්මාන්ත හා විසිතුරු භාණ්ඩ කාණ්ඩ යටතේ වර්ගීකරණය කර ඇත.

"ලක්කම්" අලෙවි මධ්‍යස්ථානයේ අරමුණ වන්නේ කුඩා හා මධ්‍ය පරිමාණ නිෂ්පාදකයන්ගේ අලෙවි කළ හැකි නිෂ්පාදන හඳුනාගෙන ඒවා ප්‍රවර්ධනය කිරීම සහ ඒවා දැරිය හැකි මිලකට එකම ස්ථානයක දී අලෙවි කිරීමට අවස්ථාව සැලසීමයි.

### 8.3 උපදේශනය

සාමාන්‍යයෙන්, වඩාත්ම පිරිවැය ඵලදායී උපාය මාර්ග දිගු කාලීනව සැලසුම් කර ඇත. මීට අමතරව, ප්‍රාදේශීය උපායමාර්ගික සැලසුම් ආයතනයේ සමස්ත උපායමාර්ගික සැලසුම් සමඟ සහ අනෙකුත් අංශයන්හි සැලසුම් සමඟ ද සමපාත විය යුතුය. ඒ අනුව වෙළඳපල සහ තරඟකාරිත්වය සම්බන්ධයෙන් සමාගමේ ස්ථාවරය දැනගැනීම වැදගත් වේ. එබැවින්, අලෙවිකරණ අංශය විසින් වෙළඳපල වාර්තා ලිවීම,

වෙළඳපල සමීක්ෂණ පැවැත්වීමට සහ හඳුනාගත් ශක්‍යා නිෂ්පාදන පිළිබඳ වෙළඳපොළ ශක්‍යතා වාර්තා සැකසීමට පහසුකම් සැලසීම, ඉල්ලීම මත නිෂ්පාදනවල ගුණාත්මකභාවය, වෙළඳ නාමකරණය, ඇසුරුම්කරණය සහ වෙළඳපොළ තොරතුරු වැඩිදියුණු කිරීම සඳහා උපදේශනය ලබා දීම සඳහා සම්බන්ධ වේ. තවද, නව වෙළඳපොළ සංවර්ධනය පිළිබඳව වරින් වර වැඩමුළු සංවිධානය කිරීම, කාර්මික සමීක්ෂණ සිදු කිරීම සහ හඳුනාගත් දැශා නිෂ්පාදන පිළිබඳ වෙළඳපොළ ශක්‍යතා වාර්තා සකස් කිරීම සිදු කරන ලදී.

**8.4 අලෙවිකරණ ප්‍රවර්ධනය**


විභව ගනුදෙනුකරුවන් කරා ළඟා වීමට, ඔවුන් ආකර්ෂණය කර ගැනීමට සහ ඔවුන් සමඟ අන්තර් සබඳතා පවත්වා ගැනීමට කර්මාන්තකරුවන්ට පහසුකම් සැලසීම සඳහා කා.සං.ම. දිස්ත්‍රික්, පළාත් සහ ජාතික මට්ටමින් ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා ප්‍රදර්ශන සංවිධානය කරයි. තවද, කා.සං.ම. බාහිර සංවිධාන විසින් සංවිධානය කරන ලද ප්‍රදර්ශන සඳහා සහභාගී වන අතර කාර්මික ප්‍රදර්ශන වලට සහභාගිවන්නන් සමඟ සම්බන්ධතා ගොඩනගා ගනී. තවත් අලෙවිකරණ ප්‍රවර්ධන ක්‍රියාකාරකම් කිහිපයක් නම්, ජාතික මෙන්ම ජාත්‍යන්තර සහභාගිවන්නන් සමඟ ගැණුම්කරු-විකුණුම්කරු රැස්වීම් මෙහෙයවීම සහ කර්මාන්තකරුවන් දිරිමත් කිරීම සඳහා ජාතික, පළාත් සහ දිස්ත්‍රික් මට්ටමින් අංශ අනුව තරඟ සහ ක්‍රියා මාලාවන් සිදුකිරීමයි.

8.1 වගුව : ප්‍රගති සාරාංශ වාර්තාව - 2023

| ක්‍රියාකාරකම් අංකය | ක්‍රියාකාරකම | කාර්ය සාධන දර්ශක | භෞතික ප්‍රගතිය සමුච්චිත |
|---|---|---|---|
| 1 | කර්මාන්ත සඳහා අමුද්‍රව්‍ය සැපයීම | කර්මාන්ත සංඛ්‍යාව | 401 |
| | | ට්‍රාන්ස්ෆෝමර් සංඛ්‍යාව | 210 |
| | | ප්‍රමාණය (මෙට්‍රික් ටොන්) | 598 |
| 2 | "ලක්කම්" ප්‍රදර්ශන කුටිය හරහා වෙළඳපොළ අවස්ථා ලබාදීම | කර්මාන්ත සංඛ්‍යාව / සපයා ඇති අවස්ථා සංඛ්‍යාව | 11 |
| 3 | වෙනත් ආයතන විසින් සංවිධානය කරනු ලබන වෙළඳ ප්‍රදර්ශන හා ප්‍රදර්ශනවලට සහභාගී වීම | සහභාගී වූ වෙළඳ ප්‍රදර්ශන /ප්‍රදර්ශන සංඛ්‍යාව | 4 |
| 4 | කාර්මික ප්‍රදර්ශනය සංවිධානය කිරීම සහ පැවැත්වීම. | කර්මාන්ත සංඛ්‍යාව | 1 |

8.2 වගුව : අංශයේ සමුච්චිත මූල්‍ය ප්‍රගතිය

| ක්‍රියාකාරකම් අංකය | ක්‍රියාකාරකම | කාර්ය සාධන දර්ශක | සාධනය |
|---|---|---|---|
| 1 | කර්මාන්ත සඳහා අමුද්‍රව්‍ය සැපයීම. | ප්‍රමාණය (මෙට්‍රික් ටොන්) | 165,166,000 |
| 2 | "ලක්කම් " ප්‍රදර්ශන කුටිය හරහා වෙළඳපල අවස්ථා ලබා දීම | විකුණුම් ආදායම | 21,987,856 |
| | **එකතුව (රු.)** | | **187,153,856** |



## 9) රබර් නිෂ්පාදන සංවර්ධන සහ සේවා මධ්‍යස්ථානය

### 9.1 හැඳින්වීම

දේශීය රබර් ආශ්‍රිත කර්මාන්ත වලට, විශේෂයෙන් SMI වලට සහාය වීම සඳහා ලෝක බැංකුවේ උපදෙස් හා මූල්‍ය ආධාර යටතේ 1980 දී පැලියගොඩ රබර් නිෂ්පාදන සංවර්ධන හා සේවා මධ්‍යස්ථානය ආරම්භ කරන ලදී. එතැන් සිට මෙම මධ්‍යස්ථානය දේශීය රබර් නිෂ්පාදන නිෂ්පාදකයින්ට සේවා සපයයි. නිත්‍ය පාරිභෝගිකයන් වන දිගුකාලීන රබර් ආශ්‍රිත කර්මාන්තකරුවන් 200ක් පමණ අපගේ පහත සේවාවන් ලබා ගනී;

- නිෂ්පාදන සහ ක්‍රියාවලි සංවර්ධනය.
- පරීක්ෂණ පහසුකම් සහ තත්ත්ව සහතික ලබා දීම.
- තාක්ෂණික උපදේශන සහ ව්‍යාප්ති සේවා සැපයීම.
- අර්ධ වාණිජ සේවා සැපයීම.
- අධ්‍යාපනික, පර්යේෂණ සහ සංවර්ධන ආයතන හා කර්මාන්ත අතර සම්බන්ධීකරණ කටයුතු සිදුකිරීම.

9.1 වගුව : 2023 වර්ෂයේ මධ්‍යස්ථානයේ කාර්යසාධනය

| | සේවාවන් | මිනුම් දර්ශකය | සංඛ්‍යාව |
|---|---|---|---|
| අ) | තාක්ෂණය හුවමාරු කිරීම<br>1. ප්‍රායෝගික ආදර්ශ<br>2. වැඩමුළු : රබර් කොහු නිමැවුම් නිෂ්පාදන කිරීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් | වැඩසටහන් / සේවාලාභීන් සංඛ්‍යාව | (15/50)<br>01 |
| ආ) | පරීක්ෂණ පහසුකම් (මීට අපනයන වෙළෙඳපොළ සඳහා රබර් නිෂ්පාදනය කරන කර්මාන්තකරුවන් සඳහා පරීක්ෂණ පහසුකම් ලබා දීම ඇතුළත් වේ.) | පරීක්ෂණ වාර්තා සංඛ්‍යාව | 168 |
| ඇ) | නිෂ්පාදන සහ ක්‍රියාවලි සංවර්ධනය | රැකියා සංඛ්‍යාව | 18 |
| ඈ) | රබර් ආශ්‍රිත නිෂ්පාදන සහ නිෂ්පාදන ක්‍රියාවලියේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම පිළිබඳ උපදේශනය | රැකියා සංඛ්‍යාව | 10 |

### 9.2 සංවර්ධන ක්‍රියාකාරකම්:

2023 වර්ෂය තුළ පහත සඳහන් සංයෝග නිර්මාණය කිරීම සහ සංවර්ධනය කිරීම, තත්ත්ව වැඩිදියුණු කිරීම සහ නිෂ්පාදන සංවර්ධන කටයුතු නිම කිරීම ද මධ්‍යස්ථානය විසින් සිදු කරන ලදී.

| | |
|---|---|
| අ) | **සංයෝග සැලසුම් කිරීම සහ සංවර්ධනය කිරීම** |
| | **විශේෂ රැකියා සඳහා සිදුකරන ලද නිෂ්පාදන** |
| i | අඩු ඝනත්ව පොලිතින් සමඟ කෙස් මිශ්‍රිත සංයෝගය |
| ii | කම්පනය සඳහා ඔරොත්තු දෙන බුෂ් |
| iii | රබර් බාධක |
| iv | යන්ත්‍ර සඳහා භාවිතා කරන රබර් ගෑස්කට් |
| v | මඩ රෝදය |
| vi | පිරවුම් යන්ත්‍ර වැස්ම |
| vii | භාජන සඳහා භාවිත වන සීල් |
| viii | ජල මුද්‍රාව |
| ආ) | **තත්ත්ව වැඩිදියුණු කිරීමේ ක්‍රියාකාරකම් - සහතික 168** |
| | **විශේෂ නිෂ්පාදන** |
| i | හොකී ක්‍රීඩාව සඳහා භාවිත වන පෙත්ත |
| ii | රබර් රේල් පෑඩ් |
| iii | ගෙවීමට ඔරොත්තු දෙන පෑඩ් |
| iv | ගව පැදුරු |
| v | ටයර් පතු සංයෝගය |
| vi | ටියුබ් සංයෝගය |
| vii | රබර් බීඩින් පටි |
| ix | කුෂන් අලවන ගම් |
| ඇ) | **ප්‍රධාන නිෂ්පාදන සංවර්ධනය කිරීමේ රැකියා** |
| | **නිෂ්පාදන** |
| i | ටයර් පටි |
| ii | සපත්තු අඩි |
| iii | ආරක්ෂිත කෝප්පය |
| iv | ඇක්සල ඇනය |
| v | රබර් රෝදය |
| vi | ස්පොන්ජ් සපත්තුව අඩිය |
| vii | විශාල රබල් බුෂ් |
| viii | ජැක් සීල් |


නව ව්‍යවසායකයින් ප්‍රවර්ධනය කිරීම සහ දැනට සිටින ව්‍යවසායකයින් විසින් නිෂ්පාදනය කරනු ලබන නිෂ්පාදනවල ගුණාත්මක බව ඉහළ නැංවීම සඳහා වියළි රබර් සහ රබර් කිරි ආශ්‍රිත නිෂ්පාදන පිළිබඳ තාක්ෂණ ආදර්ශන 15ක් සහ වැඩමුළු 01ක් මධ්‍යස්ථානය විසින් පවත්වා ඇත.

**9.3** වාර්ෂික ආදායම:

පහත දැක්වෙන පරිදි ප්‍රධාන ක්ෂේත්‍ර හතරක් යටතේ වාර්ෂික ආදායම උත්පාදනය කිරීමට මධ්‍යස්ථානයේ ක්‍රියාකාරකම් දායක විය. වර්ෂය තුළ දී මෙම මධ්‍යස්ථානය ස්වයං මූල්‍ය සපයාගනු ලබන ඒකකයක් බවට පත්වීමේ අරමුණ ඉටුකර ගැනීම උදෙසා සතුටුදායක ප්‍රගතියක් අත්කරගෙන තිබේ. තාක්ෂණික හා වාණිජ මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් උපයාගත් ආදායම රු.මි. 36.2කි. භාණ්ඩ නිෂ්පාදනය සහ විකුණුම් පහත වගුවේ දක්වා ඇත.

| | ප්‍රමාණය (කි.ග්‍රෑම්) | විකුණුම් වටිනාකම (රු.) | එකතුව (රු.) |
|---|---|---|---|
| විකුණුම් | | | |
| අර්ධ වාණිජ කටයුතු | 41,581 | 35,518,178 | |
| | | | **35,518,178** |
| සේවාවන් | | | |
| i. ව්‍යාප්ති සහ උපදේශන )302)<br>(ආදර්ශනය(උප කොන්ත්‍රාත්තුව/වැඩමුළුව / | | 160,000 | |
| ii. තත්ත්ව පාලනය සහ රසායනාගාර පරීක්ෂණ | | 429,988 | |
| iii. නිෂ්පාදන සංවර්ධනය | | 130,076 | **720,064** |
| එකතුව | | | **36,238,242** |

**9.1** ප්‍රස්ථාරය : වාෂර්ික තත්‍ය ආදායම සංසන්දනය කිරීම (රු.මි.)



## 10) සම්භාණ්ඩ නිෂ්පාදන සහ පාවහන් සංවර්ධන මධ්‍යස්ථානය

### 10.1 හැඳින්වීම

ශ්‍රී ලංකාවේ සම්භාණ්ඩ නිෂ්පාදන සහ පාවහන් කර්මාන්තයේ දියුණුව සඳහා සම්භාණ්ඩ නිෂ්පාදන සහ පාවහන් සංවර්ධන මධ්‍යස්ථානය 1998 වර්ෂයේදී ආරම්භ කරන ලදී. මෙරට සම්භාණ්ඩ කර්මාන්තයේ සංවර්ධනය සඳහා පවතින විශාල විභවයන් සැලකිල්ලට ගනිමින්, මෙම මධ්‍යස්ථානය විසින් පාවහන් සහ සම් භාණ්ඩ අංශයේ කෙටි කාලීන හා දිගු කාලීන පාඨමාලා පවත්වනු ලබන අතර, පුහුණු ශ්‍රමිකයන්, අදාළ තොරතුරු සහ භාණ්ඩ නිෂ්පාදනය සඳහා පහසුකම් සැපයීම යනාදිය සිදු කරයි. තවද, සම්භාණ්ඩ නිෂ්පාදන සහ පාවහන් අංශයේ නියැලී සිටින (SME) කර්මාන්තකරුවන් සඳහා පොදු සේවා පහසුකම් සපයන අතරම, අපනයනය කිරීම සඳහා ගුණාත්මක නිෂ්පාදන නිෂ්පාදනය කිරීමේ තාක්ෂණය සහ පුහුණුව මෙම මධ්‍යස්ථානය විසින් සපයනු ලැබේ. මෙම සියලුම සේවාවන් කටුබැද්ද ප්‍රධාන කාර්යාලය (CDLPF) හරහා සහ වාරියපොල ප්‍රාදේශීය මධ්‍යස්ථානය හරහා සපයනු ලබයි.

**මධ්‍යස්ථානය මගින් සපයනු ලබන සේවාවන්,**

- පාවහන් සහ සම් භාණ්ඩ පිළිබඳ තාක්ෂණ හුවමාරු වැඩමුළු පැවැත්වීම
- පාවහන් සැලසුම් සහ මෝස්තර සකස් කිරීමේ පුහුණුව
- වෙළඳ සහ යන්ත්‍රෝපකරණ තොරතුරු සැපයීම
- ඉන්කියුබේටර් පහසුකම් සැපයීම
- කර්මාන්ත සඳහා පුහුණු ශ්‍රමය
- රාජ්‍ය සහ පෞද්ගලික අංශය අතර සබඳතා ඇති කිරීමට සහාය වීම
- යන්ත්‍රෝපකරණ සේවා සහ සැකසුම් පහසුකම් සැපයීම
- විකුණුම් සහ ප්‍රවර්ධන වැඩසටහන් සංවිධානය කිරීම
- ප්‍රතිපත්ති සම්පාදනයේදී පාවහන් අංශය නියෝජනය කිරීම

### 10.2 2023 වර්ෂය සඳහා අංශය විසින් පවත්වනු ලැබූ විශේෂ කටයුතු

1) අමාත්‍යාංශ, පළාත් සභා සහ සහභාගිවන්නන්ගේ මූල්‍ය දායකත්වයෙන් දිවයින පුරා පුහුණු වැඩසටහන් පවත්වා ඇත.
   - අ) පාවහන් නිෂ්පාදනය පිළිබඳ මූලික මට්ටමේ පුහුණු වැඩසටහන් 12ක් පවත්වන ලද අතර පාවහන් නිෂ්පාදන අංශය සඳහා ව්‍යවසායකයින් 135 දෙනෙකු පුහුණු කරන ලදී.
   - ආ) බෑග් නිෂ්පාදනය පිළිබඳ මූලික මට්ටමේ පුහුණු වැඩසටහන් 03ක් පවත්වන ලද අතර බෑග් නිෂ්පාදන අංශය සඳහා ව්‍යවසායකයින් 34 දෙනෙකු පුහුණු කරන ලදී.
   - ඇ) අනෙකුත් සම් නිෂ්පාදන පිළිබඳ පුහුණු වැඩසටහන් 03ක් පවත්වා ව්‍යවසායකයින් 40 දෙනෙකු පුහුණු කරන ලදී.
   - ඈ) අභිරුචිකරණය කරන ලද පුහුණු වැඩසටහන් 04 ක් පවත්වා කර්මාන්තකරුවන් 68 දෙනෙකු පුහුණු කර රු.1,941,444/- ක් උපයා ඇත.
   - ඉ) ඉහත වැඩසටහන් හරහා ක්ෂේත්‍රයේ නවකයින්ගේ කුසලතා වර්ධනය කර ඇති අතර එමඟින් රු.2,824,052 ක ආදායමක් උපයා ඇත.
   - ඊ) තත්ත්ව වැඩිදියුණු කිරීමේ වැඩසටහන් 4ක් පවත්වා පාවහන් නිර්මාණකරුවන්ගේ කුසලතා වැඩි දියුණු කිරීම සඳහා ක්ෂේත්‍රයේ පුද්ගලයින් 77 දෙනෙකු පුහුණු කර රුපියල් 852,155/-ක් උපයා ඇත..
   - උ) ඉහත පුහුණු වැඩසටහන් මගින් වසර පුරා පුහුණුව ලැබූ මුළු සංඛ්‍යාව 276 කි.

2) පාවහන් සහ සම් භාණ්ඩ කර්මාන්තය හා රජය සමඟ සම්බන්ධීකරණයමේ යටතේ ආනයන ප්‍රතිපත්ති . සම්පාදනය, සෙස් බදු සංශෝධනය, අයවැය යෝජනා වැනි කටයුතුවලට මැදිහත් වීම .පාවහන් සහ සම් භාණ්ඩ නිෂ්පාදකයින්ගේ සංගමය සහ වයඹ පාවහන් සහ සම් භාණ්ඩ නිෂ්පාදකයින්ගේ සංගමය සමඟ ක්‍රියාකාරීව කටයුතු කිරීම.

3) වර්තමාන අමුද්‍රව්‍ය හිඟයට සහ වැඩි වන මිලට ප්‍රතිචාරයක් ලෙස, පාවහන් සහ සම් භාණ්ඩ නිෂ්පාදකයින්ගේ සංගමයේ නිර්දේශය මත කා.සං.ම. විසින් ඉන්දියානු ණය මාර්ගය හරහා අමුද්‍රව්‍ය ආනයනය කිරීමට ආනයනකරුවෙකුට අවශ්‍ය සම්බන්ධීකරණය ලබා දෙන ලදී.

4) ඉන්දිය රජය විසින් ඇමෝනියම් සල්ෆේට් අපනයනය තහනම් කිරීම හේතුවෙන් දේශීය සම් පදම් කිරීමේ කර්මාන්තය විශාල අර්බුදයකට ලක් විය. එබැවින් තායිලන්තයෙන් ඇමෝනියම් සල්ෆේට් ආනයනය කිරීම සඳහා අප විසින් පෞද්ගලික අංශයට සහයෝගය ලබා දෙන ලදී .ශ්‍රී ලංකාවේ සම් පදම් කිරීමේ අංශයට දිගු ඉතිහාසයක් ඇති අතර දේශීය නිෂ්පාදකයින් විසින් ලොව පිළිගත් මට්ටමේ මනා නිමි සම් භාණ්ඩ සැකසීම සිදු කරයි 1980 .දශකයේ සිට, ඔවුන් විසින් සියලු සම් භාණ්ඩ නිෂ්පාදකයින්ට තම නිෂ්පාදන සඳහා සුදුසු එක් ස්ථානයක් සොයමින් සිටි අතර කා.සං.ම. විසින් මේ සඳහා මැදිහත් වී වාලච්චේන ප්‍රදේශයේ ඉඩම් කට්ටි නිදහස් කර ගැනීමට කටයුතු කරමින් සිටී.

5) වත්මන් තත්ත්වයන් පිළිබඳ දැනුම හුවමාරු කර ගැනීම සඳහා අදාළ සංගම් සමඟ වරින් වර රැස්වීම සංවිධානය කර ඇත.

6) විවිධ රාජ්‍ය ආයතනවල ඔවුන්ගේ පාවහන් සහ සම් භාණ්ඩ අවශ්‍යතා මිලදී ගැනීම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටු වලට සහභාගී වීම.

7) සෞන්දර්ය විශ්වවිද්‍යාලයේ සහ මොරටුව විශ්වවිද්‍යාලයේ විලාසිතා නිර්මාණ විෂය මාලාව හදාරන සිසුන්ගේ අවසන් වසර ව්‍යාපෘති සඳහා පහසුකම් සැලසීම.

8) කර්මාන්තකරුවන්ට අවශ්‍ය යන්ත්‍ර සේවා පහසුකම් ලබා දීමෙන් ඔවුන්ගේ නිෂ්පාදනවල ගුණාත්මක බව ඉහළ නැංවීම මෙන්ම නිෂ්පාදන ධාරිතාව ඉහළ නැංවීමඅදාළ කාලසීමාව තුළ මාසිකව . කර්මාන්තකරුවන්147 දෙනෙකුට සේවා සපයා ඇත .ව්‍යාපෘතිය තුළින් උපයාගත් ආදායම රු.290,212/- කි.

9) කර්මාන්තයට අවශ්‍ය පුද්ගලයන් සහ ආයතන පිළිබඳ තොරතුරු රැස් කිරීම සහ පවත්වාගෙන යාමමේ . හරහා අවශ්‍ය පුද්ගලයන්ට අදාළ තොරතුරු ලබාගත හැකිය /ආයතන .පුද්ගලයින් 540 කගේ තොරතුරු පද්ධතියක් යාවත්කාලීන කරමින් පවතී.

10) ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලවල ඉගෙනුම ලබන සිසුන්ගේ අර්ධ වාර්ෂික හා වාර්ෂික විභාගවලට අදාළ ප්‍රශ්න පත්‍ර සකස් කිරීම සහ පිළිතුරු පත්‍ර පරීක්ෂා කිරීම.

11) RPL හරහා ජාතික වෘත්තිය සුදුසුකම් (NVQ) ලබා ගැනීමට ව්‍යවසායකයින්ට පහසුකම් සලසා ඇත . මෙමගින් පුද්ගලයින්18 දෙනෙකු NVQ සහතික ලබා ගන්නා ලදී.


12) 2023 වර්ෂයේ මධ්‍යස්ථානයේ මුළු ආදායම රු. 6,377,412 කි.

## 10.3 අංශයේ මූල්‍ය ප්‍රගතිය

10.1 වගුව : 2023 වසරේ ප්‍රගති සාරාංශය


| අංකය | ක්‍රියාකාරකම | වැඩසටහන් සංඛ්‍යාව | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | මූල්‍ය ප්‍රගතිය (රු.) |
|---|---|---|---|---|
| **1** | **නව ව්‍යාපාර නිර්මාණය කිරීම** | | | |
| **1.1** | පාවහන් තාක්ෂණ පුහුණු වැඩසටහන් පැවැත්වීම | 12 | 135 | 1,658,292 |
| **1.2** | බෑග් නිෂ්පාදන තාක්ෂණ පුහුණු වැඩසටහන් පැවැත්වීම | 3 | 34 | 855,760 |
| **1.3** | සම් භාණ්ඩ තාක්ෂණ පුහුණු වැඩසටහන් පැවැත්වීම | 3 | 40 | 310,000 |
| **2** | **පවතින කර්මාන්ත ව්‍යාපාර ප්‍රවර්ධනය කිරීම /** | | | |
| **2.1** | තත්ත්ව වැඩිදියුණු කිරීමේ වැඩසටහන් පැවැත්වීම | 4 | 77 | 852,155 |
| **2.2** | කර්මාන්තකරුවන්ට සැකසුම් පහසුකම් ලබාදීම | | 147 | 290,212 |
| **2.3** | ව්‍යවසායකයින් / කර්මාන්තකරුවන් / රාජ්‍ය සහ බාහිර සංවිධාන සඳහා සකස්කළ පුහුණු වැඩසටහන් පැවැත්වීම | 4 | 68 | 1,941,444 |
| **3** | **විශේෂ සේවා** | | | |
| **3.1** | පාවහන් වෙළඳ ප්‍රදර්ශනය සංවිධානය කිරීම සහ පැවැත්වීම | 1 | | 469,549 |
| | එකතුව | | | **6,377,412** |

10.1 ප්‍රස්ථාරය : අංශයේ මූල්‍ය ප්‍රගතිය



10.2 වගුව: තත්‍ය ආදායම වාර්ෂිකව සංසන්දනය කිරීම

| වර්ෂය | Vat සහ NBT නොමැතිව තත්‍ය ආදායම (රු.) |
|---|---|
| 2019 | 6,476,884 |
| 2020 | 5,200,839 |
| 2021 | 4,892,789 |
| 2022 | 3,200,136 |
| 2023 | 6,377,412 |



# මූල්‍ය සමාලෝචනය

1 විස්තීරණ මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

2 විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

3 හිමිකම වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය

4 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

5 වැදගත් වන ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

**ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය**

**විස්තීර්ණ මූල්‍ය තත්ත්ව ප්‍රකාශය**

**2023 දෙසැම්බර් 31 න් අවසන් වසර සඳහා**

(සියලු මුදල් ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත)

| වත්කම් | සටහන | 2023 | 2022 (නැවත ප්‍රකාශිත) |
|---|---|---|---|
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | 14 | 514,399,739 | 502,155,629 |
| ආයෝජන දේපළ | 15 | 1,199,665,852 | 1,184,286,002 |
| කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ | 16 | 58,024,100 | 38,614,504 |
| | | **1,772,089,691** | **1,725,056,135** |
| **ජංගම වත්කම්** | | | |
| බඩු තොග | 17 | 78,085,026 | 46,718,615 |
| වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ | 18 | 39,999,292 | 23,567,675 |
| වෙනත් ජංගම වත්කම් | 19 | 57,899,539 | 45,914,025 |
| තැන්පතු සහ කළින් කල ගෙවීම් | 20 | 126,763,984 | 78,001,365 |
| ලැබිය යුතු - විශේෂ ව්‍යාපෘති | 21 | 14,629,625 | 9,348,448 |
| මුදල් සහ මුදල් හා සමාන දෑ | 22 | 423,674,387 | 343,300,457 |
| | | **741,051,852** | **546,850,584** |
| **මුළු වත්කම්** | | **2,513,141,544** | **2,271,906,719** |
| **හිමිකම් සහ වගකීම්** | | | |
| **ප්‍රාග්ධනය සහ සංචිත** | | | |
| විලම්බිත ප්‍රාග්ධන ප්‍රදාන | 23 | 314,264,535 | 258,785,672 |
| ප්‍රාග්ධන සංචිත | | 6,243,013 | 6,243,013 |
| පවරා දෙන ලද වත්කම් වල වටිනාකම | 24 | 13,447,061 | 13,447,061 |
| ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය මත අතිරික්තය | 25 | 960,696,320 | 960,696,320 |
| විලම්බිත රජයේ ප්‍රදාන - ප්‍රාග්ධන ව්‍යාපෘති | 26 | 643,854,473 | 581,577,397 |
| | | **1,938,505,402** | **1,820,749,463** |
| සමුච්චිත පාඩු | 27 | (32,682,441) | (60,791,523) |
| **මුළු හිමිකම්** | | **1,905,822,961** | **1,759,957,940** |
| **ජංගම නොවන වගකීම්** | | | |
| පාරිතෝෂික සඳහා වෙන්කිරීම් | 28 | 188,634,080 | 206,829,087 |
| විශේෂ ව්‍යාපෘතිය සඳහා ප්‍රදාන | 29 | 30,630 | 661,300 |
| | | **188,664,710** | **207,490,387** |
| **ජංගම වගකීම්** | | | |
| රජයට ගෙවිය යුතු හිඟ | 30 | 40,994 | 54,929 |
| සංස්ථාවලට ගෙවිය යුතු හිඟ | 31 | 15,060,823 | 7,759,526 |
| උපචිත වියදම් හා වෙන්කිරීම් | 32 | 403,552,056 | 296,643,936 |
| | | **418,653,873** | **304,458,392** |
| **මුළු හිමිකම් සහ වගකීම්** | | **2,513,141,544** | **2,271,906,719** |

පිටු අංක 05 සිට 33 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය අංගයක් වේ.

මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන මගින් 2023 දෙසැම්බර් 31 දිනට පවතින තත්ත්වය සහ එදිනෙන් අවසන් වූ කාලසීමාව සඳහා එහි අතිරික්තය පිළිබඳ සත්‍ය සහ සාධාරණ දැක්මක් ලබා දෙන බව මම සහතික කරමි.

ජේ.එම්.ආර්.එස්. ජයසිංහ
**අධ්‍යක්ෂ මුදල්**

මෙම මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේ සහ ඉදිරිපත් කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතු වන්නේය. මෙම මූල්‍ය ප්‍රකාශන මණ්ඩලය විසින් අනුමත කරන ලද අතර 2024 පෙබරවාරි 27 වැනි දින අත්සන් කරන ලදි.

| වෛද්‍ය සාරංග අලහප්පෙරුම | එච්.එම්.එස්. සමරකෝන් | සුරංග මෙන්ඩිස් |
|---|---|---|
| **සභාපති** | **අධ්‍යක්ෂ ජනරාල්** | **අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික** |

**ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය**
**විස්තීර්ණ ආදායම් ප්‍රකාශය**
**2023 දෙසැම්බර් 31 න් අවසන් වසර සඳහා**

(සියලු මුදල් ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත)

| | සටහන් | 2023 | 2022 (නැවත ප්‍රකාශිත) |
|---|---|---|---|
| ආදායම | **05** | 544,248,359 | 513,989,237 |
| අලෙවි සහ සේවා පිරිවැය | **06** | (358,869,304) | (322,580,951) |
| දළ ලාභය | | **185,379,056** | **191,408,285** |
| පොලී ආදායම | **07** | 24,622,036 | 14,955,664 |
| වෙනත් ආදායම් | **08** | 282,321,681 | 169,466,895 |
| රජයේ පුනරාවර්තන ප්‍රදාන | **09** | 598,195,000 | 505,400,000 |
| පරිපාලන වියදම් | **10** | (732,020,710) | (694,238,619) |
| විකිණීම සහ බෙදා හැරීමේ වියදම් | **11** | (340,618,701) | (59,189,699) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වල ප්‍රතිඵල** | | **17,878,362** | **127,802,526** |
| මූල්‍ය පිරිවැය | **12** | (1,281,878) | (1,070,001) |
| **බදු ගෙවීමට පෙර ශුද්ධ ආදායම / (පාඩුව)** | | **16,596,485** | **126,732,525** |
| වෙනත් විස්තීර්ණ ආදායම් | **13** | 11,768,860 | 15,052,636 |
| **වර්ෂය සඳහා ශුද්ධ ආදායම / (පාඩුව)** | | **28,365,345** | **141,785,161** |

## ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය
### හිමිකම් වෙනස්වීම් ප්‍රකාශය

(සියලු මුදල් ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත)

| | විලම්භිත ප්‍රාග්ධන ප්‍රදාන | ප්‍රාග්ධන සහ සංචිත | පවරා දෙන ලද වත්කම් වටිනාකම | ප්‍රත්‍යාගණන අතිරික්තය | විලම්බිත රජයේ ප්‍රදාන - ව්‍යාපෘති | සමුච්චිත අතිරික්තය / (හිඟය) | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| **2022 ජනවාරි 01 දිනට ශේෂය** | **304,455,732** | **6,243,013** | **13,447,061** | **960,696,321** | **556,547,142** | **(204,371,533)** | **1,637,017,736** |
| පෙර වර්ෂයේ ගැලපීම් (සටහන 27.1) | - | - | - | - | - | 1,794,849 | 1,794,849 |
| වර්ෂය සඳහා ලාභය | - | - | - | - | - | 141,785,161 | 141,785,161 |
| රජයේ ප්‍රදාන | 24,000,000 | - | - | - | 48,251,112 | - | 72,251,112 |
| රජයේ ප්‍රදාන ක්‍රමක්ෂය | (69,670,060) | - | - | - | (23,220,857) | - | (92,890,917) |
| **2022 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **258,785,672** | **6,243,013** | **13,447,061** | **960,696,321** | **581,577,397** | **(60,791,523)** | **1,759,957,942** |
| | | | | | | | |
| 2023 ජනවාරි 01 දිනට ශේෂය | **258,785,672** | **6,243,013** | **13,447,061** | **960,696,321** | **581,577,397** | **(60,791,523)** | **1,759,957,942** |
| පෙර වර්ෂයේ ගැලපීම් (සටහන 27.1) | - | - | - | - | - | (256,263) | (256,263) |
| වර්ෂය සඳහා ලාභය | - | - | - | - | - | 28,365,345 | 28,365,345 |
| රජයේ ප්‍රදාන | 98,990,000 | - | - | - | 86,101,943 | - | 185,091,943 |
| රජයේ ප්‍රදාන ක්‍රමක්ෂය | (43,511,138) | - | - | - | (23,824,867) | - | (67,336,004) |
| **2023 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **314,264,535** | **6,243,013** | **13,447,061** | **960,696,321** | **643,854,473** | **(32,682,441)** | **1,905,822,962** |

## ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය
**මුදල් ප්‍රවාහ ප්‍රකාශය**
**2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා**

(සියලු මුදල් ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත)

| | 2023 | 2022 (නැවත ප්‍රකාශිත) |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහ** | | |
| වර්ෂය සඳහා ශුද්ධ ලාභය / (පාඩුව) | 16,596,485 | 126,732,525 |
| **ගැලපීම්:** | | |
| අපහරණ ලාභය | (1,384,755) | (348,249) |
| ක්ෂයවීම් | 67,105,801 | 64,234,191 |
| ණය සහ අත්තිකාරම් සඳහා වෙන්කිරීම් | - | - |
| කම්කරු නඩු සඳහා වෙන්කිරීම් | - | - |
| කාර්ය මණ්ඩල ප්‍රසාද දීමනා සඳහා වෙන්කිරීම් | - | 9,860,000 |
| කපා හරින ලද දිගුකාලීන ණයගැති ශේෂයන් | - | - |
| ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය | (66,611,004) | (92,861,917) |
| බොල් සහ අඩමාන ණය | 451,965 | (312,089) |
| පොළී ආදායම් | (26,335,629) | (16,464,444) |
| විශ්‍රාම ප්‍රතිලාභ බැදීම් | 46,031,731 | 30,802,998 |
| | 35,854,594 | 121,643,016 |
| ගෙවන ලද විශ්‍රාම ප්‍රතිලාභ බැදීම් | (34,262,871) | (15,052,670) |
| **කාරක ප්‍රාග්ධන වෙනස්වීම් වලට පෙර මෙහෙයුම් ලාභය/(පාඩුව)** | **1,591,723** | **106,590,346** |
| තොග (වැඩිවීම)/අඩුවීම | (31,366,411) | (20,770,643) |
| ණයගැතියෝ සහ ලැබිය යුතු මුදල් (වැඩිවීම)/අඩුවීම | (16,883,582) | 1,290,483 |
| අනෙකුත් ජංගම වත්කම් (වැඩිවීම)/අඩුවීම | (11,985,514) | 2,712,654 |
| පූර්ව ගෙවීම් (වැඩිවීම)/අඩුවීම | (48,762,619) | (9,388,618) |
| ණයහිමියෝ සහ ගෙවිය යුතු වියදම් වැඩිවීම/(අඩුවීම) | 116,802,995 | 24,793,636 |
| සංස්ථාවලට ගෙවිය යුතු මුදල් වැඩිවීම/(අඩුවීම) | 7,287,361 | (456,163.92) |
| පෙර වර්ෂයේ ගැලපීම් | 256,263 | (1,794,849) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | **16,940,215** | **102,976,845** |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහ** | | |
| ස්ථාවර තැන්පතු වල ආයෝජන | - | - |
| කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ මත ආයෝජනය කල මුදල | (52,513,688) | (16,842,388) |
| ආයෝජන දේපළ මත ආයෝජිත වටිනාකම් | (28,072,696) | (22,919,159) |
| පොළී ආදායම් | 26,335,629 | 16,464,444 |
| අපහරණ දේපළවලින් ලැබූ මුදල් | 1,384,755 | 348,975 |
| දේපළ, පිරියත සහ උපකරණ අත්පත් කරගැනීම/ඉදිකිරීම | (59,887,990) | (33,864,485) |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහ** | **(114,631,440)** | **(56,812,613)** |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහ** | | |
| ලැබුණු ප්‍රදාන - ප්‍රාග්ධන/විශේෂ ව්‍යාපෘති | 93,078,964 | 63,554,716 |
| ලැබුණු ප්‍රදාන - ප්‍රාග්ධන | 98,990,000 | 24,000,000 |
| විශේෂ ව්‍යාපෘති වල ආයෝජනය | (14,003,810) | (10,463,612) |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහ** | **178,065,155** | **77,091,104** |
| මුදල් සහ මුදල් හා සමාන දෑ වල ශුද්ධ වැඩිවීම/අඩුවීම | 80,373,930 | 123,255,335 |
| වර්ෂය ආරම්භයේදී මුදල් සහ මුදල් හා සමාන දෑ | 343,300,457 | 220,045,122 |
| **වර්ෂය අවසානයේදී මුදල් සහ මුදල් හා සමාන දෑ (සටහන 22)** | **423,674,387** | **343,300,457** |

**ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය**
**වැදගත් වන ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්**

## 1. සාමාන්‍ය තොරතුරු (නෛතික ආකෘතිය සහ ස්ථිර ලිපිනය)

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය යනු 1969 අංක 36 දරන කර්මාන්ත සංවර්ධන පනත යටතේ සංස්ථාගත කරන ලද ව්‍යවස්ථාපිත මණ්ඩලයකි. මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය අංක 615, ගාලු පාර, කටුබැද්ද, මොරටුව, ශ්‍රී ලංකාව යන ලිපිනයෙහි පිහිටා ඇත.

ශ්‍රී ලංකාවේ කර්මාන්ත දිරිමත් කිරීම, ප්‍රවර්ධනය කිරීම හා සංවර්ධනය කිරීම සඳහා සහාය වීම කාර්මික සංවර්ධන මණ්ඩලයේ ප්‍රමුඛතම කාර්යන් වේ.

## 2. වැදගත් වන ගිණුම්කරණ ප්‍රතිපත්ති වල සාරාංශය

### 2.1. සකස් කිරීමේ පදනම සහ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් අනුගමනය කිරීම

මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (LKASs) සහ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්ට (SLFRS) අනුකූලව සකස් කර ඇත. මෙම මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩ පැවැත්ම පදනමකින් සකස් කර ඇති අතර වෙනත් ආකාරයකින් ප්‍රකාශ නොකළහොත් හැර, මෙම කාල පරිච්ඡේදය පුරාවට අනුකූල වන ලෙස සංගත භාවයකින් මෙම ගිණුම්කරණ ප්‍රතිපත්ති අදාළ කර ගෙන ඇත. අදාළ සටහන් යටතේ ඇති සාධාරණ වටිනාකම සම්බන්ධයෙන් සුදුසු හෙළිදරව් කිරීම් සිදු කරන අවස්ථා හැර, මූල්‍ය ප්‍රකාශන උපචිත පදනම මත සහ ඓතිහාසික පිරිවැය පදනම යටතේ සකස් කර ඇත.

මණ්ඩලයේ මූල්‍ය කාලසීමාව ජනවාරි 1 සිට දෙසැම්බර් 31 දක්වා මාස දොළහක (12) කාල සීමාවක් නියෝජනය කරයි.

### 2.2. දේපළ, පිරියත හා උපකරණ

#### 2.2.1. වත්කම්වල වටිනාකම

සියළුම දේපළ, පිරියත හා උපකරණ මූලික වශයෙන් පිරිවැයට වාර්තා කරන අතර තවදුරටත් ඓතිහාසික පිරිවැයෙන් ක්ෂයවීම් අඩුකර සඳහන් කරනු ලැබේ. අදාළ අයිතම අත්පත් කර ගැනීම සඳහා සෘජුවම දරන ලද පිරිවැය ඓතිහාසික පිරිවැයට ඇතුළත් වන අතර, අයිතමය අත්පත් කර ගන්නා අවස්ථාවේ හෝ කිසියම් කාල පරිච්ඡේදයක් ඇතුළත තොග උපදවීම හැර වෙනත් කාර්යයන් සඳහා එම කාල පරිච්ඡේදය තුළ එම අයිතමය භාවිතා කර තිබීමේ ප්‍රතිඵලයක් ලෙස ආයතනයක් දරනු ලබන බැඳීම වන එම අයිතමය ගලවා ඉවත් කර එම අයිතමය තිබූ ස්ථානය යළි යථා තත්ත්වයට පත් කිරීම සඳහා මූලිකව ඇස්තමේන්තු කරන පිරිවැය ද ඓතිහාසික පිරිවැයට ඇතුලත් වේ.

වත්කමක් ප්‍රත්‍යාගණනය කිරීමේදී, ධාරණ වටිනාකමෙහි යම් වැඩිවීමක් සිදු වුවහොත්, එය පූර්වයෙන් වියදමක් ලෙස හඳුනාගන්නා ලද එම වත්කමටම අදාළ පූර්ව ප්‍රත්‍යාගණන අඩු වීමකට ප්‍රතිවර්තනය නොවන්නේ නම්, එය සෘජුවම ප්‍රත්‍යාගණන අතිරික්තයට බැර කරනු ලැබේ. මෙවැනි අවස්ථා වලදී, වැඩිවීම පූර්වයෙන් ලියාගෙන ඇති ප්‍රමාණයට ආදායමක් ලෙස හඳුනාගෙන තිබේ. ප්‍රත්‍යාගණනයෙහි ප්‍රතිඵලයක් ලෙස වත්කමක ධාරණ වටිනාකම අඩුවූ විට, එම අඩුවීම එම වත්කමට අදාළ පූර්ව වැඩිවීමක් ප්‍රතිවර්තනය නොකරන්නේ නම් එය වියදමක් ලෙස හඳුනාගනු ලබන අතර එවැනි අවස්ථාවකදී එම අඩුවීම එම වත්කමට අදාළව ප්‍රත්‍යාගණන අතිරික්තයෙහි දරනු ලබන මුදල ඉක්මවා නොයන මට්ටමට අදාළ ප්‍රත්‍යාගණන අතිරික්තයක් තිබේ නම් එම අතිරික්තයෙන් එය අයකරනු ලැබේ. වත්කමට අදාළව ප්‍රත්‍යාගණන අතිරික්තයෙහි කිසියම් ශේෂයක් ඉතිරි වී තිබේ නම්, එය එම වත්කම ඉවත් කිරීමේදී හෝ බැහැර කිරීමේදී සෘජුවම සමුච්චිත ලාභයට / (අලාභයට) මාරු කරනු ලැබේ.

**ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය**
**මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)**

### 2.2.1. ඉතිරි කොටස....

අයිතමය හා සම්බන්ධ අනාගත ආර්ථික ප්‍රතිලාභ කාර්මික සංවර්ධන මණ්ඩලය වෙත ප්‍රවාහය වීම සිදුවිය හැකි නම් සහ අයිතමයේ පිරිවැය විශ්වාසදායක ලෙස මැනිය හැකි නම් පමණක්, ඉන්පසුව දරනු ලබන පිරිවැය යෝග්‍ය පරිදි වත්කම් ධාරණ වටිනාකමට ඇතුලත් කිරීම හෝ වෙනම ම වත්කමක් ලෙස හඳුනා ගැනීම සිදුකරනු ලැබේ. ප්‍රතිස්ථාපනය කරන ලද කොටසේ ධාරණ වටිනාකම ඉවත් කරනු ලැබේ. සියලුම අලුත්වැඩියා සහ නඩත්තු වියදම්, එම වියදම් දරන ලද මූල්‍ය කාල පරිච්ඡේදය ඇතුළත ආදායම් ප්‍රකාශනයට ඇතුලත් කරනු ලැබේ.

### 2.2.2. ක්ෂයවීම්

දේපළ, පිරියත හෝ උපකරණ අයිතමයක් භාවිතා කිරීම සඳහා සූදානම්ව තිබීම ආරම්භ වූ දිනයේ සිටම ක්ෂයවීම් අඩුකිරීම ආරම්භ වන අතර එම අයිතමය ඉවත් කරන තුරු එම කාල පරිච්ඡේදය තුළ එම උපකරණය ප්‍රයෝජනයට නොගෙන තිබුණ ද, අඛණ්ඩව ක්ෂයවීම් අඩුකරනු ලැබේ. ක්ෂයවීම සරල රේඛීය පදනමකින් දේපළ, පිරියත හෝ උපකරණ අයිතමයේ ඇස්තමේන්තු කර ඇති ප්‍රයෝජනවත් ආයු කාලය පුරා ආදායම් ප්‍රකාශනයට අය කරනු ලැබේ. ඉඩම් ක්ෂය කිරීම සිදු නොකෙරේ. ඇස්තමේන්තු කල ප්‍රයෝජනවත් ජීවිත කාලයන් පහත සඳහන් පරිදි වේ:

| | | |
|---|---|---|
| 1. | ඉඩම් වැඩිදියුණු කිරීම් සහ ගොඩනැගිලි | 2.5% (වසර 40) |
| 2. | පරිගණක මෘදුකාංග | 7% (වසර 14) |
| 3. | පිරියත සහ යන්ත්‍ර සූත්‍ර, මුද්‍රණ යන්ත්‍ර, කාර්යාලීය උපකරණ, විද්‍යාගාර උපකරණ, ලී බඩු සහ සවිකිරීම්, පාපැදි, විවිධ වත්කම්, උපයෝජ්‍ය සේවා, PABX පද්ධති සහ වෙනත් වත්කම් | 10% (වසර 10) |
| 4. | පරිගණක සහ මෝටර් වාහන | 20% (වසර 05) |
| 5. | මෙවලම්, පොත් සහ ගමන් මලු | 25% (වසර 04) |

වත්කම් වල අවශේෂ වටිනාකම් සහ ප්‍රයෝජනවත් ජීවිත කාලයන් එක් එක් ගිණුම්කරණ කාලය අවසානයේදී සමාලෝචනය කර යෝග්‍ය වන්නේ නම් ගැලපීම් සිදු කරනු ලැබේ.

වත්කමක ධාරණ වටිනාකම එහි ඇස්තමේන්තු කළ නැවත අයකර ගත හැකි වටිනාකමට වඩා වැඩි නම්, එකෙණෙහිම එම වත්කමෙහි ධාරණ වටිනාකම එහි නැවත අයකර ගත හැකි වටිනාකමට ලියා තබනු ලැබේ.

බැහැර කිරීමේදී සිදුවන ලාභය/පාඩුව බැහැර කිරීමෙන් ලබන මුදල ධාරණ වටිනාකම හා සංසන්දනය කිරීමෙන් තීරණය කරනු ලැබේ. එවැනි ලාභ/පාඩු ආදායම් ප්‍රකාශනයෙහි ඇතුළත් කර තිබේ.

සටහන - 1997 දී ප්‍රදානයක් ලෙස ලැබුණු අධි සංඛ්‍යාත ප්‍රේරක ඌෂ්මකය හානියට පත් වී සම්පූර්ණයෙන්ම ක්ෂය වී ඇති අතර වර්ෂය තුළ රු.1,356,000 කට බැහැර කර ඇත.

**2.3.** ප්‍රාග්ධනිත නොකරන ලද ඉඩම් පිළිබඳ විස්තර

**පහත සඳහන් ඉඩම් කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් පරිහරණය කරනු ලබන නමුත් මණ්ඩලයට එම ඉඩම් වල නීත්‍යානුකූල හිමිකමක් නොමැති බැවින් මණ්ඩලය ඒවා ප්‍රාග්ධනිත කර නොමැත:**

| අංකය | ඉඩම පිහිටා ඇති දිස්ත්‍රික්කය | වර්ගඵලය | | | භාවිතා කරන කාර්යය | භුක්තිය ලබා ගත් දිනය | අත්පත් කර නොගැනීමට හේතුව | අත්පත් කර ගැනීමට ගෙන ඇති ක්‍රියාමාර්ගය |
|---|---|---|---|---|---|---|---|---|
| | | අක්කර | රූඩ් | පර්චස් | | | | |
| 1 | අනුරාධපුරය | | 1 | 20 | ප්‍රාදේශීය කාර්යාලය | 1971 සිට | රජයේ ඉඩමකි | බුක්තිය ලබා දී ඇත, නමුත් අයිතිය පවරා දී නොමැත. |
| | | | | | පොදු සේවා මධ්‍යස්ථානය | | රජයේ ඉඩමකි | බුක්තිය ලබා දී ඇත, නමුත් අයිතිය පවරා දී නොමැත. |
| 2 | පොළොන්නරුව | | 3 | 26.6 | ප්‍රාදේශීය කාර්යාලය සහ සංචාරක බංගලාව | 1992 සිට | රජයේ ඉඩමකි | දිස්ත්‍රික් ලේකම් වෙත භාර දී ඇත. |
| 3 | මාතර | 1 | 1 | 6.2 | ප්‍රාදේශීය කාර්යාලය සහ පොදු සේවා මධ්‍යස්ථානය | | | අතිරේක ඉඩම් රෙජිස්ට්‍රාර් - මාතර විසින් ලිපියක් මඟින් මණ්ඩලයට බුක්තිය පවරා දී ඇත. |
| 4 | හම්බන්තොට | | | | ප්‍රාදේශීය කාර්යාලය | 2006 සිට | ඉඩම සංවර්ධනය කිරීම සඳහා අනුමැතිය ලබා දී ඇත. | |
| 5 | කුරුණෑගල | | | | සම් භාණ්ඩ මධ්‍යස්ථානය, වාරියපොළ | | | ඉඩම අත්පත් කර ගැනීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත. |
| 6 | මොණරාගල | | | 48 | ප්‍රාදේශීය කාර්යාලය | | රජයේ ඉඩමකි | ඉඩම භාවිතා කිරීම සඳහා ලිපියක් මඟින් මණ්ඩලයට බුක්තිය ලබා දී ඇත. |
| 7 | බදුල්ල | | | 50 | "ගම් උදා" මධ්‍යස්ථානය - මහියංගනය | 1997 සිට | | NADA වෙත භාර දී ඇත. |
| 8 | කොළඹ | හෙක්ටයාර 1.2953 | | | ප්‍රධාන කාර්යාලය | | රජයේ ඉඩමකි (මොරටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය) | ඉඩම අත්පත් කර ගැනීම සඳහා අදාල ආයතන වලට ලිපියක් මඟින් ඉල්ලීම් කර ඇත. |
| | | | | | නවනිම මධ්‍යස්ථානය | | | |
| 9 | කොළඹ | හෙක්ටයාර 0.4046 | | | රබර් සංවර්ධන මධ්‍යස්ථානය | 1980 සිට | 99 අවුරුදු බදු පදනම මත | |
| 10 | අම්පාර | | | | ප්‍රාදේශීය කාර්යාලය | | රජයේ ඉඩමකි | ලිපියක් මඟින් පවරා දී ඇත. |
| 11 | කොළඹ | 13 | 2 | 6 | කාර්මික ජනපදය, පානළුව | 2006 සිට | | නිදහස් දීමනා පත්‍රයක් හරහා හිමිකාරිත්වය IDB වෙත ලබාගෙන ඇත. (2023 පෙබරවාරි 23 දින අත්පත් කර ගන්නා ලදි) |
| 12 | බද්දේගම | 1 | 2 | 0.5 | කාර්මික ජනපදය | 1992 සිට | | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට ඉඩම් පැවරීම සඳහා කාර්මික සංවර්ධන මණ්ඩලය සහ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව අතර සාකච්ඡා පවත්වා ඇත. |
| 13 | බෙලිඅත්ත | 10 | 0 | 29.2 | කාර්මික ජනපදය | 1995 සිට | | |

**ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය**
**මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)**

## 2.4. ආයෝජන දේපළ

ආයෝජන දේපළ ආරම්භයේ දී පිරිවැයෙන් හඳුනාගනු ලබයි. ප්‍රධාන අලුත්වැඩියාවන් සහ වැඩිදියුණු කිරීම් සඳහා වන පිරිවැය ප්‍රාග්ධනීත කර ඇත. නඩත්තු කිරීම්, අළුත්වැඩියා කිරීම් සහ සුළු වැඩිදියුණු කිරීම් සඳහා වන පිරිවැය, එය සිදු වූ අවස්ථාවේ දී, ලාභ හා අලාභ තුළ හඳුනා ගැනේ. ආයෝජන දේපළක් බැහැර කිරීමේදී, බැහැර කිරීමෙන් ලැබෙන මුදල සහ ධාරණ වටිනාකම අතර වෙනස ලාභ හා අලාභ තුළ හඳුනා ගනු ලැබේ.

ක්ෂය කිරීම සඳහා ප්‍රතිපාදන ගණනය කරනු ලබන්නේ සියලු දේපළවල පිරිවැය හෝ තක්සේරුව මත සරල රේඛීය පදනමක් භාවිතා කිරීමෙනි. ඉඩම් වැඩිදියුණු කිරීම් සහ ගොඩනැගිලි සඳහා වාර්ෂික ක්ෂයවීම් අනුපාතය 2.5% වේ.

## 2.5. මූල්‍ය වත්කම්

### 2.5.1. වර්ගීකරණය

කාර්මික සංවර්ධන මණ්ඩලය මූල්‍ය වත්කම් අත්පත් කර ගත් කාර්යය පදනම් කර ගෙන එහි මූල්‍ය වත්කම් ණය සහ ලැබිය යුතු මුදල් වශයෙන් වර්ග කර ඇත.

**ණය සහ ලැබිය යුතු මුදල්:**

ණය සහ ලැබිය යුතු මුදල් සක්‍රිය වෙළඳ පොළක මිල ගණන් ප්‍රකාශ නොකළ ස්ථාවර හෝ නිශ්චය කල හැකි ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් වේ. ඒවා ශේෂ පත්‍ර දිනෙන් පසු, මාස 12 ට වැඩි කල්පිරීම් හැරෙන්නට වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දෑ වශයෙන් ජංගම වත්කම් වල ඇතුළත් කර ඇත.

### 2.5.2. මූල්‍ය වත්කම් හඳුනාගැනීම

ණය සහ ලැබිය යුතු මුදල් ආරම්භක අවස්ථාවේදී සාධාරණ වටිනාකමට ගණුදෙනු පිරිවැය එකතුකළ අගයට හඳුනාගනු ලබන අතර ඉන්පසුව සඵල පොළී ක්‍රමය භාවිතා කරමින් ක්‍රමක්ෂය කල පිරිවැයට ගෙනයනු ලැබේ.

### 2.5.3. මූල්‍ය උපකරණ හිලව් කිරීම

හඳුනාගත් වටිනාකම් හිලව් කිරීම සඳහා නීත්‍යානුකූලව බලාත්මක කළහැකි අයිතියක් ඇති විට සහ ශුද්ධ පදනමක් මත පියවීමට හෝ එකවර වත්කම උපලබ්ධි කර වගකීම් පියවීමේ චේතනාවක් ඇති විට මූල්‍ය වත්කම් සහ වගකීම් හිලව් කර ශුද්ධ වටිනාකම ශේෂ පත්‍රයේ වාර්තා කරනු ලැබේ.

**ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය**
**මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)**

## 2.5.4. මූල්‍ය වත්කම් හානිකරණය

### ක්‍රමක්ෂය කල පිරිවැයට ගෙන යනු ලබන වත්කම් (ණය සහ ලැබිය යුතු මුදල්)

සෑම වාර්තාකිරීමේ කාල පරිච්ඡේදයක් අවසානයේදී ම කාර්මික සංවර්ධන මණ්ඩලය එහි මූල්‍ය වත්කමකට හානි සිදුවී ඇති බවට වෛෂයික සාක්ෂි තිබේද යන්න තක්සේරු කරයි. කාර්මික සංවර්ධන මණ්ඩලයේ මූල්‍ය වත්කමක් මූලික වශයෙන් හඳුනා ගැනීමෙන් අනතුරුව සිදුවූ සිද්ධීන් (අලාභ සිද්ධි) එකක හෝ වැඩි ගණනක ප්‍රතිඵලයක් ලෙස එම වත්කම් හානිකරණය වී ඇති බවට වෛෂයික සාක්ෂි ඇත්නම් පමණක් සහ එම අලාභ සිද්ධිය (සිද්ධීන්) විශ්වසනීය ලෙස ඇස්තමේන්තු කළ හැකි පරිදි කාර්මික සංවර්ධන මණ්ඩලයේ ඇස්තමේන්තු කල අනාගත මුදල් ගලනයන්ට බලපෑමක් ඇතිකරන්නේ නම් කාර්මික සංවර්ධන මණ්ඩලයේ මූල්‍ය වත්කමක් හෝ වත්කම් හානි වී ඇති බවට සලකනු ලබන අතර මණ්ඩලය හානිකරණ පාඩු දරනු ලැබේ. හානිකරණට අදාළ වෛෂයික සාක්ෂි පවතින්නේ ද යන්න කාර්මික සංවර්ධන මණ්ඩලය මුලින්ම තක්සේරු කරයි.

ණය සහ ලැබිය යුතු මුදල් සඳහා අලාභයෙහි වටිනාකම වත්කමෙහි ධාරණ වටිනාකමෙහි සහ වත්කමෙහි මුල් සඵල පොළී අනුපාතයට වට්ටම් කරන ලද ඇස්තමේන්තු කල අනාගත මුදල් ගලනයන් හි (දැනට අලාභය දරා නොමැති අනාගත ණය අලාභ හැර) වර්තමාන වටිනාකම අතර වෙනස ලෙස මනිනු ලැබේ. වත්කමෙහි ධාරණ අගය අඩු කරනු ලබන අතර අලාභයෙහි වටිනාකම විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගනු ලැබේ.

පසුව එළඹෙන කාල පරිච්ඡේදයකදී හානිකරණ අලාභයෙහි වටිනාකම අඩු වන්නේ නම් සහ එම අඩුවීම වෛෂයිකව හානිකරණය හඳුනා ගැනීමෙන් පසුව සිදු වූ සිදුවීමකට (ණයගැතියාගේ ණය ශ්‍රේණිගත කිරීමෙහි වර්ධනයක් වැනි) අදාළව විය හැකි නම්, පූර්වයෙන් හඳුනා ගන්නා ලද හානිකරණ අලාභය ප්‍රතිවර්ත කිරීම විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයෙහි හඳුනා ගනු ලැබේ.

වෙළඳ ලැබිය යුතු දෑ හානිකරණ පරීක්ෂා කිරීම 2.8 වැනි සටහනෙහි විස්තර කර ඇත.

## 2.6. මූල්‍ය වගකීම්

මූල්‍ය වගකීම් වලට වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ සහ ණයට ගැනීම් ඇතුළත් වේ. ණය හැර අනෙකුත් සියලුම මූල්‍ය වගකීම් ආරම්භක අවස්ථාවේදී ඒවායේ සාධාරණ වටිනාකමට හඳුනා ගනු ලබන අතර ඉන්පසුව, වට්ටම් කිරීමෙහි ප්‍රතිඵලය නොසැලකිය හැකි මට්ටමේ නොමැති නම්, සඵල පොළී ක්‍රමය යොදා ගනිමින් ක්‍රමක්ෂය කල පිරිවැයට ඒවා මනිනු ලබන අතර එවිට ඒවා පිරිවැයට සඳහන් කරනු ලැබේ.

## 2.7. තොග

තොග වටිනාකම පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයට තොග තක්සේරු කරනු ලැබේ. සාමාන්‍ය පිරිවැය ක්‍රමය (AVCO Method) යොදා ගනිමින් පිරිවැය තීරණය කරනු ලැබේ. ශුද්ධ උපලබ්ධි අගය යනු සාමාන්‍ය ව්‍යාපාර පරිපාටියෙහි දී තොග විකිණිය හැකි මිලෙන් නිම කිරීමේ ඇස්තමේන්තු කල පිරිවැය සහ විකිණීම සිදුකිරීම සඳහා ඇස්තමේන්තු කල පිරිවැය අඩු කළ විට ලැබෙන මිලයි. තොග ඒවායේ වර්තමාන පිහිටීමට සහ තත්ත්වයට ගෙන ඒමට දරන ලද පිරිවැය පහත සඳහන් පරිදි ගිණුම්ගත කරනු ලැබේ.

| | |
|---|---|
| අමුද්‍රව්‍ය | --- පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයට |
| නිමි භාණ්ඩ | --- පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයට |
| ක්‍රියාත්මක කෙරෙමින් පවතින වැඩ | --- සෘජු ද්‍රව්‍ය, සෘජු ශ්‍රමය සහ සාමාන්‍ය මෙහෙයුම් ධාරිතාව පදනම් කර ගත් නිෂ්පාදන පොදු කාර්ය වලින් යෝග්‍ය කොටසක පිරිවැයට. |

**ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය**
**මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)**

### 2.8. වෙළඳ ලැබිය යුතු දෑ

වෙළඳ ලැබිය යුතු දෑ යනු සාමාන්‍ය ව්‍යාපාර පරිපාටියේ දී විකුණන ලද භාණ්ඩ සඳහා හෝ ඉටුකරන ලද සේවා සඳහා ගණුදෙනුකරුවන් ගෙන් අය විමට ඇති මුදල් වේ. එක් වර්ෂයක් හෝ එයට අඩු කාලයක් තුළ අය කර ගැනීමට අපේක්ෂා කරන්නේ නම් (හෝ ව්‍යාපාරයේ සාමාන්‍ය මෙහෙයුම් චක්‍රයේ දී එයටත් වැඩි කාලයක් නම්), එම මුදල් ජංගම වත්කම් ලෙස වර්ගීකරණය කරනු ලැබේ. නොඑසේ නම් ඒවා ජංගම නොවන වත්කම් ලෙස ඉදිරිපත් කරනු ලැබේ.

කාර්මික සංවර්ධන මණ්ඩලයට ලැබිය යුතු දේ වලට අදාළ මුල් කොන්දේසි අනුව අයවීමට ඇති සියලුම වටිනාකම් අය කර ගැනීමට නොහැකි වනු ඇතැයි වෛෂයික සාක්ෂි ඇති විට, වෙළඳ ලැබිය යුතු දෑ හානිකරණය සඳහා ප්‍රතිපාදනයක් පිහිටුවනු ලැබේ. ණයගැනියාගේ සැලකිය යුතු මූල්‍ය දුෂ්කරතා, ණයගැනියා බංකොලොත්භාවයට හෝ මූල්‍ය ප්‍රතිසංවිධානයට පත්වීමට ඉඩ තිබීම, ගෙවීම් පැහැර හැරීම හෝ කඩ කිරීම ආදිය වෙළඳ ලැබිය යුතු දෑ හානිකරණය වී ඇති බව පෙන්නුම් කරන සාධක වේ. ප්‍රතිපාදනයෙහි වටිනාකම, වත්කමෙහි ධාරණ වටිනාකම සහ මුල් සඵල පොළී අනුපාතයට වට්ටම් කළ ඇස්තමේන්තු කල අනාගත මුදල් ගලනයන් හි වර්තමාන වටිනාකම අතර වෙනස වේ. 2018 වර්ෂයේ සිට පහත සඳහන් පරිදි ප්‍රතිපාදන ගණනය කරනු ලැබේ:

| වයස | | ප්‍රතිපාදන % |
|---|---|---|
| ප්‍රවර්තන වර්ෂය | - | 0% |
| වසර 01 - 02 | - | 10% |
| වසර 03 - 05 | - | 25% |
| වසර 05 ට වැඩි | - | 100% |

### 2.9. මුදල් සහ මුදල් හා සමාන දෑ

මුදල් සහ මුදල් හා සමාන දෑට අත ඉතුරු මුදල්, බැංකු වල ඇති ඒක්ෂණ තැන්පතු, මාස 03ක හෝ ඊට අඩු මුල් කල්පිරීමේ කාලයක් සහිත අනෙකුත් කෙටි කාලීන ඉහල ද්‍රවශීලතාවයක් සහිත ආයෝජන සහ බැංකු අයිරා ඇතුළත් වේ. මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වගකීම් යටතේ බැංකු අයිරා සෘණ ශේෂයන් ලෙස පෙන්වා ඇත.

### 2.10. ප්‍රතිපාදන

කාර්මික සංවර්ධන මණ්ඩලයට අතීත සිද්ධියක ප්‍රතිඵලයක් ලෙස වර්තමාන නෛතික හෝ සම්මුතික බැඳියාවක් ඇති විට, එම බැඳියාව බේරුම් කිරීම සඳහා ආර්ථික ප්‍රතිලාභ ඇතුළත් සම්පත් ගලායාමක් සිදුවීම අවශ්‍ය විය හැකි විට සහ බැඳියාවෙහි වටිනාකම විශ්වාසනීය ලෙස තක්සේරු කල හැකි විට ඒ සඳහා ප්‍රතිපාදන හඳුනාගනු ලැබේ.

### 2.11. වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වෙනත් ගෙවිය යුතු දෑ ලෙස වර්ගීකරණය කර ඇති වගකීම් වන්නේ ඉල්ලූ විට හෝ ශේෂ පත්‍ර දිනයේ සිට එක් වර්ෂයක කාලයක් ඇතුළත ගෙවීමට නියමිතව ඇති ගෙවිය යුතු දෑ වේ. ජංගම නොවන වගකීම් ලෙස වර්ගීකරණ කර ඇති අයිතම වන්නේ ශේෂ පත්‍ර දිනයේ සිට එක් වර්ෂයකට වැඩි කාල පරිච්ඡේදයක දී ගෙවීමට නියමිතව ඇති වගකීම් වේ.

**ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය**
**මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)**

## 2.12. නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම

නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම යන්නෙන් අදහස් කරන්නේ සේවකයෙකු විශ්‍රාම ගැනීමේ දී එම සේවකයාට ලැබෙන ප්‍රතිලාභයෙහි වටිනාකම වන අතර එය සාමාන්‍යයෙන් සේවය කර ඇති වසර ගණන සහ වන්දි මුදල (වේතනය) වැනි සාධක එකක් හෝ වැඩි ගණනක් මත රඳා පවතී. නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම 1983 අංක 12 දරන පනත යටතේ ලබාදෙන පාරිතෝෂිකයෙන් සමන්විත වේ. නිශ්චිත ප්‍රතිලාභ සැලැස්මේ දිගුකාලීන ස්වභාවය හේතුවෙන්, එවැනි ඇස්තමේන්තු සැලකිය යුතු අවිනිශ්චිතතාවයකට යටත් වේ.

නිශ්චිත ප්‍රතිලාභ බැඳියාව ප්‍රක්ෂේපිත ඒකක ණය ක්‍රමය (PUC) භාවිතා කර වාර්ෂිකව ගණනය කරනු ලැබේ. ප්‍රතිලාභ ගෙවනු ලබන ව්‍යවහාර මුදලින් බලපවත්වන රජයේ බැඳුම්කර වල පොළී අනුපාත භාවිතා කරමින් ඇස්තමේන්තු කරන ලද සහ කල්පිරීම සඳහා අදාළ විශ්‍රාම බැඳියාවෙහි කොන්දේසි වලට ආසන්නවන කොන්දේසි සහිත අනාගත මුදල් ගලා යෑම් වට්ටම් කරමින් නිශ්චිත ප්‍රතිලාභ බැඳියාවෙහි වර්තමාන වටිනාකම තීරණය කරනු ලැබේ.

අත්දැකීම් ගැලපීම් සහ ක්‍රියාකාරී උපකල්පනයන් හි වෙනස්කම් මගින් හටගන්නා ක්‍රියාවලි ලාභ සහ පාඩු එම ලාභ හෝ පාඩු හටගන්නා කාල පරිච්ඡේදය තුළ පරිපූර්ණ ආදායමෙහි ස්කන්ධයට අය කිරීම හෝ බැර කිරීම සිදු කරනු ලැබේ.

සැලැස්මෙහි සිදු කරන වෙනස්කම් නිශ්චිත කාල පරිච්ඡේදයක් සඳහා (පැවරීමේ කාල පරිච්ඡේදය) සේවයේ රැඳී සිටින සේවකයින්ට කොන්දේසි නොවන්නේ නම් අතීත සේවා පිරිවැය එකෙණෙහි ම පරිපූර්ණ ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගනු ලැබේ. මෙසේ කිරීමේ දී, අතීත සේවා පිරිවැය පැවරීමේ කාල පරිච්ඡේදය පුරා සරල රේඛීය පදනමකට ක්‍රමක්ෂය කරනු ලැබේ.

## 2.13. නිශ්චිත දායක සැලැස්ම

කාර්මික සංවර්ධන මණ්ඩලයේ සියලුම ස්ථිර සහ කොන්ත්‍රාත් සේවකයින් සේවක අර්ථසාධක අරමුදලෙහි (EPF) සහ සේවක භාරකාර අරමුදලෙහි (ETF) සාමාජිකයින් වන අතර, ඒ සඳහා කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් අනුපිළිවෙලින් එවැනි සේවකයින්ගේ මූලික වේතනය හෝ වැටුප සහ ජීවන වියදම් දීමනා වලින් 12% සහ 3% බැගින් දායක මුදල් ගෙවනු ලැබේ.

## 2.14. ආයෝජන

ආයෝජන, තනි ආයෝජන පදනමින් තීරණය කරන ලද පිරිවැයට ගෙනයනු ලැබේ.

## 2.15. රජයේ ප්‍රදාන

රජයෙන් ලැබෙන ප්‍රදාන ඒවායේ සාධාරණ වටිනාකමට හඳුනාගනු ලබන අතර මෙහි දී ප්‍රදානය ලැබෙනු ඇති බවට සහ කණ්ඩායම ඒ සම්බන්ධිත සියලු කොන්දේසි වලට එකඟ වනු ඇති බවට සාධාරණ සහතිකයක් ඇත.

පිරිවැයට අදාළ රජයේ ප්‍රදාන මගින් හිලව් කිරීමට අපේක්ෂිත පිරිවැය සමඟ ගැලපීමට අවශ්‍ය කරන කාල පරිච්ඡේදය පුරා එම ප්‍රදාන ආදායම් ප්‍රකාශනයෙහි විලම්භනය කර හඳුනා ගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ වලට අදාළ රජයේ ප්‍රදාන, විලම්භිත රජයේ ප්‍රදාන ලෙස ජංගම නොවන වත්කම් වල ඇතුළත් කර ඇති අතර, අදාළ වත්කම් වල අපේක්ෂිත ජීවිත කාලය පුරා සරල රේඛීය පදනමකට ආදායම් ප්‍රකාශනයට බැර කරනු ලැබේ.

**ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය**

**මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)**

**2.16.** පරිත්‍යාග

පරිත්‍යාග යනු සාමාන්‍යයෙන් අන්‍යෝන්‍ය නොවන මාරුකිරීම් වේ. කෙසේ වුවත්, කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් දායකයා වෙත නාම මාත්‍ර ප්‍රතිෂ්ඨාව ලබා දෙන අවස්ථා තිබිය හැක. එවැනි පරිත්‍යාග සඳහා, දායකයින් වෙත ලබාදී ඇති ප්‍රතිෂ්ඨාව, අසාධාරණ හුවමාරු ගනුදෙණුවක් ප්‍රතිඵලය වන තරමට, ලැබුණු පරිත්‍යාගයෙහි ප්‍රතිෂ්ඨාවට වඩා සැලකිය යුතු තරමින් අඩු නම්, ඒවා ලැබුණු පරිත්‍යාග ලෙස හඳුනා ගත යුතුය.

**2.17.** ආදායම් හඳුනාගැනීම

**2.17.1.** විකුණන ලද භාණ්ඩ සහ ඉටුකරන ලද සේවා

හිමිකාරිත්වයේ සැලකිය යුතු අවදානම් සහ ප්‍රතිලාභ ගැනුම්කරුට පවරා දී ඇති විට භාණ්ඩ අලෙවි කිරීමෙන් උපයාගත් ආදායම ආදායම් ප්‍රකාශනයේ හඳුනා ගනු ලැබේ. අයවීමට ඇති ප්‍රතිෂ්ඨාව, ආශ්‍රිත පිරිවැය අයකර ගැනීම හෝ භාණ්ඩ ආපසු එවිය හැකි වීම පිළිබඳ සැළකිය යුතු අවිනිශ්චිතතාවයන් තිබේ නම් කිසිදු ආදායමක් හඳුනාගනු නොලැබේ.

**2.17.2.** පොළී ආදායම

පොළී ආදායම කාල සමානුපාත පදනමකින් හඳුනාගනු ලබන අතර එවැනි ආදායම කාර්මික සංවර්ධන මණ්ඩලයේ සාමාන්‍ය ක්‍රියාකාරකම් සිදුකිරීමේ දී විකුණනු ලබන භාණ්ඩ සඳහා හෝ ඉටු කරනු ලබන සේවා සඳහා ලැබෙන හෝ ලැබිය යුතු ප්‍රතිෂ්ඨාවෙහි සාධාරණ වටිනාකමෙන් සමන්විත වේ. එකතු කළ අගය මත බද්ද (VAT), ප්‍රතිලාභය, ප්‍රතිදානය සහ වෙළඳ වට්ටම් තිබේ නම් ඒවායේ ශුද්ධ අගය මගින් ආදායම පෙන්වනු ලැබේ.

**2.18.** වියදම් හඳුනාගැනීම

**2.18.1.** මෙහෙයුම් වියදම්

වියදම් උපචිත පදනමකින් හඳුනාගනු ලැබේ. කාල පරිච්ඡේදය සඳහා ලාභය ගණනය කිරීමේදී සාමාන්‍ය ව්‍යාපාර පරිපාටියෙහි දී සහ කාර්යක්ෂම තත්ත්වයෙන් දේපොළ, පිරියත සහ උපකරණ නඩත්තු කිරීමෙහි දී දරන ලද සියලු වියදම් ආදායමට අය කරනු ලැබේ.

**2.18.2.** ශුද්ධ මූල්‍ය පිරිවැය

ශුද්ධ මූල්‍ය පිරිවැය ආදායම් ප්‍රකාශනයේ හඳුනාගනු ලබන ණයට ගැනීම් සඳහා ගෙවිය යුතු පොළිය, ආයෝජනය කරන ලද අරමුදල් වලින් ලැබිය යුතු පොළිය සහ විදේශ විනිමය ලාභ සහ පාඩු වලින් සමන්විත වේ.

ණයට ගැනීම් සම්බන්ධයෙන් දරන ලද සියලු පොළී සහ අනෙකුත් පිරිවැය ශුද්ධ මූල්‍ය පිරිවැයෙහි කොටසක් ලෙස වියදම් දරා ඇත.

**මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)**

## 3. මූල්‍ය අවදානම් කළමනාකරණය

### 3.1. මූල්‍ය අවදානම් සාධක

කාර්මික සංවර්ධන මණ්ඩලයේ ප්‍රධාන මූල්‍ය උපකරණ බැංකු ණය, කෙටි කාලීන තැන්පතු සහ මුදල් වලින් සමන්විත වේ. මෙම මූල්‍ය උපකරණ වල ප්‍රධාන අරමුණ වන්නේ කාර්මික සංවර්ධන මණ්ඩලයේ මෙහෙයුම් වල ද්‍රවශීලතාව ඉහළ නැංවීම සහ පවත්වා ගෙන යාම සහ කාර්මික සංවර්ධන මණ්ඩලයේ සංචිත මත ලැබෙන ප්‍රතිලාභය උපරිම කිරීමයි. කාර්මික සංවර්ධන මණ්ඩලයට එහි ව්‍යාපාර ක්‍රියාකාරකම් වලින් සෘජුව ම ඇතිවන ලැබිය යුතු වෙළඳ සහ ගෙවිය යුතු වෙළඳ ආදී වශයෙන් වූ වෙනත් විවිධ මූල්‍ය උපකරණ ද තිබේ.

කාර්මික සංවර්ධන මණ්ඩලය විවිධ වූ මූල්‍ය අවදානම් රැසකට නිරාවරණය වී ඇත. අනෙකුත් ඒවා අතර, විදේශ විනිමය අවදානම්, ණය අවදානම්, පොළී අනුපාත අවදානම් සහ ද්‍රවශීලතා අවදානම් මෙයට අයත් වේ. කාර්මික සංවර්ධන මණ්ඩලයේ ආර්ථික දර්ශනය සහ මෙම අවදානම් වලට එහි ඇති නිරාවරණය පදනම් කර ගෙන කාර්මික සංවර්ධන මණ්ඩලයේ අධ්‍යක්ෂක මණ්ඩලය කලින් කලට විවිධ අවදානම් කළමනාකරණ ක්‍රමෝපායයන් අනුමත කරයි.

සාමාන්‍යයෙන් ණය අවදානමට භාජනය වන මූල්‍ය වත්කම් වල උපරිම අවදානම් තත්ත්වය ඒවායෙහි ධාරණ අගයට සමාන වේ. පහත වගුව මඟින් උපරිම අවදානම් තත්ත්වයන් පෙන්නුම් කර ඇත. (2023.12.31 දිනට)

(ශ්‍රී.ල.රු.)

| | වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දෑ | මුදල් සහ මුදල් හා සමාන දෑ | එකතුව |
|---|---|---|---|
| **අවදානම් නිරාවරණය** | | | |
| **වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දෑ** | 39,999,292 | - | 39,999,292 |
| **මුදල් සහ මුදල් හා සමාන දෑ** | - | 423,674,387 | 423,674,387 |
| | **39,999,292** | **423,674,387** | **463,673,679** |

### 3.1.1. පොළී අනුපාත අවදානම

පොළී අනුපාත අවදානම යනු වෙළඳපොළ පොළී අනුපාතවල සිදුවන වෙනස්කම් නිසා මූල්‍ය උපකරණ වල සාධාරණ වටිනාකම හෝ අනාගත මුදල් ගලනයන් උච්චාවචනය විය හැකි වීමේ අවදානමයි. කාර්මික සංවර්ධන මණ්ඩලය වෙළඳ පොළ පොළී අනුපාත වෙනස් වීමේ අවදානමට ඇති නිරාවරණය මූලික වශයෙන්ම කාර්මික සංවර්ධන මණ්ඩලයෙහි පාවෙන අනුපාත සහිත ණය බැඳීම්වලට අදාළව වේ. කාර්මික සංවර්ධන මණ්ඩලය දෛනිකව මුදල් ගලනයන් අධීක්ෂණය කිරීම සහ කළමනාකරණය කිරීම, ණයට ගැනීම් අවම මට්ටමක තබා ගැනීම, සහ ණයට ගැනීම හා තැන්පතු සඳහා වාසිදායක අනුපාතයන් ගිවිස ගැනීම ආදී ක්‍රම මඟින් එහි පොළී අනුපාත අවදානම කළමනාකරණය කරයි.

කාර්මික සංවර්ධන මණ්ඩලය විචල්‍ය පොළී අනුපාත යටතේ ණය ලබා ගෙන නොමැති නිසා 2023 දෙසැම්බර් 31 වැනි දිනට කාර්මික සංවර්ධන මණ්ඩලය පොළී අනුපාත අවදානමකට නිරාවරණය වී නොමැත.

**ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය**

**මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)**

### 3.1.2. ණය අවදානම

මුදල් සහ මුදල් හා සමාන දෑ, ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ, සහ බැංකු හා මූල්‍ය ආයතනවල ඇති තැන්පතු මෙන්ම හිඟ ලැබිය යුතු දෑ සහ සිදුකල ගණුදෙනු ද ඇතුළත්ව විදේශ ගණුදෙනුකරුවන්ට ඇති ණය නිරාවරණයන් ආදියෙන් ණය අවදානම ඇතිවේ.

### 3.2. ප්‍රාග්ධන කළමනාකරණය

ප්‍රාග්ධනය කළමනාකරණය කිරීමේ දී, කාර්මික සංවර්ධන මණ්ඩලයේ අරමුණු වන්නේ කොටස්කරුවන්ට ප්‍රතිලාභ ලබාදීම සහ අනෙකුත් පාර්ශ්වකරුවන්ට ප්‍රයෝජන සලසා දීම පිණිස ප්‍රවර්තන ව්‍යාපාරයක් ලෙස අඛණ්ඩව පවත්වාගෙන යාමට කාර්මික සංවර්ධන මණ්ඩලය සතු හැකියාව ආරක්ෂා කිරීමත්, ප්‍රාග්ධන පිරිවැය අඩුකිරීම සඳහා ප්‍රශස්ත ප්‍රාග්ධන ව්‍යුහයක් පවත්වා ගැනීමත් ය.

කර්මාන්තයේ නියැලී සිටින අනෙකුත් කර්මාන්තකරුවන් හා අනුකූලව, කාර්මික සංවර්ධන මණ්ඩලය තෝලන අනුපාතය පදනමින් ප්‍රාග්ධනය අධීක්ෂණය කරයි. මෙම අනුපාතය මුළු හිමිකම් වලින් මුළු ණයට ගැනීම් ලෙස ගණනය කරනු ලැබේ. මුළු ණය ගැනුම් වලට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි පෙන්වා ඇති පරිදි ජංගම නොවන සහ ජංගම ණයට ගැනීම් ඇතුළත් වේ. මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි මුළු හිමිකම් හි දක්වා ඇති පරිදි 'මුළු හිමිකම' ගණනය කරනු ලැබේ.

2023 දෙසැම්බර් 31 දිනට තෝලන අනුපාතය පහත සඳහන් පරිදි විය.

| | 2023 (ශ්‍රී.ල.රු.) | 2022 (ශ්‍රී.ල.රු.) |
|---|---|---|
| මුළු ණයට ගැනීම් | 607,318,583 | 511,948,779 |
| මුළු හිමිකම් | 1,905,822,961 | 1,759,957,940 |
| **තෝලන අනුපාතය** | **31.87%** | **29.09%** |

## 4. අවිනිශ්චිතතාවයන් සහ විනිශ්චයන් තක්සේරු කිරීමේ ප්‍රධාන මූලාශ්‍ර පිළිබඳ තොරතුරු

තක්සේරු සහ විනිශ්චයන් අඛණ්ඩව ඇගයීම් කරනු ලැබේ. ඒවා ඓතිහාසික අත්දැකීම් සහ පවතින වාතාවරණයන් යටතේ සාධාරණ යැයි විශ්වාස කළ හැකි, අනාගත සිදුවීම් පිළිබඳ අපේක්ෂාවන් ද ඇතුළත් අනෙකුත් සාධක මත පදනම්ව ඇත.

### 4.1. ඉතා වැදගත් ගිණුම්කරණ ඇස්තමේන්තු සහ උපකල්පන

කාර්මික සංවර්ධන මණ්ඩලය අනාගතය සම්බන්ධ ඇස්තමේන්තු සහ උපකල්පන සිදු කරයි. එහි ප්‍රතිඵලයක් ලෙස, ගිණුම්කරණ ඇස්තමේන්තු, ස්වභාවයෙන්ම අදාළ සත්‍ය ප්‍රතිඵල වලට සමාන වන්නේ කලාතුරකිනි. මීළඟ මූල්‍ය වර්ෂය තුළ වත්කම් සහ වගකීම් වල ධාරණ වටිනාකමට ප්‍රමාණික ගැලපීමක් සිදු කිරීමට හේතු වන සැලකිය යුතු අවදානමක් සහිත ඇස්තමේන්තු සහ උපකල්පන පහත අනාවරණය කර ඇත.

**ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය**

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)

## 4.1. ඉතිරි කොටස…

### 4.1.1. නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම - පාරිතෝෂික

නිශ්චිත ප්‍රතිලාභ බැඳීම් වල වර්තමාන වටිනාකම උපකල්පන කිහිපයක් භාවිතා කරමින් ආයු ගණන පදනමකින් තීරණය කරනු ලබන සාධක කිහිපයක් මත රඳා පවතී. නිශ්චිත ප්‍රතිලාභ බැඳීම් සඳහා ශුද්ධ පිරිවැය (ආදායම) තීරණය කිරීමේදී යොදාගනු ලබන උපකල්පන වලට වට්ටම් අනුපාතය, අනාගත වැටුප් වර්ධක අනුපාතය, මරණ අනුපාතිකය, කාර්යභාරයෙන් ඉවත් වීමේ සහ ආබාධිත වීමේ අනුපාතයන් සහ විශ්‍රාම ගැනීමේ වයස ඇතුළත් වේ. මෙම උපකල්පන වලට සිදුකරනු ලබන කිසියම් වෙනස්කමක් මඟින් නිශ්චිත ප්‍රතිලාභ බැඳීම් වල ධාරණ වටිනාකම මත බලපෑමක් ඇති කරනු ඇත.

නිශ්චිත ප්‍රතිලාභ බැඳීම ප්‍රක්ෂේපිත ඒකක බැර ක්‍රමය (PUC) භාවිතා කරමින් ස්වායක්ත ආයු ගණකයින් අනුව ගණනය කරනු ලැබේ. නිශ්චිත ප්‍රතිලාභ බැඳීමෙහි වර්තමාන වටිනාකම ආයු ගණක තක්සේරුකරු විසින් නිසි පොළී අනුපාත යොදා ගනිමින් ඇස්තමේන්තු කල අනාගත මුදල් ගලා යෑම් වට්ටම් කිරීමෙන් තීරණය කරනු ලැබේ.

විශ්‍රාම බැඳීම් සඳහා වන අනෙකුත් ප්‍රධාන උපකල්පන පවතින වෙළඳපොළ තත්ත්වයන් මත ද අර්ධ වශයෙන් රඳා පවතී. අමතර තොරතුරු 28 වැනි සටහනෙහි අනාවරණය කර ඇත.

### 4.1.2. දේපළ, පිරියත සහ උපකරණ වල ප්‍රයෝජනවත් ජීවිත කාලයන්

කාර්මික සංවර්ධන මණ්ඩලය, ව්‍යාපාර සැලැස්ම සහ ක්‍රමෝපායයන්, අපේක්ෂිත භාවිත මට්ටම සහ අනාගත තාක්ෂණික වැඩිදියුණු කිරීම් වැනි සාධක පදනම් කරගෙන දේපළ, පිරියත සහ උපකරණ වල ඇස්තමේන්තු කල ප්‍රයෝජනවත් ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය කරයි. ඉහත සඳහන් කල සාධක වල සිදුවන වෙනස්කම් හේතුවෙන් මෙම ඇස්තමේන්තු වල ඇති විය හැකි වෙනස්කම් මෙහෙයුම් වල අනාගත ප්‍රතිඵල වලට ප්‍රමාණික ලෙස බලපෑ හැකිය. දේපළ, පිරියත සහ උපකරණ වල ඇස්තමේන්තු කල ප්‍රයෝජනවත් ජීවිත කාලයෙහි අඩු වීමක් සිදුවීම මඟින් වාර්තාකර ඇති ක්ෂය කිරීම් වැඩිවිය හැකි අතර දේපළ, පිරියත සහ උපකරණ අඩුවිය හැක.

## 4.2. අවිනිශ්චිත වගකීම්

මුදල් වර්ෂය අවසාන වන විට නඩු 15ක් තිබුණි. කෙසේ වෙතත්, ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ නීති අංශය විසින් සපයන ලද තොරතුරු වලට අනුව, මෙම නඩුවල ප්‍රතිඵලය ලෙස කිසිදු වන්දියක් ගෙවීමට සිදුවීමේ හැකියාවක් නොමැත. එබැවින්, ඒ සම්බන්ධයෙන් කිසිදු ප්‍රතිපාදනයක් වෙන් කිරීමට තුඩුදෙන වගකීමක් පැන නැඟී නොමැත.

## 4.3. නැවත වර්ගීකරණය කිරීම් සහ සංසන්දනාත්මක සංඛ්‍යා

අවශ්‍ය තැන්හි දී ප්‍රවර්තන වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ සංසන්දනාත්මක බව වැඩිකිරීම සඳහා පෙර වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වලට යම් යම් නැවත වර්ගීකරණය කිරීම් සිදු කර තිබේ. ප්‍රවර්තන වර්ෂයේ ඉදිරිපත් කිරීමට අනුකූල කිරීම පිණිස සංසන්දනාත්මක සංඛ්‍යා ගැලපීම් කර ඇත. රේඛීය අයිතමවල සිදු කරන ලද වෙනස්කම් පෙන්වන ඉදිරිපත් කිරීම පිටු 31 සිට 33 දක්වා පෙන්වා ඇත.

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)

(සියලු මුදල් ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත)

## 05 ආදායම

### 5.1 විකුණුම්

| | 2023 | 2022 (නැවත ප්‍රකාශිත) |
|---|---|---|
| භාණ්ඩ විකිණීම (යොමු සටහන 5.1.1) | 79,199,856 | 69,426,319 |
| අබලි ද්‍රව්‍ය විකිණීම | 317,358,176 | 324,298,479 |
| කැස්පර් විකිණීම | 3,799,055 | 2,403,855 |
| ප්‍රකාශන අලෙවිය | 1,028,890 | 294,970 |
| | **401,385,977** | **396,423,623** |

### 5.1.1 භාණ්ඩ විකිණීම

| | 2023 | 2022 (නැවත ප්‍රකාශිත) |
|---|---|---|
| ඉංජිනේරු | 58,296,897 | 41,803,728 |
| සම්භාණ්ඩ | 379,121 | 1,640,952 |
| රබර් | 20,523,838 | 25,981,639 |
| | **79,199,856** | **69,426,319** |

### 5.2 සේවා

| | 2023 | 2022 (නැවත ප්‍රකාශිත) |
|---|---|---|
| කුලී - කාර්මික ජනපද | 73,564,624 | 67,436,665 |
| ජල ගාස්තු | 13,727,412 | 7,640,904 |
| අධිභාර | 2,351,015 | 3,493,238 |
| ඉඩම් සහ ගොඩනැගිලි පැවරුම් ගාස්තු | 2,748,126 | 2,022,001 |
| පුහුණු වැඩසටහන් | 39,333,336 | 31,007,104 |
| ව්‍යාපෘති වාර්තා | 735,912 | 4,297,517 |
| රසායනාගාර පරීක්ෂණ සඳහා සේවා ගාස්තු | 10,401,959 | 1,668,185 |
| | **142,862,383** | **117,565,614** |
| | **544,248,359** | **513,989,237** |

## 06 විකුණුම් සහ සේවා පිරිවැය

| | 2023 | 2022 (නැවත ප්‍රකාශිත) |
|---|---|---|
| විකුණුම් පිරිවැය - සෘජු ද්‍රව්‍ය | 26,379,148 | 44,642,010 |
| විකුණුම් පිරිවැය - කාර්මික ජනපද | 6,577,549 | 4,821,283 |
| විකුණුම් පිරිවැය - අබලි ව්‍යාපෘතිය | 220,657,133 | 193,339,535 |
| විකුණුම් පිරිවැය - කැස්පර් | 3,129,551 | 2,710,417 |
| විකුණුම් පිරිවැය - සෘජු ශ්‍රමය | 5,688,504 | 6,276,877 |
| විකුණුම් පිරිවැය - සෘජු නොවන ද්‍රව්‍ය | 39,555 | 15,803 |
| සාමාන්‍ය පොදුකාර්ය | 2,301,963 | 2,121,175 |
| යන්ත්‍ර පොදුකාර්ය | 1,565,930 | 1,883,317 |
| යන්ත්‍ර සහ පිරියත නඩත්තු කිරීම | 105,500 | 36,000 |
| විදුලිය | 16,761,091 | 7,247,911 |
| යන්ත්‍ර සහ පිරියත ක්ෂය | 8,653,639 | 8,424,418 |
| ආයෝජන දේපළ මත ක්ෂය - ඉඩම් වැඩිදියුණු කිරීම් | 12,426,609 | 11,474,544 |
| ආයෝජන දේපළ මත ක්ෂය - ගොඩනැගිලි | 7,515,982 | 7,413,026 |
| උපයෝගිතා සේවා ක්ෂය | 3,390,591 | 3,240,396 |
| ඉංජිනේරු වැඩ ගාස්තු | - | 89,250 |
| උප කොන්ත්‍රාත් ගාස්තු | - | 49,000 |
| ජල සැපයුම් නඩත්තු කිරීම | 129,171 | - |
| කාර්මික ජනපද නඩත්තු කිරීම | 4,503,402 | 2,705,876 |
| රසායනාගාර උපකරණ නඩත්තු කිරීම | 251,108 | 468,090 |
| මෙවලම් සහ අමතර කොටස් නඩත්තු කිරීම | 106 | 1,028,885 |
| ප්‍රවාහන ගාස්තු | 2,740,844 | 2,395,245 |
| පුහුණු වැඩසටහන් | 22,578,188 | 20,821,160 |
| "Get up Start up"වැඩසටහන | 7,163,624 | 1,258,563 |
| ව්‍යවසායක කාර්මික වාරිකා | 54,800 | - |
| පිරිසැකසුම් ගාස්තු - රබර් | 384,548 | 22,800 |
| රසායනාගාර පරීක්ෂණ පිරිවැය | 5,866,470 | 95,370 |
| වාහන අවසර පත්‍ර සඳහා වියදම් | 4,300 | - |
| | **358,869,304** | **322,580,951** |

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය
**මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)**

(සියලු මුදල් ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත)

| 07 පොළී ආදායම | 2023 | 2022 (Re-stated) |
|---|---|---|
| ස්ථාවර සහ කෙටි කාලීන තැන්පතු පොළිය | 16,697,620 | 10,643,966 |
| ඉතිරිකිරීම් පොළිය | 7,924,416 | 4,311,698 |
| | **24,622,036** | **14,955,664** |

| 08 වෙනත් ආදායම් | 2023 | 2022 (නැවත ප්‍රකාශිත) |
|---|---|---|
| ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය | 66,611,004 | 92,861,917 |
| ප්‍රදර්ශන (යොමු සටහන 8.1) | 190,869,338 | 62,609,386 |
| සම්මන්ත්‍රණ, සම්මේලන සහ සිදුවීම් (සටහන 8.2) | 6,517,975 | - |
| ව්‍යවසායකයින් ලියාපදිංචිය | 643,300 | - |
| විවිධ ආදායම් | 2,388,170 | 1,815,146 |
| කොමිස් - උප කොන්ත්‍රාත් භුවමාරු | - | 144,404 |
| කොමිස් - ලක්කම් මධ්‍යස්ථාන | 7,273,910 | 7,581,283 |
| කොමිස් - සම් භාණ්ඩ මධ්‍යස්ථානය | 4,587 | 142,146 |
| සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම | 825,750 | 1,116,000 |
| නොතාරිස් ගාස්තු | 1,639,589 | 186,452 |
| දඩ | 579,889 | 103,448 |
| ස්ථාවර වත්කම් අලෙවිකිරීමෙන් ලැබූ ලාභය | 1,384,755 | 348,249 |
| හානි සහ පාඩු ප්‍රතිසාධනය | 607,184 | - |
| කාර්ය මණ්ඩල ණය පොළිය | 1,713,592 | 1,508,780 |
| විදුලි ගාස්තු වෙනස් කිරීම් ආදායම | 233,191 | 92,273 |
| සූර්ය බලශක්ති විකිණීමෙන් ලද ආදායම් | 1,029,446 | 357,412 |
| පුහුණු වැඩසටහන් සඳහා අනුග්‍රහය | - | 600,000 |
| | **282,321,681** | **169,466,895** |

| 08.1 ප්‍රදර්ශන | 2023 | 2022 (නැවත ප්‍රකාශිත) |
|---|---|---|
| "කර්මාන්ත" 2022 | - | 62,609,386 |
| ජාතික කර්මාන්ත පුදර්ශනය-2023 | 120,731,341 | - |
| ප්‍රාදේශීය කර්මාන්ත ප්‍රදර්ශනය 2023-යාපනය | 38,854,015 | - |
| ප්‍රාදේශීය කර්මාන්ත ප්‍රදර්ශනය 2023- මහනුවර | 13,775,032 | - |
| ප්‍රාදේශීය කර්මාන්ත ප්‍රදර්ශනය 2023- ගාල්ල | 15,423,950 | - |
| ප්‍රදර්ශන -අලෙවිකරණය | 1,440,000 | - |
| Inco ප්‍රදර්ශනය | 105,000 | - |
| විසිතුරු මත්ස්‍ය ප්‍රදර්ශනය | 180,000 | - |
| COMEX | 360,000 | - |
| | **190,869,338** | **62,609,386** |

| 08.2 සම්මන්ත්‍රණ, සම්මේලන සහ සිදුවීම් | 2023 | 2022 (නැවත ප්‍රකාශිත) |
|---|---|---|
| කර්මාන්ත විශිෂ්ටතා සම්මාන-2023 | 3,746,975 | - |
| කඩිනම් කර්මාන්ත සංවර්ධන සම්මන්ත්‍රණය | 800,000 | - |
| ජාතික මෝටර් රථ සමුළුව 2023 | 330,000 | - |
| ජාතික ආහාරපාන සමුළුව 2023 | 1,156,000 | - |
| Technopreneurship විශිෂ්ටතා තරඟය | 13,000 | - |
| ජාතික රබර් සහ ප්ලාස්ටික් සමුළුව | 372,000 | - |
| ලංකා උරුමයන් පිළිබඳ උළෙල සහ විලාසිතා දැක්ම | 100,000 | - |
| | **6,517,975** | |

| 09 ප්‍රදාන | 2023 | 2022 (නැවත ප්‍රකාශිත) |
|---|---|---|
| වැටුප් සඳහා රජයේ ප්‍රදාන | 512,195,000 | 462,000,000 |
| වෙනත් පුනරාවර්තන සඳහා රජයේ ප්‍රදාන | 86,000,000 | 43,400,000 |
| | **598,195,000** | **505,400,000** |

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)

(සියලු මුදල් ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත)

| 10 පරිපාලන වියදම් | 2023 | 2022 (නැවත ප්‍රකාශිත) |
|---|---|---|
| මූලික වැටුප් | 273,665,347 | 290,333,872 |
| සභාපතිවරයාගේ වේතනය | 900,000 | 751,855 |
| ජීවන වියදම් දීමනාව | 50,336,730 | 52,374,633 |
| වෙනත් දීමනා (යොමු සටහන 10.1) | 67,165,759 | 69,918,138 |
| සේ.අ.අ. 12% | 40,202,033 | 42,681,649 |
| සේ.නි.භා.අ. 3% | 10,050,508 | 10,670,412 |
| මණ්ඩලයේ සේවකයන් සඳහා ප්‍රසාද දීමනා | - | 9,860,000 |
| පාරිතෝෂික (යොමු සටහන 28) | 27,836,723 | 30,802,998 |
| පුහුණු දීමනා | 1,530,202 | 419,000 |
| දෛනිකව වැටුප් හා භාරකරු දීමනා | 2,360,027 | 2,361,143 |
| භාවිතා නොකළ වෛද්‍ය නිවාඩු සඳහා ගෙවීම් | 19,286,409 | 21,534,412 |
| අතිකාල | 31,709,631 | 27,233,540 |
| නිවාඩු දින ගෙවීම් | 2,841,431 | 1,647,230 |
| ගමන් වියදම් (දේශීය) | 9,972,806 | 3,429,465 |
| ගමන් වියදම් (විදේශීය) | 4,902,233 | - |
| ජාත්‍යන්තර ප්‍රදර්ශන සඳහා සහභාගී වීම | 2,694,490 | - |
| නවාතැන් වියදම් | 42,463 | 19,480 |
| සේවක සුබසාධනය | 6,218,399 | 3,775,837 |
| මණ්ඩලයේ සේවකයින් සඳහා දේශීය පුහුණු | 2,468,027 | 1,768,634 |
| වෘත්තියවේදී ආයතනවල සාමාජික ගාස්තු (දේශීය සහ විදේශීය) | 37,672 | 25,462 |
| කාර්ය මණ්ඩල නිල ඇඳුම් | 3,647,061 | 3,553,182 |
| වෛද්‍යාධාර යෝජනාක්‍රමය සඳහා දායකත්වය | 2,194,000 | 2,360,200 |
| ලිපිද්‍රව්‍ය සහ කාර්යාලීය අවශ්‍යතා | 11,490,406 | 8,374,907 |
| වෛද්‍ය පරීක්ෂණ ගාස්තු | 500 | 5,001 |
| වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වියදම් | 437,952 | 872,239 |
| ඉන්ධන වියදම් | 17,960,359 | 11,307,370 |
| නඩත්තු වියදම් (යොමු සටහන 10.2) | 41,922,541 | 18,580,476 |
| විදුලි ගාස්තු | 16,607,132 | 11,664,336 |
| දුරකථන ගාස්තු | 5,974,016 | 4,592,318 |
| ආරක්ෂක ගාස්තු ගෙවීම් | 25,950,436 | 25,415,945 |
| තැපැල් සහ විදුලි පණිවුඩ | 1,773,900 | 1,039,901 |
| ජල ගාස්තු | 3,683,127 | 940,284 |
| කුලී, වරිපනම් සහ බදු | 6,538,219 | 5,644,793 |
| රක්ෂණ | 1,387,675 | 187,287 |
| පුවත්පත් සහ සඟරා | 532,810 | 642,330 |
| අධ්‍යක්ෂකවරුන්ගේ ගාස්තු | 642,000 | 544,000 |
| විගණන ගාස්තු | 966,500 | 951,500 |
| විශේෂ අවස්ථා සඳහා වියදම් | 1,261,877 | 987,540 |
| වෙළඳ දැන්වීම් | 3,034,805 | 2,479,823 |
| නීති ගාස්තු | 962,283 | 1,132,284 |
| වෙළඳ පරීක්ෂණ, සම්මුඛ පරීක්ෂණ ආදිය සඳහා ගාස්තු | 148,280 | 43,859 |
| බලපත්‍ර ගාස්තු | 338,956 | 187,900 |
| උපදේශක ගාස්තු | 22,500 | 5,000 |
| ප්‍රකාශන | 1,978,041 | 69,965 |
| ඡායාරූප | - | 3,980 |
| වාහන කුලියට ගැනීමේ ගාස්තු | - | 135,000 |
| විවිධ වියදම් | 69,354 | 41,449 |
| ලියාපදිංචි ගාස්තු | 12,000 | 17,500 |
| ක්ෂුද්‍රජීව විද්‍යාගාරය විවෘත කිරීමේ වියදම් | 311,530 | - |
| පාරිභෝගික අත්තිකාරම් ආපසු ගෙවීම- යන්ත්‍ර හැසිරවීම - ඉංජිනේරු විද්‍යාව | 30,000 | - |
| නැවත වෙන් කිරීම් (යොමු සටහන 10.3) | (7,247,641) | (11,977,012) |
| කොවිඩ් 19 වියදම් | - | 267,675 |

**ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය**

**මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)**

(සියලු මුදල් ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත)

| **10** ඉතිරි කොටස... | **2023** | **2022** (නැවත ප්‍රකාශිත) |
|---|---:|---:|
| ක්‍රියාකාරී සැලැස්ම 2023 | - | 217,460 |
| කා.ස.ම. බෞද්ධ සමාජය සඳහා පරිත්‍යාග | - | 550,000 |
| 5S සඳහා වියදම් | 3,000 | - |
| ධාරිතා අභිප්‍රේරණ දීමනාව / වියදම් | 47,220 | 138,400 |
| ක්ෂයවීම (යොමු සටහන 10.4) | 35,118,981 | 33,653,966 |
| | **732,020,710** | **694,238,619** |

| **10.1** වෙනත් දීමනා | **2023** | **2022** (නැවත ප්‍රකාශිත) |
|---|---:|---:|
| අතිරේක වැඩ | 110,583 | 134,742 |
| අධ්‍යක්ෂවරුන්ගේ ඉන්ධන දීමනාව | 9,962,573 | 9,647,870 |
| දුහුවිලි දීමනාව | 282,182 | 332,896 |
| වැඩ ආවරණ දීමනාව | 553,199 | 863,376 |
| දිරි දීමනාව | 473,308 | 505,488 |
| අතුරු දීමනාව | 31,893,954 | 33,493,866 |
| නිවාඩු දින දීමනාව | 9,121,726 | 7,565,996 |
| වෛද්‍ය දීමනා | 117,855 | 125,827 |
| වෘත්තීය දීමනා | 11,011,346 | 12,971,900 |
| සේවාස්ථාන දීමනාව | 266,388 | 234,986 |
| අධීක්ෂණ දීමනාව | 24,500 | 42,000 |
| දුරකථන දීමනාව | 2,174,896 | 2,707,317 |
| සුබසාධන දීමනාව | 1,173,248 | 1,291,877 |
| | **67,165,759** | **69,918,138** |

| **10.2** නඩත්තු වියදම් | **2023** | **2022** (නැවත ප්‍රකාශිත) |
|---|---:|---:|
| ඉඩම් | 847,059 | 382,845 |
| ගොඩනැගිලි | 9,114,833 | 1,840,177 |
| යන්ත්‍ර සහ පිරියත | 2,162,905 | 1,162,937 |
| මුද්‍රණ යන්ත්‍ර | 10,580 | 76,724 |
| පරිගණක සහ උපාංග | 2,214,330 | 1,218,844 |
| මෝටර් රථ | 11,786,136 | 6,648,760 |
| කාර්යාල උපකරණ | 8,029,034 | 3,262,974 |
| කාර්යාල | 2,562,408 | 404,098 |
| ලී බඩු, උපාංග සහ කාර්යාල උපකරණ | 271,929 | 12,560 |
| බයිසිකල් | 13,720 | 11,550 |
| PABX පද්ධති | 20,130 | 42,300 |
| විවිධ වත්කම් | - | 700 |
| මෘදුකාංග, වෙබ් සහ ජාලකරණ | 4,197,829 | 2,892,611 |
| 1995 ක්ෂණික ඇමතුම් අංකය | 663,130 | 609,255 |
| සූර්ය පැනල, උපයෝගීතා යනාදිය | 28,518 | 14,142 |
| | **41,922,541** | **18,580,476** |

| **10.3** නැවත වෙන් කිරීම | **2023** | **2022** (නැවත ප්‍රකාශිත) |
|---|---:|---:|
| යන්ත්‍ර පිරිවැය නැවත වෙන් කිරීම | (1,241,617) | (1,528,329) |
| පොදු කාර්ය නැවත වෙන් කිරීම | (1,531,468) | (1,709,037) |
| වැටුප් නැවත වෙන් කිරීම | (4,373,262) | (4,744,105) |
| කෙරීගෙන යන යන්ත්‍ර පිරිවැය අත්හිටුවීම | - | (682,216) |
| කෙරීගෙන යන පොදු කාර්ය අත්හිටුවීම් | (26,261) | (945,946) |
| කෙරීගෙන යන වැටුප් අත්හිටුවීම් | (75,033) | (2,367,380) |
| | **(7,247,641)** | **(11,977,012)** |

| **10.4** ක්ෂයවීම | **2023** | **2022** (නැවත ප්‍රකාශිත) |
|---|---:|---:|
| ඉඩම් වැඩිදියුණු කිරීම් | 355,078 | 333,745 |
| ගොඩනැගිලි | 5,883,147 | 5,906,935 |
| යන්ත්‍ර හා පිරියත | 2,315,923 | 2,373,983 |
| පරිගණක උපාංග | 6,999,178 | 6,756,141 |

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)

(සියලු මුදල් ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත)

| 10.4 ඉතිරි කොටස... | 2023 | 2022 (නැවත ප්‍රකාශිත) |
|---|---|---|
| රසායනාගාර උපකරණ | 8,863,174 | 8,691,946 |
| මුද්‍රණ යන්ත්‍ර | 495,560 | 460,000 |
| මෝටර් රථ | 750,709 | 673,916 |
| කාර්යාල උපකරණ | 4,072,319 | 3,882,542 |
| ගමන් මලු | 11,006 | 10,807 |
| ලී බඩු සහ සවිකිරීම් | 1,316,437 | 1,095,223 |
| බයිසිකල් | 9,066 | 6,686 |
| මෙවලම් සහ අමතර කොටස් | 1,472,598 | 1,055,785 |
| පුස්තකාල පොත් | 141,721 | 90,722 |
| PABX පද්ධති | 30,750 | 30,852 |
| උපයෝගිතා සේවා | 1,194,339 | 1,193,926 |
| විවිධ වත්කම් | 249,070 | 265,100 |
| පරිගණක මෘදුකාංග | 958,905 | 825,658 |
| | **35,118,981** | **33,653,966** |

| 11 විකිණීම සහ බෙදා හැරීමේ වියදම් | 2023 | 2022 (නැවත ප්‍රකාශිත) |
|---|---|---|
| බොල් සහ අඩමාන ණය සඳහා වෙන් කිරීම් | 451,965 | (312,089) |
| අලෙවිකරණ වියදම් | 165,750 | 315,700 |
| ප්‍රදර්ශන (යොමු සටහන 11.1) | 306,650,655 | 57,160,735 |
| සම්මන්ත්‍රණ සහ සම්මේලන (යොමු සටහන 11.2) | 20,579,223 | - |
| පාසල් කර්මාන්ත ව්‍යවසායකත්ව කවය | 2,187,758 | - |
| කර්මාන්ත රූපවාහිනිය | 3,464,374 | - |
| ගුවන්විදුලි විකාශනය | 1,052,000 | - |
| සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද | 6,066,976 | 2,025,353 |
| | **340,618,701** | **59,189,699** |

| 11.1 ප්‍රදර්ශන | 2023 | 2022 (නැවත ප්‍රකාශිත) |
|---|---|---|
| කර්මාන්ත ප්‍රදර්ශනය 2022 | - | 57,067,560 |
| විසිතුරු මත්ස්‍ය ප්‍රදර්ශන වියදම් | 216,678 | - |
| ජාතික කර්මාන්ත ප්‍රදර්ශනය-2023,BMICH | 147,354,947 | - |
| ප්‍රාදේශීය කර්මාන්ත ප්‍රදර්ශනය 2023-යාපනය | 57,494,594 | - |
| ප්‍රාදේශීය කර්මාන්ත ප්‍රදර්ශනය 2023-මහනුවර | 38,954,289 | - |
| ප්‍රාදේශීය කර්මාන්ත ප්‍රදර්ශනය 2023-ගාල්ල | 61,823,727 | - |
| වෙනත් ප්‍රදර්ශන වියදම් | 806,420 | 93,175 |
| | **306,650,655** | **57,160,735** |

| 11.2 සම්මන්ත්‍රණ, සම්මේලන සහ සිදුවීම් | 2023 | 2022 (නැවත ප්‍රකාශිත) |
|---|---|---|
| කර්මාන්ත විශිෂ්ටතා සම්මාන-2023 | 12,971,181 | - |
| කඩිනම් කර්මාන්ත සංවර්ධන සම්මන්ත්‍රණය | 2,910,000 | - |
| ජාතික මෝටර් රථ සමුළුව 2023 | 96,460 | - |
| ජාතික ආහාරපාන සමුළුව 2023 | 1,795,332 | - |
| Technopreneurship විශිෂ්ටතා තරඟය | 62,600 | - |
| ජාතික රබර් සහ ප්ලාස්ටික් සමුළුව | 1,387,330 | - |
| ලංකා උරුමයන් පිළිබඳ උළෙල සහ විලාසිතා දැක්ම | 464,720 | - |
| ලෝක තිරසාර ප්‍රවාහන දින සමුළුව | 891,600 | - |
| | **20,579,223** | **-** |

| 12 මූල්‍ය පිරිවැය | 2023 | 2022 (නැවත ප්‍රකාශිත) |
|---|---|---|
| බැංකු ගාස්තු | 1,281,878 | 1,029,588 |
| බැංකු අයිරා පොලිය | - | 40,413 |
| | **1,281,878** | **1,070,001** |

| 13 වෙනත් විස්තීර්ණ ආදායම් | 2023 | 2022 (නැවත ප්‍රකාශිත) |
|---|---|---|
| වර්ෂය සඳහා ආයුගණක ලාභය / (පාඩුව) - (යොමු සටහන 28) | 11,768,860 | 15,052,636 |
| | **11,768,860** | **15,052,636** |

(සියලු මුදල් ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත)

## 14 2023/12/31 දිනට දේපළ, පිරියත සහ උපකරණ

| | ඉඩම් හා ඉඩම් වැඩිදියුණු කිරීම් | ගොඩනැගිලි | පිරියත, යන්ත්‍ර සූත්‍ර හා සවිකිරීම් | මුද්‍රණ යන්ත්‍ර | JICA ව්‍යාපෘති වත්කම් | කාර්යාලයීය උපකරණ |
|---|---|---|---|---|---|---|
| **2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය** | | | | | | |
| **ආරම්භක ශුද්ධ පොත් අගය** | **103,768,411** | **168,811,172** | **84,622,251** | **3,973,786** | **(1)** | **22,319,595** |
| එකතු කිරීම් | - | 8,123,904 | 2,595,000 | - | - | 4,967,056 |
| යළි ප්‍රකාශිත එකතු කිරීම් | - | - | - | - | - | 42,000 |
| බැහැර කිරීම් | - | - | - | - | - | - |
| බැහැර කළ වත්කම් සඳහා සමුච්චිත ක්ෂයවීම් | - | - | - | - | - | - |
| අය කල ක්ෂයවීම් (යොමු සටහන 9) | (333,745) | (5,906,935) | (10,798,400) | (460,000) | - | (3,882,139) |
| යළි ප්‍රකාශිත සමුච්චිත ක්ෂය | - | - | - | - | - | (403) |
| **අවසාන ශුද්ධ පොත් අගය** | **103,434,666** | **171,028,141** | **76,418,851** | **3,513,786** | **(1)** | **23,446,109** |
| **2022 දෙසැම්බර් 31 දිනට** | | | | | | |
| පිරිවැය | 106,672,023 | 240,961,088 | 216,196,898 | 12,212,955 | 228,842,384 | 77,590,309 |
| සමුච්චිත ක්ෂය | (3,237,357) | (69,932,947) | (139,778,047) | (8,699,170) | (228,842,385) | (54,144,199) |
| **ශුද්ධ පොත් අගය** | **103,434,666** | **171,028,141** | **76,418,851** | **3,513,786** | **(1)** | **23,446,109** |
| **2023 දෙසැම්බර් 31 දිනට අවසන් වර්ෂය** | | | | | | |
| **ආරම්භක ශුද්ධ පොත් අගය** | **103,434,666** | **171,028,141** | **76,418,851** | **3,513,786** | **(1)** | **23,446,109** |
| එකතු කිරීම් | 27,277,354 | - | - | 759,019 | - | 3,597,606 |
| බැහැර කිරීම් | - | - | - | - | - | - |
| නැවත ප්‍රකාශිත ක්ෂයවීම් | - | - | - | - | - | - |
| අය කල ක්ෂයවීම් (යොමු සටහන 9) | (355,078) | (5,883,147) | (10,969,562) | (495,560) | - | (4,072,319) |
| **අවසාන ශුද්ධ පොත් අගය** | **130,356,941** | **165,144,994** | **65,449,289** | **3,777,245** | **(1)** | **22,971,397** |
| **2023 දෙසැම්බර් 31 දිනට** | | | | | | |
| පිරිවැය | 133,949,377 | 240,961,088 | 216,196,898 | 12,971,974 | 228,842,384 | 81,187,915 |
| සමුච්චිත ක්ෂය | (3,592,436) | (75,816,094) | (150,747,609) | (9,194,729) | (228,842,385) | (58,216,519) |
| **ශුද්ධ පොත් අගය** | **130,356,941** | **165,144,994** | **65,449,289** | **3,777,245** | **(1)** | **22,971,397** |

තවමත් භාවිතයේ පවතින, ශුන්‍ය ශුද්ධ පොත් වටිනාකමක් සහිත ජංගම නොවන වත්කම්වල මුළු වටිනාකම **2023** දෙසැම්බර් **31** වන දිනට රු. **505,585,293** කි.

(සියලු මුදල් ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත)

**14 2023/12/31 දිනට දේපළ, පිරියත සහ උපකරණ**

| | රසායනාගාර උපකරණ | ගමන් මලු | ලී බඩු සහ සවිකිරීම් | බයිසිකල් | උපකරණ සහ අමතර කොටස් | පුස්තකාල පොත් | PABX පද්ධති |
|---|---|---|---|---|---|---|---|
| **2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය** | | | | | | | |
| **ආරම්භක ශුද්ධ පොත් අගය** | **58,683,894** | **22,863** | **5,455,011** | **240,790** | **3,028,421** | **229,341** | **119,562** |
| එකතු කිරීම් | 5,520,507 | 16,000 | 3,825,991 | - | 841,258 | 151,497 | 603,603 |
| යළි ප්‍රකාශිත එකතු කිරීම් | (274,900) | - | - | - | - | - | - |
| බැහැර කිරීම් | - | (1,300) | - | - | - | - | - |
| බැහැර කළ වත්කම් සඳහා සමුච්චිත ක්ෂයවීම් | - | 574 | - | - | - | - | - |
| අය කල ක්ෂයවීම් (යොමු සටහන 9) | (8,720,189) | (10,807) | (1,095,223) | (6,686) | (1,055,785) | (90,722) | (30,852) |
| යළි ප්‍රකාශිත සමුච්චිත ක්ෂය | 28,243 | - | - | - | - | - | - |
| **අවසාන ශුද්ධ පොත් අගය** | **55,237,556** | **27,330** | **8,185,779** | **234,104** | **2,813,894** | **290,116** | **692,312** |
| **2022 දෙසැම්බර් 31 දිනට** | | | | | | | |
| පිරිවැය | 96,821,430 | 1,363,055 | 26,704,140 | 316,860 | 18,321,756 | 13,673,962 | 5,016,522 |
| සමුච්චිත ක්ෂය | (41,583,874) | (1,335,725) | (18,518,361) | (82,756) | (15,507,862) | (13,383,846) | (4,324,209) |
| **ශුද්ධ පොත් අගය** | **55,237,556** | **27,330** | **8,185,779** | **234,104** | **2,813,894** | **290,116** | **692,312** |
| **2023 දෙසැම්බර් 31 දිනට අවසන් වර්ෂය** | | | | | | | |
| **ආරම්භක ශුද්ධ පොත් අගය** | **55,237,556** | **27,330** | **8,185,779** | **234,104** | **2,813,894** | **290,116** | **692,312** |
| එකතු කිරීම් | 1,427,548 | 4,900 | 1,551,800 | 69,500 | 11,835,388 | 214,898 | - |
| බැහැර කිරීම් | - | - | - | - | - | - | - |
| නැවත ප්‍රකාශිත ක්ෂයවීම් | - | - | - | - | - | - | - |
| අය කල ක්ෂයවීම් (යොමු සටහන 9) | (8,863,174) | (11,006) | (1,316,437) | (9,066) | (1,472,598) | (141,721) | (30,750) |
| **අවසාන ශුද්ධ පොත් අගය** | **47,801,930** | **21,224** | **8,421,142** | **294,538** | **13,176,685** | **363,293** | **661,562** |
| **2023 දෙසැම්බර් 31 දිනට** | | | | | | | |
| පිරිවැය | 98,248,978 | 1,367,955 | 28,255,940 | 386,360 | 30,157,145 | 13,888,860 | 5,016,522 |
| සමුච්චිත ක්ෂය | (50,447,047) | (1,346,731) | (19,834,798) | (91,822) | (16,980,460) | (13,525,567) | (4,354,959) |
| **ශුද්ධ පොත් අගය** | **47,801,930** | **21,224** | **8,421,142** | **294,538** | **13,176,685** | **363,293** | **661,562** |

## ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය

### මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)

(සියලු මුදල් ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත)

**14 2023/12/31** දිනට දේපළ, පිරියත සහ උපකරණ

| | උපයෝගිතා සේවා | විවිධ වත්කම | පරිගණක සහ සන්නිවේදන උපකරණ | පරිගණක මෘදුකාංග | මෝටර් වාහන | එකතුව |
|---|---|---|---|---|---|---|
| **2022** දෙසැම්බර් **31** දිනෙන් අවසන් වර්ෂය | | | | | | |
| ආරම්භක ශුද්ධ පොත් අගය | **32,227,726** | **1,411,352** | **18,380,736** | **8,041,048** | **1,986,174** | **513,322,135** |
| එකතු කිරීම් | 104,535 | 17,850 | 4,890,000 | 2,233,700 | 495,000 | **34,385,901** |
| යළි ප්‍රකාශිත එකතු කිරීම් | - | - | - | - | - | **(232,900)** |
| බැහැර කිරීම් | - | - | - | - | - | **(1,300)** |
| බැහැර කළ වත්කම් සඳහා සමුච්චිත ක්ෂයවීම් | - | - | - | - | - | **574** |
| අය කල ක්ෂයවීම් (යොමු සටහන 9) | (4,434,323) | (265,100) | (6,756,141) | (825,658) | (673,916) | **(45,346,620)** |
| යළි ප්‍රකාශිත සමුච්චිත ක්ෂය | - | - | - | - | - | **27,840** |
| අවසාන ශුද්ධ පොත් අගය | **27,897,939** | **1,164,101** | **16,514,595** | **9,449,090** | **1,807,258** | **502,155,629** |
| | - | - | - | - | - | |
| **2022** දෙසැම්බර් **31** දිනට | | | | | | |
| පිරිවැය | 60,212,769 | 5,433,269 | 94,300,943 | 13,029,747 | 55,169,345 | **1,272,839,454** |
| සමුච්චිත ක්ෂය | (32,314,829) | (4,269,168) | (77,786,348) | (3,580,657) | (53,362,086) | **(770,683,826)** |
| ශුද්ධ පොත් අගය | **27,897,939** | **1,164,101** | **16,514,595** | **9,449,090** | **1,807,258** | **502,155,629** |
| **2023** දෙසැම්බර් **31** දිනට අවසන් වර්ෂය | | | | | | |
| ආරම්භක ශුද්ධ පොත් අගය | **27,897,939** | **1,164,101** | **16,514,595** | **9,449,090** | **1,807,258** | **502,155,629** |
| එකතු කිරීම් | 2,111,486 | - | 5,323,823 | 5,234,000 | - | **59,407,322** |
| බැහැර කිරීම් | - | - | - | - | - | **-** |
| නැවත ප්‍රකාශිත ක්ෂයවීම් | - | - | - | - | - | **-** |
| අය කල ක්ෂයවීම් (යොමු සටහන 9) | (4,584,930) | (249,070) | (6,999,178) | (958,905) | (750,709) | **(47,163,211)** |
| අවසාන ශුද්ධ පොත් අගය | **25,424,495** | **915,031** | **14,839,239** | **13,724,184** | **1,056,550** | **514,399,739** |
| **2023** දෙසැම්බර් **31** දිනට | | | | | | |
| පිරිවැය | 62,324,254 | 5,433,269 | 99,624,766 | 18,263,747 | 55,169,345 | **1,332,246,775** |
| සමුච්චිත ක්ෂය | (36,899,759) | (4,518,238) | (84,785,526) | (4,539,563) | (54,112,795) | **(817,847,037)** |
| ශුද්ධ පොත් අගය | **25,424,495** | **915,031** | **14,839,239** | **13,724,184** | **1,056,550** | **514,399,739** |

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)

(සියලු මුදල් ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත)

| 15 | ආයෝජන දේපළ | ඉඩම් සහ ඉඩම් වැඩිදියුණු කිරීම් | ගොඩනැගිලි | එකතුව |
|---|---|---|---|---|
| | **2022 දෙසැම්බර් 31 අවසන් වූ වර්ෂය** | | | |
| | **ආරම්භක ශුද්ධ පොත් අගය** | **880,457,859** | **235,105,430** | **1,115,563,290** |
| | පිරිවැය සඳහා නැවත ප්‍රකාශිත ගැලපීම | (225,497) | - | (225,497) |
| | එකතු කිරීම් | 75,851,950 | 11,983,830 | 87,835,780 |
| | බැහැර කිරීම් | - | - | - |
| | ක්ෂයවීම් ගාස්තුව (යොමු සටහන 6) | (11,474,544) | (7,413,026) | (18,887,570) |
| | **අවසාන ශුද්ධ පොත් අගය** | **944,609,768** | **239,676,235** | **1,184,286,002** |
| | **2022 දෙසැම්බර් 31 දිනට** | | | |
| | පිරිවැය | 1,006,762,087 | 301,531,679 | 1,308,293,766 |
| | සමුච්චිත ක්ෂය | (62,152,320) | (61,855,444) | (124,007,763) |
| | **ශුද්ධ පොත් අගය** | **944,609,768** | **239,676,235** | **1,184,286,002** |
| | **2023 දෙසැම්බර් 31 අවසන් වූ වර්ෂය** | | | |
| | **ආරම්භක ශුද්ධ පොත් අගය** | **944,609,768** | **239,676,235** | **1,184,286,002** |
| | එකතු කිරීම් | 35,322,440 | - | 35,322,440 |
| | බැහැර කිරීම් | - | - | - |
| | ක්ෂයවීම් ගාස්තුව (යොමු සටහන 6) | (12,426,609) | (7,515,982) | (19,942,590) |
| | **අවසාන ශුද්ධ පොත් අගය** | **967,505,599** | **232,160,253** | **1,199,665,852** |
| | **2023 දෙසැම්බර් 31 දිනට** | | | |
| | පිරිවැය | 1,042,084,528 | 301,531,679 | 1,343,616,206 |
| | සමුච්චිත ක්ෂය | (74,578,928) | (69,371,425) | (143,950,354) |
| | **ශුද්ධ පොත් අගය** | **967,505,599** | **232,160,253** | **1,199,665,852** |

| 16 | ක්‍රියාත්මක වෙමින් පවතින ප්‍රාග්ධන වැඩ | 2023 | 2022 (නැවත ප්‍රකාශිත) |
|---|---|---|---|
| | ආපනශාලාව, තැපැල් කාර්යාලය, ළිඳ - අච්චුවේලි | 1,911,259 | 1,911,259 |
| | අභ්‍යන්තර මාර්ග වැඩිදියුණු කිරීම - අච්චුවේලි | 7,251,379 | 7,251,379 |
| | නව ගොඩනැගිල්ල ඉදිකිරීම - ගම්පහ | 13,331,540 | 11,992,080 |
| | පාර්ටිෂන් කිරීම - T S D - ආහාර රසායනාගාරය | 5,890,041 | 5,890,041 |
| | දම්වැල් සම්බන්ධක වැට ඉදිකිරීම - වවුනියාව | - | 1,017,634 |
| | අභ්‍යන්තර තාර පාර ඉදිකිරීම - අච්චුවේලි | - | 6,232,110 |
| | Sage 200 ERP මෘදුකාංගය | 4,320,000 | 4,320,000 |
| | අභ්‍යන්තර මාර්ග සහ මායිම් තාප්පය ඉදිකිරීම - ඒකල | 3,220,098 | - |
| | රඳවුම් බිත්තිය සහ දම්වැල් සම්බන්ධක වැට ඉදිකිරීම - කළුදැවල | 1,992,975 | - |
| | ඇල්පිටිය නව කාර්මික ජනපදය | 19,447,006 | - |
| | පොත්තාපිටිය නව කාර්මික ජනපදය | 509,803 | - |
| | වාලච්චේන සම් මධ්‍යස්ථානය | 150,000 | - |
| | | **58,024,100** | **38,614,504** |

| 17 | නිමි භාණ්ඩ, තොග සහ කෙරීගෙන යන වැඩ | 2023 | 2022 (නැවත ප්‍රකාශිත) |
|---|---|---|---|
| | ඉංජිනේරු අමුද්‍රව්‍ය - (ප්‍රධාන කාර්යාලය) | 952,158 | 1,845,222 |
| | ඉංජිනේරු සිවිල් අමුද්‍රව්‍ය | 72,526 | 43,043 |
| | ඉංජිනේරු විද්‍යුත් අමුද්‍රව්‍ය | 1,083,011 | 2,670,996 |
| | මුද්‍රණ අමුද්‍රව්‍ය | 40,787 | 38,972 |
| | ලිපිද්‍රව්‍ය | 3,892,969 | 4,123,175 |
| | වෙනත් අමුද්‍රව්‍ය | 5,502,624 | 1,913,212 |
| | ගම්මාන සංවර්ධන ව්‍යාපෘතියේ තොග | 4,125,325 | 1,764,876 |
| | උප ගබඩාව - වාත්තු වැඩහළ | 16,043,270 | 13,005,464 |
| | උප ගබඩාව - රබර් | 37,230,024 | 6,372,492 |
| | උප ගබඩාව - සම්භාණ්ඩ | 427,758 | 422,132 |
| | උප ගබඩාව - C S C - මාතර | 326,560 | 317,021 |
| | උප ගබඩාව - විද්‍යුත් ලෝහාලේපන මධ්‍යස්ථානය | 1,664,147 | 1,063,236 |
| | උප ගබඩාව - A T R D C පන්නල | 1,142,292 | 1,419,732 |
| | පිත්තල මධ්‍යස්ථානය - පිළිමතලාව | 176,761 | 176,761 |

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය
**මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)**

(සියලූ මුදල් ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත)

| 17 ඉතිරි කොටස... | 2023 | 2022 (නැවත ප්‍රකාශිත) |
|---|---|---|
| කෙරීගෙන යන වැඩ - සෘජු ද්‍රව්‍ය (ප්‍රධාන කාර්යාලය) | 440,580 | 2,265,529 |
| කෙරීගෙන යන වැඩ - සෘජු ශ්‍රමය | 1,735,552 | 3,689,090 |
| කෙරීගෙන යන වැඩ - සාමාන්‍ය පොදු කාර්ය | 284,555 | 1,028,789 |
| කෙරීගෙන යන වැඩ - කර්මාන්තශාලා පොදු කාර්ය | 160,167 | 160,167 |
| කෙරීගෙන යන වැඩ - යන්ත්‍ර පොදුකාර්ය - ඉංජිනේරු | 537,225 | 547,538 |
| යකඩ අඩංගු නොවන ලෝහ අබලි | 1,067,576 | 5,173,918 |
| තොග - විද්‍යාගාර රසායන සහ පාරිභෝගික භාණ්ඩ | 696,645 | 113,915 |
| තොග - අලෙවි අංශය -ලක්කම් | 701,496 | 397,617 |
| නිමි භාණ්ඩ- වාත්තු | 78,973 | 80,041 |
| නිමි භාණ්ඩ-CNC | 212,729 | |
| චලනය නොවන තොග හානිකරණය සඳහා වෙන්කිරීම් | (1,052,453) | (1,052,453) |
| පිත්තල ලෝහ කුට්ටි නැතිවීම සඳහා වෙන්කිරීම් | (996,420) | (996,420) |
| සෘජු නිකුත්කිරීම් | 325,984 | 134,549 |
| පොදු - ස්ථාවර වත්කම් | 1,212,204 | - |
| | 78,085,026 | 46,718,615 |

| 18 වෙළඳ සහ වෙනත් අයවිය යුතු | 2023 | 2022 (නැවත ප්‍රකාශිත) |
|---|---|---|
| විවිධ ණයගැතියෝ- ප්‍රධාන කාර්යාලය | 264,713 | 264,713 |
| විවිධ ණයගැතියෝ- සම්භාණ්ඩ | 521,423 | 131,635 |
| විවිධ ණයගැතියෝ- ඉංජිනේරු | 7,373,942 | 463,701 |
| විවිධ ණයගැතියෝ- ඉංජිනේරු - කම්හල | 2,551,187 | 2,560,744 |
| විවිධ ණයගැතියෝ- රබර් අංශය | 2,399,919 | 2,018,695 |
| විවිධ ණයගැතියෝ - A T R D C - පන්නල | 837,679 | 821,276 |
| විවිධ ණයගැතියෝ - E P C | 1,190,354 | 73,272 |
| විවිධ ණයගැතියෝ- විදුලිත් | 2,695,210 | 2,695,210 |
| විවිධ ණයගැතියෝ- වාත්තු වැඩහල | 878,366 | 832,651 |
| විවිධ ණයගැතියෝ- සිවිල් | 2,163,600 | 2,163,600 |
| විවිධ ණයගැතියෝ- ලක් නිපැයුම් | 42,120 | 42,120 |
| විවිධ ණයගැතියෝ - C S C -මාතර | 461,902 | 95,443 |
| විවිධ ණයගැතියෝ- අලෙවි | 1,261,232 | 321,040 |
| විවිධ ණයගැතියෝ- අබලි ව්‍යාපෘතිය | 13,422,093 | 4,790,870 |
| විවිධ ණයගැතියෝ - පොදු | 4,171,284 | 2,305,714 |
| විවිධ ණයගැතියෝ - TSD | 566,413 | - |
| විවිධ ණයගැතියෝ -CEDACS | 379,261 | 461,079 |
| බදුකාර ණයගැතියෝ (යොමු සටහන 18.1) | 14,180,401 | 18,435,757 |
| | 55,361,101 | 38,477,519 |
| අඩුකලා: බොල් සහ අඩමාන ණය සඳහා වෙන් කිරීම් | (15,361,809) | (14,909,844) |
| | 39,999,292 | 23,567,675 |

| 18.1 බදුකාර ණයගැතියෝ | 2023 | 2022 (නැවත ප්‍රකාශිත) |
|---|---|---|
| කාර්මික ජනපදය - ඒකල | 2,185,284 | 2,383,338 |
| කාර්මික ජනපදය - පල්ලෙකැලේ | 3,806,176 | 5,198,055 |
| කාර්මික ජනපදය - හොරණ | 130,134 | 645,029 |
| කාර්මික ජනපදය - පන්නල | 1,091,588 | 802,177 |
| කාර්මික ජනපදය - ලුණුවිල | 474,495 | 228,390 |
| කාර්මික ජනපදය - මිහින්තලේ | 36,025 | - |
| කාර්මික ජනපදය - මාතලේ | 460,387 | 430,458 |
| කාර්මික ජනපදය - පුස්සැල්ල | 391,401 | 362,305 |
| කාර්මික ජනපදය - ගලිගමුව | 712,918 | 461,507 |
| කාර්මික ජනපදය - පානළුව | 1,759,270 | 4,326,957 |
| කාර්මික ජනපදය - කොටගල | 274,304 | 1,323,084 |
| කාර්මික ජනපදය - අච්චුවේලි | 1,705,196 | 1,367,015 |
| කාර්මික ජනපදය - වවුළුගල | 529,720 | 280,040 |

**ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය**

**මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)**

(සියලු මුදල් ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත)

| 18.1 ඉතිරි කොටස... | 2023 | 2022 (නැවත ප්‍රකාශිත) |
|---|---|---|
| කාර්මික ජනපදය - වවුනියාව | 623,502 | 627,401 |
| | **14,180,401** | **18,435,757** |

| 19 වෙනත් ජංගම වත්කම් | 2023 | 2022 (නැවත ප්‍රකාශිත) |
|---|---|---|
| උත්සව අත්තිකාරම් | 340,250 | 296,500 |
| මෝටර් බයිසිකල් ණය | 106,360 | 106,360 |
| බයිසිකල් අත්තිකාරම් | 3,254 | 9,554 |
| ආපදා ණය | 46,453,112 | 39,015,273 |
| විලම්බිත කාර්ය මණ්ඩල පිරිවැය | (8,886,865) | (7,164,907) |
| පෙරගෙවූ කාර්ය මණ්ඩල පිරිවැය (IFRS ගැලපීම්) | 8,886,865 | 7,164,907 |
| විශේෂ අත්තිකාරම් - පොත් | 5,800 | 7,000 |
| මැතිවරණ කොමසාරිස්ගෙන් ලැබිය යුතු | 100,882 | 92,512 |
| රඳවා ගැනීමේ බදු | 7,174,518 | 5,172,442 |
| ගෙවියයුතු උපයන විට ගෙවීමේ බදු | 82,346 | - |
| වෘත්තීය සමිති පාලන | 900 | - |
| ගෙවිය යුතු ශත පාලනය | 1,108 | - |
| බෞද්ධ සංගමයේ පාලන ගිණුම | 50 | - |
| UNIDO | 64,670 | 60,070 |
| ඉල්ලා අස්වූ සේවකයින්ගෙන් ලැබිය යුතු | 150,814 | 150,814 |
| රේඛීය අමාත්‍යාංශය/ඉන්දුනීසියා වෙතින් ලැබිය යුතු | 3,500 | 3,500 |
| ප්‍රදර්ශන වලින් ලැබිය යුතු මුදල් | 3,411,975 | 1,000,000 |
| | **57,899,539** | **45,914,025** |

| 20 තැන්පතු සහ පූර්ව ගෙවීම් | 2023 | 2022 (නැවත ප්‍රකාශිත) |
|---|---|---|
| ඇප තැන්පතු | 312,853 | 305,229 |
| පූර්ව ගෙවීම් (යොමු සටහන 20.1) | 133,650,054 | 86,967,052 |
| පූර්ව ගෙවීම් හානිකරණය සඳහා වෙන්කිරීම් | (11,787,162) | (11,787,162) |
| පූර්ව ගෙවීම් / අත්තිකාරම් - ප්‍රධාන කාර්යාලය | 192,206 | 192,206 |
| කාර්ය මණ්ඩලය සඳහා අත්තිකාරම් - ප්‍රධාන කාර්යාලය | 651,527 | 345,595 |
| කාර්ය මණ්ඩල ඉන්ධන අත්තිකාරම් - ප්‍රධාන කාර්යාලය | - | 8,000 |
| වෙනත් තැන්පතු / ලැබිය යුතු | 2,698,958 | 1,498,958 |
| කලින් ගෙවූ කුලී සහ වෙනත් වියදම් | 1,037,848 | 471,487 |
| ජාත්‍යන්තර කර්මාන්ත ප්‍රදර්ශනය 2024 | 7,700 | - |
| | **126,763,984** | **78,001,365** |

| 20.1 පූර්ව ගෙවීම් | 2023 | 2022 (නැවත ප්‍රකාශිත) |
|---|---|---|
| ඉදිකිරීම් | 626,429 | 252,733 |
| අබලි ව්‍යාපෘතිය | 57,450,799 | 73,068,636 |
| විවිධ | 75,572,826 | 13,645,683 |
| | **133,650,054** | **86,967,052** |

| 21 ලැබිය යුතු - විශේෂ ව්‍යාපෘති | 2023 | 2022 (නැවත ප්‍රකාශිත) |
|---|---|---|
| දිවියට උදානය - කර්මාන්ත අමාත්‍යාංශය | 8,059,237 | 8,059,237 |
| * අමාත්‍යාංශ අරමුදල් - Robot Arm (CERA ව්‍යාපෘතිය) -විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය | 4,502,850 | - |
| One Stop වෙළඳ සල - කර්මාන්ත අමාත්‍යාංශය | 1,241,580 | 1,194,320 |
| දැයට පුනරුදයක් -කර්මාන්තය ජීවයක් - කර්මාන්ත අමාත්‍යාංශය | 20,500 | 20,500 |
| කාබනික සහතිකය-TSD- කර්මාන්ත අමාත්‍යාංශය | 52,591 | 74,391 |
| රූපලාවණ්‍ය කර්මාන්ත අංශය සංවර්ධනය - කර්මාන්ත අමාත්‍යාංශය | 752,868 | - |
| | **14,629,625** | **9,348,448** |

*

ව්‍යාපෘතිය මේ වන විට විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය යටතේ පවතී. අනාගතයේදී PPE විෂය පථය යටතේ IDB සහ විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය විසින් ඒකාබද්ධව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට සාකච්ඡා කරගෙන යනු ලැබේ.

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)

(සියලු මුදල් ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත)

**22 මුදල් සහ මුදල් හා සමාන දෑ**

| | ගිණුම් ශීර්ෂය | ගිණුම් අංකය | 2023 | 2022 (නැවත ප්‍රකාශිත) |
|---|---|---|---|---|
| 72000 | ජංගම ගිණුම - ලංකා බැංකුව, ඉඩම (පුනරාවර්තන-ප්‍රධාන) | 682974 | 32,578,192 | 27,339,113 |
| 72016 | ජං/ගිණුම-ලංකා බැං.-ඉඩම (රබර්) | 4064199 | 20,000 | 20,000 |
| 72002 | ජං/ගිණුම-ලංකා බැං.-ඉඩම (ප්‍රාග්ධන ප්‍රදාන) | 683231 | 4,012,074 | 7,621,662 |
| 72005 | ජං/ගිණුම-ලංකා බැං.-ඉඩම (ඉංජිනේරු) | 683144 | 227,079 | 56,363 |
| 72020 | ජං/ගිණුම-ලංකා බැං.-ඉඩම (ගම්මාන සංවර්ධන ව්‍යාපෘතිය) | 4204245 | 16,537,410 | 6,520,554 |
| 72011 | ජං/ගිණුම-ලංකා බැං.-ඉඩම (අබලි) | 682519 | 89,820,317 | 170,164,926 |
| 72008 | ජං/ගිණුම-ලංකා බැං.-ඉඩම (ප්‍රාදේශීය) | 683237 | 2,454,724 | 516,169 |
| 72014 | ජං/ගිණුම-මහජන බැං.-කටුබැද්ද (අමාත්‍යාංශ ව්‍යාපෘති) | 313100153657035 | 888,956 | 998,000 |
| 72015 | ඉ/ගිණුම-මහජන බැං.-කටුබැද්ද | 313200223657035 | 138,511,478 | 23,723,134 |
| 72030 | ජං/ගිණුම-ලංකා බැං.-ඉඩම (ලක්කම්) | 7153282 | 17,860,682 | 7,492,985 |
| 72001 | ජං/ගිණුම-ලංකා බැං.-ඉඩම (ආදායම්) | 70034730 | 4,775,424 | 1,895,440 |
| 72017 | ජං/ගිණුම-ලංකා බැං.-ඉඩම (දිස්ත්‍රික් කාර්යාලය) | 74791255 | 25,500 | 20,000 |
| 72010 | ජං/ගිණුම-ලංකා බැං.-ඉඩම (ප්‍රදර්ශනය) | 90494906 | 5,814,297 | - |
| 72028 | ඉ/ගිණුම-ලංකා බැං.-ඉඩම (පෙරස් නොවන) | 7271240 | 237,625 | 231,644 |
| 72029 | ඉ/ගිණුම-ලංකා බැං.-ඉඩම (CESS අරමුදල) | 9123868 | 1,928,988 | 1,880,436 |
| 72023 | ඉ/ගිණුම-RDB බැං.- "කර්මාන්ත" අරමුදල | 134011100742 | 1,001 | - |
| 72142 | කර්මාන්ත ණය අරමුදල - RDB බැංකුව | | 16,606,800 | - |
| | කෙටිකාලීන තැන්පතු | | 85,202,397 | 85,202,397 |
| | ලැබිය යුතු කෙටිකාලීන තැන්පතු පොලිය | | 3,407,096 | 8,979,798 |
| | අග්‍රිම ගිණුම් | | 2,727,247 | 614,458 |
| | විශේෂ අග්‍රිමය - අයකැමි | | 37,099 | 23,379 |
| | | | **423,674,387** | **343,300,457** |
| | හර ශේෂ | | 423,674,387 | 343,300,457 |
| | ණය ශේෂ | | - | - |
| | **මුදල් සහ මුදල් හා සමාන දෑ** | | **423,674,387** | **343,300,457** |

**23 විලම්බිත ප්‍රාග්ධන ප්‍රදාන**

| | 2023 | 2022 (නැවත ප්‍රකාශිත) |
|---|---|---|
| ජනවාරි 01 දිනට රජයේ ප්‍රාග්ධන ප්‍රදාන | 258,785,672 | 304,455,732 |
| වර්ෂය තුලදී ලැබුණු ප්‍රදාන | 98,990,000 | 24,000,000 |
| මාරු කරන ලද ප්‍රාග්ධන ප්‍රදාන | (43,511,138) | (69,670,060) |
| | **314,264,535** | **258,785,672** |

**24 මාරු කරන ලද වත්කම් වල වටිනාකම**

| | 2023 | 2022 (නැවත ප්‍රකාශිත) |
|---|---|---|
| 1969 ට පෙර කා.සං.ම. | 4,403,441 | 4,403,441 |
| කාර්මික ජනපද සංස්ථාව | 9,043,620 | 9,043,620 |
| | **13,447,061** | **13,447,061** |

**25 ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය මත අතිරික්තය**

| | 2023 | 2022 (නැවත ප්‍රකාශිත) |
|---|---|---|
| ඉදිරියට ගෙනා ශේෂය | 960,696,320 | 960,696,320 |
| | **960,696,320** | **960,696,320** |

**26 විලම්බිත රජයේ ප්‍රදාන - ප්‍රාග්ධන ව්‍යාපෘති**

| | 2023 | 2022 (නැවත ප්‍රකාශිත) |
|---|---|---|
| Cess අරමුදල | 10,500,000 | 10,500,000 |
| Sirap අරමුදල - ගොඩනැගිලි | 19,458,055 | 20,305,321 |
| ප්‍රදාන - පෑලියගොඩ RD & SC සඳහා ඉන්ජෙක්ෂන් මෝල්ඩින් යන්ත්‍රය | 2,815,347 | 3,747,149 |
| අමාත්‍යාංශ අරමුදල් - අච්චුවේලි | 45,340,872 | 46,832,190 |
| අමාත්‍යාංශ අරමුදල් කාර්මික ජනපද | 445,940,570 | 382,563,526 |
| අමාත්‍යාංශ අරමුදල් - පුන්තෝට්ටම් කාර්මික ජනපදය වවුනියාව | 6,555,198 | 6,604,844 |
| අමාත්‍යාංශ අරමුදල් - TSD රසායනාගාරය | 1,258,233 | 1,707,217 |
| පානළුව කාර්මික ජනපදය | 6,139,821 | 6,162,972 |
| ප්‍රතීතනය ලත් ආහාර රසායනාගාරය - අදියර I | 15,302,374 | 18,499,830 |

**ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය**

**මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)**

(සියලු මුදල් ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත)

| 26 | ඉතිරි කොටස... | 2023 | 2022 (නැවත ප්‍රකාශිත) |
|---|---|---|---|
| | ප්‍රතිනනය ලත් ආහාර රසායනාගාරය - අදියර II | 66,275,633 | 69,554,952 |
| | අච්චුවෙලි මිලියන 100 ව්‍යාපෘතිය 2018 | 7,259,371 | 7,259,371 |
| | ගම්මාන සංවර්ධන ව්‍යාපෘතිය | 2,722,356 | 2,722,356 |
| | අමාත්‍යාංශ අරමුදල් - "නංවමු ලංකා" | 5,117,669 | 5,117,669 |
| | බොයිලේරු මධ්‍යස්ථානය | 8,493,975 | - |
| | SVA යන්ත්‍රයක් සකස් කිරීම | 675,000 | - |
| | | **643,854,473** | **581,577,397** |

| 27 | සමුච්චිත ලාභ / (පාඩු) | 2023 | 2022 (නැවත ප්‍රකාශිත) |
|---|---|---|---|
| | ඉදිරියට ගෙනා සමුච්චිත පාඩු | (60,791,523) | (204,371,533) |
| | පෙර වසරේ ගැලපීම් (යොමු සටහන 27.1) | (256,263) | 1,794,849 |
| | කාලසීමාව සඳහා අතිරික්තය | 28,365,345 | 141,785,161 |
| | ඉදිරියට ගෙනා සමුච්චිත පාඩු | **(32,682,441)** | **(60,791,523)** |

| 27.1 | පෙර වසරේ ගැලපීම | 2023 | 2022 (නැවත ප්‍රකාශිත) |
|---|---|---|---|
| | 2021.01.01 දින වැඩිපුර ගෙවීම් /ශේෂ නිවැරදි කිරීම | - | 0 |
| | 2021 සඳහා අධි තක්සේරුව | - | 1,290 |
| | 2021 සඳහා අධි තක්සේරුව | - | 1,320 |
| | අවලංගු වූ චෙක්පත - කොවිඩ් වියදම් - පන්නල | - | 2,900 |
| | 2021 සඳහා අධි තක්සේරුව | - | 3,332 |
| | අවලංගු වූ චෙක්පත (සම්පත් දායකයන් - TSD) | - | 5,000 |
| | අවලංගු වූ චෙක්පත - (ලක්කම් ආපසු ලැබීම්) | - | 5,475 |
| | අවලංගු වූ චෙක්පත - බලපත්‍ර ගාස්තු | - | 6,000 |
| | අවලංගු වූ චෙක්පත | - | 7,500 |
| | අවලංගු වූ චෙක්පත -(ප්‍රදර්ශනය - බදුල්ල) | - | 8,490 |
| | අවලංගු වූ චෙක්පත - හේමා ගමගේ - බෝනස් - 2020 | - | 13,500 |
| | ඊ. පත්මරාණි-3138 | - | 15,831 |
| | ඉල්ලුම් නොකළ කාර්යාල කුලිය - කොළඹ දිස්ත්‍රික් කාර්යාලය | - | 15,972 |
| | 2019.01.01-31.12.2019 කාලය සඳහා කුලිය | - | 30,000 |
| | අවලංගු වූ චෙක්පත - කොවිඩ් වියදම් - කුරුණෑගල | - | 54,420 |
| | 2021.12.31 දිනට අධි ඇස්තමේන්තුව | - | 503,014 |
| | අවලංගු වූ චෙක්පත (උණබම්බු ව්‍යාපෘතිය) | - | 877,500 |
| | විගණකාධිපති - විගණන ගාස්තු - 2020 | - | (112,800) |
| | උත්සව අත්තිකාරම් - ඇපකරුවන් - මන්නාරම - ජේ.එම්.ඒ. ලැම්බර්ට් | - | (1,875) |
| | උත්සව අත්තිකාරම් - ඇපකරුවන් - මන්නාරම - එම්.ටී.එම්. ෆර්සන් | - | (1,875) |
| | ආර්.එම්.එම්.එන්.කේ. රත්නායක - TSD - ආපසු ගෙවීම | - | (35,000) |
| | මිල කමිටුවේ සාමාජික ගාස්තුව - පී.අයි.යූ.රත්නමලල - යකඩ නොවන | - | (5,000) |
| | ගමන් වියදම් - භාණ්ඩ සමීක්ෂණය | - | (3,951) |
| | ප්‍රසාද දීමනා -2020 - ඩබ්ලිව්.පී.හේමා ගමගේ | - | (13,500) |
| | ගමන් වියදම් - භාණ්ඩ සමීක්ෂණ - යාපනය | - | (1,100) |
| | ගමන් වියදම් - සිළිමහලාව | - | (2,320) |
| | 2021 සඳහා ඌන ඇස්තමේන්තු/කොවිඩ් 19 වියදම් | - | (8,000) |
| | ඌන ඇස්තමේන්තු/2021 සඳහා වියදම් (අබලි ව්‍යාපෘතිය) | - | (6,000) |
| | 2021.12.31 දිනට ඌන ඇස්තමේන්තු සඳහා ප්‍රතිපාදන | - | (200) |
| | ඌන ඇස්තමේන්තු/2021 සඳහා වියදම් (අබලි ව්‍යාපෘතිය) | - | (7,800) |
| | 2021 උපචිත වියදම්/ආපසු හැරවීම | - | (6,247) |
| | අධි ප්‍රතිපාදන - ගමන් වියදම් | - | 100,521 |
| | ආපසු හැරවූ ලදු පත | - | (3,000) |
| | ආපසු හැරවූ ලදු පත | - | (1,500) |
| | ආපසු හැරවූ ලදු පත | - | (3,240) |
| | අධි ප්‍රතිපාදන (ප්‍රසාද දීමනා) | - | 352,125 |
| | අධි ප්‍රතිපාදන (පුහුණු වැඩසටහන) | - | 4,068 |
| | විකුණුම් පිරිවැය (2019)-W/06/19,W/30/19 | (11,400) | - |
| | ඌන ඇස්තමේන්තු | (174,798) | - |

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය
**මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)** (සියලු මුදල් ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත)

| **27.1 ඉතිරි කොටස...** | **2023** | **2022** (නැවත ප්‍රකාශිත) |
|---|---|---|
| විකුණුම් පිරිවැයට ගැලපීම-අබලි ව්‍යාපෘතිය | (70,065) | - |
| | **(256,263)** | **1,794,849** |

**28 විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්**

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි හඳුනාගෙන ඇති මුදල් පහත සඳහන් කර ඇති පරිදි තීරණය කරනු ලැබේ.

| | **2023** | **2022** (නැවත ප්‍රකාශිත) |
|---|---|---|
| අරමුදල් සපයා නොමැති බැඳීම්වල වර්තමාන වටිනාකම | 188,634,080 | 206,829,087 |
| මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි වගකීම | **188,634,080** | **206,829,087** |

| වර්ෂය තුළ නිශ්චිත ප්‍රතිලාභ බැඳීම්වල චලනය පහත සඳහන් පරිදි වේ. | **2023** | **2022** (නැවත ප්‍රකාශිත) |
|---|---|---|
| ජනවාරි 01 දිනට | 206,829,087 | 206,131,395 |
| වර්තමාන සේවා පිරිවැය | 11,282,050 | 12,630,367 |
| පොලී පිරිවැය | 16,554,674 | 18,172,631 |
| පශ්චාත් සේවා නියුක්ති ප්‍රතිලාභ බැඳීම් මත ආයුගණක පාඩුව/(ලාභය) | (11,768,860) | (15,052,636) |
| | 222,896,950 | 221,881,757 |
| ගෙවන ලද ප්‍රතිලාභ | (34,262,871) | (15,052,670) |
| දෙසැම්බර් 31 දිනට | **188,634,080** | **206,829,087** |

| යොදා ගන්නා ලද ප්‍රධාන ආයුගණක උපකල්පන පහත සඳහන් පරිදි විය. | **2023** | **2022** (නැවත ප්‍රකාශිත) |
|---|---|---|
| වට්ටම් අනුපාතය | 9.50% | 9.50% |
| අනාගත වැටුප් වැඩිවීම | 5.00% | 5.00% |
| විශ්‍රාම යැමේ වයස | 60 | 60 |

| **29 විශේෂ ව්‍යාපෘතිය සඳහා ප්‍රදාන** | **2023** | **2022** (නැවත ප්‍රකාශිත) |
|---|---|---|
| අමාත්‍යාංශ අරමුදල් - Robot Arm (CERA ව්‍යාපෘතිය) | - | 661,300 |
| තායිලන්ත පුණ්‍යායතන බොනැන්සා - විදේශ අමාත්‍යාංශය | 30,630 | - |
| | **30,630** | **661,300** |

| **30 රජයට ගෙවිය යුතු** | **2023** | **2022** (නැවත ප්‍රකාශිත) |
|---|---|---|
| දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් | 28,879 | 28,879 |
| දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් (මුද්දර ගාස්තු) | 12,115 | 26,050 |
| | **40,994** | **54,929** |

| **31 මණ්ඩල සහ සංස්ථා වලට ගෙවිය යුතු** | **2023** | **2022** (නැවත ප්‍රකාශිත) |
|---|---|---|
| ශ්‍රී ලංකා මහ බැංකුව (EPF) | 13,253,524 | 6,891,980 |
| සේවා නියුක්ති භාරකාර අරමුදල (ETF) | 1,807,299 | 867,546 |
| | **15,060,823** | **7,759,526** |

| **32 වෙළඳ සහ වෙනත් ණය හිමියෝ, වෙන් කිරීම් සහ උපචිත වියදම්** | **2023** | **2022** (නැවත ප්‍රකාශිත) |
|---|---|---|
| වෙළඳ ණය හිමියෝ (යොමු සටහන 32.1) | 132,979,090 | 79,446,049 |
| ගෙවිය යුතු "SGS ලංකා පුද්. සමාගම" | 2,820,737 | 6,635,504 |
| RPD & SC - MOU ක්‍රියාකාරී සැලැස්ම - වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය | 3,498,000 | 3,498,000 |
| කර්මාන්ත ණය අරමුදල-යුනිලිවර් ලංකා | 10,000,000 | - |
| ජාතිය ගොඩ නැගීමේ බදු 2% | 3,706,617 | 3,706,617 |
| ගෙවිය යුතු කාර්ය මණ්ඩල අධුකිරීම් | 12,387 | 12,387 |
| ගෙවිය යුතු උපයන විට ගෙවීම් බදු | - | 11,479 |
| විවිධ ණය හිමියෝ | 399,453 | 399,453 |
| වෙනත් ණය හිමියෝ | 40,883 | 40,883 |
| විවිධ ණය හිමියෝ - ප්‍රධාන කාර්යාලය | 2,047,780 | 1,946,480 |
| ගෙවිය යුතු VAT | 16,870,579 | 9,583,175 |
| සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද 2.5% | 1,060,745 | 969,555 |
| නිරාකරණය කිරීමට නියමිතව තිබෙන තැන්පතු | 11,535,511 | 4,464,752 |
| ලක් නිපැයුම් අලෙවි සහ ප්‍රදර්ශන මධ්‍යස්ථානය - ණය හිමියෝ | 89,753 | 89,753 |

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය

**මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)**

(සියලු මුදල් ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත)

| 32 ඉතිරි කොටස... | 2023 | 2022 (නැවත ප්‍රකාශිත) |
|---|---|---|
| ගණුදෙනුකරුවන්ගෙන් ලැබුණු අත්තිකාරම් | 46,677,588 | 26,785,591 |
| පුහුණු වැඩසටහන් සඳහා අත්තිකාරම් | - | 775,070 |
| ඇප තැන්පතු | 337,853 | 330,229 |
| ආපසු ගෙවිය හැකි තැන්පතු - ජනපද | 91,169,520 | 83,615,560 |
| ආපසු ගෙවිය හැකි තැන්පතු - ජනපද නොවන | 12,423,771 | 3,145,629 |
| ගෙවිය යුතු රඳවා ගැනීම් | 4,951,615 | 4,512,355 |
| කලින් ගෙවූ වසර 30ක බිම් කුලිය | 1,777,361 | 1,841,028 |
| වෛද්‍යාධාර යෝජනා ක්‍රමය | 4,833,048 | 4,429,240 |
| සුබසාධන සංගමය | 71,329 | 68,931 |
| සහයුරුවම් සමාජය | - | 4,418 |
| වෘත්තීය සමිතිය | - | 200 |
| කම්කරු නඩු සඳහා වෙන්කිරීම් | 4,294,311 | 4,294,311 |
| උප කොන්ත්‍රාත් ණය හිමියෝ | 95,046 | 95,046 |
| උපචිත වියදම් (යොමු සටහන 32.2) | 46,007,396 | 53,338,915 |
| ලක්කම් ණය හිමියෝ | 4,513,236 | 1,746,255 |
| ද්‍රව්‍ය විකුණුම් මධ්‍යස්ථානය -සම්භාණ්ඩ | (632,300) | (632,300) |
| ගෙවිය යුතු වැටුප් | 90,750 | 1,489,344 |
| MOU-RPD සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය | 1,880,000 | - |
| ගෙවිය යුතු ශත පාලනය | - | 30 |
| | **403,552,056** | **296,643,936** |

| 32.1 වෙළඳ ණය හිමියෝ | 2023 | 2022 (නැවත ප්‍රකාශිත) |
|---|---|---|
| ඉදිකිරීම් | 20,308,187 | 10,090,303 |
| අබලි ව්‍යාපෘතිය | 9,161,255 | 11,112,797 |
| වෙනත් සැපයුම් | 65,632,084 | 23,555,765 |
| උපචිත මිලදී ගැනීම | 37,877,564 | 34,687,184 |
| | **132,979,090** | **79,446,049** |

| 32.2 උපචිත වියදම් | 2023 | 2022 (නැවත ප්‍රකාශිත) |
|---|---|---|
| උපචිත හිලව් නිවාඩු ගෙවීම් | 1,759,772 | 1,310,378 |
| වෙළඳ ප්‍රචාරණ වියදම් | 26,163 | 26,163 |
| ප්‍රසාද දීමනා ගෙවීම් | 0 | 9,894,875 |
| ගෙවිය යුතු අනියම් වැටුප් | 2,014,452 | 2,444,803 |
| විදුලි ගාස්තු | 25,314 | 16,316 |
| ජල ගාස්තු | 5,208 | 2,248 |
| නිවාඩු දින ගෙවීම් | 851,809 | 442,482 |
| නවාතැන් වියදම් | 1,800 | 9,900 |
| පුවත්පත් සහ සඟරා | 12,560 | 46,460 |
| වෙනත් ද්‍රව්‍ය | (2,210) | (2,210) |
| අතිකාල | 5,277,808 | 3,107,866 |
| සුභසාධනය | 6,100 | - |
| වරිපනම් සහ බදු | 12,754,603 | 12,926,586 |
| ලිපි ද්‍රව්‍ය | 111,648 | 111,648 |
| අභ්‍යාසලාභින්ගේ දීමනා සහ දින වැටුප් | 268,350 | 201,484 |
| පුහුණු වැඩසටහන් | 7,021 | 234,783 |
| ගමන් වියදම් සහ යැපීම් | 3,134,805 | 790,821 |
| පිරිවැටුම් බද්ද | 246,728 | 246,728 |
| භාවිතා නොකළ වෛද්‍ය නිවාඩු සඳහා ගෙවිය යුතු | 19,286,410 | 21,490,451 |
| වාහන රක්ෂණ හිමිකම් | - | 37,134 |
| විවිධ | 154,094 | - |
| ප්‍රදර්ශන | 64,960 | - |
| | **46,007,396** | **53,338,915** |

## 2022 මූල්‍ය ප්‍රකාශනවල අයිතම සඳහා කරන ලද නිවැරදි කිරීම්

2022 වර්ෂයේදී, Sage 200 ERP පද්ධතියට දත්ත ඇතුළත් කිරීමේ අදියරේ ඉගෙනුම් හා පුහුණුවීම් සිදුවෙමින් පැවැති බැවින්, පද්ධතියේ වැරදි සහ අතපසුවීම් ගණනාවක් සිදු වූ අතර එය 2023 වර්ෂයේදී නිවැරදි කරන ලදී. පහත ගිණුම් සකස් කර 2022 වර්ෂයේ සංසන්දනාත්මක සංඛ්‍යා ඒ අනුව වෙනස් කරන ලදී. ක්ෂේත්‍ර සහ වෙනස් වීමේ බලපෑම පහත දැක්වේ.

**මූල්‍ය වර්ෂය 2021**

| කේතය | විස්තරය | වෙනස් කිරීමට පෙර මුදල | | වෙනස්කම් වලින් පසු මුදල | | වෙනස් කළ මුදල | |
|---|---|---|---|---|---|---|---|
| 70000 | වෙළඳ ණය ගැතියෝ | 27,190,036 | - | 29,898,876 | 2,696 | (2,708,840) | (2,696) |
| 79000 | වෙළඳ ණය හිමියෝ | 1,044,679 | 28,498,260 | 1,270,177 | 28,190,798 | (225,497) | 307,462 |
| 30048 | පරිගණක සහ උපාංග නඩත්තු කිරීම | 8,000 | - | 65,500 | - | (57,500) | - |
| 30056 | කාර්යාල උපකරණ නඩත්තු කිරීම | 16,214 | - | 51,464 | - | (35,250) | - |
| 10000 | විකුණුම් | - | 16,003,752 | - | 18,028,260 | - | (2,024,509) |
| 80027 | ආපසු ගෙවිය හැකි තැන්පතු - කාර්මික ජනපද | - | 73,867,694 | - | 74,375,294 | - | (507,600) |
| 80102 | විකුණුම් මත වැට් බද්ද | - | 8,656,093 | - | 8,838,921 | - | (182,828) |
| 25010 | නොතාරිස් ගාස්තු | - | - | - | 32,400 | - | (32,400) |
| 10008 | අධිභාර - කාර්මික ජනපද | - | 742,244 | - | 741,466 | - | 778 |
| 10005 | බිම් කුලිය - කාර්මික ජනපද | - | 8,013,196 | - | 8,005,418 | - | 7,778 |
| 10012 | ව්‍යාපෘති වාර්තා | - | 55,496 | - | 44,850 | - | 10,646 |
| 60027 | තොග-ඉංජිනේරු-EPC-අමුද්‍රව්‍ය | 1,526,860 | - | 1,516,290 | - | 10,570 | - |
| 60103 | තොග-පොදු-මුද්‍රණ-අමුද්‍රව්‍ය | 53,546 | - | 39,796 | - | 13,750 | - |
| 60101 | තොග-පොදු-ලිපිද්‍රව්‍ය-අමුද්‍රව්‍ය | 2,233,704 | - | 2,154,704 | - | 79,000 | - |
| 58040 | ආයෝජන දේපල මත ඉඩම් වැඩිදියුණු කිරීම් | 931,135,635 | - | 930,910,137 | - | 225,497 | - |
| 58011 | රසායනාගාර උපකරණ පිරිවැය | 91,575,823 | - | 91,300,923 | - | 274,900 | - |

**මූල්‍ය වර්ෂය 2022**

| කේතය | විස්තරය | වෙනස් කිරීමට පෙර මුදල | | වෙනස්කම් වලින් පසු මුදල | | වෙනස් කළ මුදල | |
|---|---|---|---|---|---|---|---|
| 10000 | විකුණුම් | - | 32,226,219 | - | 38,799,193 | - | (6,572,974) |
| 10003 | කුලිය - කාර්මික ජනපද | - | 7,647,175 | - | 7,249,876 | - | 397,298 |
| 10005 | බිම් කුලිය - කාර්මික ජනපද | - | 23,912,258 | - | 24,703,815 | - | (791,556) |
| 10006 | අමතර බිම් කුලිය (කාර්මික ජනපද) | - | 2,030,475 | - | 2,007,193 | - | 23,281 |
| 10007 | ජල ගාස්තු - කාර්මික ජනපද | - | 3,565,432 | - | 3,490,499 | - | 74,934 |
| 10008 | අධි අය - කාර්මික ජනපද | - | 864,980 | - | 838,393 | - | 26,586 |
| 10011 | විකුණුම් - කැස්පර් | - | 35,875 | - | 51,875 | - | (16,000) |
| 10016 | සේවා ගාස්තු - රසායනාගාර පරීක්ෂණ | - | - | - | 32,826 | - | (32,826) |
| 10019 | ප්‍රකාශන අළෙවිය | - | - | - | 500 | - | (500) |
| 10021 | පුහුණු වැඩසටහන් | - | 11,664,890 | - | 20,753,581 | - | (9,088,691) |

| කේතය | විස්තරය | වෙනස් කිරීමට පෙර මුදල | | වෙනස්කම් වලින් පසු මුදල | | වෙනස් කළ මුදල | |
|---|---|---|---|---|---|---|---|
| 20000 | විකුණුම් පිරිවැය - ඍජු ද්‍රව්‍ය | 11,345,391 | - | 11,960,148 | - | (614,757) | - |
| 20010 | විකුණුම් පිරිවැය - අබලි ව්‍යාපෘතිය | 193,317,401 | - | 193,339,535 | - | (22,134) | - |
| 20014 | විකුණුම් පිරිවැය - කැස්පර් | 1,596,500 | - | 1,349,205 | - | 247,295 | - |
| 20015 | විකුණුම් පිරිවැය - ඍජු ශ්‍රමය | 4,900,620 | - | 5,497,845 | - | (597,225) | - |
| 20026 | සාමාන්‍ය පොදු කාර්ය | 1,387,776 | - | 1,799,914 | - | (412,138) | - |
| 20027 | යන්ත්‍ර පොදු කාර්ය | 1,066,268 | - | 1,346,257 | - | (279,988) | - |
| 20065 | පුහුණු වැඩසටහන් | 12,487,459 | - | 12,729,704 | - | (242,245) | - |
| 20100 | මිලදී ගැනීමේ උපචිත | - | 16,019,322 | - | - | - | 16,019,322 |
| 20101 | මිලදී ගැනීමේ පිරිවැය විචලනය | 23,030 | - | - | - | 23,030 | - |
| 25008 | විවිධ ආදායම් | - | - | - | 240,386 | - | (240,386) |
| 25030 | රසායනාගාර පරීක්ෂණ සඳහා සේවා ගාස්තු | - | 683,115 | - | 1,635,359 | - | (952,244) |
| 25066 | කර්මාන්ත ප්‍රදර්ශන ආදායම | - | 28,635,000 | | 29,635,000 | | (1,000,000) |
| 25081 | පුහුණු වැඩසටහන සඳහා අනුග්‍රාහකත්වය-TSD | - | - | - | 600,000 | - | (600,000) |
| 30034 | භාණ්ඩ සමීක්ෂණ වියදම් | 807,308 | - | 872,239 | - | (64,931) | - |
| 30035 | සංචාරය (දේශීය) | 2,198,724 | - | 2,356,946 | - | (158,222) | - |
| 30039 | ලිපිද්‍රව්‍ය සහ කාර්යාල අවශ්‍යතා | 46,086 | - | 47,566 | - | (1,480) | - |
| 30046 | ගොඩනැගිල්ල නඩත්තු කිරීම | 57,000 | - | 117,045 | - | (60,045) | - |
| 30052 | වාහන නඩත්තු කිරීම | 466,331 | - | 353,931 | - | 112,400 | - |
| 30055 | කාර්යාල නඩත්තු වියදම් | 1,975 | - | 3,335 | - | (1,360) | - |
| 30056 | කාර්යාල උපකරණ නඩත්තු කිරීම | - | - | 102,500 | - | (102,500) | - |
| 30070 | විදුලිය | 121,511 | - | 138,821 | - | (17,311) | - |
| 30074 | තැපැල් ගාස්තු සහ විදුලි පණිවුඩ | 2,885 | - | 5,045 | - | (2,160) | - |
| 30075 | ජල ගාස්තු | 37,845 | - | 40,093 | - | (2,248) | - |
| 30086 | පුවත්පත් සහ සඟරා | 364,840 | - | 411,300 | - | (46,460) | - |
| 30097 | සුභසාධනය | 113,001 | - | 124,245 | - | (11,244) | - |
| 30102 | මණ්ඩල සේවකයින් සඳහා දේශීය පුහුණුව | 44,187 | - | 78,434 | - | (34,247) | - |
| 30122 | විවිධ වියදම් | 16,642 | - | 29,646 | - | (13,004) | - |
| 30131 | ක්ෂය වීම - රසායනාගාර උපකරණ | 7,242,658 | - | 7,214,415 | - | 28,243 | - |
| 30134 | ක්ෂය වීම - කාර්යාල උපකරණ | 78,897 | - | 79,300 | - | (403) | - |
| 40002 | 2022 "කර්මාන්ත" ප්‍රදර්ශනය සඳහා වියදම් | - | - | 57,067,560 | - | (57,067,560) | - |
| 58011 | රසායනාගාර උපකරණ පිරිවැය | 97,096,330 | - | 96,821,430 | - | 274,900 | - |
| 58012 | රසායනාගාර උපකරණ - සමුච්චිත ක්ෂය වීම | 41,612,117 | - | 41,583,874 | - | 28,243 | - |
| 58018 | කාර්යාල උපකරණ පිරිවැය | 77,548,309 | - | 77,590,309 | - | (42,000) | - |
| 58019 | කාර්යාල උපකරණ - සමුච්චිත ක්ෂය වීම | - | 54,143,796 | - | 54,144,199 | - | (403) |
| 58040 | ආයෝජන දේපල මත ඉඩම් වැඩිදියුණු කිරීම් | 1,006,987,585 | - | 1,006,762,087 | - | 225,497 | - |

| කේතය | විස්තරය | වෙනස් කිරීමට පෙර මුදල | | වෙනස්කම් වලින් පසු මුදල | | වෙනස් කළ මුදල | |
|---|---|---|---|---|---|---|---|
| 60023 | තොග-ඉංජිනේරු-විද්‍යුත්-අමුද්‍රව්‍ය | 2,712,996 | - | 2,670,996 | - | 42,000 | - |
| 60027 | තොග-ඉංජිනේරු-EPC-අමුද්‍රව්‍ය | 1,073,806 | - | 1,063,236 | - | 10,570 | - |
| 60062 | තොග-රබර්-රසායනික ද්‍රව්‍ය-අමුද්‍රව්‍ය | 4,766,900 | - | 5,123,150 | - | (356,250) | - |
| 60101 | තොග-පොදු-ලිපිද්‍රව්‍ය-අමුද්‍රව්‍ය | 4,202,175 | - | 4,123,175 | - | 79,000 | - |
| 60103 | තොග-පොදු-මුද්‍රණ-අමුද්‍රව්‍ය | 52,722 | - | 38,972 | - | 13,750 | - |
| 60106 | තොග-පොදු-සුබසාධනය | 770,240 | - | 763,896 | - | 6,344 | - |
| 60120 | තොග-ප්‍රාදේශීය සංවර්ධනය | 1,517,581 | - | 1,764,876 | - | (247,295) | - |
| 60800 | WIP-සෘජු ද්‍රව්‍ය (H/O) | 925,636 | - | 473,429 | - | 452,207 | - |
| 60801 | WIP-සෘජු ශ්‍රමය | 1,218,787 | - | 621,562 | - | 597,225 | - |
| 60802 | WIP-සාමාන්‍ය පොදු කාර්ය | 426,576 | - | 14,438 | - | 412,138 | - |
| 60804 | WIP-යන්ත්‍ර පොදු කාර්ය | 290,301 | - | 10,313 | - | 279,988 | - |
| 70000 | වෙළඳ ණය ගැතියෝ | 10,940,272 | 25,608,285 | 22,073,180 | 12,631,212 | (11,132,908) | 12,977,074 |
| 71003 | ප්‍රදර්ශනය-2022 | 65,067,560 | - | - | - | 65,067,560 | - |
| 71014 | පුද්ගලික අත්තිකාරම් - කේ. ඩී. ලාලසේන | 343,095 | - | 353,595 | - | (10,500) | - |
| 71059 | ප්‍රදර්ශනයෙන් ලැබියයුතු මුදල් | - | - | - | 1,000,000 | - | (1,000,000) |
| 72020 | ගම්මාන සංවර්ධනය - BOC ඉඩම 4204245 | 6,514,804 | - | 6,520,554 | - | (5,750) | - |
| 72079 | පමුණුව පිත්තල මධ්‍යස්ථානය -පාලිත පුෂ්පකුමා | - | - | - | 5,000 | - | (5,000) |
| 72134 | අනැති මුදල් | 522,073 | - | 429,859 | - | 92,214 | - |
| 72140 | පුහුණු අග්‍රිමය | - | - | - | 193,216 | - | (193,216) |
| 79000 | වෙළඳ ණය හිමියෝ | 5,610,893 | 33,285,311 | 5,737,346 | 25,477,798 | (126,452) | 7,807,513 |
| 80027 | ආපසු ගෙවිය හැකි තැන්පතු - කාර්මික ජනපද | - | 80,384,796 | - | 83,615,560 | - | (3,230,764) |
| 80042 | ප්‍රසාද දීමනා ගෙවීම | - | 10,247,000 | - | 9,894,875 | - | 352,125 |
| 80047 | උපචිත පුහුණු වැඩසටහන් | - | 238,851 | - | 234,783 | - | 4,068 |
| 80050 | නවාතැන් වියදම් | - | - | - | 9,900 | - | (9,900) |
| 80051 | ගමන් වියදම් | - | 500,658 | - | 790,821 | - | (290,163) |
| 80052 | විදුලිය | - | - | - | 16,316 | - | (16,316) |
| 80055 | ජල ගාස්තු | - | - | - | 2,248 | - | (2,248) |
| 80056 | පුවත්පත් | - | - | - | 46,460 | - | (46,460) |
| 80102 | විකුණුම් මත වැට් බද්ද | - | 36,049,617 | - | 37,053,859 | - | (1,004,242) |
| 80200 | ගෙවිය යුතු එකතු කළ අගය මත බද්ද (වැට්) | 27,477,752 | - | 27,470,684 | - | 7,069 | - |
| 80202 | මිලදී ගැනීමේ උපචිත | - | 18,670,392 | - | 34,687,184 | - | (16,016,792) |
| 90000 | ආදායමට වඩා වැඩිවූ වියදම් (සමුච්චිත) | 279,319,545 | - | 278,963,352 | - | 356,193 | - |
| 90006 | රාජ්‍ය ආයතන්වය සමුච්චිත (ප්‍රාග්ධන) | - | 239,059,326 | - | 258,785,672 | - | (19,726,347) |
| 90007 | රජයේ ප්‍රදාන ප්‍රවර්තන වර්ෂය (ප්‍රාග්ධන) | - | 19,726,347 | - | - | - | 19,726,347 |

# මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සමාලෝචනය

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. IMT/A/IDB/FA/2023/10 | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2024 ජූලි 26 දින

22 AUG 2024
මුදල් අංශය

Div. Finance

F-M/A
23/08/2024

සභාපති,

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය

**ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

**1.** **මූල්‍ය ප්‍රකාශන**

**1.1** **තත්ත්වාගණනය කළ මතය**

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාළ තොරතුරුද ඇතුලත් මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව | இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 19 හි 57 ඡේදය ප්‍රකාරව අස්ථිත්වය විසින් සේවක ප්‍රතිලාභ බැඳීම ගණනයේදී ආයු ගණක ක්‍රමය යොදා ගැනීම සිදු කළ යුතුය. මණ්ඩලය විසින් එය ගණනයේදී ආයුගණක උපකල්පන භාවිතා කරනු ලබන බව මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කර ඇති නමුත් ගණනය කිරීමේදී ඇති වූ දෝෂයක් නිසා රු. 146,328,424 ක් විය යුතු සේවක ප්‍රතිලාභ වගකීම රු. 188,643,080 ක් ලෙස ගණනය කර තිබීමෙන් වර්ෂයේ ලාභය රු. 3,056,332 කින් ද වෙනත් විස්තීරණ ආදායම් රු. 39,249,324 කින් ද අවගණනය වී මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සේවක ප්‍රතිලාභ වගකීම රු. 42,305,656 කින් අධි ගණනය වී තිබුණි.

(ආ) 2016 වර්ෂයට පෙර සිට පැවත එන ප්‍රාග්ධන ප්‍රදාන යටතේ දක්වා ඇති රු.10,500,000 ක් වටිනා Cess Fund නම් ප්‍රදානය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 20 හි 26 හෝ 27 ඡේද පරිදි ක්‍රමක්ෂය කර නොතිබුණි.

(ඇ) බැංකු ප්‍රකාශනය අනුව ඉතුරුම් ගිණුමක ශේෂය රු.143,362,332 ක් වූ අතර, මූල්‍ය ප්‍රකාශන අනුව එය රු.138,511,478 ක් විය. එහි වෙනස වූ රු.4,850,853 ක් සමාලෝචිත වර්ෂයේ ලැබූ පොලී ආදායම වන අතර එය ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ රබර් භාණ්ඩ විකිණීමෙන් ලද ආදායම රු. 20,523,838 ක් ලෙස මූල්‍ය ප්‍රකාශන තුළ හඳුනා ගෙන තිබූ නමුත් එය රබර් භාණ්ඩ සංවර්ධන මධ්‍යස්ථානයේ බැංකු ගිණුම් ප්‍රකාශය අනුව රු. 31,013,048 ක් වන බැවින් එහි රු.10,489,211 ක වෙනසක් පැවතුණි.

(ඉ) 2020 වර්ෂයේදී රු.4,320,000 කට මිලදී ගත් Sage 200 මෘදුකාංගය වත්කමක් ලෙස ගිණුම් ගත නොකර කෙරීගෙන යන වැඩ යටතේද එම මෘදුකාංගය වැඩිදියුණු කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේ දරන ලද ප්‍රාග්ධන වියදම රු. 1,750,000 ක් වියදම් ලෙස ද කපා හැර තිබුණි.

(ඊ) 2023 වර්ෂයේ ලබා දෙන ලද රු. 2,275,482 ක අත්තිකාරම් 2024 වර්ෂයේ මුල් මාසවල පියවීම සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල අත්තිකාරම් ගිණුමෙන් ගැලපුම් නොකර වියදමක් ලෙස ගිණුම් ගත කර තිබුණි.

(උ) ජනපද අංශයේ උපලේඛන අනුව 2023 දෙසැම්බර් 31 දිනට රු.8,275,427 ක ණයගැති ශේෂයක් පැවතියද මූල්‍ය ප්‍රකාශන අනුව එය රු.14,180,401 ක් වීමෙන් රු.5,904,973 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඌ) මූල්‍ය ප්‍රකාශන අනුව වෙනත් ණයහිමි ගිණුමේ ශේෂය රු.65,632,084 ක් වූ අතර, පොදු ලෙජරයේ වෙනත් ණයහිමි ගිණුම්වල එකතුව රු.64,907,063 ක් වූයෙන් රු.725,021 ක වෙනසක් දක්නට ලැබුණි.

(එ) ප්‍රාදේශීය සංවර්ධන බැංකුවෙ කර්මාන්ත ණය අරමුදලේ බැංකු ප්‍රකාශනය අනුව 2023 දෙසැම්බර් 31 දිනට ශේෂය රු. 16,948,392 ක් වුවද, මූල්‍ය ප්‍රකාශන අනුව රු. 16,606,800 ක් වීම හේතුවෙන් රු. 341,592 ක වෙනසක් දක්නට ලැබුණි.

(ඒ) ලක්කම් මධ්‍යස්ථානයේ උපලේඛන අනුව සමාලෝචිත වර්ෂයේ නිෂ්පාදිත අලෙවි ආදායම හා පොත්පත් අලෙවි ආදායම රු.8,755,482 ක් වුවද මූල්‍ය ප්‍රකාශන අනුව එහි ආදායම රු.7,273,910 ක් ලෙස දක්වා තිබීමෙන් රු.1,481,572 ක වෙනසක් දක්නට ලැබුණි.

(ඔ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව අබලි පෙර ගෙවුම් ශේෂය රු.43,287,723 ක් වුවද මෘදුකාංග පද්ධතියේ අබලි නොපියවූ සාරාංශය (Unsettle Summery) අනුව එම වටිනාකම රු.21,282,407 ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ අබලි පෙර ගෙවුම් රු.22,005,316 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඕ) පෙර ගෙවුම් ශේෂවල ඇතුළත් වටිනාකම රු.465,000 ක් වූ දේශීය ආයුර්වේද යුෂ වර්ග නිෂ්පාදනය කළ හැකි යන්ත්‍රයක් 2021 වර්ෂයේදී මණ්ඩලය පරිත්‍යාග වශයෙන් ලබා දී තිබියදී පරිත්‍යාග ලෙස ගිණුම් ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මණ්ඩලයේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු.**

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන මණ්ඩලයේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු

මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මණ්ඩලයේ 2023 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

## 1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

**2.** වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සමාගම පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ ආ, ඇ හා ඊ හි දක්වා ඇති නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට මණ්ඩලය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් ඍජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| | නීතිරීති / විධානයට යොමුව | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | 2017 ඔක්තෝබර් 25 දිනැති මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 5/2017 | චක්‍රලේඛය පරිදි සක්‍රිය සේවා කාලය පදනම් කර නොගෙන වෘත්තීය දීමනා ලෙස 2018 වර්ෂයේ සිට රු.7,717,590 ක් වැඩිපුර ගෙවා තිබුණි. |
| (ආ) | 2022 අගෝස්තු 08 දිනැති මුදල් අමාත්‍යාංශයේ ජාතික අයවැය චක්‍රලේඛ අංක 04/2022 හි 2.4 ඡේදය | චක්‍රලේඛයේ විධිවිධානවලින් බැහැරව 2023 වර්ෂයේදී කොන්ත්‍රාත් පදනමින් නිලධාරින් 106 දෙනෙකු බඳවාගෙන ඉන් 61 දෙදෙනෙකු ස්ථිර කර තිබුණි. |
| (ඇ) | 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 හි 9.1 (ආ) ඡේදය | එක් වරකදී පුද්ගලයෙකුට ලබාදිය හැකි උපරිම අත්තිකාරම් මුදල රු.100,000 ක් වුවද, එම සීමාව ඉක්මවා අවස්ථා 12 කදී රු.125,000 සිට රු.500,000 දක්වා එකතු වටිනාකම රු.4,148,960 ක අත්තිකාරම් ලබා දී තිබුණි. |

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර මණ්ඩලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

2.3 වෙනත් කරුණු

(අ) කාර්මික සංවර්ධන මණ්ඩලය සතු කාර්මික ජනපද 16 (ඇල්පිටිය කාර්මික ජනපදය හැර) හි බිම් කොටස් 733ක් පවතින අතර ඉන් බිම් කොටස් 53ක් කර්මාන්තකරුවන්ට බෙදා දී නොතිබීමෙන් වර්ෂ කිහිපයක සිට භාවිතයෙන් තොරව පැවතුණි. 2023 දෙසැම්බර් 31 දිනට කර්මාන්ත ශාලා 26ක් ක්‍රියාත්මක නොවී වසා දමා තිබූ අතර ඒවා වෙනත් කර්මාන්තකරුවන්ට බෙදා දීමට කටයුතු කර නොතිබුණි. තවද මණ්ඩලය සතු කාර්මික ජනපද 05ක ඉඩම් කට්ටි 23ක් පුද්ගලික පදිංචිය සඳහා භාවිතයට ගෙන තිබුණි.

(ආ) ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයට අයත් මාතර වැඩහල වෙත ජාතික ශිල්ප සභාව විසින් රු.3,850,740ක වටිනාකමැති යන්ත්‍ර 3ක් සකස් කිරීමට 2021 වර්ෂයේ දී ඇණවුමක් ලබා දී තිබුණ ද, මා වෙවැල් කැලයෙන් ඇදීම සඳහා වන රු.351,000 ක් වටිනා යන්ත්‍රය හැර අනෙකුත් යන්ත්‍ර 2 2024 අප්‍රේල් අවසන් වනවිටත් වැඩ අවසන්කර ශිල්ප සභාවට භාර දී නොතිබුණි.

(ඇ) පැලියගොඩ රබර් සංවර්ධන හා සේවා මධ්‍යස්ථානයට රබර් ආශ්‍රිත නිෂ්පාදන වල ගුණත්වය වැඩි දියුණු කිරීම, නාස්තිය අවම කිරීම, නිෂ්පාදන ක්‍රියාවලියේ කාර්යක්ෂමතාවය වැඩි කිරීම හා නිෂ්පාදන පිරිවැය අවම කිරීම, සුළු හා මධ්‍යම මට්ටමේ කර්මාන්ත වලට භාවිතය හඳුන්වා දීම හා දිරිගැන්වීම ආදිය අරමුණු පෙරදැරිව රබර් ඉන්ජෙක්ෂන් මෝල්ඩිං යන්ත්‍රයක් 2016 වර්ෂයේදී රු.9,318,026 ක මුදලකට මිලදී ගෙන තිබුණි. මිලදී ගත් දින සිට පුහුණු ලාභීන් 328 දෙනෙකුට පමණක් පුහුණුව ලබා දී තිබූ අතර, 2020 වර්ෂයේ සිට 2024 වර්ෂයේ විගණිත දින වන විටත් මෙම යන්ත්‍රය ක්‍රියාකාරී මට්ටමකින් තොරව පැවතිණි.

(ඈ) පැලියගොඩ රබර් භාණ්ඩ සංවර්ධන හා සේවා මධ්‍යස්ථානයේ රබර් ආශ්‍රිත යන්ත්‍රෝපකරණ 64 ක් පැවති අතර ඉන් යන්ත්‍ර 26 ක් වර්ෂ 1 ක සිට වර්ෂ 39 ක් දක්වා කාල පරාසයක සිට අක්‍රියව පැවති අතර රු.85,560ක් වූ Compressor යන්ත්‍රය 2017 වර්ෂයේ සිට භාවිතයකින් තොරව ඇසුරුම් වලම ගබඩාවේ පැවතිණි. තවද, එහි පවතින අමුද්‍රව්‍ය වර්ග 17ක් හා යන්ත්‍ර අමතර කොටස් වර්ග 284 ක් වර්ෂ 1 සිට වර්ෂ 17 ක් දක්වා කාල පරාසයක සිට භාවිතා කිරීමකින් තොරව නිෂ්කාර්යව පැවතිණි.

(ඉ) 2016 අගෝස්තු 17 දින අමප/16/1424/723/039 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මගින් රජයේ දායකත්වයක් සහිතව නවබිම පෙර වැවුම් මධ්‍යස්ථානයේ පිහිටුවූ රොබෝ තාක්ෂණය සඳහා වන විශිෂ්ඨතා මධ්‍යස්ථානය වෙනුවෙන් ගොඩනැගිලි නවීකරණය, වැටුප් හා වේතන ලෙස රු.මිලියන 51 ක් වැයකර තිබුණු අතර 2018 හා 2019 වර්ෂයන්හිදී රු.මිලියන 35 ක් වටිනා රොබෝ තාක්ෂණික උපකරණ ස්ථාපිතකර තිබුණද අවශ්‍ය කාර්ය මණ්ඩලය බඳවා ගැනීම හා එහි කටයුතු ආරම්භ කිරීම කර නොතිබුණි. විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය යටතේ පැවති මෙම මධ්‍යස්ථානය කර්මාන්ත අමාත්‍යාංශයටත් 2023 වර්ෂය අවසන් වන විට නැවත තාක්ෂණ අමාත්‍යාංශයටත් වරින් වර මාරු වී තිබුණි. 2023 වර්ෂයේ දී මෙම ව්‍යාපෘතිය සඳහා IRB 2600 welding power source එකක්, Reproving of 45 existing Robot cell එකක් හා එය භාවිතා කිරීමට දින 04කට ඉංජිනේරුවන් දෙදෙනෙකු පුහුණුකිරීම හා වෙනත් වියදම් ඇතුළුව රු.5,164,149 ක් දරා තිබුණි. කෙසේ වුවද ලංකාවේ කර්මාන්ත වලට ධෛර්යය දීම, ඒවා වැඩි දියුණු කිරීම හා සංවර්ධනයට සහාය වීමේ අරමුණින් මෙම ව්‍යාපෘතිය ආරම්භ කර තිබුණ ද 2023 දෙසැම්බර් 31 දින වන විටත් මෙය ක්‍රියාත්මක මට්ටමක නොපැවතුණි.

(ඊ) 2020 වර්ෂයේ යුනිඩෝ ආයතනය විසින් ඇ. ඩො. 101,130ක් වටිනා යන්ත්‍ර උපකරණ 12 ක් සහ ඇ.ඩො.1167.44 ක් වටිනා භාණ්ඩ මණ්ඩලයට ලබාදී ඒවා ලක්සල ගොඩනැගිල්ලේ ස්ථාපනය කර තාවකාලිකව උණ දැව පුහුණු මධ්‍යස්ථානය ආරම්භ කර තිබුණි. 2022 සැප්තැම්බර් මස මෙම පුහුණු මධ්‍යස්ථාන ගොඩනැගිල්ල ජාතික ශිල්ප සභාවට පැවරීම නිසා එහි තිබූ යන්ත්‍ර උපකරණ ඉවත් කර කටුබැද්ද නවබිම පරිශ්‍රයේ ගොඩනැගිල්ලක අසුරා තිබීමෙන් 2024 මැයි වන විටත් ඒවා භාවිතයෙන් තොරව නිෂ්කාර්යව පැවතිණි.

(උ) 2023 දෙසැම්බර් 31 දිනට පවතින රු. 11,535,511 ක හඳුනානොගත් තැන්පතු ශේෂය හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඌ) මූල්‍ය ප්‍රකාශන අනුව රු.75,572,826 ක වෙනත් පෙර ගෙවුම් ශේෂය තුළ පැවති 2018 වර්ෂය හා ඊට පෙර වර්ෂයන්ට අදාළ රු.6,618,086 ක්ද සමාලෝචිත වර්ෂයේදී විදුලි බල මණ්ඩලයට ගෙවා තිබුණු 25,331,256 ක්ද නිරවුල් කර ගැනීමට මණ්ඩලය කටයුතු කර නොතිබුණි.

(එ) බැංකු ගිණුම් දෙකක තැන්පත් කර තිබූ වටිනාකම රු. 1,228,365 ක් වූ චෙක්පත් 59 ක් මාස 1 සිට මාස 11 ක් දක්වා කාල පරාසයක සිට උපලබ්ධි වී නොතිබුණි.

(ඒ) විවිධ ණයගැති - පොදු (Sundry Debtors – Common) යනුවෙන් පෙර වර්ෂයේ රු.2,305,714ක් වූ ශේෂය සමාලෝචිත වර්ෂයේදී රු.4,171,284 ක් වී තිබුණි. මෙම ශේෂය අයකර ගැනීමට මණ්ඩලය කටයුතු කර නොතිබුණි.

(ඔ) 2022 වර්ෂයේදී විමලසුරේන්ද්‍ර විදුලි බලාගාරයෙන් ඉවත් කරන ලද අබලි ලෝහ මිලදී ගැනීම සඳහා ගෙවන ලද රු. 3,754,298 ක් සඳහා අබලි තඹ ලෝහ ප්‍රමාණවත්ව නොතිබීම හේතුවෙන් මණ්ඩලයට භාණ්ඩ ලැබී නොතිබුණි. එම මුදල ආපසු ලබා ගැනීමට හෝ භාණ්ඩ ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඕ) 2023 දෙසැම්බර් 31 දිනට ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රගතිය පරීක්ෂාවේ දී අංශ 07 ක සැලසුම් කර තිබූ ක්‍රියාකාරකම් 83 කින් ක්‍රියාකාරකම් 18 ක් පමණක් ඉටුකර තිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න

විගණකාධිපති